# ගොවිජන බැංකු වැඩසටහන පිළිබඳ කාර්ය සාධන ඇගයීම් අධ්‍යයනය

ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි
චතුර සෙව්වන්දි විජේතුංග
බී.ඒ.ඩී.එස්. බමුණුආරච්චි



HARTI

2014/12
2015/11

# ගොවිජන බැංකු වැඩසටහන පිළිබඳ කාර්යසාධන ඇගයීම් අධ්‍යයනය

ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි
චතුර සෙව්වන්දි විජේතුංග
බී.ඒ.ඩී.එස්. බමුණුආරච්චි

MFN 12252

පර්යේෂණ වාර්තා අංක: 56 2013 ජුනි

24190

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ 07.

24190

24190

පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

ප්‍රථම මුද්‍රණය : 2013 ජූනි

© හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

සියලුම හිමිකම් ඇවිරිණි

ISBN : 978-955-612-146-9

පරිගණක පිටු සැකසුම හා කවර නිර්මාණය : ජී.පී. උදේනි කරුණාරත්න

පරිගණක ගත කිරීම : ජී.පී. මනෝජා තුෂාරි

# පෙරවදන

මෙරට ග්‍රාමීය කෘෂි ක්ෂේත්‍රයේ ඉතා කුඩා ඉඩම්වල වගා කටයුතුවල නියැලී අඩු ආදායම්ලාභී බොහෝ ගොවීන්ට නවීන තාක්ෂණයේ ප්‍රතිඵල ලබාගැනීම සඳහා ආයෝජන කටයුතු සිදු කිරීමට අනිවාර්යයෙන්ම ණය මත රැඳී සිටීමට සිදුව ඇත. එසේ වුව ද, පවත්නා නීති රීතීන් යටතේ ඔවුන්ට බැංකු මගින් ණය ලබාගැනීම ඉතා අසීරු ය.

මෙවන් වාතාවරණයක් තුළ රජය විසින් දශක එක හමාරකට පමණ පෙර මෙරට ගොවීන්ගේ කෘෂි ණය අවශ්‍යතා සපුරා ගැනීම සඳහා සුදුසු ක්‍රමෝපායයක් ලෙස ගොවිජන බැංකු පිහිටුවීමේ වැඩ පිළිවෙළ නියමු ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කරනු ලැබිණි. එහි ප්‍රගතිය හා එමගින් අපේක්ෂිත අරමුණු කෙතරම් දුරට සැපිරී ඇද්ද යන්න සම්බන්ධයෙන් දිගු කාලයක් තුළ ක්‍රමවත් අධ්‍යයනයක් සිදු වී ඇති බවක් නො පෙනේ. මෙම අධ්‍යයනය එම හිදැස පිරවීම සඳහා දරනු ලැබූ උත්සාහයකි.

මෙම අධ්‍යයනය විවිධ දිස්ත්‍රික්කයන්ගෙන් තෝරාගත් වඩාත් දියුණු හා අඩු දියුණු ගොවි බැංකු 10ක් සම්බන්ධයෙන් සිද්ධි අධ්‍යයන ක්‍රමවේදය පදනම් කොටගත් එකක් වන අතර එමගින් තෝරාගත් එකිනෙක ගොවි බැංකු කෙතරම් දුරට අපේක්ෂිත අරමුණු සපුරා ඇද්ද යන්නත්, ඒ සඳහා බලපා ඇති සමාජ ආර්ථික තත්ත්වයන් හා අනුගමනය කළ කළමනාකරණ ක්‍රමෝපායයන් මොනවා ද යන්නත් විග්‍රහ කොට ඇත. අධ්‍යයනය මගින් ගොවීන්ගේ ණය අවශ්‍යතා සැපිරීම සඳහා ගොවිජන බැංකුව සතු විභව්‍යතාවය කදිමට පෙන්වා දී ඇති අතර ඒ සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග ද නිර්දේශ කෙරේ.

අධ්‍යයනයෙන් අනාවරණය කෙරෙන ප්‍රධාන කරුණක් වන්නේ මහත් අපේක්ෂාවන් පෙරදැරි කර ගනිමින් ගොවිජන බැංකුව පිහිටවූව ද කාලීන සමාජයට ගැලපෙන පරිදි වෙනස් නොවූ යල් පැනගිය නීති රීතීන් නිසා අති බහුතරයක් වූ ග්‍රාමීය ගොවීන්ට ඉන් ප්‍රයෝජන ලැබීමට නො හැකි වී ඇති බව යි. එබැවින් වේගයෙන් වෙනස්වන සමාජ වාතාවරණය තුළ එහි නීති රීතීන් ප්‍රතිසංවිධානයට ලක් කළ යුතු අතර ඒ සඳහා කැපවී සිටින ප්‍රතිපත්ති සම්පාදකයින්ට මෙම අධ්‍යයනය මනා වූ මාර්ගෝපදේශයක් සපයනු ලබයි.

මෙම අධ්‍යයනය ආරම්භයේ සිට අවසානය දක්වා අදාළ ආයතනය වන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ අදහස් හුවමාරු කර ගැනීමෙන් සිදු කළ නිසාත්, සොයාගැනීම් හා නිර්දේශ පිළිබඳ කඩිනමින් එම ආයතනය දැනුවත් කළ නිසාත් අධ්‍යයනයේ බොහොමයක් නිර්දේශ මෙම පොත මුද්‍රණය වීමටත් පෙර ක්‍රියාවට නැඟීම අධ්‍යයනයේ ඵලදායීභාවය ඉහළ මට්ටමක පවතින බවට වන සාධකයකි. මෙම අධ්‍යයනයට සහභාගී වූ පර්යේෂකයින් මෙන් ම අප හට ද මෙය සතුටට පත්විය හැකි කාරණයකි.

ගොවි බැංකු වැඩසටහන වඩාත් ගොවිජන අවශ්‍යතා සපුරාලන එකක් බවට පත් කිරීම සඳහා කැපවී සිටින සැමටත්, වැඩසටහන පිළිබඳව උනන්දුවක් දක්වන සියළු දෙනාටත් මෙම වාර්තාවෙහි අඩංගු තොරතුරු වඩාත් ප්‍රයෝජනවත් වනු නො අනුමාන ය.

**ඊ.එම්. අභයරත්න**

**අධ්‍යක්ෂ**

## ස්තුතිය

මෙම අධ්‍යයනය මේ ආකාරයෙන් වූ සාර්ථක එකක් බවට පත්කර ගැනීම සඳහා සහාය වූවන් බොහෝ ය. ඔවුන් සැමට අපි අපගේ ප්‍රණාමය පළ කිරීම යුතුකමක් කොට සලකමු.

ප්‍රථමයෙන් ම, මෙවන් අධ්‍යයනයක් සඳහා වූ අදහස ඉදිරිපත් කළ මොහොතේ සිට අවසන් අදියර දක්වා අපට ඒ සඳහා නන් අයුරින් දිරිමත් කළ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ නීතිඥ ලලිත් කාන්ත ජයසේකර මහතාට අපගේ ප්‍රණාමය පළ කිරීමට කැමැත්තෙමු. අධ්‍යයන යෝජනාව මෙන් ම පර්යේෂණ වාර්තාව වඩාත් ගුණාත්මක තත්ත්වයට පත්කර ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදෙමින් සහාය දැක් වූ අතිරේක අධ්‍යක්ෂ එල්.පී.රූපසේන මහතාට ද අපගේ ස්තුතිය පළ කිරීමට කැමැත්තෙමු.

මෙම අධ්‍යයනය වඩාත් ඵලදායී බවට පත් කිරීමේ අභිප්‍රායෙන් පර්යේෂණ යෝජනාව මෙන් ම අධ්‍යයනයේ දළ කෙටුම්පත සැකසූ සැනින් එහි සොයාගැනීම් ද අදාළ ආයතනය වන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කොට සාකච්ඡාවට ලක් කරනු ලැබිණි. එය මහත් ඉහළින් පිළිගෙන එහි ප්‍රතිඵල නෙළාගැනීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ හිටපු ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් රවීන්ද්‍ර හේවාවිතාරණ මහතා මෙන් ම එම ආයතනයේ හිටපු ගණකාධිකාරී එස්.ටී. ගාමිණී මහතා ඇතුළු කාර්ය මණ්ඩලය මහත් උනන්දුවෙන් කටයුතු කළෝ ය. මෙහි දී, අගනා අදහස් ඉදිරිපත් කිරීමෙන් හා අවශ්‍ය උපදෙස් ලබාදීමෙන් දැක් වූ සහාය පර්යේෂණ කාර්ය මණ්ඩලය වඩාත් උනන්දු කරවීමට පමණක් නොව අධ්‍යයනයේ වටිනාකම වැඩි කිරීම කෙරෙහි ද බලපෑවේ ය. මේ සම්බන්ධයෙන් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ජෙනරාල්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයට අපගේ ප්‍රණාමය පළ කරන්නෙමු.

අධ්‍යයනයට අවශ්‍ය තොරතුරු සම්පාදනය සඳහා සහාය දැක්වූවන් බොහෝ ය. තෝරාගත් දිස්ත්‍රික්කයන් හි සහකාර ගොවිජන සංවර්ධන කොමසාරිස්වරුන්, අදාළ ගොවිජන බැංකු පිහිටි ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානයන් හි ප්‍රාදේශීය නිලධාරීන්, ගොවි බැංකු කළමනාකරුවන්/ සහායකයින් (ගොවිජන සංවර්ධන සහා කම්ටු ලිපිකාරිණියන් ඇතුළු) මෙන් ම බිම් මට්ටමේ බැංකු කාර්යයන් හි නියැළි කෘ.ප.නි.ස වරුන්, ගොවි සංවිධාන නියෝජිතයින් ද, ගොවි බැංකු සාමාජික හා සාමාජික නොවන පිරිස් මේ සම්බන්ධයෙන් දක්වන ලද සහාය සිහිපත් කරන්නේ කෘතඥතා පූර්වකව ය.

ක්ෂේත්‍ර තොරතුරු රැස් කිරීම හා ඒවා වගු ගත කිරීම අනියම් විමර්ශකයින් ලෙස බඳවා ගනු ලැබූ කේ.ඩී. ඩැනියෙල්ස් සහ ඩී.ජී.ප්‍රභාත් ඉන්දික යන මහත්වරුන් විසින් සිදු කරනු ලැබූ අතර හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කරීමේ ආයතනයේ සංඛ්‍යාන නිලධාරිණී සන්ධ්‍යා සේනානායක මහත්මියගේ සහාය ද ඒ සඳහා නොමඳව ලැබුණි. මෙහි දී, ඔවුන් ද සිහිපත් කොට සිටින්නේ හෘදයාංගමව ය.

මෙම අධ්‍යයන වාර්තාව පරිගණක ගත කිරීම සඳහා සහාය දැක් වූ පරිගණක අකුරු සැකසුම්කාරීන් වන ඒ.ජී.මනෝජා තුෂාරි සහ පී.උදේනි කරුණාරත්න යන අයටත්, කළමනාකරණ සහකාරිණී එන්.ඒ.කාංචනා සඳමාලි යන අයටත් අපි අපගේ ස්තුතිය පළ කරනු කැමැත්තෙමු.

මෙය ඉතා ඉක්මනින් මුද්‍රණය කිරීම සඳහා කටයුතු කළ ආයතනයේ ප්‍රකාශන ඒකකයේ ජ්‍යෙ. ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරී එස්.ඒ.සී.යූ. සේනානායක මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, මුද්‍රණ ඒකකයේ කාර්ය මණ්ඩලයටත් අපගේ ස්තුතිය හිමි වේ.

**ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි**

**චතුර සෙව්වන්දි විජේතුංග**

**බී.ඒ.ඩී.එස්. බමුණුආරච්චි**

# සංක්ෂිප්තය

ග්‍රාමීය සුළු ගොවීන්ගේ ඉතිරි කිරීම් හැකියාව වර්ධනය කිරීම හා ආයෝජන ණය අවශ්‍යතා සැපිරීම මූලික වශයෙන් අරමුණු කොට ගනිමින් 1998 දී ගොවි බැංකු නියමු ව්‍යාපෘතිය ස්ථාපිත කරනු ලැබිණි. මේ යටතේ ඒ ඒ ප්‍රදේශවල ගොවීන්ගේ ණය අවශ්‍යතා එම ප්‍රදේශවල ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන පදනම් කර ගනිමින් පිහිටවනු ලබන ගොවිජන බැංකු මඟින් ලබාදීමට අපේක්ෂා කෙරිණි. ඒවායේ පාලනය ජාතික මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා විවිධ මට්ටම්න් එකිනෙකට වෙනස් බලතල හා වගකීම් සහිතව පිහිටවනු ලැබූ කමිටු පහක් මඟින් සිදු කෙරේ. එමඟින් වගාව, අස්වනු නෙළීම, අස්වනු රැස්කිරීම, යන්ත්‍ර සූත්‍ර මිල දී ගැනීම, කෘෂි ව්‍යාපෘති ඇරඹීම හා ගොවි විශ්‍රාම වැටුපට දායකවීම යනා දී කාරණා වෙනුවෙන් වූ ණය වර්ග හයක් ක්‍රියාත්මක කෙරේ. ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රමෝපායය යටතේ සපයනු ලබන මෙම ණය ලබාගැනීම සඳහා ඒවා ආපසු ගෙවීම සම්බන්ධයෙන් සාමූහිකව වගකීම භාරගනු ලබන කුඩා කණ්ඩායම් හි සාමාජිකයින් ලෙස ගොවි බැංකුවට බැඳිය යුතු ය. වැඩසටහනෙහි කාර්ය සාධන මට්ටම හා ඒ සඳහා බලපෑ හේතුන් විමර්ශනය සඳහා ප්‍රමාණවත් තරම් අධ්‍යයන සිදු කෙරී නොමැති බැවින් ඒ සම්බන්ධයෙන් ඇති තොරතුරුවල හිදැස පිරවීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදී. ග්‍රාමීය ගොවීන්ගේ ණය අවශ්‍යතා සැපිරීම සඳහා ගොවිජන බැංකුව කොතෙක් දුරට සමත් ව සිටීද? යන්න සොයා බැලීම මෙහි ප්‍රධාන අරමුණ විය. විවිධ තත්ත්වයන් නියෝජනය කරමින් තෝරාගත් දිස්ත්‍රික්ක පහකට අයත් ඉතා සාර්ථක හා සාමාන්‍ය මට්ටමෙන් ක්‍රියාත්මක ගොවි බැංකු දහයක් පදනම් කරගත් සිද්ධි අධ්‍යයන ක්‍රමවේදය මේ සඳහා භාවිතා කරන ලදී.

ගොවි බැංකුවල දිගුකාලීන කාර්ය සාධනය විමසීමේ දී ඒවායේ සාමාජිකයන් ප්‍රමාණය, ඉතිරි කිරීම්, ණය ලබාදීම යනාදියේ අඩුවීමක් ද, ණය අයකර ගැනීමේ වර්ධනයක් ද (95%ක) දැකිය හැකි ය. බොහෝ ගොවීන් (70%- 80%) ගොවි බැංකුවට බැඳී නොමැති අතර එමඟින් දෙන ණය ප්‍රමාණය (වී වගාව සඳහා අක්කරයකට රු. 5000 සහ සියලු බෝග සඳහා උපරිම ණය සීමාව රු. 25,000 ලෙස) ප්‍රමාණවත් නොවීම (30%), එහි සේවා හා ප්‍රතිලාභ පිළිබඳ අඩු දැනුම (28%) සහ ණය ලබා ගැනීමට ඇති බිය (15%) යනා දී කරුණු එයට බලපා තිබේ. ඇතැම් කණ්ඩායම් සාමාජිකයින් ලබාගත් ණය නො ගෙවීමෙන් එම කණ්ඩායමෙ හි අන් අයට දිගටම ණය ලබාගැනීම සම්බන්ධයෙන් ප්‍රශ්න ඇති වන නිසා එහි ඇති කණ්ඩායම් ණය ක්‍රමයට ඇතැම් ගොවීහු (37%) අකමැත්ත දැක්වූ හ. හුදකලා ගම්වල වෙසෙන ගොවීහු ද්‍රව්‍ය ණය ලබාදීම පිළිබඳව අගය කළ අතර ඒ සඳහා ඇති පොළිය වඩාත් වැඩි නිසා අනෙක් ගොවීන්ගෙන් විශාල ප්‍රමාණයක් (47%) ඒ සඳහා අකමැත්ත දැක්වූ හ. කඩිනමින් හා පහසුවෙන් ලබාගත නො හැකි නිසා ගොවීන් මෙන් ම ගොවි සංවිධාන ද සැලකිය යුතු ලෙස ගොවි බැංකුවෙ හි ඉතිරි කිරීමට පෙළඹී නොමැත. මෙවන් ගැටලු පැවතිය ද, සීමිත ගොවි බැංකු සංඛ්‍යාවක් ඉතුරුම් සඳහා පෙළඹවීම මෙන් ම ණය ලබාදීම හා අයකිරීම අතින් වඩාත් හොඳ ප්‍රගතියක් පෙන්වා තිබේ. ඒ සඳහා ප්‍රාදේශීය නිලධාරී ඇතුළු පරිපාලනය සම්බන්ධ වූ අයගේ පරිපාලන දක්ෂතාව හා කැපවීම මෙන් ම ප්‍රදේශයේ සමාජ-ආර්ථික තත්ත්වය ද හේතු වී ඇත. සාමාන්‍යයෙන් ගොවි බැංකුවෙන් වඩාත් ප්‍රයෝජන ගන්නා අයගෙන් වැඩිදෙනෙකු ණය හා අනෙකුත් යෙදවුම් වන බීජ හා කෘෂි රසායනික වෙත පහසුවෙන් ළඟාවීමට නොහැකි දුෂ්කර ප්‍රදේශවල වෙසෙන දුප්පත් ගොවීන් ය. කණ්ඩායම් ණය ක්‍රමය යටතේ මෙම සේවා ඔවුන්ගේ ගම් වෙත සැපයීම ඔවුන්ට මහත් ප්‍රයෝජනවත් වේ.

සුළු ගොවීන්ගේ ණය අවශ්‍යතා සැපිරීම සඳහා ගොවිජන බැංකුවට ඉහළ හැකියාවක් පවතින බැවින් ඈත ගම්වල වෙසෙන දුප්පත් ගොවීන්ට වැඩි වශයෙන් සීමා වූ එහි සේවා අනෙක් ගොවීන් වෙතට ද ව්‍යාප්ත කළ යුතු ය යන්න නිගමනය විය.

අධ්‍යයනයේ නිර්දේශ අතර ගොවි බැංකුව හා එහි ප්‍රයෝජන පිළිබඳව දැනුවත් කොට සාමාජිකත්වය වැඩි කිරීම, ඉක්මනින් හා පහසුවෙන් ඉතුරුම් ආපසු ලබාගැනීමට සැලැස්වීම, ඒ ඒ බෝගයට හා ප්‍රදේශයට ගැළපෙන ලෙස ලබාදෙන ණය ප්‍රමාණය වැඩි කිරීම, ප්‍රමාණවත් මුදලක් ඉඩම් සැකසීම සඳහා ලබාදීම හා සියලු ගොවි බැංකුවලට එකවර මිල දී ගැනීමෙන් කෘමිනාශක සඳහා ඉහළ කොමිස් ලබාදීම, පුහුණු වැඩසටහන් ආශ්‍රයෙන් කණ්ඩායම් සාමාජිකයින් අතර සාමූහික හැඟීම් වර්ධනය සඳහා කටයුතු සැලසීම, ණය ලබාදීමේ දී කණ්ඩායම් ක්‍රමයට අමතරව ඔප්පුවක් වැනි පුද්ගලික ඇපයක් මත ණය ලබාගැනීමට අවස්ථාව ලබාදීම ඒ අතර විය.

# පටුන


| | | පිටුව |
|---|---|---|
| පෙරවදන | | ii |
| ස්තුතිය | | iii |
| සංක්ෂිප්තය | | iv |
| පටුන | | v |
| වගු සටහන් | | xi |
| රූප සටහන් | | xiii |
| පළමුවැනි පරිච්ඡේදය | | |
| හැඳින්වීම | | 1 |
| 1.1 | ගොවිජන බැංකු වැඩසටහන | 1 |
| 1.2 | අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ | 3 |
| 1.3 | විශේෂිත අරමුණු | 3 |
| 1.4 | අධ්‍යයන ක්‍රමවේදය | 4 |
| 1.5 | අධ්‍යයන කාලය | 5 |
| 1.6 | ගැටලු | 5 |
| 1.7 | වාර්තාවෙ හි සැකැස්ම | 5 |
| දෙවැනි පරිච්ඡේදය | | 6 |
| සාහිත්‍ය විමර්ශනය | | 6 |
| 2.1 | හැඳින්වීම | 6 |
| 2.2 | මූල්‍ය පහසුකම් | 6 |
| 2.3 | ණය සැපයීමට දරනු ලැබූ උත්සාහයන් | 6 |
| 2.4 | ආයතනික ණය වැඩසටහන් අසාර්ථකවීම | 6 |
| 2.5 | විකල්ප මාර්ගයක් ලෙස ක්ෂුද්‍ර ණය යෝජනා ක්‍රම | 7 |
| 2.6 | ගොවිජන බැංකු ණය වැඩසටහන | 7 |
| තුන්වැනි පරිච්ඡේදය | | 10 |
| ගොවිජන බැංකු හා සම්බන්ධ සිද්ධි අධ්‍යයන | | 10 |
| 3.1 | පුත්තලම තබ්බෝව ගොවි බැංකුව | 10 |



පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

3.1.1 හැඳින්වීම 10

3.1.2 සාමාජිකත්ව වර්ධනය 10

3.1.3 ගොවි බැංකුවේ ඉතුරුම්, කොටස් ප්‍රාග්ධනය හා ලාභාංශ වර්ධනය 11

3.1.4 ණය නිකුත් කිරීම 12

3.1.5 ණය අයවීම 15

3.1.6 ද්‍රව්‍ය ණය ලබා දීම 16

3.1.7 කණ්ඩායම් ක්‍රමය 17

3.1.8 ණය සීමාවන් 17

3.1.9 ගොවි බැංකුවෙ හි වර්තමාන ප්‍රගතිය / දුර්වලත්වය සඳහා බලපෑ සාධක 17

3.1.10 යෝජනා 18

3.2 මහකුඹුක්කඩවල ගොවි බැංකුව 19

3.2.1 හැඳින්වීම 19

3.2.2 සාමාජිකත්ව වර්ධනය 20

3.2.3 ගොවි බැංකුවේ ඉතුරුම්, කොටස් ප්‍රාග්ධනය හා ලාභාංශ වර්ධනය 21

3.2.4 ණය නිකුත් කිරීම 22

3.2.5 ණය අයවීම 23

3.2.6 ද්‍රව්‍ය ණය ලබා දීම 24

3.2.7 කණ්ඩායම් ක්‍රමය 25

3.2.8 ණය සීමාවන් 26

3.2.9 ගොවි බැංකුවෙ හි වර්තමාන ප්‍රගතිය/දුර්වලත්වය සඳහා බලපෑ සාධක 26

3.2.10 සංවර්ධනයට බලපෑ නීතිමය හා වෙනත් ගැටලු 26

3.2.11 යෝජනා 27

3.3 ඇලයාපත්තුව ගොවි බැංකුව 28

3.3.1 හැඳින්වීම 28

3.3.2 සාමාජිකත්ව වර්ධනය 28

3.3.3 ගොවි බැංකුවේ ඉතුරුම්, කොටස් ප්‍රාග්ධනය හා ලාභාංශ වර්ධනය 29

3.3.4 ණය නිකුත් කිරීම 30

3.3.5 ණය අයවීම 33

3.3.6 ද්‍රව්‍ය ණය ලබා දීම 34

3.3.7 කණ්ඩායම් ක්‍රමය 35

3.3.8 ණය සීමාවන් 35

3.3.9 ගොවි බැංකුවෙ හි වර්තමාන ප්‍රගතිය/දූර්වලත්වය සඳහා බලපෑ සාධක 35

3.3.10 යෝජනා 37

3.4 ඉපලෝගම ගොවි බැංකුව 38

3.4.1 හැඳින්වීම 38

3.4.2 සාමාජිකත්ව වර්ධනය 39

3.4.3 ගොවි බැංකුවේ ඉතුරුම්, කොටස් ප්‍රාග්ධනය හා ලාභාංශ වර්ධනය 40

3.4.4 ණය නිකුත් කිරීම 41

3.4.5 ණය අයවීම 42

3.4.6 ද්‍රව්‍ය ණය ලබා දීම 43

3.4.7 කණ්ඩායම් ක්‍රමය 44

3.4.8 ණය සීමාවන් 44

3.4.9 යෝජනා 45

3.5 මැදිරිගිරිය ගොවි බැංකුව 45

3.5.1 හැඳින්වීම 45

3.5.2 සාමාජිකත්ව වර්ධනය 45

3.5.3 ගොවි බැංකුවේ ඉතුරුම්, කොටස් ප්‍රාග්ධනය හා ලාභාංශ වර්ධනය 46

3.5.4 ණය නිකුත් කිරීම 47

3.5.5 ණය අයවීම 49

3.5.6 ද්‍රව්‍ය ණය ලබා දීම 49

3.5.7 කණ්ඩායම් ක්‍රමය 50

3.5.8 ණය සීමාවන් 50

3.5.9 ගොවි බැංකුවෙ හි වර්තමාන ප්‍රගතිය / දූර්වලත්වය කෙරෙහි බලපෑ සාධක 51

3.5.10 සංවර්ධනයට බලපෑ නීතිමය හා වෙනත් ගැටලු 52

3.5.11 යෝජනා 53

3.6 මතම්පිටිය ගොවි බැංකුව 54

3.6.1 හැඳින්වීම 54

3.6.2 සාමාජිකත්ව වර්ධනය 54

3.6.3 ගොවි බැංකුවේ ඉතුරුම්, කොටස් ප්‍රාග්ධනය හා ලාභාංශ වර්ධනය 55

3.6.4 ණය නිකුත් කිරීම 55

3.6.5 ණය අයවීම 57

3.6.6 ද්‍රව්‍ය ණය ලබා දීම 59

3.6.7 කණ්ඩායම් ක්‍රමය 59

3.6.8 ණය සීමාවන් 60

3.6.9 ගොවි බැංකුවෙ හි වර්තමාන ප්‍රගතිය / දූර්වලත්වය කෙරෙහි බලපෑ සාධක 60

3.6.10 සංවර්ධනයට බලපෑ නීතිමය හා වෙනත් ගැටලු 61

3.6.11 යෝජනා 61

3.7 යටවත්ත ගොවි බැංකුව 62

3.7.1 හැඳින්වීම 62

3.7.2 සාමාජිකත්ව වර්ධනය 62

3.7.3 ගොවි බැංකුවේ ඉතුරුම්, කොටස් ප්‍රාග්ධනය හා ලාභාංශ වර්ධනය 63

3.7.4 ණය නිකුත් කිරීම 64

3.7.5 ණය අයවීම 66

3.7.6 ද්‍රව්‍ය ණය ලබා දීම 66

3.7.7 කණ්ඩායම් ක්‍රමය 67

3.7.8 ණය සීමාවන් 67

3.7.9 ප්‍රගතිය සඳහා බලපෑ සාධක 67

3.7.10 ගොවි බැංකුවෙ හි වර්තමාන ප්‍රගතිය / දූර්වලත්වය කෙරෙහි බලපෑ සාධක 68

3.7.11 යෝජනා 69

3.8 ඉඳුක්කුඹුර ගොවි බැංකුව 69

3.8.1 හැඳින්වීම 69

3.8.2 සාමාජිකත්ව වර්ධනය 70

3.8.3 ගොවි බැංකුවේ ඉතුරුම්, කොටස් ප්‍රාග්ධනය හා ලාභාංශ වර්ධනය 70

3.8.4 ණය නිකුත් කිරීම 71

3.8.5 ණය අයවීම 73

3.8.6 ද්‍රව්‍ය ණය ලබා දීම 74

3.8.7 කණ්ඩායම් ක්‍රමය 75

3.8.8 ණය සීමාවන් 75

3.8.9 ගොවි බැංකුවේ හි වර්තමාන ප්‍රගතිය / දුර්වලත්වය කෙරෙහි බලපෑ සාධක 75

3.8.10 සංවර්ධනයට බලපෑ නීතිමය හා වෙනත් ගැටලු 76

3.8.11 යෝජනා 76

3.9 බොරලන්ද ගොවි බැංකුව 77

3.9.1 හැඳින්වීම 77

3.9.2 සාමාජිකත්ව වර්ධනය 77

3.9.3 ගොවි බැංකුවේ හි ඉතුරුම්, කොටස් ප්‍රාග්ධනය හා ලාභාංශ වර්ධනය 78

3.9.4 ණය නිකුත් කිරීම 79

3.9.5 ණය අයවීම 82

3.9.6 ද්‍රව්‍ය ණය ලබා දීම 83

3.9.7 කණ්ඩායම් ක්‍රමය 83

3.9.8 ණය සීමාවන් 83

3.9.9 ඉහළ ප්‍රගතිය සඳහා බලපෑ සාධක 84

3.9.10 සංවර්ධනයට බලපාන නීතිමය හා වෙනත් ගැටලු 85

3.9.11 යෝජනා 87

3.10 රිදීමාලියද්ද ගොවි බැංකුව 88

3.10.1 හැඳින්වීම 88

3.10.2 සාමාජිකත්ව වර්ධනය 88

3.10.3 ගොවි බැංකුවේ හි ඉතුරුම්, කොටස් ප්‍රාග්ධනය හා ලාභාංශ වර්ධනය 89

3.10.4 ණය නිකුත් කිරීම 91

3.10.5 ණය අයවීම 92

3.10.6 ද්‍රව්‍ය ණය ලබා දීම 93

3.10.7 කණ්ඩායම් ක්‍රමය 93

3.10.8 ණය සීමාවන් 94

3.10.9 ගොවි බැංකුවේ හි වර්තමාන ප්‍රගතිය/ දුර්වලත්වය කෙරෙහි බලපෑ සාධක 94

3.10.10 සංවර්ධනයට බලපාන නීතිමය හා වෙනත් ගැටලු 95

3.10.11 යෝජනා 97

**සිව්වැනි පරිච්ඡේදය** **99**

**සත්සන්දනාත්මක ප්‍රගතිය** **99**

4.1 හැඳින්වීම 99

4.2 ගොවීන් දායක කරගැනීම 99

4.3 තැන්පතු වර්ධනය හා ප්‍රාග්ධනය ගොඩනැඟීම 101

4.4 ණය ලබාදීම 102

4.5 නිකුත් කළ ණය වර්ග 103

4.6 ණය අය කරගැනීම 104

4.7 දුප්පත්කම සඳහා බලපෑම 105

**පස්වැනි පරිච්ඡේදය** **106**

**සොයා ගැනීම්, නිගමන හා නිර්දේශ** **106**

5.1 හැඳින්වීම 106

5.2 සොයා ගැනීම් 106

5.3 නිගමන 109

5.4 නිර්දේශ 109

**ආශ්‍රිත ග්‍රන්ථ** **114**

**ඇමුණුම් අංක 01** **115**

**ඇමුණුම් අංක 02** **117**

# වගු සටහන්


| | | පිටුව |
|---|---|---|
| වගු අංක 1.1 | අධ්‍යයනය සඳහා තෝරාගත් දිස්ත්‍රික්ක හා අදාළ ගොවි බැංකු | 5 |
| වගු අංක 3.1 | පුත්තලම - තබ්බෝව ගොවි බැංකුවේ සාමාජිකත්වය වර්ධනය, 2001-2010 | 11 |
| වගු අංක 3.2 | පුත්තලම - තබ්බෝව ගොවි බැංකුවේ අරමුදල් වර්ධනය, 2001-2010 | 12 |
| වගු අංක 3.3 | පුත්තලම - තබ්බෝව ගොවි බැංකුව මගින් නිකුත් කළ ණය වටිනාකම, 2001-2010 | 14 |
| වගු අංක 3.4 | සංචිත වටිනාකමට සාපේක්ෂව පුත්තලම - තබ්බෝව බැංකුව මගින් නිකුත් කළ ණය වටිනාකම, 2001-2010 | 15 |
| වගු අංක 3.5 | පුත්තලම - තබ්බෝව ගොවි බැංකුවේ ණය අයවීම, 2001-2010 | 16 |
| වගු අංක 3.6 | මහකුඹුක්කඩවල ගොවි බැංකුවේ සාමාජිකත්වය වර්ධනය, 2001-201 | 20 |
| වගු අංක 3.7 | මහකුඹුක්කඩවල ගොවි බැංකුවේ අරමුදල් වර්ධනය, 2001-2010 | 21 |
| වගු අංක 3.8 | මහකුඹුක්කඩවල ගොවි බැංකුව හරහා ලබාදුන් ණය වටිනාකම, 2001-2010 | 23 |
| වගු අංක 3.9 | සංචිත වටිනාකමට සාපේක්ෂව මහකුඹුක්කඩවල ගොවි බැංකුව මගින් නිකුත් කළ ණය වටිනාකම, 2001-2010 | 23 |
| වගු අංක 3.10 | මහකුඹුක්කඩවල ගොවි බැංකුවේ ණය අයවීම, 2001-2010 | 24 |
| වගු අංක 3.11 | ඇලයාපත්තුව ගොවි බැංකුවේ සාමාජිකත්ව වර්ධනය, 2002-2010 | 29 |
| වගු අංක 3.12 | ඇලයාපත්තුව ගොවි බැංකුවේ අරමුදල් වර්ධනය, 2002-2010 | 30 |
| වගු අංක 3.13 | ඇලයාපත්තුව ගොවි බැංකුව මගින් නිකුත් කළ ණය වටිනාකම, 2001-2010 | 32 |
| වගු අංක 3.14 | ඇලයාපත්තුව ගොවි බැංකුවෙ හි සංචිත වටිනාකමට සාපේක්ෂව ගොවි බැංකුව මගින් නිකුත් කළ ණය වටිනාකම, 2002-2010 | 32 |
| වගු අංක 3.15 | ඇලයාපත්තුව ගොවි බැංකුවෙ හි ණය අයවීම, 2001-2010 | 34 |
| වගු අංක 3.16 | ඉපලෝගම ගොවි බැංකුවේ සාමාජිකත්ව වර්ධනය, 2001-2010 | 39 |
| වගු අංක 3.17 | ඉපලෝගම ගොවි බැංකුවේ අරමුදල් වර්ධනය, 2001-2010 | 40 |
| වගු අංක 3.18 | ඉපලෝගම ගොවි බැංකුව මගින් නිකුත් කළ ණය වටිනාකම, 2001-2010 | 42 |

| | | |
|---|---|---|
| වගු අංක 3.19 | සංචිත වට්ටනාකමට සාපේක්ෂව ඉපලෝගම ගොවි බැංකුව මඟින් තිකුත් කළ ණය වට්ටනාකම, 2001-2010 | 42 |
| වගු අංක 3.20 | ඉපලෝගම ගොවි බැංකුවේ ණය අයවීම, 2001-2010 | 43 |
| වගු අංක 3.21 | මැදිරිගිරිය ගොවි බැංකුවේ සාමාජිකත්ව වර්ධනය, 2000-2010 | 46 |
| වගු අංක 3.22 | මැදිරිගිරිය ගොවි බැංකුවේ අරමුදල් වර්ධනය, 2000-2010 | 47 |
| වගු අංක 3.23 | මැදිරිගිරිය ගොවි බැංකුව මඟින් තිකුත් කළ ණය වට්ටනාකම, 2000-2010 | 48 |
| වගු අංක 3.24 | සංචිත වට්ටනාකමට සාපේක්ෂව මැදිරිගිරිය ගොවි බැංකුව මඟින් තිකුත් කළ ණය වට්ටනාකම, 2001-2009 | 48 |
| වගු අංක 3.25 | මැදිරිගිරිය ගොවි බැංකුවේ ණය අයවීම, 2001-2009 | 49 |
| වගු අංක 3.26 | මතම්පිටිය ගොවි බැංකුවේ සාමාජිකත්ව වර්ධනය, 2001-2010 | 54 |
| වගු අංක 3.27 | මතම්පිටිය ගොවි බැංකුවේ අරමුදල් වර්ධනය, 2001-2009 | 55 |
| වගු අංක 3.28 | මතම්පිටිය ගොවි බැංකුව මඟින් තිකුත් කළ ණය වට්ටනාකම | 56 |
| වගු අංක 3.29 | සංචිත වට්ටනාකමට සාපේක්ෂව මතම්පිටිය ගොවි බැංකුව මඟින් තිකුත් කළ ණය වට්ටනාකම, 2001-2009 | 57 |
| වගු අංක 3.30 | මතම්පිටිය ගොවි බැංකුවේ ණය අයවීම, 2001-2010 | 58 |
| වගු අංක 3.31 | යටවත්ත ගොවි බැංකුවේ සාමාජිකත්ව වර්ධනය, 2002-2010 | 63 |
| වගු අංක 3.32 | යටවත්ත ගොවි බැංකුවේ අරමුදල් වර්ධනය, 2002-2010 | 64 |
| වගු අංක 3.33 | යටවත්ත ගොවි බැංකුව මඟින් තිකුත් කළ ණය වට්ටනාකම | 65 |
| වගු අංක 3.34 | සංචිත වට්ටනාකමට සාපේක්ෂව යටවත්ත ගොවි බැංකුව මඟින් තිකුත් කළ ණය වට්ටනාකම, 2002-2010 | 65 |
| වගු අංක 3.35 | යටවත්ත ගොවි බැංකුවේ ණය අයවීම, 2002-2010 | 66 |
| වගු අංක 3.36 | ඉඳුක්කුඹුර ගොවි බැංකුවේ සාමාජිකත්වය වර්ධනය, 2001-2010 | 70 |
| වගු අංක 3.37 | ඉඳුක්කුඹුර ගොවි බැංකුවේ අරමුදල් වර්ධනය, 2001-2010 | 71 |
| වගු අංක 3.38 | ඉඳුක්කුඹුර ගොවි බැංකුව මඟින් තිකුත් කළ ණය වට්ටනාකම 2001-2010 | 73 |
| වගු අංක 3.39 | සංචිත වට්ටනාකමට සාපේක්ෂව ඉඳුක්කුඹුර ගොවි බැංකුව මඟින් තිකුත් කළ ණය වට්ටනාකම, 2001-2010 | 73 |
| වගු අංක 3.40 | ඉඳුක්කුඹුර ගොවි බැංකුවේ ණය අයවීම, 2001-2010 | 74 |
| වගු අංක 3.41 | බොරලන්ද ගොවි බැංකුවේ සාමාජිකත්ව වර්ධනය, 2003-2010 | 78 |
| වගු අංක 3.42 | බොරලන්ද ගොවි බැංකුවේ අරමුදල් වර්ධනය, 2003-2010 | 79 |

වගු අංක 3.43 බොරලන්ද ගොවි බැංකුව මගින් නිකුත් කළ ණය වටිනාකම 2004-2010 80
වගු අංක 3.44 බොරලන්ද ගොවි බැංකුව මගින් නිකුත් කළ ණය පිළිබඳ සාරාංශය 81
වගු අංක 3.45 බොරලන්ද ගොවි බැංකුව විසින් නිකුත් කළ ණය ප්‍රමාණය සංචිත වල ප්‍රතිශතයක් ලෙස 82
වගු අංක 3.46 බොරලන්ද ගොවි බැංකුව විසින් නිකුත් කල ණය අයවීම, 2003-2010 82
වගු අංක 3.47 රිදීමාලියද්ද ගොවි බැංකුවේ කොටස් හිමියන්ගේ සහ කොටස් වටිනාකමේ වර්ධනය 89
වගු අංක 3.48 රිදීමාලියද්ද ගොවි බැංකුවේ තැන්පත්වල වර්ධනය 90
වගු අංක 3.49 රිදීමාලියද්ද ගොවි බැංකුවේ අරමුදල් වර්ධනය 90
වගු අංක 3.50 රිදීමාලියද්ද ගොවි බැංකුවේ ණය නිකුත් කිරීම 91
වගු අංක 3.51 රිදීමාලියද්ද ගොවි බැංකුවේ ණය නිකුත් කිරීම සංචිත වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස 92
වගු අංක 3.52 රිදීමාලියද්ද ගොවි බැංකුවේ ණය අය කරගැනීම 93
වගු අංක 4.1 ගොවි බැංකු මගින් 2009 වර්ෂය අවසාන වනවිට ඒවාට ගොවීන් දායක කරගැනීම 99
වගු අංක 4.2 ගොවි බැංකුවෙ හි සාමාජිකත්වය ලබා නො ගැනීමට හේතු 100
වගු අංක 4.3 ගොවි බැංකු විසින් 2009 වර්ෂය අවසන් වනවිට ප්‍රාග්ධනය ගොඩනැගීම 101
වගු අංක 4.4 ගොවි බැංකු විසින් 2009 වර්ෂය තුළ නිකුත් කළ ණය පිළිබඳ විස්තර 102
වගු අංක 4.5 ගොවි බැංකු විසින් 2009 වර්ෂය තුළ නිකුත් කළ ඒ ඒ වර්ගයේ ණය මුළු ණය වටිනාකමේ ප්‍රතිශතය 103
වගු අංක 4.6 ගොවි බැංකු විසින් 2009 වර්ෂයේ ලබාදුන් ණය අය කරගැනීමේ ප්‍රතිශතය 104
වගු අංක 4.7 ගොවි බැංකු ණය ලබාගත් ගොවීන් වගා කරන ඉඩම් ප්‍රමාණය අනුව බෙදීයාම 105

## රූප සටහන්

පිටුව

රූප සටහන් අංක 1.1 ගොවිජන බැංකු ණය යෝජනා ක්‍රමය 2
රූප සටහන් අංක 3.1 ගොවි බැංකුවේ සාමාජිකත්වය වර්ධනය 78
රූප සටහන් අංක 3.2 ගොවි බැංකු මගින් එක් එක් වර්ෂවල නිකුත් කළ මුළු ණය ප්‍රමාණය 81
රූප සටහන් අංක 3.3 ගොවි බැංකුවේ සාමාජිකත්ව වර්ධනය 89

# පළමු පරිච්ඡේදය

# හැඳින්වීම

## 1.1 ගොවිජන බැංකු වැඩසටහන

මෙරට කෘෂිකර්මයෙ හි නියුතු බහුතරයක් ගොවීන් කුඩා ඉඩම් හා සබැඳි දුප්පතුන් ය. අඩු ඵලදාව, අඩු ආදායම ආදී හේතූන් නිසා ඔවුන්ට නැවත ආයෝජනය සඳහා ණය ලබාදීම අත්‍යවශ්‍ය ය. කෘෂිකර්ම අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 1998 වර්ෂයේ දී නියමු ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කරනු ලැබූ "ගොවි බැංකු" වැඩසටහන එවැනි ග්‍රාමීය දුප්පත් ගොවීන්ගේ ආයෝජන ණය අවශ්‍යතා සැපිරීම පෙරදැරි කරගෙන ආරම්භ කරනු ලැබූවකි. ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතියෙ හි අරමුණු පහත දැක් වේ.

1. ග්‍රාමීය ගොවි ජනතාවගේ දිළිඳුකම තුරන් කිරීම සඳහා ඔවුන්ට අවශ්‍ය මූලධනය සපයා ගැනීමට සහාය වන ආයතනයක් ලෙස කටයුතු කිරීම
2. ගොවි ජනතාවගේ ඉතිරි කිරීම් නැම්යාව වර්ධනය කර ගැනීම හා ඒ තුළින් ඔවුන්ගේ ආයෝජන ශක්තිය වර්ධනය කිරීමට සහාය වීම
3. යැපුම් මට්ටමේ කෘෂිකර්මාන්තය වාණිජමය මට්ටමකට පත් කර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය හා ආර්ථික ශක්තිය වර්ධනය කර ගැනීමට අවකාශ සැලසීම
4. ගොවි ජනතාව සංවිධානය කර ඔවුන්ගේ මූල්‍ය හා ආර්ථික ශක්තිය වර්ධනය කර ගැනීමට අවකාශ සැලසීම
5. ගොවි ජනතාව සමාජයීය වශයෙන් බලවත් සමාජ ස්ථරයක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය පරිසරය ගොඩනැඟීම

ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන කේන්ද්‍රගත කරගනිමින් පිහිටුවා ඇති මෙවැනි ගොවිජන බැංකු මඟින් වර්ෂ ගණනාවක සිට කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් විවිධ ව්‍යාපෘතීන් යටතේ කෘෂිකර්මයෙ හි යෙදී සිටි සුළු ගොවීන්ට ලබා දෙන ලද ණය, එක් ආයතනයක් යටතේ ඒකාබද්ධ කරමින් ලබාදීමට ක්‍රියා කොට ඇත. ඒ අනුව, කෘෂිකර්ම භාරකාර අරමුදල, ගොවීන්ගේ භාරකාර අරමුදල හා චක්‍රීය අරමුදල ඒකාබද්ධ කොට ගොවි භාරකාර අරමුදල ඇති කොට ඇති අතර ඒ මඟින් ගොවිජන බැංකු සඳහා අවශ්‍ය ප්‍රාග්ධන අරමුදල් ලබා දේ. මේ වන විට, මෙවැනි ගොවිජන බැංකු දිවයිනේ ඇති ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන 555න් 515කම පිහිටුවා ඇත. යුධමය වාතාවරණයක් පැවතියෙන් බොහොමයක් උතුරු-නැගෙනහිර ප්‍රදේශයන් හි මේවා පවත්වාගෙන යෑමට නො හැකි වී ඇති අතර අන් ප්‍රදේශවල අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබේ.

ගොවීන්, ගොවි සංවිධාන හා නිලධාරීන් යනා දී සියළු කොටස්වල සහභාගීත්වය ඇතිව පවත්වාගෙන යාමට අපේක්ෂා කරනු ලැබූ ගොවිජන බැංකු වැඩසටහන ඒවායේ කළමනාකරණය සඳහා ජාතික මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා අනුපිළිවෙළින් වගකීම් හා බලතල බෙදී යන පරිදි පිහිටුවනු ලැබූ කමිටු ගණනාවකින් යුක්ත ය. ඒ අනුව ජාතික




පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො,ප.පු.ආ
HARTI

මෙහෙයුම් කමිටුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු මෙහෙයුම් කමිටුව, දිස්ත්‍රික් මෙහෙයුම් කමිටුව, ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුව හා ග්‍රාමීය මෙහෙයුම් කමිටුව යන කමිටු ගණනාවක් ක්‍රියාත්මක ය (රූප සටහන් අංක 1.1). මෙම එකිනෙක කමිටුවල වගකීම් හා බලතල පිළිබඳ ඇමුණුම් අංක 1 හි සවිස්තරව දක්වා ඇත.

රූප සටහන් අංක 1.1

**ගොවිජන බැංකු ණය යෝජනා ක්‍රමය**

**ණය නිකුත් කිරීමේ හා අයකිරීමේ ක්‍රියාවලිය**




ගොවිජන බැංකු වැඩසටහන යටතේ ඒ ඒ ගොවිජන බැංකුවට අයත් ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ ගොවීන් එහි කොටස් හිමියන් බවට පත් කර ගනු ලබන අතර ඉතිරි කිරීම් සඳහා පෙළඹවීමෙන් ඔවුන් තැන්පත්කරුවන් ලෙස ද දායක කරගනු ලැබේ. ආරම්භයේ දී ජාතික මට්ටමෙන් ලබා දෙනු ලැබූ ප්‍රාග්ධන අරමුදල් ද, කොටස් හා ඉතුරුම් තැන්පතු ද, ණය ලබාදීමෙන් උපයා ගනු ලැබූ ලාභය ද ඇතුළත් සමුච්චිත අරමුදල් භාවිතා කරමින් ප්‍රදේශයේ ගොවි බැංකුවෙ හි සාමාජිකත්වය ලබාගත් ගොවීන්ට සහනදායී පොලියක් යටතේ විවිධ ආකාරයේ ණය ලබාදීමට කටයුතු කොට තිබේ. ගොවි බැංකුව මඟින් ලබාදෙනු ලබන ණය වර්ග හයකි. ඒවා නම් වගා ණය, යන්ත්‍රෝපකරණ ණය, අස්වනු තෙළීමේ ණය, අස්වනු සුරැකීමේ ණය, ව්‍යාපෘති ණය, ක්ෂණික ණය මෙන් ම ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට දායකවීමේ ණය වෙයි.

ඉහත දැක් වූ විවිධාකාරයේ ණය ලබාගැනීම සඳහා එකිනෙකට වෙනස් වූ කොන්දේසි බල පැවැත් වේ. (මේ පිළිබඳ ඇමුණුම් අංක 2 හි විස්තර දක්වා ඇත). වගා ණය වශයෙන් ලබා දෙන්නේ උපරිම රු. 25,000/-ක මුදලක් වන අතර අස්වනු තෙළීමේ ණය සඳහා රු 40,000ක ණය මුදලක් ද, අස්වනු සුරැකීමේ ණය සඳහා රු. 75,000ක මුදලක් ද ලබා දිය හැකි ය. පොලිය සම්බන්ධයෙන් සලකා බලන විට ක්ෂණික ණය හැරුණු විට (ක්ෂණික

ණය සඳහා මාසික පොළිය 20% කි) අන් සියළු ණය වර්ග සඳහා වාර්ෂික පොළිය 9%කි. වගා ණය මාස 6ක කාලයක් තුළත් අස්වනු නෙළීමේ ණය මාසයක කාලයක් හා අස්වනු රැස් කර තබා ගැනීමේ ණය මාස 3ක කාලයක් තුළත් ආපසු ගෙවිය යුතු අතර ව්‍යාපෘති හා යන්ත්‍රෝපකරණ ණය හැර අන් සියළුම ණය ප්‍රාදේශීය මට්ටමෙන් (ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන මට්ටමෙන්) අනුමත කොට ලබාදිය හැකි ය. එසේ වුව ද, රු. 300,000 දක්වා වූ ව්‍යාපෘති හා යන්ත්‍රෝපකරණ ණය සඳහා දිස්ත්‍රික්ක මට්ටමෙන් ද, රු. 1,000,000 දක්වා වූ ව්‍යාපෘති හා යන්ත්‍රෝපකරණ ණය සඳහා දෙපාර්තමේන්තු මට්ටමෙන් ද ඊට වැඩි ණය සඳහා ජාතික මට්ටමෙන් යනා දී ලෙස අනුමැතිය ලබා ගත යුතු අතර ඒවා ගෙවීම සඳහා ද දිගු කාලයක් ලබාදෙනු ලබයි.

ගොවිජන බැංකු වැඩසටහන නියමු ව්‍යාපෘතියක් ලෙස වසර 10කට අධික කාලයක සිට පවත්වාගෙන එන අතර එමඟින් ලද සාර්ථක හා අසාර්ථක අත්දැකීම්, පාඩම් හා දුර්වලතා හඳුනා ගැනීම සඳහා මේ දක්වාත් පුළුල් වූ අධ්‍යයනයක් සිදු කොට ඇති බවක් නො පෙනේ. මෙම අධ්‍යයනය එම හිඩැස පිරවීම සඳහා දරනු ලැබූ ප්‍රයත්නයකි. වර්තමාන රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය වන "මහින්ද චින්තන ඉදිරි දැක්ම" තුළ ද, ග්‍රාමීය හා ගොවි ජනතාවගේ ණය අවශ්‍යතා සැපිරීමේ ක්‍රමෝපායයක් ලෙස ගොවිජන බැංකුව ශක්තිමත් කරන බව දක්වා ඇති බැවින්, එම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා ද ගොවිජන බැංකු වැඩසටහනෙ හි සාර්ථක හා අසාර්ථක අත්දැකීම්, එමඟින් උගත හැකි පාඩම් මෙන් ම දුර්වලතා හඳුනා ගැනීම ඉතා වැදගත් වෙයි.

## 1.2 අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ

ග්‍රාමීය ගොවි ණය අවශ්‍යතා සපුරාලීම සඳහා ගොවිජන බැංකුවෙ හි ක්‍රියාකාරීත්වය කෙතරම් දුරට සමත් වී ඇත් ද යන්න විමසා බැලීම

## 1.3 විශේෂිත අරමුණු

1. ග්‍රාමීය ගොවි ජනතාව අතර කොටස් මිල දී ගැනීම හා ඉතුරුම් තැන්පතු සඳහා උනන්දු කරන ආයතනයක් ලෙසත්, ණය සැපයුම් ආයතනයක් ලෙසත් ගොවි බැංකුවෙ හි ක්‍රියාකාරී ප්‍රගතිය විමසා බැලීම

2. ගොවි බැංකුවෙහි සේවා ලබාගැනීම සඳහා ගොවීන් දක්වා ඇති දායකත්වයේ ප්‍රමාණය, ඊට හේතු හා ලබාගත් සේවාවන් හි ප්‍රයෝජන විමසා බැලීම

3. ගොවි බැංකුවෙ හි සේවාවන් පිළිබඳව විශේෂයෙන්ම වගා ණය සීමා, ද්‍රව්‍ය ණය ලබාදීම හා කණ්ඩායම් ණය ක්‍රමය පිළිබඳව ගොවීන්ගේ අදහස් හා යෝජනා විමසා බැලීම

4. ගොවි බැංකු වැඩසටහනින් ලබා ඇති අත්දැකීම්, පාඩම් මෙන් ම අඩුපාඩු හා දුර්වලතා හඳුනාගැනීම

5. ගොවි බැංකු වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ප්‍රතිපත්ති යෝජනා ඉදිරිපත් කිරීම

## 1.4 අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනය වඩාත් සාර්ථකත්වයක් දක්වා ඇති හා එතරම් සාර්ථකත්වයක් දක්වා නොමැති ගොවි බැංකු හා සම්බන්ධයෙන් සිද්ධි අධ්‍යයන ක්‍රමවේදය පදනම් කර ගනිමින් සිදු කරනු ලැබූවකි. මෙම සිද්ධි අධ්‍යයනයන් සඳහා දිස්ත්‍රික්ක 05ක් ඇසුරින් තෝරාගත් ගොවි බැංකු 10ක් දායක කර ගනු ලැබිණි. කෘෂි දේශගුණික ලක්ෂණ, බෝග වගාවන් හා සමාජ-ආර්ථික තත්ත්වයන් සම්බන්ධයෙන් විවිධත්වයක් ඇති පරිදි එම දිස්ත්‍රික්ක තෝරා ගැනීමට වග බලා ගන්නා ලදී. එම එක් දිස්ත්‍රික්කයකින් වඩාත් සාර්ථකත්වයක් පෙන් වූ හා ඊට සාපේක්ෂව සාර්ථකත්වය අඩු ගොවිජන බැංකුව බැගින් තෝරාගත් අතර එම දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරුන් සමඟ කරනු ලැබූ සාකච්ඡාවන්ට අනුව ඒවා තෝරාගනු ලැබුණි. තෝරාගත් දිස්ත්‍රික්ක හා ගොවිජන බැංකු අංක 1.1 වගුවෙ හි දක්වා ඇත.

සිද්ධි අධ්‍යයනයන් යටතේ අදාළ ගොවිජන බැංකුවලින් කොටස් මිල දී ගැනීම, ඉතුරුම් තැන්පතු සිදු කිරීම මෙන් ම විවිධ ණය ලබාදීම හා අයකර ගැනීම් සම්බන්ධ සංඛ්‍යාත්මක තොරතුරු ලබාගනු ලැබූ අතර ගොවිජන බැංකු සහාය කාර්ය මණ්ඩලය (ගොවිජන බැංකු සහකාර/කළමනාකරු, ගොවිජන සංවර්ධන සහා ලිපිකරු) ප්‍රාදේශීය නිලධාරී හා ගොවිජන සංවර්ධන සහකාර දිස්ත්‍රික් කොමසාරිස්වරුන් සමඟ සාකච්ඡා කොට ගොවිජන බැංකුවල ප්‍රගතිය හා ඒ සඳහා බලපෑ හේතු, සාර්ථක අත්දැකීම්, පාඩම් හා මුහුණ පෑ ගැටලු සම්බන්ධව තොරතුරු ලබා ගැණුනි. වගා ණය සීමාව, ද්‍රව්‍ය ණය ලබාදීම හා කණ්ඩායම් ණය ක්‍රමය යනාදිය පිළිබඳව මෙන් ම ගොවිජන බැංකු ණය යෝජනා ක්‍රමය පිළිබඳව ගොවීන්ගේ අදහස් විමසා බැලීම සඳහා ප්‍රශ්නාවලි අධ්‍යයනයක් සිදුකරනු ලැබූ අතර ඒ සඳහා එක් එක් ගොවිජන බැංකු බල ප්‍රදේශයකින් ගොවි බැංකු සාමාජිකත්වය ලැබූ ගොවීන් 10 දෙනෙකු හා එසේ සාමාජිකත්වය ලබා නොගත් ගොවීන් 10 දෙනෙකු බැගින් වන සේ සමස්ත අධ්‍යයනය සඳහා ගොවීන් 200 දෙනෙකු තෝරා ගන්නා ලදී. සාමාජිකත්වය ලබා නො ගත් ගොවීන්ගෙන් එසේ සාමාජිකත්වය ලබා නො ගැනීමට හේතු සම්බන්ධයෙන් විමසා බැලිනි. මෙම නියැදිය තෝරා ගැනීමේ දී ණය ලබාගත් ගොවීන් සිටින ගොවි සංවිධාන බල ප්‍රදේශ විමසා බැලූ අතර එහි දී ද සංවිධාන බල ප්‍රදේශ හතරක් හෝ පහක් නියෝජනය වන ආකාරයට හා අහඹු ලෙස ඔවුන්ව තෝරා ගැනීමට වග බලා ගන්නා ලදී.

මෙයට අමතරව, ගොවි සංවිධාන නායකයින්, කෘ.ප.නි.ස. වරුන් වැනි අය සමඟ ද, ගොවි බැංකු ණය ලබාදීම හා සම්බන්ධ අත්දැකීම් හා ගැටලු පිළිබඳව සාකච්ඡා කොට තොරතුරු ලබා ගන්නා ලදී.

වගු අංක 1.1: අධ්‍යයනය සඳහා තෝරාගත් දිස්ත්‍රික්ක හා අදාළ ගොවි බැංකු

| | දිස්ත්‍රික්කය | ගොවිජන බැංකුව |
|---|---|---|
| 1 | බදුල්ල | රිදීමාලියද්ද, බොරලන්ද |
| 2 | මාතලේ | යටවත්ත, ඉලුක්කුඹුර |
| 3 | අනුරාධපුරය | ඇලයාපත්තුව, ඉපලෝගම |
| 4 | පොළොන්නරුව | මැදිරිගිරිය, මනම්පිටිය |
| 5 | පුත්තලම | පුත්තලම/තබ්බෝව, මහකුඹුක්කඩවල |

## 1.5 අධ්‍යයන කාලය

අධ්‍යයනය සඳහා තොරතුරු ලබා ගැනීම 2011 වසරේ මැයි සිට අගෝස්තු අවසානය දක්වා කාලය තුළ දී සිදු කරනු ලැබිණි.

## 1.6 ගැටලු

අධ්‍යයනය යටතේ ගොවි බැංකුවල මූල්‍යමය තිරසාරභාවය පිළිබඳ සොයා බැලීමට අපේක්ෂා කළත් ගොවි බැංකුවල වියදම් දැරීම තවමත් සිදු වන්නේ ගොවිජන සංවර්ධන කම්ටු අරමුදලින් වන නිසාත්, අවශ්‍ය තොරතුරු නොමැති නිසාත්, එය සාර්ථක ලෙස කළ නො හැකි වීම හේතුවෙන් එම අදහස අත්හැර දමනු ලැබිණි.

## 1.7 වාර්තාවෙහි සැකැස්ම

මෙම අධ්‍යයන වාර්තාව පරිච්ඡේද පහකින් සමන්විත ය. පළමුවැනි පරිච්ඡේදය ගොවිජන බැංකු වැඩසටහන පිළිබඳ හැඳින්වීමක් මෙන් ම මෙවැනි අධ්‍යයනයක අවශ්‍යතාවය, මෙහි අරමුණු හා අධ්‍යයනයේ ක්‍රමවේදය පිළිබඳව ඉදිරිපත් කිරීමට යොදා ගෙන ඇත. දෙ වැනි පරිච්ඡේදය සාහිත්‍ය විමර්ශනය සඳහා වෙන් කොට ඇති අතර ඒ යටතේ ණයවල අවශ්‍යතාවය ඒ සඳහා දැරූ උත්සාහයන් අසාර්ථකවීම නිසා ගොවිජන බැංකු වැනි ක්ෂුද්‍ර මූල්‍ය ණය සැපයීමේ ක්‍රම කෙරෙහි අවතීර්ණවීම සම්බන්ධව පමණක් නොව, ඒ යටතේ බිහි කළ ගොවිජන බැංකුව සම්බන්ධව ද කෙරුණු අධ්‍යයන සොයාගැනීම් සම්බන්ධව විමර්ශනයක් සිදු කොට තිබේ. තුන් වැනි පරිච්ඡේදය අධ්‍යයනය සඳහා තෝරාගත් ගොවි බැංකු 10 පිළිබඳ සිද්ධි අධ්‍යයන තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා වෙන් කෙරිණි. ඒ යටතේ සියළු ගොවි බැංකු පිළිබඳව පොදු හැඳින්වීමක්, සාමාජිකත්වය වර්ධනය, ඉතුරුම්, කොටස් හා ලාභාංශ වර්ධනය, ණය ලබාදීම ආදී වශයෙන් වූ තෝරාගත් මාතෘකා 10ක් යටතේ තොරතුරු ඉදිරිපත් කොට තිබේ. හතර වැනි පරිච්ඡේදය මඟින් සියළු ගොවි බැංකු සැසඳීමකට භාජනය කරමින් පොදු සොයාගැනීම් මෙන් ම අත්දැකීම් හුවා දැක්වීමට උත්සහ දරා ඇත. පස්වැනි පරිච්ඡේදය සොයාගැනීම් නිගමන හා යෝජනා සඳහා වෙන් කෙරේ.

## දෙවැනි පරිච්ඡේදය

# සාහිත්‍ය විමර්ශනය

## 2.1 හැඳින්වීම

ගොවි බැංකු වැඩසටහන හා සම්බන්ධ සාහිත්‍ය විමර්ශනය සඳහා වෙන් වූ මෙම පරිච්ඡේදය යටතේ සුළු ගොවි ක්ෂේත්‍රය සඳහා ණය සැපයීමේ වැදගත්කම, ඒ සඳහා රජය දරා ඇති උත්සාහයන් අසාර්ථකවීමට හේතුව පමණක් නොව, විකල්ප ණය සැපයීමේ ක්‍රමවේදයක් ලෙස ගොවි බැංකු ක්ෂුද්‍ර ණය යෝජනා ක්‍රමය පහළ වීමත්, එම ණය යෝජනා ක්‍රමය පිළිබඳව සිදු කර ඇති අධ්‍යයන සොයා ගැනීම් ඉදිරිපත් කිරීමත් කෙරෙහි අවධානය යොමු කෙරේ.

## 2.2 මූල්‍ය පහසුකම්

මූල්‍ය පහසුකම් යනු ආර්ථික මෙන් ම වර්ධනය හා සංවර්ධනය සම්බන්ධයෙන් වඩාත් තීරණාත්මක ලෙස වැදගත් වන්නා වූ යෙදවුමකි (Batra et al. 2011). අනෙකුත් ව්‍යාපාරික කටයුතු මෙන් ම කෘෂිකාර්මය සම්බන්ධයෙන් ද වැදගත් තීරණ ගැනීම කෙරෙහි බලපානු ලබන ණය, සපයන ප්‍රමාණයේ වැඩිවීම හා කලට වේලාවට සැපයීම මත ගොවීන්ට නිසි වේලාවට නවීන බීජ, පොහොර හා වෙනත් යෙදවුම් නිසි පරිදි භාවිතා කිරීමට අවකාශය සැලසේ.

## 2.3 ණය සැපයීමට දරනු ලැබූ උත්සාහයන්

අනෙකුත් සංවර්ධනය වෙමින් පවත්නා රටවල්වල මෙන් ශ්‍රී ලංකාවේ ආණ්ඩු ද ග්‍රාමීය ක්ෂේත්‍රයට විශේෂයෙන් ම සුළු ගොවීන්ට ණය පහසුකම් සැලසීම සඳහා නිදහස ලැබීමටත් පෙර අවධියේ සිටම නොකඩවා විවිධ පියවර ගෙන ඇත. ඒ අනුව, ආහාර නිෂ්පාදන දෙපාර්තමේන්තුව 1947 සිටත්, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව 1956 සිටත්, සමූපකාර මාර්ගයෙන් ග්‍රාමීය හා ගොවි ක්ෂේත්‍රයට ණය පහසුකම් සැලසීම සඳහා මැදිහත් වී ඇත. ණය අයකර ගැනීම ඇතුළු වෙනත් දුර්වලතා නිසා කෘෂි ණය සැපයීම වඩාත් සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදිහත්වීම හා සුපරීක්ෂණය යටතේ අනෙකුත් රාජ්‍ය මෙන් ම වාණිජ බැංකු ද සහභාගී කර ගැනීමෙන් 1967 වර්ෂයේ සිට විවිධ ණය යෝජනා ක්‍රමයන් ද ක්‍රියාත්මක කොට තිබේ (1967 – 1973 කාලය තුළ නව කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමයත්, 1973-1985 කාලය තුළ විස්තීරණ ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයත්, 1985 න් පසු නව විස්තීරණ ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයත් ක්‍රියාත්මක කර ඇත. එසේ වූව ද, ග්‍රාමීය කෘෂි ක්ෂේත්‍රයට ණය සැපයීම සඳහා ආරම්භ කරනු ලැබූ මෙම හැම යෝජනා ක්‍රමයකින්ම පටන් ගැනීමේ දී දෙනු ලබන ණය ප්‍රමාණය වැඩිවීමත්, කල්යත් ම ණය ගෙවීම් පැහැර හැරීමත් අත්දැකීමට ලැබුණි (Sanderatne, 2002).

## 2.4 ආයතනික ණය වැඩසටහන් අසාර්ථකවීම

ග්‍රාමීය ගොවීන්ට සහනදායී ලෙස ණය සැපයීම සඳහා ආරම්භ කළ රජයේ ආයතනික ණය වැඩසටහන එතරම් සාර්ථක නොවීම සඳහා බලපා ඇති කරුණු විවිධ වූ අතර ණය ලබා ගන්නන්ට මෙන් ම බැංකු ආයතනවලට බලපෑ කරුණු වෙන වෙනම අත්දැකිය හැකි ය. ණය ලබා ගන්නන්ට බලපෑ කරුණු අතර ගොවීන්ට පහසුවෙන් සැපිරිය නො හැකි තදබල ~~නීති රීතීන්~~ හා රෙගුලාසීන් පැවතීමෙන් ඒවා සපුරාලමින් ණය ලබා ගැනීමේ දී අධික

පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

වියදමක් මෙන් ම කාලයක් ගතවීම (Fernando, 1987) මූලික වෙයි. ණය දෙනු ලබන ආයතන මුහුණදෙන ප්‍රධාන ප්‍රශ්නය වූයේ අධික ණය ප්‍රමාණයක් ආපසු අය නොවීම හා ඒ හේතුවෙන් ඒවා කපා හැරීමට සිදුවීම මෙන් ම සුළු ගොවීන්ට කුඩා ප්‍රමාණයේ ණය විශාල ප්‍රමාණයක් ලබාදීමේ දී අධික පරිපාලන වියදමක් දැරීමට සිදුවීම (Attanayake, 1993), මහ බැංකුවෙන් තීරණය කරනු ලබන ආර්ථිකමය ලෙස ප්‍රමාණවත් නොවන පොලියකට ණය දීමට සිදුවීම හා ණය දීම මෙන් ම අයකර ගැනීම සඳහා වෙනත් ආයතනික සහාය ප්‍රමාණවත් පරිදි ලබා ගැනීමට අපහසුවීම (Ratnayake, 1992) යනා දී කරුණු ය.

## 2.5 විකල්ප මාර්ගයක් ලෙස ක්ෂුද්‍ර ණය යෝජනා ක්‍රම

ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළවල් යටතේ කාලයක් මුළුල්ලේ පැවති සහනදායී ණය නිදහස් ආර්ථිකය යටතේ වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වෙනුවට රජය මඟින් ග්‍රාමීය ණය සම්බන්ධයෙන් වෙළෙඳපොළ වෙත යොමු වූ ප්‍රතිපත්තියක් අනුගමනය කරනු ලැබුණි. මේ යටතේ රජය ණය සැපයීමේ වැඩසටහන් කෙලින්ම පාලනය කරනවා වෙනුවට එම වැඩසටහන් සඳහා පදනම හා මඟපෙන්වීමක් කරන ලදී (Attanayake, 1993). ඒ සමඟම 1980 පමණ කාලයේ සිට රාජ්‍ය අනුග්‍රහයෙන් ක්‍රියාත්මක වූ සහනදායී ණය යෝජනා ක්‍රමයන් හි අසාර්ථකත්වය නිසා සංවර්ධනය වෙමින් පවත්නා අනෙක් රටවල් මෙන් ශ්‍රී ලංකාව ද විවිධාකාරයේ වූ ක්ෂුද්‍ර මූල්‍ය යෝජනා ක්‍රම (Micro finance systems) වෙතට යොමු විය (Chandrasiri, 2005). විධිමත් ණය සැපයුම් ආයතනවලට දුප්පතුන් හා කුඩා පරිමාණයේ ණය ලබාගන්නන්ගේ අවශ්‍යතා සැපිරීමට නො හැකිවීම නිසා ඇති වූ ගැටලුකාරී තත්ත්වය මගහැරවීම සඳහා මෙවැනි ක්ෂුද්‍ර ණය සැපයීමේ ක්‍රම ක්‍රියාත්මක විය (Shylendra, 2011) . ක්ෂුද්‍ර ණය යනු ග්‍රාමීය, අර්ධ නාගරික හා නාගරික ප්‍රදේශයන් හි වසන දුප්පතුන්ගේ ආදායම් උත්පාදන කටයුතු ඇරඹීම සඳහාත්, ජීවන තත්ත්වය නැංවීම සඳහාත් ඔවුන්ට ඵල ප්‍රයෝජන ලැබීමට හැකිවන පරිදි කරනු ලැබූ ඉතුරුම් ප්‍රවර්ධනය, ණය හා රක්ෂණය ලබාදීම හා සම්බන්ධව සේවාවන් ය (Krog, 2000). මෙබඳු සේවා පසුගිය දශක කිහිපය තුළ සංවර්ධනය වන රටවල දුප්පත්කම නැති කිරීම සඳහා වූ වඩාත් ප්‍රායෝගික ක්‍රමවේදයක් ලෙස ක්‍රියාත්මක වන්නට විය.

විවිධ රටවල් විසින් ක්ෂුද්‍ර ණය සැපයීම සඳහා විවිධ, ආයතනික ක්‍රමෝපායයන් පිළිබඳව අත්හදා බැලීම් කරනු ලැබූ අතර (Brau et al. 2004) ඒ හැම එකක් මඟින් ම ආයතනික ණය සැපයීමේ දී මතු වූ ණය සුරක්ෂිතතාවය තහවුරු කිරීම, ණය ලබා ගැනීමට අධික කාලයක් හා වියදමක් වැයවීම හා අයහපත් ආකාරයෙන් ණය අයවීම යනා දී ගැටලු සඳහා විසඳුම් සෙවීමට උත්සාහ දැරිණි. ඒ අනුව, බොහෝ අධ්‍යයනයන්ට අනුව ක්ෂුද්‍ර ණය යෝජනා ක්‍රමයන්ට ණය ලබා ගන්නන් සඳහා යන අධික වියදම අඩු කිරීමට පමණක් නොව ණය ආපසු ගෙවීමේ ප්‍රමාණය වැඩි කිරීමට ද හැකි වී තිබේ (Ramakrishna et al. 2011).

## 2.6 ගොවිජන බැංකු ණය වැඩසටහන

රාජ්‍ය අනුග්‍රහයෙන් ආරම්භ කළ ක්ෂුද්‍ර ණය යෝජනා ක්‍රමයක් ලෙස ගොවිජන බැංකුව හැඳින්විය හැකි ය. ගොවිජන බැංකු ණය වැඩසටහන පිළබඳව සිදු කර ඇති අධ්‍යයනය පිළිබඳව විමසා බැලීමේ දී අධ්‍යයන දෙකක් පමණක් සිදු කොට ඇති බව අනාවරණය විය. "ගොවි බැංකු මඟින් සුළු ගොවීන් සඳහා ලබාදුන් ණය හා සම්බන්ධ කාර්ය සාධනය විමසීම" යන මැයෙන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මඟින් සිදු කරනු ලැබූ අධ්‍යයනය (Jayasena et al. 1999) මෙයින් ප්‍රධාන ය.

ගොවි බැංකු වැඩසටහන ආරම්භ කොට වසර පහකින් පමණ ආරම්භ කරනු ලැබූ මෙම අධ්‍යයනයෙහි ප්‍රධාන අරමුණ වූයේ එම වැඩසටහනින් අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීමේ දී මතු වී ඇති ප්‍රශ්න හා ගැටලු හඳුනා ගැනීමත්, එය සාර්ථක කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු මාර්ග පෙන්වා දීමත් ය.

ඉහත දැක් වූ අධ්‍යයනයෙහි සොයා ගැනීම්වලට අනුව අදාළ ප්‍රදේශවල වී වගා කිරීම සඳහා ඉතා කුඩා ගොවීන් පිරිසකට පමණක් ණය ලබා දී ඇති අතර එයට හේතු වී ඇත්තේ ප්‍රමාණවත් තරම් අරමුදල් නොමැතිකම ය. ලබා දී ඇති ණය වුව ද, වී සහ අනෙකුත් බෝගවල නිෂ්පාදන මිල ආවරණය කර ගැනීමට තරම් ප්‍රමාණවත් වී නොමැත. එම අධ්‍යයනයටම අනුව ලබාදුන් ණය අයවීම සම්බන්ධයෙන් ද අසතුටුදායක තත්ත්වයක් පැවතී ඇති අතර ඒ හේතුව නිසාම ණය වැඩපිළිවෙළ චක්‍රීය අරමුදලක් ලෙස සාර්ථකව නොකඩවා ක්‍රියාත්මක කිරීමට බාධාවක් වී තිබේ. ණය වශයෙන් ලබාදුන් බීජ අඩුවෙන් පැළවීම වැනි හේතු නිසා පමණක් නොව නියඟය, ගංවතුර වැනි ස්වභාවික හේතුන් නිසා අස්වැන්න අඩුවීම මෙන් ම නිෂ්පාදන සඳහා වඩාත් යහපත් මිලක් නො ලැබීම හේතුවෙන් අඩු ආදායමක් ලැබීමත්, ප්‍රාදේශීය නිලධාරීන්ට වෙනත් රාජකාරීන් නිසා ණය අය කර ගැනීමට ප්‍රමාණවත් කාලයක් කැප කිරීමට නො හැකිවීම වැනි මානව සම්පත් සම්බන්ධ ගැටලු ද ණය අයකර ගැනීමේ ක්‍රියාවලිය දුර්වලවීම කෙරෙහි බලපා ඇත. ගොවි බැංකු වැඩසටහන පිළිබඳව ගොවීන්ගේ අදහස් ද විමසා බලා ඇති එම අධ්‍යයනයට අනුව ගොවි බැංකු සංකල්පය හා එමඟින් ගොවි ජනතාවට ලැබෙන සහන පිළිබඳව ගොවීන් බහුතරයක් තුළ පැහැදිලි අදහසක් නො පැවති බව පැහැදිලි විය.

ගොවි බැංකු ණය යෝජනා ක්‍රමය වඩාත් සාර්ථක කර ගැනීම සඳහා එම අධ්‍යයනය මඟින් ඉදිරිපත් කරනු ලබන යෝජනා අතර වැඩි අරමුදල් ප්‍රමාණයක් ගොවි බැංකු වෙත ලබාදීමත්, එම අරමුදල් කලට වේලාවට ලැබීමට කටයුතු සැලසීමත්, ගොවි බැංකු ගොවිජන සේවා මධ්‍යස්ථානයන් හි වෙනම ඒකකයක් ලෙසට ස්ථාපිත කිරීමත්, එය ක්‍රියාත්මක කිරීම සඳහා වඩාත් ඉහළ අධ්‍යාපන සුදුසුකම් ඇති ගොවි නියාමකයින් දෙදෙනෙකු පත් කිරීමත්, එහි ගිණුම් කටයුතු සඳහා සහභාගී වන නිලධාරීන්ට ගිණුම්කරණය පිළිබඳව පුහුණුව ලබාදීමත්, වී ඇතුළු අනෙකුත් බෝග සඳහා ණය දීමේ දී අඩුම වශයෙන් පවත්නා නිෂ්පාදන වියදම ආවරණය කර ගැනිමට හැකිවන පරිදි සුදුසු ණය ප්‍රමාණයක් ලබාදීමත්, ණය පහසුකම් මඟින් ආරම්භ කරනු ලබන නිෂ්පාදන විකුණා ගැනීමට හැකිවන ආකාරයට වෙළෙඳපොළ පහසුකම් සැලසීමට කටයුතු කිරීමත් වෙයි.

ඉහත දැක් වූ අධ්‍යයනයට අමතරව රාජ්‍ය නොවන සංවිධානයක් වන සැප්කෝ ආයතනය මඟින් කෑගල්ල දිස්ත්‍රික්කයේ පිහිටි ගොවිජන බැංකුවල ක්‍රියාකාරීත්වය අළලා 2009 වසරේ දී අධ්‍යයනයක් සිදු කොට ඇත. මෙම අධ්‍යයනය දිස්ත්‍රික්කයේ ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්. තෝරාගත් ගොවිජන සේවා මධ්‍යස්ථානයන් හි නිලධාරීන්, ගොවිජන බැංකු ක්‍රියාකරවන්නන් හා ක්ෂේත්‍ර මට්ටමේ කටයුතුවල නියැලී කෘ.ප.නි.ස. වරුන් සම්බන්ධ කරගනිමින් "ස්වොට්" (SWOT) ක්‍රමවේදය ආශ්‍රයෙන් කරනු ලැබූ තොරතුරු විග්‍රහ කිරීමකි. ඒ අනුව, ගොවි බැංකු සතුව ඇති ශක්තීන්, දුර්වලකම්, මෙන් ම ඒවා වඩාත් ශක්තිමත් කිරීම සඳහා ඇති අවස්ථාවන් ද ඒ සඳහා ඇති බාධක ද දියුණු කිරීම සඳහා යෝජනාවන් ද ඉදිරිපත් කොට ඇත.

එම අධ්‍යයනයෙන් සොයා ගත් ගොවි ජන බැංකුවල දුර්වලතා ලෙස ගොවිජන බැංකු කිසි දිනෙක විගණනයට හා විමර්ශනයට ලක් වී නොමැති රජයේ වගකීමෙන් බැහැරව පවත්නා ආයතනයක්වීම, ගිණුම් තැබීම පිළිගත් ක්‍රමයකට සිදු නොවීම, ප්‍රාදේශීය මෙන් ම දිස්ත්‍රික් නිලධාරීන්ගේ ක්‍රමවත් අධීක්ෂණයට එවා ලක් නොවීම, කාර්ය මණ්ඩලවලට නිසි පුහුණුවක් නොමැතිවීම, සුළු ගොවීන්ට එමඟින් ලබාදිය හැකි සේවාව අති විශාල වූව ද ප්‍රදේශයේ ගොවීන්ගෙන් ඉතා අල්ප ප්‍රමාණයකට පමණක් එහි සේවාව ලබාදීම, ගොවිජන බැංකුවෙ හි කටයුතුවල නිරතවීම අදාළ නිලධාරීන්ගේ කාර්යයන් ලෙස ඇතුලත් නො කිරීම හා ණය අයකර ගැනීමේ ප්‍රතිශතය ඉතා පහළ මට්ටමක පැවතීම සඳහන් කර ඇත.

'සැප්කෝ' ආයතනය මඟින් කර ඇති අධ්‍යයනයට අනුව ගොවිජන බැංකුව දියුණු කිරීම සඳහා එයට ඇති අවස්ථා ලෙස කෘෂි ක්ෂේත්‍රයට සම්බන්ධ විවිධ අංශයන් හි අනුග්‍රහය ලබාගත හැකිවීම, ගොවි සමිති හා ගොවි කණ්ඩායම් එහි කටයුතු පුළුල් කිරීමට යොදාගත හැකිවීම ගෙනහැර දක්වා තිබේ.

එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී මතු වූ බාධක හා තර්ජන ලෙස ගොවි බැංකුවට නීතිමය පසුබිමක් නොමැතිවීම, ගොවි සමිති කණ්ඩායම්වලට ගොවි බැංකුවේ ගණුදෙනු කිරීම සඳහා ගොවි සමිති ව්‍යවස්ථාව මඟින් අවස්ථාව සලසා දී නොමැතිවීමත් වර්ෂ 2000 අංක 46 දරන ගොවිජන පනතෙ හි ගොවිජන බැංකුව පිළිබඳව කිසිදු අදහසක් සඳහන් නොවීමත් සඳහන් කොට ඇත.

පවත්නා තත්ත්වය තුළ ගොවිජන බැංකුවල දුර්වලතා නැති කර එම ණය යෝජනා ක්‍රමය වඩාත් ඵලදායී එකක් බවට පත් කිරීම සඳහා සැප්කෝ ආයතනය මඟින් කරනු ලැබූ අධ්‍යයනය මඟින් යෝජනා ගණනාවක් ඉදිරිපත් කොට ඇති අතර එවා අතර ගොවිජන බැංකු නියාමක ව්‍යාපෘතිය නීතිගත කිරීම, එම බැංකු සඳහා සුදුසුකම් සහිත නිලධාරීන් පත් කිරීම, සියළු නිලධාරීන් සඳහා අදාළ පුහුණු පහසුකම් ලබාදීම, එම බැංකුවල ක්‍රියාකාරීත්වය මසකට වරක්වත් දිස්ත්‍රික්ක මට්ටමෙන් විමර්ශනයට ලක් කිරීම, එහි විගණන කටයුතු පිළිගත් ආයතනයක් මඟින් සිදු කිරීම යනා දිය දක්නට ලැබේ.

එසේ වූව ද, මෙම අධ්‍යයනය සැලකිය යුතු ප්‍රදේශයක් නියෝජනය වන ආකාරයට සිදු කළ එකක් නොවන නිසාත්, අධ්‍යයනය සඳහා භාවිත ක්‍රමවේදය හා පදනම් කොටගත් තොරතුරු සමස්ත ගොවිජන බැංකු ක්‍රියාවලියම නියෝජනය කරන්නක් නොවන නිසාත්, මෙම අධ්‍යයනයේ තොරතුරු විශ්වසනීයත්වය අතින් එතරම් ඉහළ මට්ටමක නො පවතින බව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අදහස විය.

## තුන්වැනි පරිච්ඡේදය

# ගොවිජන බැංකු හා සම්බන්ධ සිද්ධි අධ්‍යයන

## 3.1 පුත්තලම - තබ්බෝව ගොවි බැංකුව

### 3.1.1 හැඳින්වීම

පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන බල ප්‍රදේශයක් වන පුත්තලම/තබ්බෝව විල්පත්තු වනෝද්‍යානයට යාබදව පිහිටා ඇති අතර තබ්බෝව ව්‍යාපාරය හා රදව්බැදි ඇල ව්‍යාපාරය යන ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රමයන්ට අයත් ප්‍රදේශ මෙන් ම සුළු වාරිමාර්ග ප්‍රදේශවලින් සමන්විත වන්නකි. ප්‍රදේශය තුළ සිටින මුළු ගොවි පවුල් ප්‍රමාණය 2,460 කි. එසේ වුව ද, ප්‍රදේශයේ ගොවි පවුල්වලින් වැඩි ප්‍රමාණයක් සුළු වාරිමාර්ග ප්‍රදේශයන් නියෝජනය කරන්නන් වන අතර ඔවුන්ගේ ප්‍රමාණය 1,878ක් වන අතර සුළු වාරිමාර්ග යටතේ වගා කරන බිම් ප්‍රමාණය අක්කර 1,730ක් වෙයි. මහා වාරිමාර්ග යටතේ වගා කරන ගොවීන් ප්‍රමාණය 730ක් වන අතර ඒ යටතේ වගා කරන ප්‍රමාණය අක්කර 2,090ක් වෙයි. බල ප්‍රදේශය තුළ ඇති කෘ.ප.නි.ස. වසම් සංඛ්‍යාව 10 ක් වන අතර ගොවි සංවිධානය ප්‍රමාණය 28 කි.

තබ්බෝව හා රදව්බැදිඇල ව්‍යාපාරය නියෝජනය කරනු ලබන ගොවීන්ගේ ප්‍රධාන ජීවනෝපාය මහ සහ යල දෙකන්නයේ ම වාරි ජලය පදනම් කරගෙන වී වගා කිරීමයි. එසේ වුවත්, ගොවීහු සුළු ප්‍රමාණයක් විශේෂයෙන් ම, යල කන්නයේ දී බඩඉරිඟු වැනි වෙනත් බෝග ද වගා කරති. ගොවීන් විසින් සිය කැමැත්තෙන් අල්ලාගෙන වගා කර ගනිමින් තිබූ ඉඩම් සඳහා නීතිමය අයිතිය ලබා දී තිබේ. තබ්බෝව ව්‍යාපාරය යටතේ ඇතැම් ගොවි පවුල් අක්කර 5ක් වැනි විශාල කුඹුරු ප්‍රමාණයක් වගා කරනු ලබන අතර ඇතැම් පවුල් අක්කර 2-5 අතර ප්‍රමාණයක් වගා කරති. ප්‍රදේශය තුළ ඇති බොහෝමයක් කුඩා වැව් යටතේ ද මහ මෙන් ම යල කන්නවලදීත් වී වගාව සිදු කෙරේ. සුළු වාරි යටතේ ඇතැම් ගොවීහු බඩඉරිඟු වගාව ද සිදු කරති. එසේ වුවත්, ඇතැම් යල කන්නවල දී ප්‍රමාණවත්ව වැව් පිරී නො තිබීම නිසා සුළු වාරිමාර්ග යටතේ ඇති මුළු ඉඩම් ප්‍රමාණයම හෝ කොටසක් වගා කිරීමට නො හැකි වේ. සුළු වාරි යටතේ බොහෝමයක් ගොවීහු අක්කර 1-3 අතර ඉඩම් ප්‍රමාණයක් වගා කරති. බල ප්‍රදේශයේ ඇති ගොවි පවුල් සතු ගොඩ ඉඩම් ප්‍රමාණය ද සැලකිය යුතු මට්ටමක (බොහෝ විට අක්කර 2-5 හෝ ඊට ඉහළ) පවතින අතර ඒවායේ වගා කොට ඇති පොල්, කජු හා වන වගාවලින් ඔවුන්ට අමතර ආදායමක් ද ලැබේ. සත්ත්ව පාලනය සඳහා ප්‍රචලිත ප්‍රදේශයක පිහිටි මෙහි ඇතැම් පවුල් කිරි සඳහා මෙන් ම මස් සඳහා ද හරකුන් හා එළුවන් ඇති කිරීම සිදු කරති.

### 3.1.2 සාමාජිකත්ව වර්ධනය

ගොවි බැංකුව ආරම්භ කරන ලද්දේ 1999 යල කන්නයේ දී ය. කෙසේ වුව ද, දත්ත වාර්තා අනුව 2001 වර්ෂය වන විට ප්‍රදේශයේ ගොවීන්ගෙන් 285ක් හෙවත් ප්‍රදේශයේ මුළු ගොවි පවුල් සංඛ්‍යාවෙන් 11.6%ක් මෙහි කොටස් මිල දී ගෙන තිබුණි (වගු අංක 3.1). ගොවි බැංකුවේ ඉහළම සාමාජිකත්ව වර්ධනයක් දක්නට ලැබෙන්නේ 2006 වර්ෂය තුළ වන අතර එම වර්ෂය වන විට ප්‍රදේශයේ මුළු ගොවීන්ගෙන් 23.4%ක් ගොවි බැංකුවේ කොටස් මිල දී ගෙන ඇත. මෙය ඊට පෙර වර්ෂයට (2005) සාපේක්ෂව 8.7%ක වර්ධනයකි. කෙසේ වුව ද, 2008 වර්ෂයේ සිට ගොවි බැංකුවේ කොටස් මිල දී ගත් ගොවීන් සංඛ්‍යාවේ

දුර්වලවීමක් දැකිය හැකි ය. 2010 වර්ෂය වනවිට ගොවි බැංකුවේ කොටස් හිමියන් සංඛ්‍යාව 709ක් වන අතර මෙය 2001 වර්ෂයට සාපේක්ෂව 149%ක වර්ධනයකි. මේ වනවිට කුඩා කණ්ඩායම් 99ක් ක්‍රියාත්මක වේ.

**වගු අංක 3.1: පුත්තලම - තබ්බෝව ගොවි බැංකුවේ සාමාජිකත්ව වර්ධනය: 2001-2010**

| වර්ෂය | සාමාජිකයන් / කොටස් හිමියන් සංඛ්‍යාව | කොටස් වල වටිනාකම (රු) | ප්‍රදේශයේ ගොවි පවුල් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස (%) | ප්‍රදේශයේ ගොවි පවුල් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|---|
| 2001 | 285 | 82,500 | 10.87 | 11.6 |
| 2002 | 309 | 84,900 | 11.78 | 12.5 |
| 2003 | 328 | 103,900 | 12.51 | 13.3 |
| 2004 | 345 | 125,100 | 13.16 | 14.0 |
| 2005 | 363 | 143,100 | 13.84 | 14.7 |
| 2006 | 578 | 398,500 | 22.04 | 23.4 |
| 2007 | 642 | 483,270 | 24.49 | 26.0 |
| 2008 | 705 | 583,370 | 26.89 | 28.6 |
| 2009 | 705 | 583,370 | 26.89 | 28.6 |
| 2010 | 709 | 610,320 | 27.04 | 28.8 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

## 3.1.3 ගොවි බැංකුවේ ඉතුරුම්, කොටස් ප්‍රාග්ධනය හා ලාභාංශ වර්ධනය

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මඟින් මෙම ගොවි බැංකුව සඳහා ආරම්භක ප්‍රාග්ධන මුදල් ලෙස රු. 1,062,455 ක මුදලක් කොටස් 3ක් යටතේ වරින් වර ලබා දී ඇත. මෙම සම්පූර්ණ මුදල 2010 වර්ෂය වන විට ගෙවා නිම කොට තිබේ. එසේ ම, ගොවි බැංකුවේ කොටස් වටිනාකම 2001 වර්ෂයේ දී රු. 82,500ක් වූ අතර 2010 වර්ෂය වන විට ගොවි බැංකුවෙ හි සාමාජිකයින් 709 දෙනා විසින් ලබා ගෙන ඇති මුළු කොටස් ප්‍රාග්ධනයෙ හි වටිනාකම රු 610,320කි (වගු අංක 3.1). මෙම ගොවි බැංකුවෙ හි ඉතිරි කිරීම් කොට ඇත්තේ කොටස් මිල දී ගත් අයගෙන් භාගයකට ආසන්න ප්‍රමාණයකි. එනම් 306 දෙනෙකි. එසේ වුව ද, මේ අයගේ ප්‍රමාණය ද මේ වන විට 278ක් දක්වා අඩු වී තිබේ. කොටස් මිල දී ගෙන බැංකුවෙ හි සාමාජිකත්වය ලබා ගත්ත ද ණය ලබා ගැනීමට ඉදිරිපත් නොවීම ඉහත දැක් වූ පරිදි කොටස් හිමියන්ගෙන් භාගයක් පමණක් ඉතිරි කිරීම් සඳහා ඉදිරිපත් වීමට හේතු වී ඇත. පසුව, එම ප්‍රමාණය ද තවදුරටත් අඩුවීමට හේතු වී ඇත්තේ ගොවිජන බැංකුවෙන් සපයනු ලබන ණය සේවාවන් විශේෂයෙන් ම ද්‍රව්‍ය ණය ලෙස සපයනු ලබන

කෘෂි රසායන ද්‍රව්‍ය හා බීජවලින් සුවිශේෂී වූ වාසියක් නො ලැබෙන බැවින් හා ගොවිජන බැංකු බල ප්‍රදේශයෙ හි සැහෙන ජනගහනයක් ඇති තබ්බෝව ව්‍යාපාර බල ප්‍රදේශය තුළ ග්‍රාමීය මට්ටමින් ගොවි ණය පහසුකම් ලබා දෙන "ඉසුරු ණය" යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන නිසා ගොවි බැංකු ණය ලබා ගැනීමට දැඩි වුවමනාවක් ගොවීන් තුළ නොමැතිවීම නිසා ය. ඉතිරි කිරීම් සිදු කර ඇති සාමාජිකයින් වුව ද, වැඩි ප්‍රමාණයක් ඉතිරි කර ඇත්තේ ඔවුන්ට ගොවි බැංකුව හරහා සාමාන්‍ය ගොවි ණය ලෙස ලබා ගත හැකි රු. 25,000/-ක් වූ මුදල ලබා ගැනීමට පමණක් ප්‍රමාණවත් වන මුදල් ප්‍රමාණයකි. එනම් රු. 2,500/-කි. එසේ වුව ද, ව්‍යාපෘති ණය ලබා ගන්නන් පමණක් ඊට වඩා වැඩි ප්‍රමාණයන්ගෙන් ඉතිරි කොට ඇත (ලබා ගන්නා ණය මුදලෙන් 10%ක් ඉතිරි කිරීමේ ගිණුම්වල පැවතිය යුතු නිසා).

ගොවි බැංකුවේ සමුච්චිත අරමුදල 2001 වර්ෂය තුළ දී රු. 86,801ක් පෙන්නුම් කළ අතර ඒ ප්‍රමාණය 2010 වර්ෂය වන විට රු. 1,627,572 දක්වා වාර්ෂිකව 22%කින් පමණ වර්ධනය වීමක් පෙන්නුම් කරයි. මේ අනුව, 2001 වර්ෂය වන විට ගොවි බැංකු මූලික ප්‍රාග්ධනය, කොටස් ප්‍රාග්ධනය, තැන්පතු හා සමුච්චිත අරමුදලෙන් සැදුම් ලද සමස්ත සංචිත වටිනාකම රු. 1,375,463ක් වූ අතර 2009 වර්ෂයේ දී එය රු. 3,434,736ක් දක්වා වර්ධනය වී තිබේ. කෙසේ වුව ද, 2010 වර්ෂය තුළ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් ලැබුණු මූලික ප්‍රාග්ධන මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කිරීම හේතුවෙන් එම වර්ෂය තුළ දී, ගොවි බැංකුවේ ණය දීම සඳහා යොදා ගත හැකි සංචිත වටිනාකම රු. 2,640,042ක් ව පැවතුණි.

**වගු අංක 3.2: පුත්තලම - තබ්බෝව ගොවි බැංකුවේ අරමුදල් වර්ධනය: 2001-2010**

| වර්ෂය | ප්‍රාග්ධනය (රු) | කොටස් ප්‍රාග්ධනය (රු) | මුළු තැන්පතු වටිනාකම (රු) | සමුච්චිත අරමුදල (රු) | සංචිත වටිනාකම (රු) |
|---|---|---|---|---|---|
| 2001 | 1,062,455 | 82,500 | 143,706 | 86,801 | 1,375,463 |
| 2002 | 1,062,455 | 84,900 | 171,453 | 216,540 | 1,535,349 |
| 2003 | 1,062,455 | 103,900 | 181,247 | 348,014 | 1,695,616 |
| 2004 | 1,062,455 | 125,100 | 196,891 | 467,871 | 1,852,317 |
| 2005 | 1,062,455 | 143,100 | 248,438 | 604,127 | 2,058,120 |
| 2006 | 1,062,455 | 398,500 | 310,222 | 760,543 | 2,531,721 |
| 2007 | 1,062,455 | 483,270 | 347,522 | 1,185,696 | 3,078,944 |
| 2008 | 1,062,455 | 583,370 | 386,670 | 1,185,696 | 3,218,192 |
| 2009 | 1,062,455 | 583,370 | 386,670 | 1,402,240 | 3,434,735 |
| 2010 | - | 610,320 | 402,149 | 1,627,572 | 2,640,041 |

ප්‍රාග්ධනය යනු: ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගොවි බැංකු වෙත සපයන ලද මුදල
සංචිත යනු: ප්‍රාග්ධනය,කොටස් ප්‍රාග්ධනය, තැන්පතු වටිනාකම සහ සමුච්චිත අරමුදලේ වටිනාකම් වල එකතුව
පුද්ගල තැන්පතු හා කුඩා කණ්ඩායම් තැන්පතු වල එකතුව මුළු තැන්පතු වේ.
මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

### 3.1.4 ණය නිකුත් කිරීම

මෙම ගොවි බැංකුව යටතේ වගා ණය හා ව්‍යාපෘති ණය පමණක් නිකුත් කෙරේ. මුල් කාලයේ දී වී සුරකුම් ණය ලබා දී ඇතත් කෙටි කාලයක දී ගෙවීමට ඇති අපහසුතාවය

නිසා ගොවීන් ඉල්ලීම් නො කරන බැවින් මේ වන විට එවැනි ණය නිකුත් කිරීම සිදු නොවේ. අස්වනු තෙළීමේ ණය මේ දක්වාත් නිකුත් කොට නැත.

වගා ණය යටතේ උපරිම රු. 25,000ක් ද්‍රව්‍යමය වශයෙන් එනම්, සහනාධාර පොහොර, කෘෂි රසායනික ද්‍රව්‍ය, බිත්තර වී හා ගෙවතු බීජ (වම්බටු, තක්කාලි, මිරිස් වැනි) යනාදිය ලෙස ලබා දේ. වගා ණය වැඩි වශයෙන් ලබා ගන්නේ ප්‍රධාන වාරිමාර්ගවලට වඩා සුළු වාරිමාර්ග යටතේ වගා කරන ගොවීන් ය. තබ්බෝව වැනි මහා වාරිමාර්ග ප්‍රදේශයන් හි ගොවීන් ගොවි බැංකුවෙන් ද්‍රව්‍ය ණය පමණක් ලබාදීම හා ඒ යටතේ ප්‍රධාන වශයෙන් ම දෙන කෘෂි රසායනික ද්‍රව්‍යවලට සැලකිය යුතු කොමිස් මුදලක් නො ලැබීම නිසා විශේෂයෙන්ම තම්බපණිනිය හා පාවට්ටමඩුව කෘ.ප.නි.ස. වසම්වල ගොවීහු ගොවි බැංකුවෙන් ණය ලබා ගැනීමට මැලිකමක් දක්වති. මේ හේතුව නිසා සමෘද්ධි බැංකුව, ග්‍රාමීය සමූපකාර බැංකුව හා ඉසුරු ණය යෝජනා ක්‍රමය (මහා බැංකුවෙ හි අනුග්‍රහයෙන් එම ප්‍රදේශවල ක්‍රියාත්මක) මඟින් තම ණය අවශ්‍යතා සපුරා ගැනීමට ගොවීහු පෙළඹී සිටිති. විශේෂයෙන් ම, සමෘද්ධි බැංකුව කෙරෙහි ඔවුන්ගේ අවධානය වැඩිවීමට හේතු වී ඇති කරුණ වන්නේ එමඟින් වගා ණය මුදලින් ලබාදීමත්, එසේ ම ගොවිජන බැංකුවට වඩා වැඩි ප්‍රමාණයක් ණය ලෙස ලබාදීමත් හේතුවෙති.

සුළු වාරිමාර්ග ප්‍රදේශයන් වන කරුවලගස්වැව, මහකෝන්වැව එගොඩපිටිය හා කුඩා මැදවච්චිය වැනි ප්‍රදේශයන් බොහෝමයක් යටතේ වගා කරන ගොවීහු ඉතා කුඩා ඉඩම් ප්‍රමාණයක් වගා කරන නිසා තමන් ලබා ගන්නා කෘෂි රසායන ද්‍රව්‍යයන්වල මිල කෙරෙහි එතරම් තැකීමක් නො කරති. ඊට අමතරව, එම ප්‍රදේශයන් හි අනෙකුත් ණය ලබා ගන්නා මාර්ගයන් ද එතරම් ප්‍රචලිත නොවන නිසා එම ගොවීහු ගොවිජන බැංකුවෙන් ණය ලබාගැනීමට වැඩි කැමැත්තක් දක්වති.

වගා ණය යටතේ වී වගාව සඳහා පමණක් ණය නිකුත් කරන අතර 2001 වර්ෂය තුළ ගොවීන් 150ක් සඳහා නිකුත් කළ මුළු ණය මුදල රු. 931,345කි (වගු අංක 3.3). මෙය ගොවි බැංකුව තුළ එම වර්ෂයේ පැවති සංචිත වටිනාකමෙන් 68%ක් (වගු අංක 2.4) පමණ වන මුදලකි. වැඩිම ණය මුදලක් නිකුත් කොට තිබුණේ 2009 වර්ෂය සඳහා වන අතර එම වර්ෂයේ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 344 කි. මේ යටතේ වගා ණය රු. 2,931,546ක් හා ව්‍යාපෘති ණය රු. 650,000ක් නිකුත් කොට තිබේ. මෙම බැංකුවේ ණය නිකුත් කිරීමේ දී 2006, 2008 හා 2009 වර්ෂවල දී සංචිත වටිනාකමට වැඩි ණය මුදලක් නිකුත් කොට ඇති අතර 2010 වර්ෂය තුළ නිකුත් කොට තිබුණේ ගොවි බැංකුව සතු සංචිත අරමුදලෙන් අඩක් පමණ වන ණය මුදලකි.

ගොවි බැංකුවේ ආරම්භක අවධියේ දී ගොවීන් විශාල ප්‍රමාණයක් ගොවි බැංකුව සමඟ ගනු දෙනු කිරීමට පෙළඹී සිටියත්, මේ වන විට තේවනුවර වැනි ග්‍රාම නිලධාරී වසම්වල ගොවීන් ස්වෝත්සාහයෙන් වගා කටයුතු කරන බව දක්නට ලැබුණි. මෙම ගොවිජන සේවා බල ප්‍රදේශයට අයත් ගොවි සංවිධාන 28ම ආරම්භයේ දී ගොවි බැංකුව සමඟ ගණුදෙනු කළත්, මේ වන විට ණය ගණු දෙනු සඳහා ඉදිරිපත් වන්නේ ගොවි සංවිධාන 14-15ක් අතර ප්‍රමාණයක් බව දැනගත හැකි විය.

වගා ණය ලෙස 2010-2011 මහ කන්නය තුළ දී ගොවීන් 177කට රු. 1,363,189/-ක් ලබා දී තිබේ. 2011 යල කන්නය තුළ දී ගොවීන් 110 කට රු. 772,224/-ක් ලබා දී ඇත. ඒ අනුව, මහ කන්නය තුළ දී යල කන්නයට වඩා වැඩි ගොවීන් ප්‍රමාණයකට වැඩි ණය

24190



පුස්තකාලය
LIBRARY
හෙ.කො ගො,ප.පු.ආ
HARTI

ප්‍රමාණයක් නිකුත් කොට ඇති බව පෙනේ. සාමාන්‍යයෙන් වැඩි ගොවීන් ප්‍රමාණයක් ලබා ගෙන ඇති සාමාන්‍ය ණය ප්‍රමාණය රු. 15,000/- ක් පමණ වෙයි.

ව්‍යාපෘති ණය ලබා දී ඇත්තේ කෙසෙල් වගාව, සත්ත්ව පාලනය (කුකුළු) හා අඹ වගාව යන කාර්යයන් සඳහා ය. මේ වන විට, ව්‍යාපෘති ණය ලෙස ගොවීන් 44 දෙනෙකු සඳහා රු. 1,080,000/-ක මුදලක් ලබා දී ඇත. ගොවීන් 40කට කෙසෙල් වගාව සඳහාත්, ගොවීන් 3 කට සත්ත්ව පාලනය සඳහාත්, එක් ගොවියෙකුට අඹ වගාව සඳහාත් මෙම ණය නිකුත් කොට තිබේ.

ව්‍යාපෘති ණය ලෙස මෙතෙක් නිකුත් කොට ඇති වැඩිම ණය මුදල රු. 50,000/-ක් වෙයි. එම ප්‍රමාණය ගොවීන් කිහිප දෙනෙකු ලබා ගෙන ඇත. ව්‍යාපෘති ණය වසරින් අය කර ගැනීමේ පදනම මත ලබා දී තිබේ. දෙපාර්තමේන්තුවෙන් ආරම්භ කොට ඇති ව්‍යාපෘති ණය ලෙස ලක්ෂයක් දීමේ නව ක්‍රියාමාර්ගය යටතේ ණය ලබා දීමට සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා කලින් ණය ලබා ගෙන හොඳින් ගෙවා ඇති කණ්ඩායම් කිහිපයක් කැඳවා ඇතත් ඒ සඳහා කැමැත්ත දක්වා ඇත්තේ ගොවීන් දෙදෙනෙකු පමණි.

**වගු අංක 3.3: පුත්තලම - තබ්බෝව ගොවි බැංකුව මගින් නිකුත් කල ණය වටිනාකම : 2001-2010**

| වර්ෂය | වගා ණය ප්‍රමාණය | | | ව්‍යාපෘති ණය (රු) | නිකුත් කල මුළු ණය වටිනාකම (රු) | ණය ලබාගත් ගොවීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| | යල (රු) | මහ (රු) | එකතුව (රු) | | | |
| 2001 | 929,015 | 2,330 | 931,345 | - | 931,345 | 150 |
| 2002 | 195,375 | 519,295 | 714,670 | - | 714,670 | 140 |
| 2003 | 78,081 | 916,700 | 994,781 | - | 994,781 | 131 |
| 2004 | 175,091 | 761,482 | 936,573 | - | 936,573 | 109 |
| 2005 | 467,612 | 1,231,581 | 1,699,193 | 180,000 | 1,879,193 | 191 |
| 2006 | 470,950 | 1,355,472 | 1,826,423 | 1,038,900 | 2,865,323 | 299 |
| 2007 | 626,926 | 1,487,699 | 2,114,625 | 600,000 | 2,714,625 | 359 |
| 2008 | 1,304,069 | 1,438,188 | 2,742,258 | 495,000 | 3,237,258 | 383 |
| 2009 | 1,119,845 | 1,811,701 | 2,931,546 | 650,000 | 3,581,546 | 344 |
| 2010 | 368,432 | 929,250 | 1,297,682 | 135,000 | 1,432,682 | 169 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

වගු අංක 3.4: සංචිත වටිනාකමට සාපේක්ෂව පුත්තලම -තබ්බෝව ගොවි බැංකුව මඟින් නිකුත් කළ ණය වටිනාකම: 2001-2010

| වර්ෂය | නිකුත් කළ මුළු ණය වටිනාකම (රු) | සංචිත වටිනාකම (රු) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| 2001 | 931,345 | 1,375,463 | 67.7 |
| 2002 | 714,670 | 1,535,349 | 46.5 |
| 2003 | 994,781 | 1,695,616 | 58.6 |
| 2004 | 936,573 | 1,852,317 | 50.5 |
| 2005 | 1,879,193 | 2,058,120 | 91.3 |
| 2006 | 2,865,323 | 2,531,721 | 113.1 |
| 2007 | 2,714,625 | 3,078,944 | 88.1 |
| 2008 | 3,237,258 | 3,218,192 | 100.5 |
| 2009 | 3,581,546 | 3,434,735 | 104.2 |
| 2010 | 1,432,682 | 2,640,041 | 54.2 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

## 3.1.5 ණය අයවීම

ගොවීන්ට ලබා දී ඇති වගා ණය 100%ක් ම සාර්ථකව අඛණ්ඩව අය කර ගැනීමට මෙම ගොවි බැංකුව ක්‍රියා කර ඇත. කෙසේ වූව ද, 2010 වර්ෂය තුළ නිකුත් කළ වගා ණයවලින් එම වර්ෂය තුළ අය කර ගෙන ඇති ප්‍රමාණය 98.7%කි (වගු අංක 3.5). මෙම බැංකුව ව්‍යාපෘති ණයවලට අදාළව 2006 වර්ෂය තුළ දී අය කර ගත් මුදල ඉතා අඩු ප්‍රමාණයක් වන නිසා සමස්ත ණය අයවීම 63.8%ක් තරම් පහළ මට්ටමකට බැස තිබේ. මෙම ව්‍යාපෘති ණය ලබා දෙන්නේ වසරක් හෝ ඊට වැඩි කාලයකට බැවින් එම වර්ෂය තුළ දී අයවන ප්‍රමාණය අඩු ප්‍රමාණයකි. එම නිසා ව්‍යාපෘති ණය අයවීම වාර්ෂිකව දැක්විය නො හැකි අතර එය හැරුණු කොට මෙම ගොවි බැංකුවේ සමස්ත ණය අයවීම ඉතා සාර්ථක බව දැක්විය හැකි ය. ණය ගෙවීමට නියමිත කාලය පැමිණීමත් සමඟ මෙන් ම ගෙවීම් ප්‍රමාද වූ විට කෘ.ප.නි.ස. මාර්ගයෙන් ලිපි යවා අය කරවා ගැනීමට කටයුතු කරන නිසාත්, මාසික ප්‍රගති සාකච්ඡාවන්හි දී හිඟ ණය පිළිබඳව සියළු දෙනාගේ අවධානයට ලක් කරවන නිසාත්, මෙම ගොවි බැංකුවට ණය ගෙවීම්වල ප්‍රගතිය ඉහළ මට්ටමකට නංවා ගැනීමට හැකිව තිබේ. කෙසේ වූව ද, ඇතැම් කෘ.ප.නි.ස. වරුන් ඉහළ සහයෝගයක් ලබාදෙන අතර ඇතැම් අයගේ සහයෝගය මඳ බව දැන ගත හැකි විය.

වගු අංක 3.5: පුත්තලම - තබ්බෝව ගොවි බැංකුවේ ණය අයවීම: 2001-2010

| වර්ෂය | ණය වර්ගය | | | | අය කර ගත් මුළු ණය වටිනාකම (රු) | වර්ෂයට අදාළ ව නිකුත් කළ මුළු ණය වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|---|---|---|
| | වගා ණය (රු) | ප්‍රතිශතය (%) | ව්‍යාපෘති ණය (රු) | ප්‍රතිශතය (%) | | |
| 2001 | 931,345 | 100.00 | - | - | 931,345 | 100.00 |
| 2002 | 714,670 | 100.00 | - | - | 714,670 | 100.00 |
| 2003 | 994,781 | 100.00 | - | - | 994,781 | 100.00 |
| 2004 | 936,573 | 100.00 | - | - | 936,573 | 100.00 |
| 2005 | 1,699,193 | 100.00 | - | - | 1,699,193 | 90.42 |
| 2006 | 1,826,423 | 100.00 | 2,068 | 0.20 | 1,828,491 | 63.81 |
| 2007 | 2,114,625 | 100.00 | - | - | 2,114,625 | 77.90 |
| 2008 | 2,742,258 | 100.00 | - | - | 2,742,258 | 84.71 |
| 2009 | 2,931,546 | 100.00 | 103,112 | 15.86 | 3,034,658 | 84.73 |
| 2010 | 1,280,762 | 98.70 | 68,693 | 50.88 | 1,349,455 | 94.19 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

## 3.1.6 ද්‍රව්‍ය ණය ලබා දීම

ලබා ගන්නා ණය මුදලින් 20%ක් මුදලින් දිය හැකි වුව ද, ඉන් 100%ක් ම දෙනු ලබන්නේ ගොවිජන සේවා අලෙවි සළෙහි ඇති රසායනික තෙල්, පොහොර, බීජ හා උපකරණ (හේස්ප්‍රේ රසායනික ඉසින ටැංකි හා උදළුතල) මඟිනි.

මෙම ගොවිජන සේවා මධ්‍යස්ථානය තුළ පිහිටුවා ඇති අලෙවි සැලට සී.අයි.සී. සමාගමෙන් විකුණා මුදල් ගෙවීමේ පදනම මත කෘෂි රසායන ද්‍රව්‍ය ලබා ගනී. එම නිසා, ඔවුන්ට ලැබෙන්නේ 10%ක පමණ ඉතා අඩු වට්ටමකි. කම්ටුව මඟින් එම රසායනික ද්‍රව්‍ය ගොවීන්ට ලබාදීමේ දී ගොවියාට ලබාදෙන්නේ 5%ක වට්ටමකි. මේ නිසා, කෘෂි රසායන ද්‍රව්‍යවල මිල බාහිර වෙළෙඳසැල්වලට වඩා ඉහළ ගොස් තිබේ. විශේෂයෙන් ම, තබ්බෝව ගොවි ජනපදයෙ හි සම්මුඛ සාකච්ඡාවන්ට සහභාගී කරගත් ගොවීන් සියළුම දෙනාගේ අදහස වූයේ ගොවිජන සේවා මධ්‍යස්ථානය මඟින් ලබා දෙන රසායනික ද්‍රව්‍ය බාහිර වෙළඳසැල්වලට වඩා රු. 200/-ක්, 300/-ක් පමණ මිලෙන් වැඩි වන බවයි. එම නිසා, ඔවුහු කි.මී. 20ක් පමණ ඈතින් පිහිටි සාලියවැව හා කි.මී. 40ක් ඈතින් පිහිටි නොච්චියාගම යන ප්‍රදේශවල වෙළෙඳසැල්වලින් ඒවා අඩු මිලට ගැනීමට පුරුදුව සිටිති.

සමීක්ෂණයට භාජනය වූ ගොවීන්ගෙන් වැඩි පිරිසක් ප්‍රකාශ කළේ ගොවි බැංකුවෙන් ලබාදෙන කෘෂි රසායන ද්‍රව්‍ය මිල බාහිර වෙළෙඳසැල්වලට වඩා ඉතා අධික නිසාත්, නිසි වේලාවට අවශ්‍ය ද්‍රව්‍ය ලබාගත නො හැකි නිසාත්, තමන් ද්‍රව්‍ය ණය සඳහා අකමැති බවයි. එම නිසා, මුදලින් ප්‍රමාණවත් ණය මුදලක් ලබා දෙන්නේ නම් වඩා අඩු මුදලකට එම ද්‍රව්‍ය පිටතින් ලබා ගත හැකි බවත්, සී සෑම ආදී මුදලින් ගෙවිය යුතු කටයුතු සඳහා ගොවි බැංකු ණය උපයෝගී කර ගත හැකි බවත්, ගොවීන්ගේ අදහස විය. ගොවීන් ගොවි බැංකුව හරහා එම ද්‍රව්‍ය මිල දී ගැනීමට ඉදිරිපත්වීමට හේතු වූ කරුණු ලෙස ඔවුන්ට ප්‍රවාහන අපහසුතා

නිසා ඉතා ඈතින් පිහිටි බාහිර වෙළඳසැල් වෙත යැමට ක්‍රමයක් නො තිබීමත්, ණය අවශ්‍යතාවය කෙසේ හෝ ඉටු කර ගත යුතුවීමත් යන කරුණු බලපා තිබුණි.

### 3.1.7 කණ්ඩායම් ක්‍රමය

මෙම ගොවි බැංකුවෙ හි පස් දෙනාගේ කණ්ඩායම් ක්‍රමය ක්‍රියාත්මක වන අතර එවැනි කණ්ඩායම් 99ක් තිබේ. වඩාත් ඉහළ ආදායම් ලබන තබ්බෝව වැනි ප්‍රධාන වාරි ප්‍රදේශයන් හි කණ්ඩායම් හි ඇතැම් සාමාජිකයින් ණය නො ගෙවීම නිසා අනෙක් සාමාජිකයින්ට ණය ලබා ගත නො හැකිවීම හේතුවෙන් කණ්ඩායම් ක්‍රමය කෙරෙහි අප්‍රසාදයට පත්ව කණ්ඩායම්වලින් පමණක් නොව ණය ලබා ගැනීමේ ක්‍රියාවලියෙන් ද ඉවත්ව ඇති බව ගොවි කණ්ඩායම් සමඟ කළ සාකච්ඡා ඇසුරින් පැහැදිලි විය. එසේ වුව ද, වඩාත් කුඩා වාරිමාර්ග ප්‍රදේශවල කණ්ඩායම් ක්‍රමය ණය ලබා ගැනීමේ සංවිධානාත්මක ක්‍රමෝපායයක් පමණක් නොව, ණය අය කර ගැනීම සඳහා භාවිතා කළ හැකි මෙවලමක් ලෙස සාර්ථකව භාවිතා කෙරේ.

කෙසේ වුව ද, කණ්ඩායමේ එක් අයෙකු ණය නො ගෙවූ විට ඉතිරි අයටත් ණය ලබා ගත නොහැකි නිසා මෙම ක්‍රමය උත්සාහයෙන් ඉදිරියට යන ගොවියාට බාධාවක් විය. එම නිසා, කලට වේලාවට ණය ගෙවා ඉදිරි කන්නයට ණය බලාපොරොත්තු වන ගොවීන්ට පවා ණය නිසි වේලාවට ලබාගත නොහැකි වීමෙන් විවිධ අපහසුතාවන්ට මුහුණදීමට සිදු වේ. සාමාජිකයන් විශ්වාසයෙන් යුතුව කලට වේලාවට ණය ගෙවන කණ්ඩායම්වල ගොවීන් මෙම ක්‍රමයට කැමැත්ත ප්‍රකාශ කළ අතර ඔවුන්ගේ අදහස වූයේ ණය ගෙවීම සඳහා කණ්ඩායමේ අන් අය නිතරම මතක් කරන නිසා තමන්ට ඒ පිළිබඳව වගකීමක් ඇති වන බවත්, අනෙක් බැංකුවල මෙන් ඇප සඳහා කරදරවීමට සිදු නොවන බවත් ය.

### 3.1.8 ණය සීමාවන්

වගා ණය යටතේ රු. 25,000/-ක් දක්වා වූ මුදලක් ලබාදිය හැකි වුව ද, බොහෝ ගොවීන් ලබා ගෙන ඇත්තේ රු. 15,000/-ක් තරම් වූ ප්‍රමාණයකි. ද්‍රව්‍ය ණය පමණක් දීම මෙයට හේතුවයි. එසේ වුව ද, වගා කටයුතු සඳහා යන්ත්‍ර සූත්‍ර බෙහෙවින් භාවිතා කරනු ලබන තබ්බෝව වැනි ව්‍යාපාරයන් හි ගොවීන් එම වියදම් පියවා ගැනීමට මුදලින් ද යම් කිසි ප්‍රමාණයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටියත් එය සැපිරීමට නො හැකි වී තිබේ. වී වගාවේ අක්කරයක් සඳහා රු. 20,000-25,000 අතර මුදලක් වැය වන නිසා දැනට ලබාදෙන ණය මුදල ඉහළ නැංවිය යුතු බවත්, මුදලින් ද ප්‍රමාණවත් ණය මුදලක් ලබාදීම සුදුසු බවත් ගොවීන්ගේ අදහස විය. ව්‍යාපෘති ණය යටතේ ද මේ දක්වා ලබා දී ඇති උපරිම ණය ප්‍රමාණය රු. 50,000/ කි. ව්‍යාපෘති සඳහා ගොවීන් ඊට වඩා ඉහළ ණය ප්‍රමාණයක් ඉල්ලා නොමැති බව පෙනේ. එසේ වුව ද, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ පෙළඹවීම මත රු. ලක්ෂය දක්වා ව්‍යාපෘති ණය ලබාදීමට දරනු ලැබූ උත්සාහය යටතේ ඉදිරිපත් ව ඇත්තේ දෙදෙනෙකු පමණි. ගොවීන්ට ව්‍යාපෘති ණය වාර්තා අනුමත කර ගැනීමට ඇති දුෂ්කරතාවය මෙයට හේතුවයි.

### 3.1.9 ගොවි බැංකුවෙ හි වර්තමාන ප්‍රගතිය /දුර්වලත්වය සඳහා බලපෑ සාධක

මෙම ගොවි බැංකුව ප්‍රදේශයේ ගොවීන්ගෙන් 29%ක් පමණ ප්‍රමාණයක සාමාජිකත්වය සහිතව පවත්වාගෙන යනු ලබන අතර සාමාජිකයින්ගෙන් 40%ක පමණ ප්‍රමාණයකට පමණ ණය සපයනු ලබයි. (2010-2011 මහ කන්නයට අනුව) ආරම්භක ප්‍රාග්ධනය ලෙස

ලබා දුන් රු. 1,062,455ක් වූ මුදල 2010 වසර අවසානය වන විට ගෙවා නිමකර ඇති අතර තම අරමුදල්වලින් පමණක් ක්‍රියාත්මක වෙයි.

තම අරමුදල් ශක්තිමත් කර ගැනීම සඳහා පමණක් නොව, ස්වශක්තියෙන් නැඟී සිටීම සඳහා ගොවි බැංකුවට හැකිවීම සඳහා නිසි පරිදි ණය අයකර ගැනීම මූලික හේතුවක් වී තිබේ. ණය ගෙවීම පිළිබඳව පරිපාලනය විසින් නිසි පරිදි ප්‍රගති සමාලෝචනයට ලක් කිරීම, ගෙවිය යුතු අවස්ථාවේ ගොවීන්ට ලිපි මඟින් දැනුම් දී සිටීම හා ඒවා අයකර ගැනීම සඳහා කෘ.ප.නි.ස. වරුන් උනන්දු කරවීම ද ඉහළ ණය අයකර ගැනීමේ ප්‍රගතියට බලපා ඇත.

ගොවි බැංකු සාමාජිකයින් දිගින් දිගටම ණය ගන්නන් ලෙස බැඳ තබා ගැනීමට ගොවිජන බැංකුව අසමත්ව ඇති අතර ඒ සඳහා බලපෑ හේතු කිහිපයකි. ඉන් ප්‍රධාන එකක් වන්නේ ඒ යටතේ ණය ලබා දෙනු ලබන ගොවිජන සංවර්ධන අලෙවි සැලෙ හි ඇති කෘෂිරසායන ගොවීන්ට සැලකිය යුතු කොමිස් මුදලක් සහිතව ලබාදීමට අපොහොසත් වීමයි. ගොවි බැංකුවෙන් 5%ක් හෝ ඊටත් වඩා අඩු කොමිස් මුදලක් යටතේ දෙනු ලබන එම ද්‍රව්‍ය පිට කඩවලින් විශේෂයෙන් ම සාලියපුර හා තොව්වියාගම පිහිටි පෞද්ගලික කෘෂි රසායන වෙළෙඳසැල්වලින් 20% හෝ 25%ක කොමිස් මුදලක් සහිතව ඔවුන්ට ලබා ගත හැකි ය. පිට කඩවලින් ලබා ගැනීම සැලකිය යුතු ලෙස ලාභදායක නිසා කි.මී. 20-40 ක් පමණ දුරකින් පිහිටි එම ප්‍රදේශ වෙත ගමන් කර අධික බස් ගාස්තු ද දරා ගනිමින් (තොව්වියාගමට යාමට හා ඒමට රු. 120) දින භාගයක් පමණ ඒ වෙනුවෙන් ගත කොට ඒවා ලබා ගැනීමට තබ්බෝව ප්‍රදේශයේ බොහෝ ගොවීහු පුරුදුව සිටිති. ඒ සමඟම ඔවුහු ගොවි බැංකුවේ කටයුතුවලින් ද ඉවත් ව සිටිති.

ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන අලෙවි සැලෙහි ගොවීන්ට අවශ්‍ය වන ආකාරයේ තෙල් වර්ග ද බොහෝ අවස්ථාවල දී නොමැති බව ගොවීන් ගේ අදහස වෙයි. බිත්තර වී වුව ද ඇතැම් කන්නවල පැවතිය ද තවත් සමහර කන්නවල දී නොමැති බව ගොවීහු ප්‍රකාශ කරති.

ගොවි ණය දීමේ දී ගොවීන්ගේ අධික මූල්‍ය වියදම් පියවා ගැනීම සඳහා මුදලින් ද කොටසක් ලබා ගැනීමට ගොවීන් අපේක්ෂා කළ ද එය ඉටු කිරීමට ගොවිජන බැංකුව අපොහොසත් ව ඇත. ලබා දෙන සම්පූර්ණ ණය මුදල ද්‍රව්‍යවලින් පමණක් ලබා දෙයි. ගොවීන්ගේ මෙම අපේක්ෂාව කඩවීම ද ඔවුන් ගොවිජන බැංකුවෙන් ඈත් කර තැබීමට හේතු වී තිබේ. මේ නිසා, කලින් සියළුම ගොවි සංවිධාන (28 ම) නියෝජනය කරමින් ඒවායේ සාමාජිකයින් ගොවි බැංකුවේ කටයුතු හා සම්බන්ධ වූවත් දැන් සිටින්නේ ඉන් 14-15ක අය පමණි.

ගොවීන්ගේ ඉතුරුම් ඉහළ දැමීමට ද ගොවි බැංකුව අසමත්ව ඇති බව පෙනේ. වැඩි ගොවීන් පිරිසක් සෑම කන්නයකදී ම තමන් ලබා ගන්නා ණය ප්‍රමාණයට සරිලන ඉතුරුම් ප්‍රමාණයක් පවත්වා ගැනීමට ක්‍රියාකර ඇති අතර ණය නො ගන්නා බොහෝ කොටස්කරුවෝ ඉතුරුම් ගිණුම් පවත්වාගෙන යාමෙන් වැළකී සිටිති. කොටස් ලබාගත් 710 දෙනෙකුගෙන්, 278 දෙනෙකු පමණක් මේ වන විට ඉතුරුම් පවත්වාගෙන යාමෙන් මෙම කරුණ පැහැදිලි වේ.

### 3.1.10 යෝජනා

1. ණය ලබා ගැනීමේ දී භාවිත කණ්ඩායම් ක්‍රමය, දුප්පත් ගොවීන්ට ණය ලබාදීමේ දී මෙන් ම අයකර ගැනීමේ දී දායක කරගත හැකි ක්‍රමවේදයක් බැවින් එය පවත්වා ගන්නා අතරම එය සාර්ථකත්වයට පත් කරගැනීම සඳහා අවශ්‍ය කණ්ඩායම් හැඟීම් වර්ධනය වන ආකාරයේ පුහුණුවක් ලබාදිය යුතු ය.

2. වර්තමානයේ පවත්නා ආකාරයට විකුණා මුදල් දීමේ පදනම මත ප්‍රදේශයේ අලෙවි ඒජන්තවරුන්ගෙන් කෘෂි රසායනික ද්‍රව්‍යයන් මිල දී ගැනීමේ දී අඩු කොමිස් මුදලක් ඒ සඳහා ලැබෙන අතර ගොවීන්ට ලබාදිය හැකි වන්නේ සුළු වාසියකි. එම නිසා, දිස්ත්‍රික් මට්ටමෙන් මැදිහත්වීම මත සියළු ගොවිජන මධ්‍යස්ථානවලට අවශ්‍ය ද්‍රව්‍යයන් තොගයක් ලෙස එකවර මිල දී ගැනීමට පියවර ගැනීම තුළින් වැඩි කොමිස් මුදලක් ලබා ගැනීමෙන් ගොවීන්ට ඉහළ ප්‍රතිලාභ ලබාදීමට පියවර ගත යුතු ය.

3. අවශ්‍යතා සඳහා මුදලින් කිසියම් ණය ප්‍රමාණයක් ලබා නොදීම, ගොවිජන සංවර්ධන අලෙවි සැලෙ හි ගොවීන්ට අවශ්‍ය කරන ආකාරයේ කෘෂි රසායනික ද්‍රව්‍ය නොමැතිවීම, එමෙන් ම, අවශ්‍ය කරන ආකාරයේ බිත්තර වී ඇතුළු අනෙක් බීජ වර්ග ගොවිජන සංවර්ධන අලෙවි සැලෙහි සෑම කන්නයකදීම නොමැතිවීම යනා දී කරුණු හේතුවෙන් කලින් බැංකු ණය ලබා ගත් බොහෝ දෙනෙකු ඉන් ඉවත්ව ගොස් ඇති නිසා මෙම අවශ්‍යතා සැපිරීම මඟින් ඔවුන් නැවත ගොවි බැංකු සාමාජිකයින් බවට පත් කර ගැනීමට කටයුතු සැලසීම.

4. ගොවි බැංකුවෙ හි භාවිතය සඳහා පරිඝනකයක් ලබා දී ඇතත් වසර 3කට ඉහත දී සිට ගොවිජන බැංකු සහායක ලෙස කටයුතු කරන කෘ.ප.නි.ස. මහත්මියට එය ක්‍රියා කරවීම හා සම්බන්ධ පුහුණුවක් ලැබී නොමැති නිසා එය ප්‍රයෝජනයට ගත නො හැකි බැවින් ඒ සඳහා ප්‍රමාණවත් පුහුණුවක් ලබාදීම.

5. ණය නිකුත් කරනු ලබන කාර්යයන් බහුල අවස්ථාවන් හි ගොවිජන බැංකුවෙ හි කාර්යයන් එක් අයෙකුට පමණක් ඉටු කිරීම අපහසු නිසා තවත් කෘ.ප.නි.ස. වරයෙකු කාලීන වශයෙන් හෝ එයට අනුයුක්ත කිරීම සඳහා පුහුණු කිරීම.

6. ගොවි බැංකු සාමාජිකයින් ඉතිරි කිරීම් සඳහා පෙළඹවීම තුළින් ණය අරමුදල් තර කිරීමට කටයුතු කිරීම.

7. ගොවි බැංකුවෙ හි තැන්පත් කොට ඇති මුදල්වලින් රු. 2000ක් හෝ ඊට වැඩි මුදලක් ආපසු ගැනීමේ දී දින කිහිපයකට කලින් දැනුම් දීමට සිදුවීම හදිසි ගොවි ණය අවශ්‍යතා සපුරා ගැනීමට ඇති අවශ්‍යතාවත් අඩපන කරවන කරුණක් බැවින් කලින් දැනුම් නොදී ලබා ගත හැකි මුදල් ප්‍රමාණය ඊට වඩා ඉහළ මට්ටමකට පත් කිරීම.

## 3.2 මහකුඹුක්කඩවල ගොවි බැංකුව

### 3.2.1 හැඳින්වීම

පුත්තලම දිස්ත්‍රික්කයට අයත් මහකුඹුක්කඩවල ගොවිජන සංවර්ධන බල ප්‍රදේශය ආණමඩුව මැතිවරණ කොට්ඨාසයට මෙන් ම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට ද අයත් වන්නකි. වියළි දේශගුණයකින් යුත් මෙම ගොවිජන සංවර්ධන බල ප්‍රදේශය වඩාත් හුදකලා වූ ප්‍රදේශයක පිහිටි අතර ගොවි බැංකුව ඇතුළත් ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානය හලාවත - පුත්තලම ප්‍රධාන මාර්ගයේ සිට කි.මී. 12ක් පමණ දුරින් ද පුත්තලම – කුරුණෑගල මාර්ගයේ සිට කි.මී. 10ක් පමණ දුරින් ද පිහිටා තිබේ.

මධ්‍ය පරිමාණ වැව් හතරකින් සහ කුඩා පරිමාණ වැව් රාශියකින් සමන්විත මෙම බල ප්‍රදේශයේ ජනතාවගෙන් වැඩි ප්‍රමාණයකගේ ප්‍රධාන ජීවනෝපාය වී ගොවිතැන හා සත්ත්ව පාලනය වෙයි. ප්‍රදේශයේ ඇති මුළු ගොවි පවුල් සංඛ්‍යාව 4,600කි. මෙම සෑම වැවක් යටතේ ම මහ කන්නයේ වී වගාව සිදු කරන අතර යල කන්නයේ ද ජලය ප්‍රමාණවත්ව ඇති හැම අවස්ථාවකදී ම වී වගාව සිදු කරයි. සුළු පිරිසක් වූ ගොවීන් හැරුණු විට බොහොමයක්

ගොවිහු අක්කර 3-5 අතර ප්‍රමාණයක් වගා කරති. ඒ හැරුණු විට, වැඩි ගොවි පවුල් ප්‍රමාණයකට අක්කර 3-5 අතර ප්‍රමාණයක් ගොඩ ඉඩම් ද ඇති අතර ඒවායේ පොල්, කජු වැනි වගාවන් සිදු කොට තිබේ. සත්ත්ව පාලනය සඳහා වඩාත් උචිත භාවයක් ඇති මෙම ප්‍රදේශයේ බොහෝ පවුල් හරකුන්, එළුවන් වැනි සතුන් ඇති කිරීම ද සිදු කරති. ඇතැම්හු කිරි ගැනීම සඳහාත්, වැඩි දෙනෙක් වැඩ ගැනීම හා මසට විකිණීම සඳහාත් හරකුන් ඇති කරති. කලට වේලාවට ප්‍රමාණවත් තරම් වර්ෂාව නො ලැබීම වැනි ස්වභාවික හේතූන් පැවතිය ද කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ප්‍රමාණවත් සම්පත් ප්‍රදේශය තුළ පවතී.

මහකුඹුක්කඩවල ගොවි බැංකුව ආරම්භ කරන ලද්දේ 1999 වසරේ දී ය. ප්‍රාග්ධන අරමුදල් ලෙස වාර කිහිපයක දී රු. ලක්ෂ 5ක් ලැබී ඇති අතර එය පොලියක් සමඟ 2010 වසරේ දී ගෙවා අවසන් කොට තිබේ.

### 3.2.2 සාමාජිකත්ව වර්ධනය

ගොවි බැංකුවේ 2010 වසර වන විට සාමාජිකත්වය ලද කුඩා කණ්ඩායම් සංඛ්‍යාව 173 වන අතර ඉන් බහුතරය පස් දෙනෙකුගෙන් සමන්විත කුඩා කණ්ඩායම් වේ. මෙයට අමතරව, සාමාජික සංඛ්‍යාව 6ක් වන කුඩා කණ්ඩායම් කිහිපයක් ද පවතී. 2001 වර්ෂය වන විට ගොවීන් 151ක් මෙහි සාමාජිකත්වය ලබා තිබූ අතර එය ප්‍රදේශයේ මුළු පවුල් සංඛ්‍යාවෙන් 2.5%ක් (එනම් ප්‍රදේශයේ ගොවි පවුල් සංඛ්‍යාවෙන් 3%ක්) විය. ගොවි බැංකුවේ ඉහළම සාමාජික වර්ධනයක් පෙන්නුම් කළ 2006 වර්ෂය වන විට ප්‍රදේශයේ මුළු ගොවි පවුල් සංඛ්‍යාවෙන් 23.7%ක් ගොවි බැංකුවේ කොටස් මිල දී ගෙන තිබුණි. 2005 වර්ෂයට සාපේක්ෂව මෙහි වර්ධනය 8.6%ක් විය. කෙසේ වුව ද, 2007 වර්ෂයෙන් පසුව ගොවි බැංකුවේ කොටස් මිල දී ගත් ගොවීන් සංඛ්‍යාවේ වර්ධනය ඉතා මන්දගාමී තත්ත්වයක් පෙන්නුම් කළ අතර 2010 වර්ෂය වන විට ප්‍රදේශයේ මුළු ගොවි පවුල් සංඛ්‍යාවෙන් 26.6%ක් කොටස් මිල දී ගෙන ඇති බව වාර්තා අනුව පැහැදිලි වේ (වගු අංක 3.6).

**වගු අංක 3.6: මහකුඹුක්කඩවල ගොවි බැංකුවේ සාමාජිකත්වය වර්ධනය: 2001-2010**

| වර්ෂය | සාමාජිකයන්/ කොටස් හිමියන් ගණන | කොටස් වටිනාකම (රු) | ප්‍රදේශයේ පවුල් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස (%) | ප්‍රදේශයේ ගොවි පවුල් සංඛ්‍යාවේ (%) ලෙස |
|---|---|---|---|---|
| 2001 | 151 | 20,700 | 2.59 | 11.6 |
| 2002 | 209 | 30,900 | 3.58 | 12.5 |
| 2003 | 396 | 110,400 | 6.79 | 13.3 |
| 2004 | 509 | 172,000 | 8.73 | 14.0 |
| 2005 | 765 | 324,300 | 13.12 | 14.7 |
| 2006 | 1,196 | 528,300 | 20.50 | 23.4 |
| 2007 | 1,271 | 601,000 | 21.79 | 26.0 |
| 2008 | 1,292 | 650,900 | 22.15 | 28.6 |
| 2009 | 1,340 | 722,200 | 22.97 | 28.6 |
| 2010 | 1,342 | 758,600 | 23.01 | 28.8 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

### 3.2.3 ගොවි බැංකුවේ ඉතුරුම්, කොටස් ප්‍රාග්ධනය හා ලාභාංශ වර්ධනය

ගොවි බැංකුව සඳහා ආරම්භක ප්‍රාග්ධනය වශයෙන් රු. ලක්ෂ 5ක අරමුදලක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් වාර කිහිපයක දී ලබා දී ඇත. මෙයට අමතරව, 2005 වර්ෂය තුළ දී ගොවීන්ට ණය ලබා දීම සඳහා අරමුදල් ප්‍රමාණවත් නොවීම මත රු. ලක්ෂ 2ක ප්‍රාග්ධනයක් නාත්තණ්ඩිය තබ්බෝව ගොවි බැංකුව මගින් ලබා ගෙන ඇති අතර 2008 වර්ෂය තුළ දී එම මුදල ආපසු පියවා තිබේ. එසේ ම, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති රු. ලක්ෂ 5ක සම්පූර්ණ මුදල 2010 වර්ෂය වන විට ගෙවා නිම කිරීමට මෙම ගොවි බැංකුව පියවර ගෙන ඇත. ගොවි බැංකුව තුළ ගොවීන් විසින් මිල දී ගත් මුළු කොටස් වටිනාකම 2001 වර්ෂය වන විට රු. 20,700ක් ව පැවති අතර 2010 වර්ෂය වන විට එම ප්‍රමාණය රු. 758,600 දක්වා වර්ධනය වී තිබේ. ගොවි බැංකුව විසින් ගොවීන්ගේ පුද්ගල හා කුඩා කණ්ඩායම් තැන්පත් ගිණුම්වල වාර්ෂිකව ඉතිරි කළ මුදල් ද, ගොවීන්ගේ ණය අවශ්‍යතා සඳහා යොදා ගනු ලැබේ. මේ අනුව, 2001 වර්ෂයේ දී රු. 17,385ක් වූ පුද්ගල තැන්පතු ගිණුම්වල වටිනාකම 2010 වර්ෂය වන විට රු. 29,164ක් දක්වා වර්ධනය වී තිබේ. 2001 වර්ෂයේ දී කුඩා කණ්ඩායම් නො තිබූ අතර කුඩා කණ්ඩායම් ආරම්භ කළ 2004 වර්ෂයේ දී කුඩා කණ්ඩායම් ගිණුම්වල රු. 84,190ක් වූ මුදලක් ඉතිරි කර තිබුණි. 2010 වර්ෂය වන විට එම ඉතිරි කිරීම් අරමුදල රු. 406,328ක් දක්වා වර්ධනය වී ඇත. මෙම ගොවි බැංකුවේ පුද්ගල තැන්පතු මත ණය ලබාදීමට වඩා කුඩා කණ්ඩායම්වල ඇති ඉතිරි කිරීම් මත ණය ලබාදීම සඳහා ගොවීන් යොමු කර තිබීම මෙසේ කුඩා කණ්ඩායම් තැන්පත් මුදල් වර්ධනය වීමට හේතුවකි. එසේ ම, ගොවි බැංකුවේ සමුච්ඡිත අරමුදල එනම්, ලාභාංශ මත ගොඩනැගුණු අරමුදල 2001 දී රු. 6,502 ක් වූ අතර මෙම අරමුදල 2010 වර්ෂය වන විට රු. 540,654ක් දක්වා ඉහළ ගොස් තිබේ. මේ අනුව, ගොවි බැංකුවේ ණය ලබාදීම සඳහා යොදා ගත හැකි සමස්ත සංචිත වටිනාකම 2001 වර්ෂයේ දී රු. 149,587 සිට 2010 වර්ෂය වනවිට රු. 1,734,746 දක්වා (වගු අංක 3.7) වාර්ෂිකව 117%කින් වර්ධනය වී ඇත. මේ අනුව, මෙම ගොවි බැංකුව මේ වනවිට ගොවීන්ට ණය ලබාදීම සඳහා තැන්පත් මුදල්, කොටස් ප්‍රාග්ධනය හා සමුච්ඡිත අරමුදලේ ඇති මුදල්වලින් ගොඩනැගුණු අරමුදල් යොදා ගනිමින් ස්වාධීනව ක්‍රියා කිරීමට හැකිවීම ඉහළ ප්‍රගතියක් බව සැලකිය හැකි ය.

**වගු අංක 3.7: මහකුඹුක්කඩවල ගොවි බැංකුවේ අරමුදල් වර්ධනයඃ 2001-2010**

| වර්ෂය | මූලික ප්‍රාග්ධනය (රු) | කොටස් ප්‍රාග්ධනය (රු) | පුද්ගල තැන්පතු වටිනාකම (රු) | කුඩා කණ්ඩායම් තැන්පතු වටිනාකම (රු) | මුළු තැන්පතු වටිනාකම (රු) | සමුච්ඡිත අරමුදල (රු) | සංචිත වටිනාකම (රු) |
|---|---|---|---|---|---|---|---|
| 2001 | 105,000 | 20,700 | 17,385 | - | 17,385 | 6,502 | 149,587 |
| 2002 | 200,000 | 30,900 | 28,750 | - | 28,750 | 14,771 | 274,421 |
| 2003 | 500,000 | 110,400 | 28,100 | - | 28,100 | 19,463 | 657,963 |
| 2004 | 500,000 | 172,000 | 26,731 | 84,190 | 110,921 | 41,742 | 824,663 |
| 2005 | 700,000 | 324,300 | 24,726 | 161,365 | 186,091 | 85,123 | 1,295,514 |
| 2006 | 700,000 | 528,300 | 23,726 | 269,190 | 292,916 | 144,862 | 1,666,078 |
| 2007 | 700,000 | 601,000 | 25,626 | 321,277 | 346,903 | 285,011 | 1,932,914 |
| 2008 | 500,000 | 650,900 | 33,422 | 352,162 | 385,584 | 383,313 | 1,919,797 |
| 2009 | 500,000 | 722,200 | 30,164 | 390,018 | 420,182 | 453,396 | 2,095,779 |
| 2010 | - | 758,600 | 29,164 | 406,328 | 435,492 | 540,654 | 1,734,746 |

ප්‍රාග්ධනය යනු: ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගොවි බැංකු වෙත සපයන ලද මුදල
සංචිත යනුඃ ප්‍රාග්ධනය,කොටස් ප්‍රාග්ධනය,තැන්පතු වටිනාකම සහ සමුච්ඡිත අරමුදලේ වටිනාකම් වල එකතුව

මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

### 3.2.4 ණය නිකුත් කිරීම

ගොවි බැංකුව ආරම්භ කළ වර්ෂය වන 1999/2000 මහ කන්නය තුළ ගොවීන් 27 දෙනෙක් සඳහා ණය ලබා දී ඇති නමුත් ඉන් පසු 2001 වර්ෂය තුළ දී ඇති වූ ජල හිඟය නිසා ගොවීන්ට වගා ණය හෝ වෙනත් වර්ගයක ණය නිකුත් කිරීමක් මෙම බැංකුව හරහා සිදු වී නොමැත. ඉන් පසු, 2002 වර්ෂය තුළ දී ගොවීන් 13 දෙනෙකු සඳහා රු. 47,496ක මුදලක් (වගු අංක 3.8) වගා ණය වශයෙන් ලබා දී ඇති අතර නිකුත් කළ මුළු ණය ප්‍රමාණය එම වර්ෂයේ දී පැවති සංචිත වටිනාකමෙන් 17% කි (වගු අංක 3.9). මෙම ගොවි බැංකුව මගින් ගොවීන්ට අවශ්‍ය වගා ණය හා ව්‍යාපෘති ණය ලබා දෙන අතර වගා ණය සම්පූර්ණයෙන් ම ද්‍රව්‍යමය වශයෙන් (එනම් බිත්තර වී, කෘෂි රසායන ද්‍රව්‍ය, පොහොර, ස්ප්‍රේ යන්ත්‍ර හා උදළු තල ආදිය) ලබා දේ. මෙයට අමතරව, මුල් අවධියේ දී ගොවීන්ට ක්ෂණික ණය ලබාදීම ද සිදු වී තිබේ. මෙහි දී, වගා ණය ලබාදෙන්නේ ප්‍රධාන වශයෙන් වී වගාවට වන අතර වෙනත් බෝග සඳහා ණය ඉල්ලුම් කිරීමක් සිදු නොවන බව දක්නට ලැබුණි. වගා ණය උපරිම වශයෙන් රු. 25,000/-ක් දක්වා ලබා ගත හැකි වුවද, මෙහි දී 100%ක් ම ද්‍රව්‍ය වශයෙන් ණය ලබා දීම නිසා ගොවීන් බහුතරයක් ලබාගෙන ඇත්තේ රු. 10,000-12,000 ක් පමණ වූ ණය මුදලක් පමණක් බව හෙළිදරව් විය. චක්‍රලේඛ අනුව වගා ණය ලබාදීමේ දී 20%ක් මුදලින් ලබාදිය හැකි වූවත්, මේ සඳහා දිස්ත්‍රික් කම්ටුවෙන් අවසර ගැනීමට යාමේ දී විශාල වශයෙන් ප්‍රමාදවීම් සිදුවන නිසා මුදලින් කිසිදු වගා ණය මුදලක් ගොවීන්ට ලබා නොදේ. වගා ණය ලබා දීමේ දී ලබා ගන්නා ණය මුදලින් 1% ආපදා අරමුදලක් වශයෙන් අයකර ගනී. ව්‍යාපෘති ණය යටතේ කජු මද සැකසීම, සහල් සැකසීම, කිරි හරක් ඇති කිරීම යනාදිය වෙනුවෙන් ණය නිකුත්කර තිබේ. ව්‍යාපෘති ණය රු. 25,000/-ට වැඩියෙන් ලබාදීමේ දී දිස්ත්‍රික් කාර්යාලයෙන් අවසර ගතයුතු අතර එහි දී විශාල වශයෙන් ප්‍රමාදවීම් සිදුවන නිසා ගොවීහු රු. 25,000/ක් පමණක් ව්‍යාපෘති ණය ලෙස ලබා ගැනීමට පෙළඹී සිටිති. එසේ වුව ද, රු. 50,000/-ක් ලබාගත් අය ද ඇත. මේ දක්වා ගොවීන් 130 දෙනෙකුට ව්‍යාපෘති ණය ලබා දී තිබේ. මෙම ණය සපයා ඇත්තේ වසරක දී ගෙවා අවසන් කිරීමේ පදනම මත ය. ඒවා ලබා ගැනීමේ දී කණ්ඩායම්වල අනෙක් සාමාජිකයින් ඉතිරි කිරීම් ආදියෙන් සහාය දක්වා ඇති බවක් පෙනේ. ඉහළම ණය මුදලක් ගොවි බැංකුව හරහා නිකුත් කොට ඇත්තේ 2009 වර්ෂයේ දී වන අතර මේ යටතේ ගොවීන් 509ක් සඳහා රු. 3,228,687ක් ණය වශයෙන් ලබා දී ඇත. කෙසේ වූව ද, 2010 වර්ෂයේ දී ණය ඉල්ලුම්කර ඇති ගොවීන් සංඛ්‍යාව පෙර වසරට සාපේක්ෂව 122%කින් අඩු වී ඇති අතර මෙහි දී රු. 1,362,109ක මුදලක් ගොවි බැංකුව හරහා ලබා දී තිබේ. මෙම ගොවි බැංකුවේ ඇති සමස්ත සංචිත වටිනාකම ඉක්මවා ගිය ණය මුදලක් 2004 වර්ෂයේ සිට ගොවීන් වෙනුවෙන් ලබා දී තිබේ. කෙසේ වූව ද, 2005 හා 2010 යන වර්ෂවල දී ගොවි බැංකුවේ සමස්ත සංචිත වටිනාකමට වඩා අඩු මුදලක් ණය වශයෙන් ගොවීන්ට ලබා දී ඇත. වගා කටයුතු කිරීමේ දී ඇතිවන අවිනිශ්චිත බව නිසා වර්ෂාව අඩු කාලවල දී ණය ලබා ගැනීමට ගොවීන්ගේ පෙළඹීම අඩුවීම මෙයට එක් හේතුවක් වේ.

**වගු අංක 3.8: මහකුඹුක්කඩවල ගොවි බැංකුව හරහා ලබාදුන් ණය වටිනාකම: 2001-2010**

| වර්ෂය | වගා ණය ප්‍රමාණය | | | ව්‍යාපෘති ණය (රු) | ක්ෂණික ණය (රු) | නිකුත් කල මුළු ණය වටිනාකම (රු) | ණය ලබාගත් ගොවීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| | යල (රු) | මහ (රු) | එකතුව (රු) | | | | |
| 2001 | - | - | - | - | - | - | - |
| 2002 | 47,496 | - | 47,496 | - | - | 47,496 | 13 |
| 2003 | 154,845 | 91,620 | 246,465 | - | - | 246,465 | 46 |
| 2004 | 35,000 | 299,373 | 334,373 | 527,000 | 75,000 | 936,373 | 106 |
| 2005 | 171,939 | 89,614 | 261,553 | 600,000 | 70,000 | 931,553 | 87 |
| 2006 | 589,299 | 844,949 | 1,434,248 | 225,000 | 15,000 | 1,674,248 | 199 |
| 2007 | 200,475 | 1,684,752 | 1,885,227 | 110,000 | - | 1,995,227 | 344 |
| 2008 | 899,013 | 1,629,093 | 2,528,106 | 150,000 | - | 2,678,106 | 414 |
| 2009 | 974,583 | 1,929,104 | 2,903,687 | 325,000 | - | 3,228,687 | 509 |
| 2010 | 118,160 | 1,193,949 | 1,312,109 | 50,000 | - | 1,362,109 | 229 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

**වගු අංක 3.9: සංචිත වටිනාකමට සාපේක්ෂව මහකුඹුක්කඩවල ගොවි බැංකුව මගින් නිකුත් කළ ණය වටිනාකම: 2001-2010**

| වර්ෂය | නිකුත් කල මුළු ණය වටිනාකම (රු) | සංචිත වටිනාකම (රු) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| 2001 | - | 149,587 | - |
| 2002 | 47,496 | 274,421 | 17.31 |
| 2003 | 246,465 | 657,963 | 37.46 |
| 2004 | 936,373 | 824,663 | 113.55 |
| 2005 | 931,553 | 1,295,514 | 71.91 |
| 2006 | 1,674,248 | 1,666,078 | 100.49 |
| 2007 | 1,995,227 | 1,932,914 | 103.22 |
| 2008 | 2,678,106 | 1,919,797 | 139.50 |
| 2009 | 3,228,687 | 2,095,779 | 154.06 |
| 2010 | 1,362,109 | 1,734,746 | 78.52 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

### 3.2.5 ණය අයවීම

මෙම ගොවි බැංකුව මගින් ණය අයකර ගැනීමේ හැකියාව පිළිබඳව සැලකීමේ දී සමස්තයක් ලෙස වගා ණය අයවීම ඉතා සාර්ථක බව (100%) කිව යුතු ය (වගු අංක 3.10). මෑතකාලීන වර්ෂ අතුරෙන් වගා ණය අයවීම අවම වී ඇත්තේ 2010 වර්ෂයේ දී වන අතර එම වර්ෂය තුළ නිකුත් කළ ණය මුදලෙන් 90%ක් පමණක් අදාළ වර්ෂය තුළ අය වී තිබේ.

ව්‍යාපෘති ණය අයවීම පිළිබඳව සැලකීමේ දී අදාළ වර්ෂයේ නිකුත් කළ ව්‍යාපෘති ණයවලින් අදාළ වර්ෂය තුළදී ම අය වී ඇති මුදල දළ වශයෙන් 20%ක් පමණ වේ. මෙම ප්‍රමාණය අඩුවීමට හේතු වී ඇත්තේ වගා ණය මෙන් මාස 6කින් ව්‍යාපෘති ණය ගෙවා අවසන් කළ යුතු නො වීමයි. ව්‍යාපෘති වෙනුවෙන් ලබා ගන්නා ණය මුදල අනුව ණය ගෙවා නිම කිරීමට වර්ෂයක් හෝ ඊට වැඩි කාලයක් ලැබේ. ක්ෂණික ණය වෙනුවෙන් ලබා දී ඇති ණය මුදලෙන් 2004 හා 2005 වර්ෂවල දී අය වී තිබුණේ 65%කට වඩා අඩු මුදලකි. මේ අනුව ගොවි බැංකුවේ සමස්ත ණය අයවීම වගා ණය පමණක් නිකුත් කළ වර්ෂවල 100%ක් වූ අතර අනෙක් වර්ෂවල එය ඊට වඩා අඩු ව පැවතිනි. එයට බලපා ඇත්තේ ප්‍රධාන වශයෙන්ම ව්‍යාපෘති ණය අඩු වශයෙන් අයවීමයි. වගා ණය අයකර ගැනීම අතින් ඉහළ ප්‍රතිශතයක් අත්කර ගැනීමට හැකි වී ඇත්තේ මතක් කොට ලිපි යැවීම හා කෘ.ප.නි.ස. වරුන් මාර්ගයෙන් ඒවා අයකර ගැනීම සඳහා ඔවුන්ව උනන්දු කිරීම වැනි ගතයුතු ක්‍රියාමාර්ග නිසි අවස්ථාවේ ගැනීම නිසා ය.

**වගු අංක 3.10: මහකුඹුක්කඩවල ගොවි බැංකුවේ ණය අයවීම: 2001-2010**

| වර්ෂය | ණය වර්ගය | | | | | | අය කර ගත් මුළු ණය වටිනාකම (රු) | නිකුත් කල මුළු ණය වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|---|---|---|---|---|
| | වගා ණය (රු) | ප්‍රතිශතය (%) | ව්‍යාපෘති ණය (රු) | ප්‍රතිශතය (%) | ක්ෂණික ණය (රු) | ප්‍රතිශතය (%) | | |
| 2001 | - | - | - | - | - | - | - | - |
| 2002 | 47,496 | 100.00 | - | - | - | - | 47,496 | 100.00 |
| 2003 | 246,465 | 100.00 | - | - | - | - | 246,465 | 100.00 |
| 2004 | 334,373 | 100.00 | 67,507 | 12.81 | 45,000 | 60.00 | 446,880 | 47.72 |
| 2005 | 261,553 | 100.00 | 81,349 | 13.56 | 45,000 | 64.29 | 387,902 | 41.64 |
| 2006 | 1,418,248 | 98.88 | 53,998 | 24.00 | 15,000 | 100.00 | 1,487,246 | 88.83 |
| 2007 | 1,885,227 | 100.00 | 16,018 | 14.56 | - | - | 1,901,245 | 95.29 |
| 2008 | 2,528,106 | 100.00 | 40,039 | 26.69 | - | - | 2,568,145 | 95.89 |
| 2009 | 2,889,777 | 99.52 | 59,139 | 18.20 | - | - | 2,948,916 | 91.33 |
| 2010 | 1,204,542 | 91.80 | 15,055 | 30.11 | - | - | 1,219,597 | 89.54 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

### 3.2.6 ද්‍රව්‍ය ණය ලබාදීම

මෙම ගොවි බැංකුව මඟින් වගා ණය ලබා දෙන්නේ 100%ක් ම ද්‍රව්‍යමය ආකාරයෙන් වන අතර ඒවාට බිත්තර වී, කෘෂි රසායන ද්‍රව්‍ය, ස්ප්‍රේ යන්ත්‍ර, පොහොර ආදිය ඇතුළත් වේ. මෙම කෘෂි රසායන ද්‍රව්‍ය කම්ටුව හරහා සී.අයි.සී. ආයතනයෙන් මිල දී ගනු ලබන අතර මිල දී ගන්නා ද්‍රව්‍ය ප්‍රමාණය අනුව ලැබෙන වට්ටම වෙනස් වේ. ඉහළ ප්‍රමාණයක් මිල දී ගන්නා ඩී ඩෑෂ් වැනි කෘෂි රසායන ද්‍රව්‍ය වෙනුවෙන් 25%ක වට්ටමක් ලැබෙන අතර ගොවීන්ට ගොවි බැංකුව හරහා මෙම ද්‍රව්‍ය ලබා ගැනීමේ දී 20%ක වට්ටමක් ලබා දේ. සී.අයි.සී. සමාගම මඟින් මිල දී ගන්නා අනෙකුත් ද්‍රව්‍ය සඳහා 25-15%ක් දක්වා වූ විවිධ වට්ටම් ලැබෙන අතර ඇතැම් විට ගොවීන් පුද්ගලිකව මිල දී ගැනීමේ දී ගොවි බැංකුව හරහා මිල දී ගනු ලබන මිලට වඩා අඩු මුදලකට කෘෂි රසායන ද්‍රව්‍ය බාහිර

වෙළෙඳසැල්වලින් ලබා ගත හැකි බව වාර්තා විය. ද්‍රව්‍ය වශයෙන් ණය ලබාදීමේ දී ගොවීන්ට එම ද්‍රව්‍ය ඍජුවම වගා කටයුතු සඳහා යොදා ගත හැකි නිසා ගොවීන් ද්‍රව්‍ය ණය සඳහා කැමැත්තක් දක්වන නමුත් ගොවි බැංකුව හරහා ලබා දෙන ද්‍රව්‍යවල මිල අධිකවීම ඔවුන්ට ගැටළුවක් බව සඳහන් කළ හ. උදාහරණ ලෙස මෙම ගොවිජන බැංකුවෙන් වගා ණය වැඩි වශයෙන් ලබා ගනු ලබන පානීයමඩුව, කරුංගාලි වෙත්ලෙයි, රත්මල්ගස්වැව හා ආඩිගම වැනි ප්‍රදේශවල ගොවීහු ගොවිජන බැංකුවෙන් ගන්නා කෘෂි රසායන සඳහා හැමවිටම පිට වෙළෙඳසැල්වලට වඩා රු. 200ක් හෝ රු. 250ක් ගෙවීමට සිදුවන බව ප්‍රකාශ කළ හ. තව ද, වගා කිරීමේ දී ද්‍රව්‍ය වශයෙන් පමණක් නොව ගොවීන්ට වගා කටයුතුවල දී සී සෑම, අස්වනු නෙළීම සඳහා ද ඉතා විශාල වශයෙන් මුදලින් වැය කිරීමට සිදුවන නිසා ප්‍රමාණවත් ණයක් මුදල්මය වශයෙන් ද ලබාදීමට ගොවි බැංකුව කටයුතු කරන්නේ නම් සුදුසු බව ගොවීන්ගේ අදහස විය. මේ නිසා ගොවීන්ට බැංකු කිහිපයක් මඟින් ණය ගැනීමට සිදුවීම අවශ්‍ය නොවනු ඇත. ගොවි බැංකුව හරහා ණය ලබා ගන්නා ගොවීන්ට පොහොර සහනාධාරය ලබා ගන්නා කාලයේ දී ප්‍රමුඛතාවය ලබාදෙන නිසා එය ඔවුන්ට පහසුවක් වී ඇති බව ද ප්‍රකාශ විය. එසේ වුව ද, පිටස්තර මිලට වඩා වැඩි නිසා ගොවි ණය වෙනුවෙන් කෘමිනාශක වැනි ද්‍රව්‍ය ලබාදීමට වඩා මුදලින් ගෙවීම වැදගත් බව වැඩිදුරටත් ඔවුන්ගේ අදහස විය.

### 3.2.7 කණ්ඩායම් ක්‍රමය

බොහෝ ගොවි බැංකුවල මෙන් මෙම ගොවි බැංකුවේ ද පස් දෙනාගේ කණ්ඩායම් ඇති අතර සාමාජිකයින් සොයා ගැනීමේ අපහසුව නිසා ඇතැම් අවස්ථාවල දී හය දෙනාගේ කණ්ඩායම් ද පිහිටුවා තිබේ. මුළු කණ්ඩායම් ප්‍රමාණය 173කි. අනෙක් ගොවි බැංකුවලට සාපේක්ෂව කණ්ඩායම් ක්‍රමය වඩාත් සාර්ථකව ක්‍රියාත්මක වන ගොවි බැංකුවක් ලෙස මෙය හැඳින්විය හැකි ය. සියළු දෙනාගෙන් ණය අය කර ගැනීම සඳහා ගොවි බැංකුව විසින් ක්‍රමානුකූලව අවශ්‍ය පියවර ගනිමින් කටයුතු කරන නිසාත්, ව්‍යාපෘති ණය සඳහා ලබාදෙන මුදල රු. 50,000/-කට සීමාකර ඇති නිසාත්, එය ලබා ගැනීමට ඉතිරි කළ යුත්තේ සුළු මුදල් ප්‍රමාණයක් නිසාත්, කණ්ඩායම් ක්‍රමය ගොවි බැංකුවේ සාමාජිකයින්ට ගැටළු සහගත තත්ත්වයක් උදා කර දී නොමැත. ඒ වෙනුවට ඇතැම් ගොවීන් සඳහන් කළේ ව්‍යාපෘති ණය ලබා ගැනීමේ දී ණය ලබා ගන්නන්ට අනෙක් සාමාජිකයින් ද ඉතිරි කිරීම් යනාදියෙන් උදව් කරන බව ය. තවත් විශේෂ කරුණක් ලෙස සඳහන් කළ හැකි වන්නේ යම් පුද්ගලයෙකු විසින් ණය ලබාගෙන දිගටම නො ගෙවූ අවස්ථාවල දී ඔහු කණ්ඩායමෙන් ඉවත් කර ඒ වෙනුවට වෙනත් අයෙකු බඳවා ගැනීමට ඉල්ලුම් කිරීමට ගොවි බැංකුව විසින් සාමාජිකයින්ට අවස්ථාව ලබා දී ඇති බව ය. සමීක්ෂණයට භාජනය වූ ගොවි බැංකු සාමාජිකයින්ගෙන් වැඩි ප්‍රමාණයක් කුඩා කණ්ඩායම් ක්‍රමයට කැමත්ත දැක් වූ අතර මේ ක්‍රමය නිසා තමන්ට වෙනත් බැංකුවලින් ණය ලබා ගැනීමට යාමේ දී ඇප සඳහා කරදරවලට මුහුණ දීමට සිදු නොවන බව ඔවුහු පැවසූ හ. කණ්ඩායම් ක්‍රමය තුළ එකිනෙක සාමාජිකයා ලබා ගන්නා ණය පිළිබඳව සියළු දෙනා දැනුවත් වන බවත්, ණය ගෙවීම ප්‍රමාද වූ විට හෝ නො ගෙවා සිටිනවිට දිගින් දිගටම ණය ගෙවීම සඳහා අනෙක් අයගෙන් බලකිරීමක් කෙරෙන බවත්, එය ගොවි බැංකුවේ සුරක්ෂිත තත්ත්වයට හේතුවන බවත් පස් දෙනාගේ කණ්ඩායම් වෙනුවට තුන් දෙනාගේ කණ්ඩායම් සැකසීම වඩා සුදුසු බවත් ඔවුහු තවදුරටත් ප්‍රකාශ කළ හ.

### 3.2.8 ණය සීමාවන්

චක්‍රලේඛ අනුව වගා ණය ලෙස ලබාදිය හැකි උපරිම ප්‍රමාණය රු. 25,000/-ක් වූවත් ගොවි බැංකුව විසින් වැඩි දෙනෙකුට ණය ලබාදීමේ අපේක්ෂාවෙන් ගොවියෙකුට දෙන ණය ප්‍රමාණය රු. 15,000/-කට සීමාකර ඇත. එසේ වූවත්, ද්‍රව්‍යවලින් පමණක් ණය ලබාදෙන නිසා බොහෝ ගොවීන් ලබා ගන්නේ රු.10,000- 12,000 අතර ප්‍රමාණයක් වටිනා ද්‍රව්‍ය පමණි. ගොවීන්ට වගා කටයුතු වෙනුවෙන් සී සෑමේ සිට අස්වනු නෙළීම දක්වා යන සම්පූර්ණ මුදල් ප්‍රමාණය අක්කරයට රු. 20,000 – 25,000 අතර ප්‍රමාණයක් වන නිසා ද්‍රව්‍ය ණයවලට අමතරව මුදලින් ද යම්කිසි ප්‍රමාණයක් ලබාදීම වැදගත් බව ගොවීහු ප්‍රකාශ කළ හ.

### 3.2.9 ගොවි බැංකුවෙ හි වර්තමාන ප්‍රගතිය/දුර්වලත්වය සඳහා බලපෑ සාධක

මහකුඹුක්කඩවල ගොවි බැංකුව ආරම්භක ප්‍රාග්ධනය ලෙස ලබාදුන් සියළු මුදල් පොළියත් සමඟ ආපසු ගෙවමින් තම අරමුදල් මත ස්වශක්තියෙන් නැඟී සිටිමින් පවතින්නකි. එහි ගොඩනගා ඇති අරමුදල් ප්‍රමාණය (කොටස් මුදල්, ඉතුරුම් හා ලාභාංශ ඇතුළත්ව) රු. 540,654 කි මේ තත්ත්වයට පත්වීම සඳහා මූලික වී ඇති හේතු සාධක කිහිපයක් පවතී.

1. ඉහත දැක් වූ ලෙස ගොවි බැංකුවට ස්වශක්තියෙන් නැඟී සිටීම සඳහා හේතු වී ඇති එක් කරුණක් වන්නේ ලබාදෙන ලද ණය 100%ක් ම සාර්ථකව අයකර ගැනීම සඳහා ආරම්භක අවධියේ පටන්ම අවශ්‍ය පියවර ක්‍රමානුකූලව ගැනීම ය. මේ යටතේ අස්වැන්න ලබා ගැනීමෙන් පසු ණය ආපසු අයකර ගැනීමේ කාලය එළඹෙන්ම කෘ.ප.නි.ස. වරුන්ගේ මාර්ගයෙන් ගොවීන්ට ණය ගෙවන ලෙස දැනුවත් කිරීම, හිඟ ණය ප්‍රමාණයන් පිළිබඳව නිතරම කෘ.ප.නි.ස. වරුන්ව දැනුවත් කිරීම හා ඒවා අයකර දෙන ලෙස ඔවුන්ව උනන්දු කිරීම, නිශ්චිත අවස්ථාවේ දී ණය නො ගෙවා ඇත්නම් ඒ පිළිබඳව කෘ.ප.නි.ස. වරුන්ගේ මාර්ගයෙන් ණය හිමියන්ට ලිපි මඟින් දැනුම්දීම යනා දී පියවර ගැනීම ය. ගොවි බැංකුවේ ණය ලබාදීමේ වැඩපිළිවෙළට සහයෝගය ලබා නොදීම නිසා කෘ.ප.නි.ස. වරුන් තිදෙනෙකුගේ පඩි වැඩි කිරීම ද නවතා දමා ඇති බව දැනගන්නට ලැබුණි.
2. වගා ණය නො ගෙවා පැහැර හැරි අය කණ්ඩායම්වලින් නෙරපා හැර වෙනත් අය එම කණ්ඩායම්වලට බඳවා ගන්නා ලෙස පරිපාලනය මඟින් දැනුම් දී ඇති නිසා ණය දීමේ හා අයකර ගැනීමේ ක්‍රියාවලියට වඩාත් සහාය ලැබෙන පරිදි කුඩා කණ්ඩායම් ක්‍රමය සකසා ගැනීමට අවස්ථාව සැලසී තිබේ.

### 3.2.10 සංවර්ධනයට බලපෑ නීතිමය හා වෙනත් ගැටලු

කුමන ප්‍රමාණයක වූව ද ව්‍යාපෘති ණය ලබා ගැනීමේ දී දිස්ත්‍රික්ක මට්ටමේ අනුමැතිය අවශ්‍ය නිසා එසේ අනුමැතිය ලබා ගැනීමට අඩුම මාස 4ක් වත් ගත වේ. රු. 50,000ක් වැනි සුළු ණය ප්‍රමාණයක් ලබා ගැනීමේ දී දිස්ත්‍රික්ක මට්ටමේ අනුමැතිය සඳහා එතරම් දිගු කාලයක් ගත කිරීම කාලය අපතේ යැවීමකි. ඊට එක් හේතුවක් වන්නේ දිස්ත්‍රික්ක මට්ටමේ ණය කමිටුව විවිධ ආයතනවල නිලධාරීන් නියෝජනය කරන්නක් නිසා ඒ සඳහා දිගු කාලයක් ගැනීම ය.

ව්‍යාපෘතියක් හා අදාළ විෂයභාර නිලධාරීන්ගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ද ඉතා දිගු කාලයක් ගත වේ. කලින් අවස්ථාවක දී සත්ත්ව පාලනය සඳහා ණය ලබා ගැනීමට

කැමැත්ත දැක් වූ ගොවීන්ගේ ණය අනුමතකර කර ගැනීම සඳහා මාස 4ක් පමණ යාම නිසා ණය වුවමනා අයටත් එපා වීම නිසා එය ලබා දීමට ඔවුන් නැවත කැඳවා ගෙන ඇත්තේ 10 වතාවක් පමණ පණිවුඩ යැවීමෙනි.

ගොවීන් මෙන් ම ගොවි සංවිධාන ද මුදල් තැන්පත් කිරීම සඳහා උනන්දු කිරීමේ දී බැංකු නීතිරීති අනුව එම මුදල් ඉක්මණින් ආපසු ලබා ගැනීමට ඇති අපහසුව ඔවුන් ඒ සඳහා තව තවත් උනන්දු කිරීමට මහත් බාධාවකි. මුදල් ආපසු ලබා ගැනීමේ දී එය චෙක්පතකින් දෙන අතර එය අත්සන් කිරීම සඳහා ගොවිජන සංවර්ධන කමිටුවේ සභාපති (ඔහු හැම විටම ප්‍රදේශයේ ගොවි සංවිධාන නායකයෙකි) හා එහි විධායක ලේකම් (අදාළ ගොවිජන සංවර්ධන කාර්යාලයේ ප්‍රාදේශීය නිලධාරී මහතා) අත්සන් කිරීම අනිවාර්ය ය. ප්‍රාදේශීය නිලධාරී මහතා තවත් ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානයක වැඩ බැලීම් කරන නිසා ඇතැම් දිනවල දී මහකුඹුක්කඩවල කාර්යාලයේ නො සිටී. ලබාදෙනු ලබන චෙක්පත් වුව ද මාරු කිරීම සඳහා මෙම ගොවිජන බැංකුවේ ගිණුම් ඇති මදුරංකුලිය ලංකා බැංකුව වෙත කි.මී. 12ක් යාමට කාලය හා මුදල් ද වැය කළ යුතු ය.

### 3.2.11 යෝජනා

1. ගොවි ණය ලබාදීමේ ක්‍රියාවලිය සාර්ථකකර ගැනීම සඳහා රු. ලක්ෂයක් පමණ දක්වා වූ ව්‍යාපෘති ණය ප්‍රමාණයක් ගොවිජන සංවර්ධන කමිටුවේ ණය කමිටුවට අනුමත කිරීමට බලය ලබා දිය යුතු ය.

2. තැන්පත් මුදල ආපසු ලබා ගැනීමේ දී රු. 5,000/-ක් පමණ වූ ප්‍රමාණයක් ගොවිජන බැංකුවේ මුදලින් ලබාදීමට හැකියාව තිබීමත්, එය ලබාදීමේ ප්‍රමාදය වැළැක්වීම සඳහා කමිටු ලේකම් හා සභාපතිගේ පසු අනුමැතිය ලබා ගැනීමේ එකඟත්වයකට යටත්ව ගොවිජන බැංකු සහාය කළමනාකරු හා කමිටු ලිපිකරුගේ අත්සනින් යුතුව එය ගෙවීමට අවසරය තිබීමත් වැදගත් වේ.

3. බැංකු ණය සඳහා අධික ඉල්ලුමක් ඇති විශේෂයෙන් ම වී වගාවේ වගා කටයුතු අරඹනු ලබන කාලයට බැංකුවේ සිටින සහාය කළමනාකරුට පමණක් එහි කටයුතු තනිවම කිරීම අපහසු ය. එම නිසා, ඔහුගේ සහාය සඳහා තවත් අයෙකු ස්ථිරවම ලබාදීම හෝ වැඩ අධික කාලයට එසේ සහාය ලබා ගැනීම සඳහා තවත් කෘ.ප.නි.ස. වරයෙකුට පුහුණුව ලබාදීම කළ යුතු ය.

4. දැනට ගොවි බැංකුව මඟින් ලබා දෙනු ලබන්නේ වගා ණය හා ව්‍යාපෘති ණය පමණක් බැවින් යන්ත්‍රෝපකරණ ණය, අස්වනු නෙළීමේ ණය හා අස්වනු ගබඩා කිරීම සඳහා දෙනු ලබන ණය ඇතුළු වෙනත් ණය වර්ග ද ප්‍රචලිත කරමින් ණය ලබාදීමේ ක්‍රියාවලිය පුළුල් කිරීමට පියවර ගත යුතු ය. එය අරමුදල් තරවීම සඳහා පමණක් නොව ගොවීන්ට ගොවිජන බැංකුවෙන් ලැබෙන සේවාව පුළුල්වීම සඳහා ද බලපායි.

5. මෙම ගොවිජන සංවර්ධන බල ප්‍රදේශය තුළ විවිධ ණය වර්ග ජනප්‍රිය කරමින් ණය ලබාදීමේ ක්‍රියාවලිය පුළුල් කිරීම සඳහා ඉහළ විභවතාවයක් ඇතත් දැනට කෘ.ප.නි.ස. වරුන් ඇතුළු අනෙක් නිලධාරීන්ගේ හිඟයක් පවතින නිසා ණය අයකර ගැනීම වැනි කාර්යයන් සඳහා මහත් අපහසුවක් දැරීමට සිදු වේ. එබැවින් ලබාදෙනු ලබන ණය ප්‍රමාණය වැඩි කිරීමට ගොවිජන බැංකුව මට්ටමින් දැරිය හැකි උපරිම උත්සාහය

ගනු නො ලබන බව නිරීක්ෂණය කළ හැකි ය. එම නිසා, මෙයට විසඳුමක් ලබා දී සාර්ථකව අයකර ගනු ලබන ණය වෙනුවෙන් සියළු නිලධාරීන්ට දිරි දීමනාවක් ලැබෙන ආකාරයට පොලියෙන් කොටසක් බෙදීයාමට සැලැස්විය යුතු ය.

## 3.3 ඇලයාපත්තුව ගොවි බැංකුව

### 3.3.1 හැඳින්වීම

අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් ඇලයාපත්තුව ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානය පදනම් කර ගනිමින් 1995 දී ආරම්භ කර ඇති මෙම ගොවිජන බැංකුව, ගොවිජන බැංකු පිහිටුවීමේ වැඩසටහන යටතේ පටන්ගත් මුල්ම බැංකු දෙකින් එකකි. වී ගොවිතැන ප්‍රධාන කොටගත් කෘෂිකාර්මික ආර්ථිකය මූලික වන මෙම ප්‍රදේශයෙ හි මහා වාරිමාර්ග, මධ්‍ය වාරිමාර්ග, කුඩා වාරිමාර්ග මෙන් ම වර්ෂා පෝෂිත තත්ත්වයන් යටතේ ඇති ඉඩම් වගා කරන ගොවි පවුල් සිටිති. මහා වාරිමාර්ග වගා ප්‍රදේශ ලෙස අනුරාධපුර නගරය ද අයත්වන තිසා වැව, නුවර වැව මෙන් ම බසවක්කුලම වැව යටතේ ඇති කුඹුරුවලින් කොටසක් ද මධ්‍ය වාරිමාර්ග වගා ප්‍රදේශ ලෙස මහමංකඩවල, මානින්ගමුව හා මහබුලංකුලම යන වැව් යටතේ පෝෂිත ප්‍රදේශ ද මෙයට අයත් වෙයි.

මහ කන්නයේ දී සියළුම වාරිමාර්ග හා අහස් දියෙන් වගා කරන කුඹුරුවල වී වගාව සිදු කෙරෙන අතර ගොඩබිම්වල වර්ෂාව පදනම් කරගෙන බඩඉරිඟු, කව්පි, උඳු, මුං හා එළවළු වගා කෙරේ. යල කන්නයේ දී ප්‍රධාන හා මධ්‍ය වාරිමාර්ග යටතේ වී වගාවත්, සුළු වාරිමාර්ග යටතේ වී මෙන් ම බඩඉරිඟු වැනි වෙනත් බෝගයන් වගා කෙරේ. බොහොමයක් ගොවීන් අක්කර 3කට වැඩි කුඹුරු ඉඩම් ප්‍රමාණයක් වගා කිරීම සාමාන්‍ය දෙයක් විය.

### 3.3.2 සාමාජිකත්ව වර්ධනය

ගොවි බැංකුවේ 2002 වර්ෂයේ දී කොටස් මිල දී ගත් මුළු සාමාජිකයින් ගණන 537ක් වූ අතර එය එම ප්‍රදේශයේ මුළු ගොවි පවුල් සංඛ්‍යාවෙන් 16%කි. 2010 වන විට, ගොවි බැංකුවේ සාමාජිකත්වය ලද ගොවීන් ප්‍රමාණය 750ක් දක්වා වර්ධනය වී ඇති අතර එම ප්‍රමාණය සමස්ත ගොවි පවුල් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 23%ක් පමණ වේ (වගු අංක 3.11). මේ වන විට කුඩා කණ්ඩායම් 78ක් ගොවි බැංකුව සමඟ ගනු දෙනු කරන අතර සාමජිකයින් 5ක් හෝ 4ක් බැගින් වන කණ්ඩායම් දැනට ක්‍රියාත්මක වේ. බල ප්‍රදේශයේ මුළු ගොවි පවුල් සංඛ්‍යාව 3,278ක් වන අතර මුල් අවධියේ දී ගොවි බැංකුව සමඟ ගනු දෙනු කළ ගොවීන් සංඛ්‍යාව මේ වන විට ඉහළ ගොස් ඇත්තේ වාර්ෂිකව 5%කින් පමණි. මෙයට වසර කිහිපයකට පෙර සාර්ථකව ක්‍රියාත්මක වූ මෙම ගොවි බැංකුව මේ වන විට ගොවීන් කෙරෙන් ක්‍රමයෙන් ඈත් වී ඇති බව නිරීක්ෂණවලින් පැහැදිලි විය. සක්‍රියව ගොවි බැංකුව සමඟ ගනු දෙනු කරන්නේ ගොවි බැංකුවට බැඳී ඇති ගොවි සංවිධාන 22ක් අතරින් පහක්/හයක් වැනි අඩු සංඛ්‍යාවකි. කෘ..ප.නි.ස. වරුන්ගේ දායකත්වය අඩුවීම, ගොවිජන බැංකුව වඩාත් බාහිර මට්ටමෙන් කෘෂිකර්මාන්තයේ නියැළී ගොවීන් ඇති තිසා වැව, නුවර වැව වැනි මහා වාරිමාර්ගවල ගොවීන් ඇති ග්‍රාම නිලධාරී වසම්වලින් ඉතා දුරින් පිහිටා තිබීම, විවිධ හේතු නිසා මුල් අවධියේ ගත් ණය නො ගෙවීමෙන් නැවත ණය ලබාගත නො හැකි අය බවට පත්වීම, ගොවීන් ගොවි බැංකුව පිළිබඳව දැනුවත්වීම අඩුවීම හා එමඟින් ලබා දෙන ණය ප්‍රමාණය ගොවීන්ගේ වගා ණය අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් නොවීම යනා දී කරුණු ගොවීන් ගොවි බැංකුව සමඟ සම්බන්ධවීම අඩුවීමට බලපා තිබේ.

පුස්තකාලය

වගු අංක 3.11: ඇලයාපත්තුව ගොවි බැංකුවේ සාමාජිකත්ව වර්ධනය: 2002-2010

| වර්ෂය | සාමාජිකයන් / කොටස් හිමියන් ගණන | කොටස් වල වටිනාකම (රු) | ප්‍රදේශයේ පවුල් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|
| 2002 | 537 | 92,100 | 16.38 |
| 2003 | 628 | 212,000 | 19.16 |
| 2004 | 664 | 209,100 | 20.26 |
| 2005 | 695 | 192,300 | 21.20 |
| 2006 | 695 | 192,300 | 21.20 |
| 2007 | 703 | 207,600 | 21.45 |
| 2008 | 707 | 206,200 | 21.57 |
| 2009 | 716 | 207,100 | 21.84 |
| 2010 | 750 | 221,700 | 22.88 |

ගොවි පවුල් සංඛ්‍යාව 3278 කි.
මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

## 3.3.3 ගොවි බැංකුවේ ඉතුරුම්, කොටස් ප්‍රාග්ධනය හා ලාභාංශ වර්ධනය

ඇලයාපත්තුව ගොවි බැංකුව සඳහා ප්‍රාග්ධනය ලෙස 1999.11.17 වැනි දින රු. 150,000ක් ලැබී ඇති අතර නැවත එම වසරේම රු. ලක්ෂයක් ලැබී ඇත. ඉන් පසු 2001.10.30 රු. ලක්ෂ 5ක් ද, 2009.12.02 රු. ලක්ෂ 2.5ක් ද වශයෙන් මුළු ප්‍රාග්ධනය රු. ලක්ෂ 10ක් ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් මෙම බැංකුවට ලබා දී තිබේ. මෙයට අමතරව 2003.12.01 දින බඩඉරිඟු ව්‍යාපෘතිය සඳහා රු. ලක්ෂ 10ක් ගොවි බැංකුව වෙත ලබා දී තිබූ අතර මේ වන විට එම මුදල සම්පූර්ණයෙන්ම දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. කෙසේ වූව ද, ප්‍රාග්ධනය වශයෙන් ලබාදුන් රු. ලක්ෂ 10 මේ වන තුරු ආපසු යවා නැත. ගොවි බැංකුවේ කුඩා කණ්ඩායම් පුද්ගලික ඉතුරුම් ගිණුම්වල හා ගොවි සංවිධාන තැන්පත්වල මුළු තැන්පත් වටිනාකම 2002 වර්ෂයේ දී රු. ලක්ෂ 2.16 සිට 2010 වන විට රු. ලක්ෂ 7.28 දක්වා වර්ධනය වී ඇත. වාර්ෂිකව ගොවීන් විසින් මිල දී ගෙන ඇති කොටස්වල මුළු වටිනාකම 2002 වර්ෂයේ දී 92,100ක් වූ අතර එය 2010 වන විට 221,700ක් දක්වා වර්ධනය වී තිබේ. මෙහි වාර්ෂික වර්ධනය 17.6%කි. වර්තමානයේ දී ගොවීන් ලබාගන්නා ණය මුදලින් 10%කට සමාන කොටස් මිල දී ගෙන තිබිය යුතු ය. 2003 වර්ෂය වන විට කොටස් ප්‍රාග්ධනය 2002 වර්ෂයට වඩා 13%කින් වර්ධනය වී ඇති නමුත් ඉන් පසු වර්ෂවල කොටස් ප්‍රාග්ධනය වර්ධනය වී ඇත්තේ සුළු වශයෙන් පමණි. ගොවි බැංකුවේ ව්‍යවස්ථාවලට අනුව ගොවීන් විසින් මිල දී ගත් කොටස් ප්‍රාග්ධනය නැවත ගෙවිය නො හැකි නමුත් මෙම ගොවි බැංකුවේ 2004, 2005 සහ 2008 යන වර්ෂවල දී කොටස් ප්‍රාග්ධන වටිනාකම පෙර වර්ෂයට සාපේක්ෂව අඩු වී තිබේ. මෙයට හේතු වී ඇත්තේ ගොවීන් කිහිප දෙනෙකු විසින් කරන ලද ඉල්ලීම් සලකා බලා උසාවිය මඟින් දුන් තීන්දු අනුව, එම ගොවීනගේ කොටස් මුදල්වලින් රු. 100 ඉතිරි කර ඉතිරි කොටස් ප්‍රාග්ධනය ආපසු ගෙවීමට ගොවි බැංකුවට සිදුවීමයි. මෙම ගොවි බැංකුව ගොවීන්ට නිකුත්

කළ ණය සඳහා ලැබුණු පොළී ලාභාංශ හා වෙනත් ලාභාංශ එකතුවීමෙන් ගොඩනැගුණු සමුච්ජිත අරමුදල 2002 වර්ෂයේ දී රු. 26,340ක් වූ අතර එය 2010 වර්ෂය වන විට රු. 1,361,356 දක්වා වර්ධනය වී තිබේ. මෙසේ ගොවි බැංකුව සතු සාමජිකයින්ගේ පුද්ගල හා කණ්ඩායම් ඉතුරුම් තැන්පතු, ගොවි සංවිධාන තැන්පතු, කොටස් ප්‍රාග්ධනය, සමුච්ජිත අරමුදල හා ගොවි බැංකුවේ ඇති ආරම්භක ප්‍රාග්ධන මුදල්වලින් ගොඩනැගුණු සමස්ත සංචිත වටිනාකම 2002 වර්ෂයේ දී රු. 1,334,352 සිට 2010 වර්ෂය වන විට රු. 3,311,485 ක් දක්වා වාර්ෂිකව 18%කින් වර්ධනය වී ඇති අතර (වගු අංක 3.12) මෙම අරමුදල ගොවීන්ගේ ණය අවශ්‍යතා සපුරාලීමට යොදා ගනී. කෙසේ වූව ද, ගොවීන්ට ණය දීම සඳහා මේ දක්වාම ප්‍රධාන වශයෙන් උපයෝගී කර ගනු ලබන්නේ මූලික ප්‍රාග්ධන අරමුදලයි.

**වගු අංක 3.12: ඇලයාපත්තුව ගොවි බැංකුවේ අරමුදල් වර්ධනයː 2002-2010**

| වර්ෂය | ප්‍රාග්ධනය (රු) | කොටස් ප්‍රාග්ධනය (රු) | පුද්ගල තැන්පතු වටිනාකම (රු) | කුඩා කණ්ඩායම් තැන්පතු (රු) | ගොවි සංවිධාන තැන්පතු (රු) | මුළු තැන්පතු (රු) | සමුච්ජිත අරමුදල (රු) | සංචිත වටිනාකම (රු) |
|---|---|---|---|---|---|---|---|---|
| 2002 | 1,000,000 | 92,100 | 215,913 | - | - | 215,913 | 26,340 | 1,334,353 |
| 2003 | 2,000,000 | 212,000 | 241,844 | 82,700 | - | 324,544 | 83,427 | 2,619,971 |
| 2004 | 1,150,000 | 209,100 | 282,329 | 138,450 | 1,500 | 422,279 | 282,551 | 2,063,930 |
| 2005 | 1,150,000 | 192,300 | 306,584 | 146,450 | 4,850 | 457,884 | 532,414 | 2,332,597 |
| 2006 | 1,150,000 | 192,300 | 320,148 | 150,599 | 4,850 | 475,596 | 780,374 | 2,598,271 |
| 2007 | 1,000,000 | 207,600 | 306,580 | 162,749 | 24,850 | 494,178 | 986,770 | 2,688,548 |
| 2008 | 1,000,000 | 206,200 | 353,146 | 180,949 | 48,470 | 582,565 | 1,107,577 | 2,896,342 |
| 2009 | 1,000,000 | 207,100 | 373,850 | 197,804 | 48,470 | 620,124 | 1,225,414 | 3,052,638 |
| 2010 | 1,000,000 | 221,700 | 436,560 | 243,399 | 48,470 | 728,429 | 1,361,357 | 3,311,486 |

ප්‍රාග්ධනය යනු: ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගොවි බැංකු වෙත සපයන ලද මුදල
සංචිත යනු: ප්‍රාග්ධනය,කොටස් ප්‍රාග්ධනය,තැන්පතු වටිනාකම සහ සමුච්ජිත අරමුදලේ වටිනාකම් වල එකතුව
මූලාශ්‍රයː සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

## 3.3.4 ණය නිකුත් කිරීම

ගොවි බැංකුව ආරම්භක වර්ෂයේ දී රු. 14,056ක මුදලක් ගොවීන් 9 දෙනෙකු සඳහා ලබා දී ඇති අතර මුල් කාලයේ දී මෙම ගොවි බැංකුව හරහා ගොවීන්ට අවශ්‍ය ණය, බිත්තර වී, පොහොර, කෘෂි රසායන ආදිය ද්‍රව්‍ය වශයෙන් සපයා දී තිබේ. මෙය 2004 වර්ෂය පමණ දක්වා සිදු කොට ඇති අතර 2003/2004 මහ කන්නයේ දී බඩඉරිඟු ව්‍යාපෘතියක් සඳහා ද ගොවීන්ට ණය නිකුත් කොට තිබේ. මුල් කාලයේ දී ගොවි බැංකුව හරහා ද්‍රව්‍ය ණය සැපයීම සිදු වූවත්, මේ වන විට සම්පූර්ණ ණය මුදලම මුදලින් ලබාදීම සිදු වේ. ගොවි බැංකුවේ සාමාජිකත්වය ලබාගත් සියළු ගොවීන් ආකර්ෂනය කර ගැනීමට හැකිවන මට්ටමට අලෙවිසැල දියුණු කර ගැනීමට නො හැකිවීම මේ සඳහා හේතු වී ඇති එක් කරුණකි. එහි සාමාජිකත්වය දරන සැලකිය යුතු ගොවීන් පිරිසක් අනුරාධපුරය නගරය තුළ මෙන් ම එයට ආසන්නව පදිංචිව සිටීමත් නිසා ඔවුන්ට ගොවිජන සංවර්ධන

අලෙවි සැලෙහි සේවය ලබාගැනීමට හෝ ගොවිජන බැංකුවෙන් ණය වෙනුවට ලබා දෙන ද්‍රව්‍ය ලබා ගැනීමට දැඩි උවමනාවක් නො පවතී. වී, මිරිස්, බඩඉරිඟු හා උඳු ආදී වගාවන්ට වගා ණය සපයනු ලැබේ.

මුල දී, කෘෂි රසායන ද්‍රව්‍ය මිල දී ගැනීම සිදු වී ඇත්තේ 'සිපෙට්කෝ' ආයතනය හරහා වන අතර මෙහි දී ගොවීන්ට අවශ්‍ය ද්‍රව්‍ය නොමැතිවීම මත ගොවීන් ණය ගැනීමට පෙළඹීම අඩු විය. මේ හේතුව මත ගොවි බැංකුව සමඟ ගනුදෙනු කළ ගොවීන් සංඛ්‍යාව අඩු වී තිබේ. වගා ණයට අමතරව, 2003 වර්ෂයේ දී පමණක් ව්‍යාපෘති ණය නිකුත් කොට ඇති අතර 2004-2007 කාල සීමාව තුළ දී ගොවීන්ට අවශ්‍ය ක්ෂණික ණය ද නිකුත් කොට ඇති නමුත් පසුව දිස්ත්‍රික් කාර්යාලයෙන් කළ නියෝග අනුව ඒවා නිකුත් කිරීම නතර කර තිබේ. වැඩිම ගොවීන් පිරිසකට එනම්, 456 දෙනෙක් සඳහා ණය නිකුත් කර ඇත්තේ 2003 වර්ෂයේ දී වන අතර එම මුදල රු.3,410,241කි (වගු අංක 3.13). පැළ තවාන්, බිත්තර වී නිෂ්පාදනය හා සත්ත්ව පාලනය සඳහා මුල් කාලයේ දී ගොවීන් 43කට ව්‍යාපෘති ණය සපයා ඇති අතර ක්ෂණික ණය සපයන ලද ගොවීන් සංඛ්‍යාව 83කි. එසේ ම රු. 75,000ක මුදලක් ගොවි මහතකු සඳහා යන්ත්‍රෝපකරණ මිල දී ගැනීමට ලබා දී ඇති අතර එය ව්‍යාපෘති ණයක් ලෙස සපයා ඇත. 2004 වර්ෂයෙන් පසුව කණ්ඩායම් ක්‍රමය පැමිණීමත් සමගම ගොවීන් ගොවි බැංකු හරහා ණය ලබාගැනීමට පෙළඹීම අඩු වී ඇති අතර 2009 වර්ෂයේ දී ගොවීන් 96ක් සඳහා රු. 2,167,000ක් ණය ලබා දී තිබේ. මෙහි දී වගා ණය වශයෙන් නිකුත් කර ඇති මුදල රු. 1,260,000කි. මෙම මුදල 2009 වර්ෂයට සාපේක්ෂව 42%ක අඩු වීමකි. ගොවි බැංකුව හරහා ලබාදෙන ණය මුදල ප්‍රමාණවත් නොවීම, ගොවීන්ට ගොවි බැංකුව හරහා ණය සැපයීමට හා ගොවීන් දැනුවත් කිරීමට ගම් මට්ටමේ සිටින නිලධාරීන් වන කෘ.ප.නි.ස. වරුන්ගේ දායකත්වය අඩුවීම හා පරිපාලනමය දුර්වලතා මෙයට හේතු වී තිබේ. ගොවි බැංකුව සතු සමස්ත සංචිත අරමුදලේ ප්‍රතිශතයක් ලෙස ඉහළම ණය මුදල් ප්‍රමාණයක් නිකුත් කර ඇත්තේ 2003 වර්ෂයේ දී වන අතර එය සංචිත වටිනාකමෙන් 130කි. 2004 වර්ෂයෙන් පසුව නිකුත් කළ ණය වටිනාකම ගොවි බැංකුවේ සමස්ත ණය සැපයීමේ විභවයට වඩා විශාල වශයෙන් අඩුවීමක් දක්නට ලැබෙයි. ඒ අනුව, 2010 වර්ෂයේ දී නිකුත් කළ ණය මුදල සංචිත වටිනාකමෙන් 38%කි (වගු අංක 3.14). මේ වන විට ක්‍රියාකාරීව ගොවි බැංකුව සමඟ ගනු දෙනු කරන ගොවි සංවිධාන සංඛ්‍යාව 5ක් පමණ වන අතර කණ්ඩායම් ක්‍රමය පැමිණීමත් සමඟ බොහෝ ගොවි සංවිධානවල ගොවීන් ගොවි බැංකුව සමඟ ගනුදෙනු කිරීම අඩු වී තිබේ.

### වගු අංක 3.13: ඇලයාපත්තුව ගොවි බැංකුව මඟින් නිකුත් කළ ණය වටිනාකම: 2001-2010

| වර්ෂය | වගා ණය ප්‍රමාණය | | | ව්‍යාපෘති ණය (රු) | ක්ෂණික ණය (රු) | අස්වනු නෙළීමේ ණය (රු) | කෘ.ප. නි.ස ක්ෂණික ණය (රු) | නිකුත් කළ මුළු ණය වටිනාකම (රු) | ණය ලබාගත් ගොවීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | යල (රු) | මහ (රු) | එකතුව (රු) | | | | | | |
| 2001 | 283,664 | 9,420 | 293,084 | - | - | - | - | 293,084 | 41 |
| 2002 | 458,505 | 134,848 | 593,353 | - | - | - | - | 593,353 | 49 |
| 2003 | 1,572,072 | 1,650,670 | 3,222,741 | 127,500 | 50,000 | 10,000 | - | 3,410,241 | 456 |
| 2004 | 309,797 | 1,441,250 | 1,751,047 | 260,000 | 37,500 | 20,000 | 45,000 | 2,113,547 | 209 |
| 2005 | 605,645 | 498,000 | 1,103,645 | 145,000 | 191,500 | - | - | 1,440,145 | 169 |
| 2006 | 135,000 | 640,000 | 775,000 | - | 93,000 | 20,000 | - | 888,000 | 98 |
| 2007 | 384,500 | 440,000 | 824,500 | - | 25,000 | - | - | 849,500 | 60 |
| 2008 | 350,000 | 850,300 | 1,200,300 | - | - | - | - | 1,200,300 | 68 |
| 2009 | 915,000 | 1,252,000 | 2,167,000 | - | - | - | - | 2,167,000 | 96 |
| 2010 | 335,000 | 925,000 | 1,260,000 | - | - | - | - | 1,260,000 | 56 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

### වගු අංක 3.14 : ඇලයාපත්තුව ගොවි බැංකුවෙ හි සංචිත වටිනාකමට සාපේක්ෂව ගොවි බැංකුව මඟින් නිකුත් කළ ණය වටිනාකම; 2002-2010

| වර්ෂය | නිකුත් කළ මුළු ණය වටිනාකම (රු) | සංචිත වටිනාකම (රු) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| 2002 | 593,353 | 1,334,353 | 44.47 |
| 2003 | 3,410,241 | 2,619,971 | 130.16 |
| 2004 | 2,113,547 | 2,063,930 | 102.40 |
| 2005 | 1,440,145 | 2,332,597 | 61.74 |
| 2006 | 888,000 | 2,598,271 | 34.18 |
| 2007 | 849,500 | 2,688,548 | 31.60 |
| 2008 | 1,200,300 | 2,896,342 | 41.44 |
| 2009 | 2,167,000 | 3,052,638 | 70.99 |
| 2010 | 1,260,000 | 3,311,486 | 38.05 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

### 3.3.5 ණය අයවීම

2002 වර්ෂයේ දී ණය අයවීම එම වර්ෂයට අදාලව නිකුත් කළ ණය මුදලේ ප්‍රතිශතයක් ලෙස 100%ක් විය. මුල් කාලයේ දී ණය අයකර ගැනීම සඳහා කෘ.ප.නි.ස. වරුන්ගෙන් ඉහළ සේවයක් ලැබී තිබේ. 2003 වර්ෂය වන විට මුළු ණය අයකර ගැනීමේ ප්‍රතිශතය 89%ක් පමණ දක්වා පහළ බැස ඇත. මෙහි දී, වගා ණය අයවීම 93%ක් දක්වා අඩු වී තිබේ. මෙයට හේතු වී ඇත්තේ මෙම වර්ෂය තුළ දී ගොවිජන බැංකුව හරහා නිකුත් කරන ලද ද්‍රව්‍ය මිල ඉහළ මට්ටමක පැවතීමත් විශේෂයෙන්ම පොහොර මිල ඉහළ යාම හේතුවෙන් ගොවීන්ට අලාභ විඳීමට සිදුවීමත් මත ගොවීන් විසින් ණය ආපසු ගෙවීම පැහැර හැරීමයි. කෙසේ වුව ද, මේ වන විට එම හිඟ ණය උසාවි මාර්ගයෙන් අය කර ගෙන ඇතත්, එය මේ වන තුරු දිස්ත්‍රික් කාර්යාලයෙන් ගොවිජන සේවා මධ්‍යස්ථානයට නියි පරිදි ලැබී නැති නිසා ගොවීන්ගේ ණය කපා හැරීමට නො හැකි වී ඇත. 2006-2007 යන වර්ෂවල 95%කට වඩා වැඩි ණය අයකර ගැනීමේ ප්‍රතිශතයක් වාර්තා වී තිබේ. පොහොර සහනාධාරය ලැබීමත් සමඟ ගොවීන්ගේ ප්‍රධාන වගාව වූ වී වගාව ලාබදායක වීම මෙයට ප්‍රධාන හේතුව යි. ණය අයවීමේ ප්‍රතිශතය අවම වී ඇත්තේ 2010 වර්ෂයේ වන අතර එය 55%කි (වගු අංක 3.15). මෙම වර්ෂයේ ඇති වූ ගංවතුර තත්ත්වය නිසා ගොවීන්ගේ වගා අස්වනු විශාල වශයෙන් හානිවීමත්, ගොවීන් වෙනත් බැංකුවලින් ලබාගත් වගා ණය මුදල් කපාහරින බවට ප්‍රචාරයවීම නිසා ගොවි බැංකුවෙන් ලබාගත් වගා ණය ද කපා හැරිය හැකි බවට ගොවීන් විශ්වාස කිරීමත් මෙයට හේතු විය. ණය අය කරදීම වෙනුවෙන් ක්ෂේත්‍රයේ සිටින කෘ.ප.නි.ස. වරුවන්ට කිසිදු දිරි දීමනාවක් නො ගෙවීම නිසා ඔවුන් ඒ සඳහා එතරම් උනන්දුවක් නො දක්වන අතර ඔවුන් සඳහා නියමිත ඇගයීම් ක්‍රමය ද මේ වන විට ක්‍රියාත්මක නොවීම මත ගොවි බැංකු ණය වැඩපිළිවෙළ සඳහා කෘ.ප.නි.ස. වරුන්ගෙන් ලැබෙන දායකත්වය අඩු බව නිරීක්ෂණය විය. එසේ ම, ගොවි බැංකු ණය පිළිබඳව විධිමත් පසු විපරමක් සිදු නොවීමත්, එම කටයුත්ත බැංකුව තුළ සිටින එක් නිලධාරයෙකුට පමණක් තනිවම කළ නො හැකිවීමත් ගොවි බැංකුවේ ණය අයවීම දුර්වලවීමට හේතු වී තිබේ.

**වගු අංක 3.15: ඇලයාපත්තුව ගොවි බැංකුවෙ හි ණය අයවීම: 2001-2010**

| වර්ෂය | ණය වර්ගය | | | | | | | | | | අය කර ගත් මුළු ණය වටිනාකම (රු) | වර්ෂයට අදාළව නිකුත් කළ මුළු ණය වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වගා ණය (රු) | ප්‍රතිශතය (%) | ව්‍යාපෘති ණය (රු) | ප්‍රතිශතය (%) | ක්ෂණික ණය (රු) | ප්‍රතිශතය (%) | අස්වනු නෙලීමේ ණය (රු) | ප්‍රතිශතය (%) | කෘ.ප.නි.ස ක්ෂණික ණය (රු) | ප්‍රතිශතය (%) | | |
| 2001 | 293,084 | 100.00 | - | - | - | - | - | - | - | - | 293,084 | 100.00 |
| 2002 | 593,353 | 100.00 | - | - | - | - | - | - | - | - | 593,353 | 100.00 |
| 2003 | 3,003,645 | 93.20 | - | - | 30,000 | 60.00 | - | - | - | - | 3,033,645 | 88.96 |
| 2004 | 1,533,174 | 87.56 | 154,914 | 59.58 | 30,500 | 81.33 | 10,000 | 50.00 | 35,000 | 77.78 | 1,763,588 | 83.44 |
| 2005 | 968,597 | 87.76 | 26,687 | 18.40 | 154,500 | 80.68 | - | - | - | - | 1,149,784 | 79.84 |
| 2006 | 767,500 | 99.03 | - | - | 85,000 | 91.40 | 15,000 | 75.00 | - | - | 867,500 | 97.69 |
| 2007 | 824,500 | 100.00 | - | - | 25,000 | 100.00 | - | - | - | - | 849,500 | 100.00 |
| 2008 | 1,037,507 | 86.44 | - | - | - | - | - | - | - | - | 1,037,507 | 86.44 |
| 2009 | 2,028,036 | 93.59 | - | - | - | - | - | - | - | - | 2,028,036 | 93.59 |
| 2010 | 694,472 | 55.12 | - | - | - | - | - | - | - | - | 694,472 | 55.12 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

## 3.3.6 ද්‍රව්‍ය ණය ලබාදීම

මෙම බැංකුව ආරම්භක අවධියේ දී ගොවීන්ට ද්‍රව්‍යමය ණය ලබා දී ඇති නමුත් මේ වන විට සම්පූර්ණ ණය ප්‍රමාණයම මුදලින් සපයනු ලැබේ. මෙහි දී, මුදලින් ම ණය ලබාදීමට තීරණය කර තිබෙන්නේ ද්‍රව්‍යමය ණය සැපයූ මුල් අවධියේ දී මෙන් ගොවීන්ට අවශ්‍ය කෘෂි රසායන ද්‍රව්‍ය ආදිය සැපයීමට ගොවිජන සේවා මධ්‍යස්ථානයට අපහසුවීම නිසා ය. ඒ කාලය තුළ දී සිපෙට්කෝ ආයතනය මඟින් මිල දී ගන්නා කෘෂි රසායන ද්‍රව්‍ය ගොවීන්ට ලබාදුන් නමුත් එම ආයතනය මඟින් ලබාදුන් කෘෂි රසායන ද්‍රව්‍ය මඟින් ගොවීන්ගේ අවශ්‍යතා නිසි පරිදි ඉටු වී නැත. ගොවීන්ගේ ප්‍රතිචාරය අනුව ද්‍රව්‍ය ණය පිළිබඳව ඔවුන්ගේ මතය වන්නේ ද තමන්ට අවශ්‍ය කෘෂි රසායන වර්ග කලට වේලාවට ගොවිජන බැංකුව හරහා ලබාගත නො හැකිවීමත්, ගොවි බැංකුව හරහා ලබා දෙන වට්ටම බාහිර වෙළෙඳ නියෝජිතයින් ලබාදෙන වට්ටමට වඩා අඩු වීමත් නිසා ඔවුන්ට ඉන් සැලසෙන ප්‍රයෝජනය අඩු බව යි. මෙහි දී, හැඟී ගිය කරුණක් වූයේ ගොවීන්ට අවශ්‍ය කෘෂි රසායන ද්‍රව්‍ය, බිත්තර වී, පොහොර ආදිය ගොවිජන බැංකුව හරහා අවශ්‍ය වේලාවට අවශ්‍ය ප්‍රමාණයන්ගෙන් මිල දී ගැනීමට තිබේ නම් එය දුෂ්කර ප්‍රදේශවල සිටින ගොවීන්ට ඉතා පහසුවක් වන බවයි. එසේ ම, ඇතැම් ගොවීන් ප්‍රකාශ කළේ බාහිර වෙළෙඳුන්ගෙන් ලබා ගන්නා ඇතැම් කෘෂි රසායන ද්‍රව්‍ය වල ගුණාත්මක බව පිළිබඳව තමන්ට සැහීමට පත්විය නොහැකි බැවින් ගොවිජන බැංකුව හරහා එම ද්‍රව්‍ය වගකීමකින් හා ගුණාත්මක බවින් යුතු ව සැපයේ නම් එයට ගොවීන් වැඩි කැමැත්තක් දක්වන බවත් ය. එසේ ම, මුදල් වශයෙන් ණය සැපයීමේ දී එය වගා කටයුතුවලට හැර වෙනත් කටයුතුවලට යෙදවීමට ඉඩකඩක් පවතින බවත්, එම නිසා ගොවියාට තමන් ණය ලබාගත් අවශ්‍යතාවය නිසි පරිදි ඉටු කරගත නො හැකිවීමෙන් තව තවත් වෙනත් ආයතනවලට ද ණයවීමට සිදු වන බවත්, සමහරෙකුගේ මතය විය. කෙසේ වූව ද, වගා කටයුතුවල මූලික වියදම (සී සෑම ආදිය)

පියවා ගැනීමටවත් ප්‍රමාණවත් මුදලක් මුදල් වශයෙන් සැපයීම සුදුසු බව ඇතැම් ගොවීන්ගේ මතය විය.

### 3.3.7 කණ්ඩායම් ක්‍රමය

මෙම ගොවි බැංකුව තුළ ගොවීන් පස් දෙනාගෙන්. යුත් කණ්ඩායම් වැඩිපුර ක්‍රියාත්මක වන අතර ගොවීන් 4 දෙනා බැගින් සිටින කණ්ඩායම් ද කිහිපයක් ඇත. මේ වන විට ක්‍රියාත්මක වන සමස්ත කුඩා කණ්ඩායම් සංඛ්‍යාව 78කි. මෙම බැංකුව හරහා මුල් අවධියේ දී පුද්ගල ඇප මත ණය නිකුත් කර සාර්ථකව අය කරගෙන ඇති බවත්, කණ්ඩායම් ක්‍රමය ක්‍රියාත්මකවීම සමඟ ගොවීන් ගොවි බැංකුවෙන් ඈත් වී ගිය බවත් දැනගන්නට ලැබුණි. මෙම ක්‍රමයේ අවාසියක් ලෙස ගොවීන් සඳහන් කළේ කණ්ඩායමේ සිටින හොඳින් ණය ගෙවන අය වේලාවට ණය ගෙව්වත් එක් අයෙකු හෝ ණය නො ගෙවීමෙන් ණය ගෙවූ අයටත් අතිකුත් ගොවීන් සියළු දෙනාටත් ඉදිරි කන්නය සඳහා අවශ්‍ය වේලාවට ණය ලබාගත නො හැකි බවයි. එසේ වුව ද, සමීක්ෂණයට ලක්කළ ගොවීන් බහුතරයකගේ අදහස වූයේ කණ්ඩායම් ක්‍රමය නිසා සෑම ගොවියෙකුටම තමන් ලබාගත් ණය පිළිබඳව වගකීමක් ඇති නිසාත්, ණය ආපසු ගෙවන ලෙස කණ්ඩායමේ අනෙක් අය නිතරම දැනුවත් කිරීම නිසාත් කෙසේ හෝ ණය ගෙවීමට සියළු දෙනාම පෙළඹෙන බවත් ය. එසේ ම, කණ්ඩායමේ යම් පුද්ගලයෙකු අසනීප වූ අවස්ථාවක ඔහුගේ වගා කටයුතු කිරීමට අනෙකුත් ගොවීන් සහායවීමත්, අත්තම් ක්‍රමයට වගා කටයුතු කර ගැනීමත්, ඇප සඳහා කණ්ඩායමේ අය ම ඉදිරිපත්වීම නිසා තමන්ට අනෙක් බැංකුවල දී මෙන් කරදර විඳීමට සිදු නොවීමත් යන කාරණා කණ්ඩායම් ක්‍රමය නිසා අත්වන වාසීන් බව ය.

### 3.3.8 ණය සීමාවන්

ගොවි බැංකුව මඟින් වගා ණය වශයෙන් සැපයෙන්නේ උපරිම වශයෙන් රු. 25,000ක මුදලකි. එසේ වුව ද, අදාළ ප්‍රදේශයේ මෙම ගොවීන් ගොවි බැංකුවට ප්‍රකාශ කළේ තමන්ට එක් වී අක්කරයක් සඳහා වගා කටයුතු වෙනුවෙන් රු. 25,000ක් පමණ වැයවන බවයි. මෙම ප්‍රදේශයේ බොහෝ ගොවීන් අක්කර 5ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් වගා කරන අතර වීවලට අමතරව බඩඉරිඟු, මිරිස්, තල, උඳු ආදී බෝග ද වගා කරයි. එම නිසා, ගොවීන්ට අධික මුදලක් වැය වන අතර ගොවීන්ගේ අදහස වූයේ එක් අක්කරයක් සඳහා රු. 25,000ක් හෝ උපරිම වශයෙන් වගා ණය ලෙස රු. 75,000ක මුදලක්වත් ලබාදිය යුතු බවයි.

### 3.3.9 ගොවි බැංකුවෙ හි වර්තමාන ප්‍රගතිය/දුර්වලත්වය සඳහා බලපෑ සාධක

ගොවි බැංකු පිහිටුවීමේ නියමු ව්‍යාපෘතියෙ හි ප්‍රථමයෙන් පිහිටුවන ලද ඇලයාපත්තුව ගොවි බැංකුව විශාල වශයෙන් ඉදිරියට ගොස් නැතත් ගොවීන්ගේ අවශ්‍යතාවන්ට අනුව ප්‍රතිචාර දැක්වීමට දරනු ලැබූ උත්සාහය තුළින් ලබා ඇති ඇතැම් අත්දැකීම් ගොවි බැංකු වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා උපයෝගී කර ගත හැකි ය.

වර්ෂ 1995 දී පටන් ගත් මෙම ගොවි බැංකුව 1998/1999 මහ කන්නයේ සිට ණය දීම ආරම්භ කර ඇති අතර 2002/2003 මහ කන්නය වැනි මුල් යුගයේ දී ගොවීන් 276 දෙනෙකුට රු. 1,650,669ක් වැනි විශාල මුදලක් ණයට දීම දක්වා ඉහළ වර්ධනයක් අත් කරගෙන තිබුණි. ණය සැපයීම සම්බන්ධයෙන් මෙතරම් ඉහළ ප්‍රගතියක් පෙන්වීමට හැකි වී ඇත්තේ එම අවධියෙහි ණය ලබා ගැනීමට ගොවීන් උනන්දු කරවීම හා ආපසු අයකර දීමට ක්‍රියා කිරීම සම්බන්ධයෙන් ක්ෂේත්‍ර මට්ටමෙහි සිටි කෘ.ප.නි.ස. වරුන්ගේ උනන්දුව හා මනා

කැපවීම බව සඳහන් කළ යුතු ය. උදාහරණ ලෙස දැනට ගොවි බැංකු සහායක ලෙස කටයුතු කරන කෘ.ප.නි.ස. මහතා එම තනතුර භාර ගැනීමට ප්‍රථම තම වසමෙහි ගොවීන් 40 දෙනෙකුට ණය ලබා දී සාර්ථකව අයකර ගෙන ඇත. එසේ වුව ද, ඔවුන් තුළ පැවති එම උනන්දුව දිගටම රඳවා ගැනීමට අපොහොසත්වීම පසු කාලයේ දී ණය වැඩපිළිවෙළ පසු බැසීමට හේතු වී තිබේ.

මුල දී ගොවීන් පුද්ගලිකව සම්බන්ධ කර ගනිමින් ඔවුන්ගේ විශ්වාසය දිනා ගැනීම තුළින් ණය ලබාදීම මෙන් ම අය කර ගැනීම ද සාර්ථකව කර ගැනීමට හැකි වී තිබේ. එසේ වුවද, කණ්ඩායම් ක්‍රමය හඳුන්වාදීමෙන් පසු ණය දීමේ ක්‍රියාවලියෙහි පසු බැස්මක් ඇති වූ බව කළමනාකරණයෙහි අත්දැකීම වී ඇත.

වගා ණය ලබාදීමට අමතරව වෙනත් ගොවි බැංකු තුළ නො පැවති ආකාරයේ වූ ක්ෂණික ණය ලබාදීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමත්, මෙම ගොවි බැංකුව මුල් යුගයේ දී වඩාත් ජනප්‍රියවීම සඳහා හේතු වී තිබේ. හදිසි කටයුත්තක දී ගොවි සංවිධානය හා කෘ.ප.නි.ස. ගේ අනුමැතිය යටතේ මාස 3ක දී 3% පොලිය යටතේ ගෙවීම සඳහා රු. 5,000/-ක් ලබාදීම එමඟින් සිදු කරනු ලැබිණි. ඒ අනුව, 2004-2007 කාලය තුළ දී ගොවීන් 83ක් වැනි ප්‍රමාණයකට රු. 397,000ක් වැනි විශාල මුදල් ප්‍රමාණයක් ලබාදීම ගොවීන් ආකර්ෂණය කර ගැනීමට හේතු වූ කරුණක් වී ඇත. සියයට සියයක්ම සාර්ථකව අයවීමේ මට්ටමක් පෙන්වන මෙම ණය ක්‍රමය දෙපාර්තමේන්තුවේ දැනුම්දීම මත නවතා දැමීමට සිදුව ඇත. වගා ණය ලබා ගැනීමේ දී තමන් කැමති අයට මුදලින් ලබා ගැනීමට අවස්ථාව සැලසීමත්, ගොවීන්ගේ ඉතුරුම් තැන්පතු ආපසු ගැනීමේ දී බැංකුව විසින්ම මුදලින් ගෙවීමත්, මෙම ගොවි බැංකුවෙහි විශේෂත්වයක් වෙයි. මේ දක්වා එසේ ගෙවීමේ දී රු. 3000 හෝ ඊට අඩු මුදලක් ගෙවීමට සිදු වී ඇති නිසා එය ගැටළුවක් වී නොමැත. කෙසේ වෙතත්, ඉතුරුම් තැන්පතු ආපසු ගැනීමේ දී චෙක්පත් වෙනුවට කෙලින්ම මුදලින් ගෙවීම නිසා එය ගොවීන්ට චෙක්පත් මාරු කිරීමට යාමට ගත වන කාලය හා වියදම අඩුවීමෙන් සහනයක් වී ඇත. (චෙක්පත් මාරු කිරීම සඳහා කි.මී. 15 දුරින් පිහිටි අනුරාධපුරයට යාම සඳහා බස් වියදම ලෙස රු. 60ක් දැරීමට සිදු වේ). මෙම ගොවි බැංකුව විසින් තමන් සතු අරමුදල් ගොවි බැංකුවෙහි තැන්පත් කරන ලෙස ප්‍රදේශයේ ගොවි සංවිධාන උනන්දු කරවීම නිසා ගොවි සංවිධාන 5ක් රු. 48,470ක් මුදලක් මෙම ගොවි බැංකුවෙහි තැන්පත් කොට ඇති අතර එය ද ගොවි බැංකුවෙහි අරමුදල තරවීම කෙරෙහි බලපා තිබේ.

වෙළෙඳපොළ මිල සමඟ සසඳන්ම නව ගොවීන් ආකර්ෂණය කර ගත හැකි ආකාරයට සහනදායී මිල ගණන්වලට කෘමිනාශක ඇතුළු අනෙකුත් යෙදවුම් ලබාදීම සඳහා ගොවිජන සංවර්ධන අලෙවිසැල දියුණු කිරීමට නො හැකිවීම ණය වැඩසටහන සාර්ථක කර ගැනීමට බාධාවක් වී තිබේ. 2002/2003 මහ කන්නය තුළ දී අලෙවිසැලින් ලබාදුන් යෙදවුම් වීචෘත වෙළෙඳපොළේ මිලට වඩා අධික නිසා ගොවීන් අමනාප වී ණය ගෙවීම පැහැර හැරීමෙන් ඒ සඳහා ප්‍රතිචාර දක්වා ඇත. ඒ සමඟම ගොවීන් ඉල්ලන ආකාරයේ කෘමිනාශක අලෙවිසැලෙහි බොහෝ විට නොමැතිවීම ද ගොවීන්ට ගැටළුවක් වී තිබේ.

ඉහත දැක් වූ හේතුවට අමතරව රජය විසින් කෘෂි ණය කපා හැරීම සඳහා ගත් තීරණයක් ද ගොවීන් විශාල ප්‍රමාණයක් මෙම ගොවි බැංකුවලින් ලබාගත් ණය ගෙවීම පැහැර හැරීමට හේතු වී ඇත. ඒ අනුව, ගොවීන් 42ක් වැනි සංඛ්‍යාවක් රු. 2,201,709ක් වැනි විශාල මුදලක් ගෙවීම පැහැර හැරිය නිසා එය උසාවි මාර්ගයෙන් අයකර ගෙන තිබේ. එසේ වුව ද,

ණය ගෙවීමෙන් පැහැර හැරිය අය නැවත ගොවි බංකුවට සම්බන්ධ කර නො ගන්නා නිසා එම සාමාජිකයන් ගොවි බැංකුවට අහිමි ව ගොස් ඇත.

ප්‍රදේශයට ගැලපෙන පරිදි විවිධ ණය වර්ග හඳුන්වාදීමට අපොහොසත්වීම ගොවි බැංකුවෙහි පරිහානිය කෙරෙහි බලපා තිබේ. සැලකිය යුතු කුඹුරු ඉඩම් ප්‍රමාණයක් වාරි ජලය යටතේ වගා කෙරෙන ප්‍රදේශයක පිහිටි මෙම ගොවිජන බැංකුව විසින් අස්වනු තෙළීමේ ණය ලෙස ලබා දී ඇත්තේ රු.15,000/- බැගින් රු.45,000ක් පමණි. එසේ වුව ද, ගෙවීමේ ප්‍රමාදය නිසා එම ණය ක්‍රමය නවතා දමා ඇත. යන්ත්‍රෝපකරණ ණය ලබා දී ඇත්තේ ද එක් අයෙකුට පමණි.

ඉතිරි කිරීමට පෙළඹවීම, ණය ලබාදීම හා ණය අයකර ගැනීම යනා දී ගොවි බැංකුවේ ප්‍රගමනය සඳහා බලපාන ලබන කාර්යයන් සඳහා කෘ.ප.නි.ස. වරුන්ගෙන් ලැබෙන සහාය ප්‍රමාණවත් නොවන බව පෙනේ.

ලබාදෙනු ලබන ණය ප්‍රමාණයන් වුව ද විශේෂයෙන් ම වී වගාවේ කටයුතුවලට අදාළ කාර්යයන් සැපිරීම සඳහා ප්‍රමාණවත් නොවන බව පෙනේ. උදාහරණ ලෙස මහා වාරිමාර්ගයන් යටතේ කෙරෙන වී වගා කටයුතු සඳහා අක්කරයක බිම් සැකසීමේ සිට අස්වනු කුඹුරෙන් ඉවත් කර ගැනීම දක්වා වූ කාර්යයන් වෙනුවෙන් රු. 25,000ක් පමණ වියදම් වුවත් ගොවි බැංකුවෙන් ලබාදෙනු ලබන්නේ රු. 15,000ක් පමණ වූ මුදල් ප්‍රමාණයකි.

### 3.3.10 යෝජනා

වී ගොවිතැන ප්‍රධාන කෘෂිකර්මාන්තය දියුණු කිරීම සඳහා විශාල සම්පත් ප්‍රමාණයක් ඇති ප්‍රදේශයක පිහිටි ඇලයාපත්තුව ගොවි බැංකුව පවත්නා තත්ත්වයට වඩා දියුණු කිරීම සඳහා ඉහළ විභවතාවයක් ඇති අතර ඒ සඳහා පහත සඳහන් යෝජනා ඉදිරිපත් කෙරේ.

1. ණය ලබාදීමේ සිට සාර්ථකව අය කර ගැනීමේ ක්‍රියාවලිය දක්වා සියළු කටයුතු වෙනුවෙන් ප්‍රාදේශීය නිලධාරීන්ගේ සිට පහළ මට්ටමේ සිටින කෘ.ප.නි.ස. දක්වා වූ සියළු නිලධාරීන්ගේ උපරිම සහාය හා කැපවීම ලබා ගැනීමට සුදුසු පියවර ගැනීම. මෙහි දී සාර්ථකව ණය ලබා දී ආපසු අයකර ගත් ණය ප්‍රමාණය පදනම් කර ගනිමින් ලබා ගන්නා ලාභයෙන් කොටසක් දායක වූ සියළු නිලධාරීන් අතර බෙදා දීමට සැලැස්වීම හා මේ යටතේ දක්වන ලද කාර්යක්ෂමතාව ඔවුන්ගේ උසස්වීම් පරිපාටිය සමඟ සම්බන්ධ කිරීම.

2. ණය ලබා ගැනීමේ දී කණ්ඩායම් ඇප ක්‍රමය අනුගමනය කිරීමට සැලැස්වීම නිසා කණ්ඩායම් හි ඇතුළු සාමාජිකයින් ණය ගෙවීම ප්‍රමාදවීම හෝ පැහැර හැරීම හේතුවෙන් වේලාවට ණය ගෙන නැවත ණය ලබා ගැනීමෙන් සාර්ථකව ආයෝජන කටයුතු කරන්නා වූ අයට තවත් ණය ලබා ගැනීමට ඇති අවස්ථාවට අවහිරයක් වන නිසා වේලාවට ණය ගෙවා ඉදිරියට යන කාර්යක්ෂම ගොවීන් හඳුනා ගැනීම තුළින් ඉඩම් ඔප්පුවක් හෝ වෙනයම් සුරක්ෂිතයක් තබා ගැනීමෙන් ණය ලබාදිය යුතු ය. එසේ වුව ද, සියළුම ගොවීන්ට එවැනි ඇප ඉදිරිපත් කිරීමට අපහසු නිසා ඒ අය වෙනුවෙන් කණ්ඩායම් ඇප ක්‍රමය තවදුරටත් පවත්වාගත යුතු ය.

3. විශේෂයෙන් ම, ප්‍රධාන වාරිමාර්ග ප්‍රදේශවල වී අක්කරයක් වගා කිරීම සඳහා සියළු කටයුතු වෙනුවෙන් රු.25,000 පමණ වැයවන නිසා දැනට වගා ණය ලෙස අයෙකුට ලබාදෙන උපරිම මුදල් ප්‍රමාණය වන රු. 25,000/- ඊට වඩා වැඩි කළ යුතු ය.

4. දැනට ලබාදෙනු ලබන ණය, වගා ණයවලට පමණක් සීමා වී ඇති නිසා වී අස්වනු තෙළීම හා අස්වනු සුරැකිම, යන්ත්‍රෝපකරණ ලබා ගැනීම ඇතුළු ප්‍රදේශය තුළ වඩාත් සාර්ථකව ප්‍රචලිත කළ හැකි ණය ක්‍රම වෙත පිය නැඟිය යුතු ය. මේ තුළින් ගොවීන්ට සැලසෙන සේවාවට අමතරව අරමුදල් වර්ධනය වීම ද සිදු වේ.

5. දැනට ඉතුරුම් වර්ධනය සඳහා තොකඩවා කෙරෙන විශේෂිත වැඩපිළිවෙළක් අනුගමනය නො කෙරෙන බැවින් ඒ සඳහා පියවර ගැනීම. සියළුම ගොවිජන බැංකු සාමාජිකයින් හැම කන්නයකදීම අවම වශයෙන් ඉතිරි කළ යුතු මුදල් ප්‍රමාණයකට එකඟ කරවා ගැනීමෙන් හා ඒ සඳහා ඔවුන් උනන්දු කිරීමෙන් මෙය සැපිරිය හැකි ය.

6. දැනට ගොවි සංවිධාන 5ක් පමණක් තම අරමුදල් ගොවි බැංකුවෙ හි ඉතිරි කිරීම් ගිණුම්වල තැන්පත් කර ඇති අතර ඒ ආකාරයට අනෙක් ගොවි සංවිධාන ද එයට පොළඹවා ගත යුතු ය. එසේ වුව ද, ගොවි සංවිධානවලට කොන්ත්‍රාත් වැනි කාර්යයන් සිදු කිරීමේ දී ඉක්මණින් මුදල් ගැනීමට අවශ්‍ය වන නිසා ගොවි සංවිධානවලට සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් ඉක්මණින් ගැනීමට ඇති හැකියාව තහවුරු කළ යුතු ය.

7. අලෙවිසැල වඩාත් දියුණු කිරීම හා එහි ඇති කෘමිනාශක හා අනෙකුත් ද්‍රව්‍යවල මිල ගොවි ජනතාව ආකර්ෂණය කර ගත හැකි මට්ටමක පවත්වා ගැනීමට වගබලා ගත යුතු ය. මෙය වඩාත් අත්‍යවශ්‍ය කාරණයක් වී තිබෙන්නේ අනුරාධපුර නගරය තුළ හා එයට ආසන්න ප්‍රදේශවල ගොවීන් ද මෙම ගොවි බැංකුවෙ හි සාමාජිකයින්ව සිටින නිසා ය. ඔවුන්ට ද්‍රව්‍ය ණය ලබාදීමේ දී ඔවුන් පදිංචි ප්‍රදේශයේ පවත්නා මිලට වඩා වැඩි වුවහොත් ඔවුන්ව ඒ සඳහා ආකර්ෂණය කර ගැනීමට නො හැකි වේ. දිස්ත්‍රික්කයේ සියළුම ගොවි ජන මධ්‍යස්ථාන වලට අවශ්‍ය කෘමිනාශක ඉහළ කොමිස් සහිතව එකවර මිල දී ගැනීමේ වැඩපිළිවෙලකට යෑම මඟින් මෙය ඉටු කර ගැනීමට හැකි අතර ඒ සඳහා ප්‍රධාන කාර්යාලය මෙන් ම දිස්ත්‍රික්ක කාර්යාලයේ ද සහාය අවශ්‍ය ය. ගොවීන්ගේ බෝග සම්බන්ධයෙන් අත්දැකීමට ලැබෙන විවිධ රෝග හා පළිබෝධ සඳහා විවිධ වර්ගයේ රසායනිකයන් අවශ්‍ය වන අතර ඒවා සැපිරීම කෙරෙහි ද අවධානය යෙදිය යුතු ය.

## 3.4 ඉපලෝගම ගොවි බැංකුව

### 3.4.1 හැඳින්වීම

අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් ඉපලෝගම ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානය පදනම් කර ගනිමින් 1999 වසරේ දී මෙම ගොවි බැංකුව පිහිටුවා ඇත. වී ගොවිතැන මූලික කොටගත් කෘෂි ආර්ථිකයක් ඇති මෙම ගොවි බැංකුවට අයත් බල ප්‍රදේශය ප්‍රධාන වශයෙන් ම සුළු වාරිමාර්ගයන්ගෙන් යුත් ප්‍රදේශයක් වන අතර මහා වාරිමාර්ග (මහවැලි ව්‍යාපාරය) නියෝජනය කරන සුළු ප්‍රදේශයකින් ද සමන්විත ය.

### 3.4.2 සාමාජිකත්ව වර්ධනය

1999/2000 මහ කන්නය තුළ ණය දීම ආරම්භ කළ මෙම ගොවි බැංකුව පිළිබඳ ඇති වාර්තා අනුව 2001 වර්ෂය වන විට කොටස් මිල දී ගත් සාමාජිකයන් සංඛ්‍යාව 1349ක් වූ අතර එම ප්‍රමාණය ප්‍රදේශයේ මුළු පවුල් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 17%ක් විය. මෙම සංඛ්‍යාව 2005 වන විට වර්ධනය වී ඇත්තේ 1355 දක්වා පමණි. මෙම වර්ෂය වන විට ගොවි බැංකුව භාරව කටයුතු කළ කෘ.ප.නි.ස. වරයා වෙනත් ප්‍රදේශයකට මාරුවී ගොස් ඇති අතර ගොවි බැංකුව 2006 සිට නව නිලධාරියෙකු යටතේ ක්‍රියාත්මක විය. එසේ වුව ද, කලින් වර්ෂවල ගොවි බැංකු වාර්තා පිළිබඳ ක්‍රමවත් දත්ත නොමැති වූ බැවින් 2006 වර්ෂයේ සිට ගොවි බැංකුවට බැඳුණු ගොවීන්ගේ තොරතුරු පමණක් වාර්තා කරමින් එතැන් සිට දත්ත යාවත්කාලීන කොට ඇති අතර මේ අනුව 2006 වර්ෂයේ ගොවි බැංකුවේ සාමාජික ගොවීන් සංඛ්‍යාව 125 බව වාර්තා වේ. මෙම ප්‍රමාණය ක්‍රමිකව වර්ධනය වී ඇති අතර 2010 වන විට ගොවි බැංකුවේ කොටස් මිල දී ගත් ගොවීන් ප්‍රමාණය 412 දක්වා වර්ධනය වී තිබේ. මෙය ප්‍රදේශයේ මුළු ගොවි පවුල් සංඛ්‍යාවෙන් 5% ක් පමණ වේ (වගු අංක 3.16). මේ වන විට සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත කුඩා කණ්ඩායම් 69ක් ඇති අතර දැනට ගොවි බැංකුව සමඟ ගනු දෙනු කරන්නේ මෙම ප්‍රදේශයේ ඇති ගොවි සංවිධාන 66 න් 7 ක් තරම් වූ සුළු සංඛ්‍යාවකි. මහවැලි ගොවි සංවිධාන 45ක් මෙම ප්‍රදේශයේ ක්‍රියාත්මක වුව ද, ඔවුන් තම ගොවි සංවිධානවල මුදල් වෙනත් බැංකුවක තැන්පත් කිරීමට කටයුතු කර ඇති නිසා ගොවි බැංකුව සමඟ සම්බන්ධවීම අවම මට්ටමක පවතී.

**වගු අංක 3.16: ඉපලෝගම ගොවි බැංකුවේ සාමාජිකත්ව වර්ධනය: 2001-2010**

| වර්ෂය | සාමාජිකයන් / කොටස් හිමියන් ගණන | කොටස් වල වටිනාකම (රු) | ප්‍රදේශයේ පවුල් සංඛ්‍යාවේ (%) ලෙස | ප්‍රදේශයේ ගොවි පවුල් සංඛ්‍යාවේ (%) ලෙස |
|---|---|---|---|---|
| 2001 | 1,349 | 136,900 | 12.52 | 17.44 |
| 2002 | 1,349 | 136,900 | 12.52 | 17.44 |
| 2003 | 1,353 | 147,000 | 12.56 | 17.50 |
| 2004 | 1,355 | 151,000 | 12.58 | 17.52 |
| 2005 | 1,355 | 151,000 | 12.58 | 17.52 |
| 2006 | 125 | 173,800 | 1.16 | 1.61 |
| 2007 | 198 | 232,737 | 1.84 | 2.56 |
| 2008 | 229 | 360,447 | 2.13 | 2.96 |
| 2009 | 388 | 411,116 | 3.60 | 5.01 |
| 2010 | 412 | 468,360.38 | 3.82 | 5.32 |

මුළු පවුල් සංඛ්‍යාව 10773 කි.

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

### 3.4.3 ගොවි බැංකුවේ ඉතුරුම්, කොටස් ප්‍රාග්ධනය හා ලාභාංශ වර්ධනය

ගොවි බැංකුව සඳහා මුළු ආරම්භක ප්‍රාග්ධන මුදල වශයෙන් රු. 1.075,000ක මුදලක් ගොවි ජන සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා ලබා දී ඇති අතර මෙම මුදල ලබා දී තිබුණේ වාරික කිහිපයකිනි. මුලින් ම 1999.01.28 දින රු. ලක්ෂ 3ක් ද, 1999.11.09 දින රු. 50,000ක් සහ නැවත එම වසරේම නොවැම්බර් 18 වැනි දින රු. ලක්ෂ 2ක් ද, 2000.01.07 රු. දෙලක්ෂ හැත්තෑපත් දහසක් හා එම වසරේම ඔක්තෝම්බර් මාසයේ දී රු. 250,000 ක මුදලක් ද ලැබී ඇත. කෙසේ වුව ද, මෙම ආරම්භක ප්‍රාග්ධන මුදල මේ දක්වාම ගොවි බැංකුව විසින් දෙපාර්තමේන්තුව වෙත යවා නැති අතර ණයදීම සඳහා ප්‍රධාන වශයෙන් උපයෝගී කර ගන්නේ ප්‍රාග්ධන අරමුදල් සඳහා ඇති මුදල් ය. ගොවි බැංකුවේ ඉතුරුම් තැන්පත් හිමියන්ගේ සංඛ්‍යාව 2001 වර්ෂයේ දී 297 සිට 2010 වර්ෂය වන විට 505 දක්වා වර්ධනය වී ඇති අතර පුද්ගල හා කණ්ඩායම් තැන්පත් වටිනාකම රු. 102,230 (2001 වර්ෂය) සිට 2010 වසර වන විට රු. 529.451 දක්වා (වාර්ෂිකව 46% කින්) වර්ධනය වී ඇත. 2001 සිට 2010 දක්වා ගොවි බැංකුවේ කොටස් ප්‍රාග්ධනය වර්ධනය වී ඇත්තේ 27% කින් පමණි. මෙම ගොවි බැංකුව සතු ලාභාංශ එකතුවීමෙන් සැදුන සමුච්ජිත අරමුදල 2001 වන විට රු. 37,023ක් ව පැවති අතර එය 2010 වර්ෂය වන විට රු. 780,371 දක්වා වර්ධනය වී තිබේ. (වගු අංක 3.17). මෙහි වාර්ෂික වර්ධනය 223%කි. මේ අනුව, සමස්ත සංචිත වටිනාකම 2001 වර්ෂයේ රු. 1,351,153ක් ද, 2010 වසර වන විට රු. 2,853,182 ක් ද දක්වා වර්ධනය වී ඇති අතර මෙහි ප්‍රධාන මූලාශ්‍රය වන්නේ දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති මූලික ප්‍රාග්ධන අරමුදල බව පෙනී යයි. එය ආපසු දෙපාර්තමේන්තුව වෙත යොමු කළහොත් ගොවීන්ට ණයදීමේ කටයුතු බොහෝ දුරට අඩාල විය හැකි ය.

**වගු අංක 3.17: ඉපලෝගම ගොවි බැංකුවේ අරමුදල් වර්ධනයඃ 2001-2010**

| වර්ෂය | ප්‍රාග්ධනය (රු) | කොටස් ප්‍රාග්ධනය (රු) | පුද්ගල තැන්පතු (රු) | කණ්ඩායම් තැන්පතු (රු) | මුළු තැන්පතු වටිනාකම (රු) | සමුච්චිත අරමුදල (රු) | සංචිත වටිනාකම (රු) |
|---|---|---|---|---|---|---|---|
| 2001 | 1,075,000 | 136,900 | | | 102,230 | 37,023 | 1,351,153 |
| 2002 | 1,075,000 | 136,900 | | | 225,710 | 126,141 | 1,563,751 |
| 2003 | 1,075,000 | 147,000 | | | 205,710 | 197,181 | 1,624,891 |
| 2004 | 1,075,000 | 151,000 | | | 178,140 | 240,596 | 1,644,736 |
| 2005 | 1,075,000 | 151,000 | | | 204,988 | 247,751 | 1,678,739 |
| 2006 | 1,075,000 | 173,800 | 212,538 | 22,800 | 235,338 | 262,384 | 1,746,522 |
| 2007 | 1,075,000 | 232,737 | 390,327 | 42,850 | 433,177 | 265,881 | 2,006,796 |
| 2008 | 1,075,000 | 360,448 | 499,962 | 53,600 | 553,562 | 333,251 | 2,322,261 |
| 2009 | 1,075,000 | 411,117 | 525,217 | 66,100 | 591,317 | 508,689 | 2,586,123 |
| 2010 | 1,075,000 | 468,360 | 455,401 | 74,050 | 529,451 | 780,371 | 2,853,183 |

මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

### 3.4.4 ණය නිකුත් කිරීම

ගොවි බැංකුව හරහා ගොවීන්ට ප්‍රධාන වශයෙන් වගා ණය හා ව්‍යාපෘති ණය නිකුත් කොට ඇත. වගා ණය ලබාදීමේ දී 60%ක් ද්‍රව්‍ය වශයෙන් (බිත්තර වී, කෘෂි රසායන ද්‍රව්‍ය, එළවළු, බීජ උදළු තල, මී මැසි පෙට්ටි ආදිය) හා 40%ක් මුදලින් ලබා දේ. වගා ණය යටතේ උපරිමය රු. 25,000ක් එක් ගොවියෙකුට ලබා දෙයි. ව්‍යාපෘති ණය යටතේ කෙසෙල් වගාව, කුකුළු පාලනය ආදියට ණය ලබා දී ඇති අතර මේ යටතේ ස්ප්‍රේයර් යන්ත්‍ර 25ක් හා වතුර මෝටර් 20ක් ද, මේ වන විට ලබා දී ඇත. එසේ වුව ද, ගොවීන්ට ණය ලබාදීම සඳහා ගොවි බැංකු අරමුදල ප්‍රමාණවත් නොවීම නිසා 2011 වසර වන විට ව්‍යාපෘති ණය සැපයීම නවතා දමා ඇත. අරමුදල ප්‍රමාණවත් නොවන බැවින් ව්‍යාපෘති ණය ලබා දුනහොත් වැඩි පිරිසකට සේවය සැලසීමට ඇති ඉඩ කඩ ඇහිරී යන බව ගොවි බැංකුවේ නිලධාරීන් ප්‍රකාශ කළ අතර එවැනි ව්‍යාපෘති ණය සඳහා ඉල්ලුම් කරන ගොවීන් ලංකා බැංකුව වැනි බැංකු වෙත යොමු කිරීමට පියවර ගෙන ඇති බව ප්‍රකාශ කරන ලදී. 2001 වර්ෂයේ දී ගොවීන් 186 දෙනෙක් සඳහා වගා ණය වශයෙන් රු. 813,422 මුදලක් ගෙවා ඇත (වගු අංක 3.18). මෙයට පසු වර්ෂවල දී ණය ලබාගත් ගොවීන් සංඛ්‍යාව ක්‍රමිකව අඩු වී ඇති අතර 2005 වර්ෂය සඳහා ණය ලබාදීමක් සිදු වී නැත. 2006 වර්ෂයේ දී එක් ව්‍යාපෘති ණයක් හා වගා ණය යටතේ පොහොර සඳහා ණය නිකුත් කොට ඇති බව වාර්ෂික වාර්තා අනුව දක්වන ලද නමුත් ණය නිකුත් කළ ගොවීන් පිළිබඳ වාර්තා නොවේ. 2007 වර්ෂයේ දී ගොවීන් 284ක් සඳහා වගා ණය නිකුත් කොට ඇති අතර ඉහළ ණය මුදලක් නිකුත් කොට ඇත්තේ 2010 වර්ෂය තුළ දී ය. 2001 වර්ෂය තුළ දී නිකුත් කරන ලද ණය මුදල සමස්ත සංචිත වටිනාකමෙන් 60%ක් වූ අතර අවම ණය ප්‍රමාණයක් එනම්, සංචිත වටිනාකමෙන් 2.8ක් 2006 වසරේ දී නිකුත් කර ඇති බව වාර්තා මඟින් දැක් වේ (වගු අංක 3.19). මෙම ගොවි බැංකුව හරහා 2007 වසරේ සිට මේ දක්වා සංචිත වටිනාකමට වඩා ඉහළ ණය මුදලක් නිකුත් කර ඇති අතර නිලධාරීන් ප්‍රකාශ කළේ මේ වන විට ගොවීන් ඉල්ලුම් කරන ණය ප්‍රමාණය ලබාදීමට තරම් ගොවි බැංකුව සතුව ප්‍රමාණවත් අරමුදලක් නො පවතින බවයි. මේ හේතුව මත ව්‍යාපෘති ණය ගෙවීම මේ වන විට නතර කොට ඇති අතර මෙවැනි තත්ත්වයක් යටතේ තම අවශ්‍යතා ඉටු කිරීමට ගොවි බැංකුව අසමත්ව ඇති හෙයින් ගොවීන් ගොවි බැංකුව හැර යාමට එය ප්‍රබල කරුණක් බවට පත් ව තිබේ. මේ නිසා ගොවි බැංකු අරමුදල, ශක්තිමත් කර ගැනීමට පියවර ගත යුතුව ඇත. මේ සඳහා ගොවීන්ගේ ඉතිරි කිරීම් මුදල් යම් ප්‍රමාණයකට යොදා ගත හැකි නමුත් ගොවීන්ට තම ඉතිරි කිරීම්වල ඇති මුදල් අවශ්‍ය අවස්ථාවල දී ක්ෂණිකව මුදලින් ලබා ගැනීමට පහසුකම් නොමැති බැවින් ඔවුන් ගොවි බැංකුව තුළ ඉතිරි කිරීම් සඳහා ද ඒ තරම් පෙළඹීමක් දැකිය නො හැකි ය.

**වගු අංක 3.18: ඉපලෝගම ගොවි බැංකුව මඟින් නිකුත් කළ ණය වටිනාකම: 2001-2010**

| වර්ෂය | වගා ණය ප්‍රමාණය | | | ව්‍යාපෘති ණය (රු) | ගොවි සංවිධාන ණය (රු) | නිකුත් කළ මුළු ණය වටිනාකම (රු) | ණය ලබාගත් ගොවීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| | යල (රු) | මහ (රු) | එකතුව (රු) | | | | |
| 2001 | 180,282 | 633,140 | 813,422 | - | - | 813,422 | 186 |
| 2002 | 705,830 | 936,607 | 1,642,437 | - | - | 1,642,437 | 151 |
| 2003 | - | 601,250 | 601,250 | - | - | 601,250 | 94 |
| 2004 | 60,375 | 242,400 | 302,775 | - | - | 302,775 | 52 |
| 2005 | - | - | - | - | - | - | - |
| 2006 | - | 33,950 | 33,950 | 15,000 | - | 48,950 | දත්ත නොමැත |
| 2007 | 511,640 | 606,688 | 1,118,328 | 1,599,670 | - | 2,717,998 | 284 |
| 2008 | 1,286,335 | 1,089,505 | 2,375,841 | 820,850 | 25,000 | 3,221,691 | 302 |
| 2009 | - | 2,306,198 | 2,306,198 | 600,000 | - | 2,906,198 | 192 |
| 2010 | 1,684,862 | 2,522,106 | 4,206,968 | 368,750 | - | 4,575,718 | 325 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

**වගු අංක 3.19: සංචිත වටිනාකමට සාපේක්ෂව ඉපලෝගම ගොවි බැංකුව මඟින් නිකුත් කළ ණය වටිනාකම; 2001-2010**

| වර්ෂය | නිකුත් කළ මුළු ණය වටිනාකම (රු) | සංචිත වටිනාකම (රු) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| 2001 | 813,422 | 1,351,153 | 60.20 |
| 2002 | 1,642,438 | 1,563,751 | 105.03 |
| 2003 | 601,250 | 1,624,891 | 37.00 |
| 2004 | 302,775 | 1,644,736 | 18.41 |
| 2005 | - | 1,678,739 | - |
| 2006 | 48,950 | 1,746,522 | 2.80 |
| 2007 | 2,717,998 | 2,006,796 | 135.43 |
| 2008 | 3,221,691 | 2,322,261 | 138.73 |
| 2009 | 2,906,198 | 2,586,123 | 112.38 |
| 2010 | 4,575,718 | 2,853,183 | 160.37 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

### 3.4.5 ණය අයවීම

ගොවි බැංකු වාර්ෂික වාර්තා දත්ත අනුව 2001 සිට 2003 අතර කාලය තුළ ගොවි බැංකුව විසින් නිකුත් කළ ණය වාර්ෂික අයවීම 100%ක් බව පෙන්නුම් කරයි (වගු අංක 3.20). කෙසේ වුව ද, 2004 වර්ෂය තුළ ණය අයවීම 92%ක් පමණ දක්වා පහළ බැස තිබේ. එසේ වුව ද, මේ වන විට එම ණය අයවෙමින් පවතින බව වාර්තා වුව ද,

2000-2006 කාලය තුළ ලබාදුන් ණය, අය වූ ණය මුදල් පිළිබඳව ඇති වාර්තාවල විවිධ අක්‍රමිකතා පවතින අතර එහි මූල්‍යමය නිවැරදිතාව පිළිබඳ සතුටුදායක තත්ත්වයේ තොරතුරු නො පවතී. මෙම ගොවි බැංකුවේ 2006 වර්ෂයේ දී ණය අයවීම 69%ක් වන අතර 2007 වර්ෂය තුළ දී එය 55% දක්වා පහළ බැස ඇත. මෙහි දී, වගා ණය අයවීම 100% වුව ද, සමස්ත ණය අයවීම පහළ බැසීමට හේතු වී ඇත්තේ ව්‍යාපෘති ණය අයවීම 23%ක් වීමයි. කෙසේ වූව ද, 2010 වර්ෂය තුළ දී එම වර්ෂය තුළ නිකුත් කළ ණය ප්‍රමාණයෙන් 85% තරම් ඉහළ ණය අය කර ගැනීමේ ප්‍රතිශතයක් වාර්තා විය. 2008-2010 වර්ෂවල වගා ණය අයවීමේ ප්‍රතිශතය 90% ඉක්මවා තිබේ. මේ වන විට ගෙවා නැති ණය අය කර ගැනීම සඳහා සමථ මණ්ඩලයට යොමු කර ඇති බව වාර්තා විය. ගොවි බැංකුව නිසි විගණනයකට හෝ අධීක්ෂණයකට ලක් වී නො තිබීම නිසා ගොවි බැංකුවේ දත්ත පිළිබඳ නිවැරදි නිගමනයකට එළැඹීමට නොහැකි වන අතර මෙම තත්ත්වය දිගින් දිගටම පැවතුනහොත් මෙහි තිරසරබව පිළිබඳ ප්‍රශ්න මතු වීමේ ඉඩක් පවතී.

**වගු අංක 3.20: ඉපලෝගම ගොවි බැංකුවේ ණය අයවීම: 2001-2010**

| වර්ෂය | ණය වර්ගය | | | | | | අය කර ගත් මුළු ණය වටිනාකම (රු) | වර්ෂයට අදාළව නිකුත් කළ මුළු ණය වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|---|---|---|---|---|
| | වගා ණය (රු) | ප්‍රතිශතය (%) | ව්‍යාපෘති ණය (රු) | ප්‍රතිශතය (%) | ගොවි සංවිධාන ණය (රු) | ප්‍රතිශතය (%) | | |
| 2001 | 813,422 | 100.00 | - | - | - | - | 813,422 | 100.00 |
| 2002 | 1,642,437 | 100.00 | - | - | - | - | 1,642,437 | 100.00 |
| 2003 | 601,250 | 100.00 | - | - | - | - | 601,250 | 100.00 |
| 2004 | 277,873 | 91.78 | - | - | - | - | 277,873 | 91.78 |
| 2005 | - | - | - | - | - | - | 0 | - |
| 2006 | 33,950 | 100.00 | - | - | - | - | 33,950 | 69.36 |
| 2007 | 1,118,328 | 100.00 | 372,507 | 23.28 | - | - | 1,490,835 | 54.85 |
| 2008 | 2,344,848 | 98.70 | 292,188 | 35.60 | 25,000 | 100.00 | 2,662,036 | 82.63 |
| 2009 | 2,243,481 | 97.28 | 171,183 | 28.53 | - | - | 2,414,665 | 83.09 |
| 2010 | 3,897,017 | 92.63 | 37,368 | 10.13 | - | - | 3,934,385 | 85.98 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

## 3.4.6 ද්‍රව්‍ය ණය ලබාදීම

මේ වන විට 60%ක ද්‍රව්‍ය ලබාදීමක් සිදුවන අතර අවශ්‍ය ද්‍රව්‍ය සී.අයි.සී., හේලීස් ආදී සමාගම් මඟින් කම්ටුවට ගෙන එයි. එමඟින් ලැබෙන වට්ටමෙන් 3%ක් කම්ටුව තබා ගන්නා අතර ඉතිරි සම්පූර්ණ වට්ටම ගොවියාට ලබාදෙන බව ප්‍රකාශ විය. කෙසේ වූව ද, පෞද්ගලික වෙළෙඳුන් ගොවීන්ට වැඩි වට්ටමක් ලබාදෙන නිසා ගොවි බැංකුවට ඒ සමඟ තරඟකාරීව ඉදිරියට යාමට අපහසු ය. එසේ ම, සමීක්ෂණයට ලක් කළ ගොවීන් අතරින් වැඩි පිරිසක් ප්‍රකාශ කළේ අවශ්‍ය වේලාවට අවශ්‍ය ප්‍රමාණයන්ගෙන් ඉහළ ගුණාත්මයෙන් යුත් කෘෂි රසායන ද්‍රව්‍ය, බිත්තර වී ආදිය ණය වශයෙන් ගොවි බැංකුවෙන් ලබා ගැනීමට තමන් කැමති බවයි. මුදලින් ණය ලබාගත් විට එය වෙනත් කටයුතුවලට වැයවන බව ගොවීහු ප්‍රකාශ කළ හ. ඇතැම් ගොවීන් ද්‍රව්‍ය ණය ලබා ගැනීමට අකමැති බව ප්‍රකාශ කළ



පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

අතර එයට හේතු වශයෙන් දක්වා තිබුණේ ගොවි බැංකුවෙන් එම ද්‍රව්‍ය ලබා ගැනීමේ දී තමන්ට බාහිර වෙළෙඳසැල්වලට වඩා වැඩි මුදලක් ගෙවීමට සිදුවීමත්, නියමිත වේලාවට අවශ්‍ය ද්‍රව්‍ය ලබාගත නොහැකිවීමත් ය. කෙසේ වුව ද, ගොවීන්ට අවශ්‍ය ද්‍රව්‍ය නිසි වේලාවට ලැබේ නම් ගොවි බැංකුව හරහා ද්‍රව්‍ය ණය ලබා ගැනීමට බොහෝ ගොවීන් යොමු වන බව පැහැදිලි විය. ගොවීන් තමන්ට වඩා සමීප ස්ථානයක් ලෙස ගොවිජන සේවා මධ්‍යස්ථාන පිළිබඳව සිතීම මෙයට හේතුවක් වේ.

### 3.4.7 කණ්ඩායම් ක්‍රමය

පස් දෙනෙකුගේ කුඩා කණ්ඩායම් ක්‍රමය මෙම ප්‍රදේශයේ ද ක්‍රියාත්මක වේ. කුඩා කණ්ඩායම් ක්‍රමය මඟින් ණය ලබා ගැනීමේ දී ඊළඟ කන්නයේ ණය ලබා ගැනීම සඳහා පෙර කන්නයේ ණය ලබාගත් සියළුම සාමාජිකයන් එම ණය ගෙවා තිබීම අත්‍යාවශ්‍ය වේ. එසේ නොමැති වුවහොත් කිසිවෙකුට ණය ලබාගත නො හැකි වේ. මෙම ක්‍රමය නිසා උත්සාහයෙන් ඉදිරියට යන ගොවියාට අවශ්‍ය ණය ගැනීම ගැටළුවක් වේ. එසේ වුව ද, මෙම ප්‍රදේශයේ සමීක්ෂණයට ලක් වූ ගොවීන් අතරින් බහුතරයක් කණ්ඩායම් ක්‍රමයට කැමැත්ත ප්‍රකාශ කළ හ. කණ්ඩායමේ එක් අයෙකු හෝ ණය නො ගෙවා සිටින විට අනික් අය නිරන්තර විමසිල්ලෙන් සිට ඔහුට බලපෑම් කිරීම නිසා ගොවීන්ට කෙසේ හෝ ණය ගෙවීමට සිදු වේ. එසේ ම, කණ්ඩායම තුළ සිටින සියළු දෙනා එකිනෙකා පිළිබඳව මැනවින් දන්නා නිසා යම් අයෙකු තමන්ට ගෙවීමට නො හැකි තරම් වැඩි ණය මුදලක් ලබා ගන්නට ගියහොත් අනෙක් අය ඔහුව ඉන් වළකාලයි. මේ නිසා ණය ලබා ගැනීමේ දී වැඩි වගකීමක් සාමාජිකයන් අතර ඇති වේ. මේ නිසා, මෙම කණ්ඩායම් ක්‍රමය ඇතැම් ප්‍රදේශවලට වඩා හොඳින් ගැළපා ගත හැකි අවස්ථා තිබේ. එසේ ම, බැංකුවේ මූල්‍යමය සුරක්ෂිතතාවයට ද මෙය සුදුසු ක්‍රමයකි. මෙහි දී පස් දෙනාගේ කණ්ඩායම් එකතු කර ගැනීමට ඇති අපහසුතාවය නිසා ඒ වෙනුවට තිදෙනෙකුගෙන් යුත් කණ්ඩායම් ක්‍රමයක් ඇති කිරීම සුදුසු බව ඇතැම් ගොවිහු යෝජනා කළ හ. වෙනත් බැංකුවලින් ණය ගැනීමේ දී ඇපකරුවන් සොයා ගැනීම බලවත් ප්‍රශ්නයක් වුව ද, ගොවි බැංකුව තුළ ණය ලබා ගැනීමේ දී කණ්ඩායමේ අනෙක් අය ඇප වන නිසා එවැනි ගැටළු පැන නො නැඟීම ද මෙම ක්‍රමයේ තවත් වාසියකි.

### 3.4.8 ණය සීමාවන්

ගොවි බැංකුව මඟින් වගා ණය වශයෙන් ලබා දෙන්නේ උපරිම වශයෙන් රු. 25,000ක මුදලකින් යුත් ණයක් වන අතර මෙම මුදලින් 60%ක් ම ද්‍රව්‍ය ලෙස ලබා දේ. එසේ වුව ද, වගා කටයුතු සඳහා වැය වන අධික වියදම සලකා බැලීමේ දී (උදාහරණ ලෙස වී වගාවේ අක්කරයක් සඳහා රු. 20,000ක් පමණ වැය වේ.) ගොවි බැංකුව මඟින් ලබා දෙන ණය මුදල ප්‍රමාණවත් නොවන බවත්, සී සෑම, ගොයම් කැපීම සඳහා කම්කරු හා යන්ත්‍ර සූත්‍ර වෙනුවෙන් වර්තමානයේ අධික මුදල් ප්‍රමාණයක් වැය වන නිසා තමන්ට මුදලින් ද ඊට සරිලන ණයක් ගොවි බැංකුව හරහා ලබාගත හැකි නම් වඩාත් සුදුසු බවත් ගොවිහු ප්‍රකාශ කළ හ. එවිට, ගොවීන්ට බැංකු කිහිපයකින් ණය ලබා ගැනීමට අවශ්‍ය නොවන අතර පහසු පොළියකට ගොවි බැංකුව හරහා ණය ලබා ගත හැකි වේ.

### 3.4.9 යෝජනා

1. ගොවි බැංකු බල ප්‍රදේශයේ ඇති ගොවීන්ගේ ප්‍රමාණයෙන් ඉතා සුළු ප්‍රමාණයක් පමණක් ගොවි බැංකුවට බැඳී සිටින අතර (5%ටත් අඩු ප්‍රමාණයක්) සාමාජිකත්වය වර්ධනය කිරීමට කටයුතු කළ යුතු ය.
2. ලබාදුන් ණය අයකර ගැනීමේ පසු බැසීමක් ඇති නිසා ණය අයකර ගැනීමට පියවර ගත යුතු ය.

## 3.5 මැදිරිගිරිය ගොවි බැංකුව

### 3.5.1 හැඳින්වීම

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මැදිරිගිරිය ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානය කේන්ද්‍ර කරගෙන මෙම ගොවි බැංකුව පිහිටුවා ඇත. මැදිරිගිරිය ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානය මින්නේරිය, කවුඩුල්ල වැනි මහා වාරිමාර්ග බල ප්‍රදේශයන් මෙන් ම එම ප්‍රදේශයන්ගෙන් ඉවතට එන ජලයෙන් පෝෂිත වන සුළු වාරිමාර්ග ප්‍රදේශයන් ද, වර්ෂාපෝෂිත වගා ප්‍රදේශයන්ගෙන් ද සමන්විත වේ. වියළි කලාපයට අයත් වන මෙම ගොවිජන සංවර්ධන බල ප්‍රදේශය තුළ සිටින ගොවීන්ගෙන් වැඩි පිරිසක් යල මෙන් ම මහ කන්නයේ ප්‍රධාන වශයෙන් ම වාරි ජලය උපයෝගී කොටගෙන වී වගාවෙ හි නිරත වන්නෝ වෙති. වී වගාව සඳහා වඩාත් ප්‍රචලිතව පවතින මෙම ප්‍රදේශය තුළ සිටින ගොවීන්ගෙන් වැඩි පිරිසක් එය යැපුම් මෙන් ම වාණිජ කටයුත්තක් ලෙස ද සිදු කරන්නෝ වෙති. ඒ හේතුවෙන් ම, සැලකිය යුතු වී අතිරික්තයක් ප්‍රදේශය තුළින් රටට දායාද කෙරේ.

ප්‍රදේශයේ සිටින මුළු ගොවි පවුල් සංඛ්‍යාව 12,194ක් වන අතර ප්‍රදේශයේ තිබෙන ගොවි සංවිධාන සංඛ්‍යාව 90ක් වේ. ඉන් ගොවි සංවිධාන 64ක් සුළු වාරිමාර්ග ගොවි සංවිධාන වන අතර 26ක් මහා වාරිමාර්ග ගොවි සංවිධානයන් ය.

1999/2000 මහ කන්නයේ දී, මෙම ගොවි බැංකුව හරහා ණය ලබාදීම ආරම්භ විය. මෙයට ප්‍රදේශයේ ඇති මහා වාරිමාර්ග ගොවි සංවිධානවලින් 48% (31)ක් හා සුළු වාරිමාර්ග ගොවි සංවිධාන වලින් 96% (25)ක් දායක වී තිබුණි.

### 3.5.2 සාමාජිකත්ව වර්ධනය

මෙම ප්‍රදේශයේ සිටින මුළු ගොවි පවුල් සංඛ්‍යාව 12,794ක් වන අතර ආරම්භයේ දී එනම්, 2000 වර්ෂය වන විට ගොවිජන බැංකුවේ සාමාජිකත්වය ලද සංඛ්‍යාව ප්‍රදේශයේ මුළු ගොවි පවුල් සංඛ්‍යාවෙන් 1.48%ක් තරම් වූ සුළු ප්‍රමාණයකි. මෙම සාමාජිකත්වය 2002 වර්ෂය වන විට 1,610ක් දක්වා එනම්, ප්‍රදේශයේ සමස්ත ගොවි පවුල් සංඛ්‍යාවෙන් 12.5%ක් දක්වා වර්ධනය වී ඇති අතර සාමාජිකත්ව වර්ධනය උපරිමයෙන් ම සිදු වී ඇත්තේ මෙම වර්ෂය තුළ දී ය. 2010 වර්ෂය වන විට ප්‍රදේශයේ මුළු පවුල් සංඛ්‍යාවෙන් 21%ක් මෙම ගොවි බැංකුව සමඟ සම්බන්ධ වී ඇත (වගු අංක 3.21). මේ වන විට මහා වාරිමාර්ග ගොවි සංවිධාන 31ක් හා සුළු වාරිමාර්ග ගොවි සංවිධාන 13ක් මැදිරිගිරිය ගොවිජන බැංකුව සමඟ සක්‍රීයව දායක වී ඇති අතර කුඩා කණ්ඩායම් 365ක් ක්‍රියාකාරී වේ. මෙම කුඩා කණ්ඩායම් පස් දෙනෙකුගෙන් හෝ තිදෙනෙකුගෙන් සමන්විත වේ.

වගු අංක 3.21: මැදිරිගිරිය ගොවි බැංකුවේ සාමාජිකත්ව වර්ධනය; 2000-2010

| වර්ෂය | සාමාජිකයන් / කොටස් හිමියන් ගණන | කොටස් වල වටිනාකම (රු) | ප්‍රදේශයේ පවුල් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|
| 2000 | 189 | 16,200 | 1.48 |
| 2001 | 538 | 156,440 | 4.21 |
| 2002 | 1,610 | 340,040 | 12.58 |
| 2003 | 1,996 | 417,440 | 15.60 |
| 2004 | 2,004 | 418,240 | 15.66 |
| 2005 | 2,013 | 419,840 | 15.73 |
| 2006 | 2,090 | 444,940 | 16.34 |
| 2007 | 2,203 | 1,165,540 | 17.22 |
| 2008 | 2,269 | 1,433,044 | 17.73 |
| 2009 | 2,435 | 1,616,321 | 19.03 |
| 2010 | 2,655 | 2,026,921 | 20.75 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

### 3.5.3 ගොවි බැංකුවේ ඉතුරුම්, කොටස් ප්‍රාග්ධනය හා ලාභාංශ වර්ධනය

මෙම ගොවි බැංකුව සඳහා 2001 වර්ෂයේ දී රු. ලක්ෂ 2ක ප්‍රාග්ධනයක් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් ලැබී ඇති අතර නැවත 2002 වර්ෂයේ දී රු. ලක්ෂ 30ක් ලැබී තිබේ. 2003 වර්ෂයේ දී රු. ලක්ෂ 97ක් දක්වා වර්ධනය වූ මූලික ප්‍රාග්ධන අරමුදල් 2011 වර්ෂය වන විට සම්පූර්ණයෙන් ම ගොවිජන සේවා දෙපාර්තමේන්තුව වෙත යැවීමට සමත් ව තිබීම මෙහි සාර්ථකත්වය පෙන්නුම් කරන්නකි. ගොවීන්ගේ කණ්ඩායම් හා පුද්ගල ගිණුම්වල වටිනාකම 2009 වර්ෂය වන විට රු. 9,067,958ක් දක්වා වර්ධනය වී ඇති අතර වාර්ෂික වර්ධනය 208%කි. මෙහි කණ්ඩායම් ගිණුම්වලට සාපේක්ෂව පුද්ගල තැන්පතුවල විශාල වශයෙන් මුදල් ඉතිරි කිරීමට ගොවීහු පෙළඹී සිටිති. ගොවි බැංකුවේ අරමුදල වර්ධනය කර ගැනීමට මෙම බැංකුව විසින් විශේෂ ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන ඇති අතර මේ යටතේ එක් කන්නයකට එක් ගොවියෙකු රු. 1,000 බැගින් පුද්ගල ගිණුම්වල තැන්පත් කළ යුතු වේ. කණ්ඩායම් ගිණුමේ මසකට රු. 50 බැගින් එක් ගොවියෙකු විසින් මුදල් ඉතිරි කිරීම් කළ යුතු ය. එසේ ම, ගොවීන් විසින් මිල දී ගන්නා ලද කොටස්වල මුළු වටිනාකම 2009 වර්ෂයට සාපේක්ෂව 104%ක වාර්ෂික වර්ධනයක් පෙන්නුම් කරයි. 2009 වනවිට ගොවි බැංකුව මඟින් ලබා දෙන ණය පොළී ලාභාංශ හා වෙනත් ලාභාංශවලින් ගොඩනැඟී ඇති සමුච්ඡිත අරමුදලේ වටිනාකම රු. ලක්ෂ 26ක් ව පැවති අතර මේ අනුව 2009 වර්ෂයේ දී මූලික ප්‍රාග්ධනය, තැන්පත්, කොටස් ප්‍රාග්ධනය හා සමුච්ඡිත අරමුදල එකතු වී වර්ධනය වූ සමස්ත සංචිත වටිනාකම රු. 20,290,457ක් ව පැවතිනි. මෙම සමස්ත අරමුදල ගොවීන්ගේ ණය අවශ්‍යතා සපුරාලීම සඳහා යොදා ගැනීමට මැදිරිගිරිය ගොවි බැංකුව ක්‍රියා කරයි (වගු අංක 3.22).

වගු අංක 3.22: මැදිරිගිරිය ගොවි බැංකුවේ අරමුදල් වර්ධනය; 2000-2010

| වර්ෂය | ප්‍රාග්ධනය (රු) | කොටස් ප්‍රාග්ධනය (රු) | පුද්ගල තැන්පතු වටිනාකම (රු) | කණ්ඩායම් තැන්පතු (රු) | මුළු තැන්පතු (රු) | සමුච්චිත අරමුදල (රු) | සංචිත වටිනාකම (රු) |
|---|---|---|---|---|---|---|---|
| 2000 | - | 16,200 | 460,608 | - | 460,608 | - | 476,808 |
| 2001 | 200,000 | 156,440 | 833,422 | - | 833,422 | 33,219 | 1,223,081 |
| 2002 | 3,200,000 | 340,040 | 2,372,442 | - | 2,372,442 | 157,767 | 6,070,249 |
| 2003 | 9,700,000 | 417,440 | 4,467,198 | - | 4,467,198 | 411,273 | 14,995,911 |
| 2004 | 9,700,000 | 418,240 | 4,879,855 | - | 4,879,855 | 1,738,167 | 16,736,262 |
| 2005 | 9,700,000 | 419,840 | 5,197,337 | - | 5,197,337 | 1,816,913 | 17,134,091 |
| 2006 | 9,700,000 | 444,940 | 5,589,494 | 827,916 | 6,417,410 | 2,925,070 | 19,487,421 |
| 2007 | 9,700,000 | 1,165,540 | 5,860,351 | 1,034,442 | 6,894,792 | 4,123,978 | 21,884,311 |
| 2008 | 9,700,000 | 1,433,044 | 6,593,798 | 1,333,637 | 7,927,435 | 3,304,742 | 22,365,221 |
| 2009 | 7,000,000 | 1,616,321 | 7,448,891 | 1,619,067 | 9,067,958 | 2,606,178 | 20,290,457 |

ප්‍රාග්ධනය යනු: ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගොවි බැංකු වෙත සපයන ලද මුදල
සංචිත යනු: ප්‍රාග්ධනය,කොටස් ප්‍රාග්ධනය,තැන්පතු වටිනාකම සහ සමුච්ඡිත අරමුදලේ වටිනාකම් වල එකතුව

### 3.5.4 ණය නිකුත් කිරීම

මැදිරිගිරිය ගොවි බැංකුව මඟින් මුල් අවධියේ දී ගොවීන්ට අවශ්‍ය වගා ණය හා කෘෂි උපකරණ ණය සපයා තිබේ. මේ වන විට, මෙය තවදුරටත් ව්‍යාප්ත කරමින් අස්වනු තෙළීමේ ණය රු. 15,000ක් දක්වාත්, වී සුරකුම් ණය රු. 75,000ක් දක්වාත්, යන්ත්‍රෝපකරණ ණය රු. ලක්ෂ 3ක් දක්වාත් ලබාදීමට කටයුතු කොට ඇත. වගා ණය ලබා දෙන උපරිම ප්‍රමාණය රු. 25,000කි. මේ යටතේ කෘෂි රසායන ද්‍රව්‍ය හා පොහොර, ද්‍රව්‍ය ණය වශයෙන් ගොවීන්ට සපයනු ලැබේ. ණය අනු කමිටුව මඟින් ගනු ලබන තීරණ මත ගොවීන්ට ණය සපයන අතර ගොවීන්ගේ ඉල්ලීම අනුව කුමන ද්‍රව්‍ය අවශ්‍ය ද යන්න සොයා බලා අදාළ සමාගම්වල නියෝජිතයින්ගෙන් විකුණා මුදල් ගෙවීමේ පදනම මත කෘෂි රසායන ද්‍රව්‍ය කමිටුව වෙත මිල දී ගනී. මෙහි දී, 26-30% අතර වට්ටමක් ගොවිජන සේවා කමිටුවට ලැබේ. අත්පිට මුදලින් කිසියම් හෝ ණය මුදලක් ගොවීන්ට ලබාදීමට මෙම ණය කමිටුව තීරණයක් ගෙන නැත. 2001 වර්ෂය සඳහා රු. ලක්ෂ 27ක මුදලක් ගොවීන් 434 දෙනෙක් සඳහා වගා ණය වශයෙන් සපයා ඇති අතර 2002 වර්ෂයේ දී ලබා දී ඇති ණය මුදල පෙර වර්ෂයට සාපේක්ෂව 232%කින් ඉහළ ගොස් තිබේ. මෙම වර්ෂයේ දී වගා ණයට අමතරව කෘෂි උපකරණ ණය ද සපයා ඇත. උපරිම මුදලක් ණය වශයෙන් සපයා ඇත්තේ 2003 වර්ෂයේ දී වන අතර 2004 වර්ෂය වන විට ලබාදුන් ණය මුදල 2002 ට සාපේක්ෂව අඩකින් පමණ පහළ බැස තිබේ. ඉන් පසු වර්ෂවල දී ලබා දී ඇති ණය මුදල සහ ණය ලබාදුන් ගොවීන් ප්‍රමාණයේ විවිධ විචලනයන් දක්නට ලැබෙන අතර 2009 වර්ෂයේ දී නිකුත් කළ මුළු ණය ප්‍රමාණය ගොවීන් 598 ක් සඳහා රු. ලක්ෂ 79.6කි (වගු අංක 3.23). මෙම වර්ෂයේ දී අස්වනු නෙළීමේ ණය ද රු. 15,000 ක් බැගින් නිකුත් කිරීමට කටයුතු කොට තිබේ. 2011 වර්ෂය වන විට එක් ගොවියෙකු සඳහා රු. 75,000 බැගින් වී අස්වනු සුරැකීමේ ණය ලබාදීමේ වැඩසටහනක් ද ක්‍රියාත්මක කර තිබීම මෙම ගොවි බැංකුවේ කටයුතු පුළුල්වීම පිළිබඳ පැහැදිලි සාක්ෂියකි. මෙහි දී, වගා ණය හා අස්වනු නෙළීමේ ණය ලබා ගෙන ඇත්නම් එය අඩු කොට ඉතිරි මුදල ණය වශයෙන් ලබා

දේ. 2001 වර්ෂයේ දී නිකුත් කළ මුළු ණය ප්‍රමාණය ගොවි බැංකුව සතුව එම වර්ෂයේ දී පැවති සමස්ත සංචිත වටිනාකම මෙන් 221%ක් වූ අතර සමස්ත සංචිත වටිනාකමට සාපේක්ෂව අවම ණය මුදලක් සපයා තිබුනේ 2006 වර්ෂයේ දී ය. එය ගොවි බැංකුවේ එම වර්ෂය තුල පැවති සමස්ත සංචිත වටිනාකමින් 31%කි (වගු අංක 3.24). කෙසේ වූව ද, 2003 වර්ෂයෙන් පසුව ගොවි බැංකුව මඟින් වාර්ෂිකව නිකුත් කොට ඇත්තේ එහි සමස්ත සංචිත වටිනාකමට වඩා අඩු මුදල් ප්‍රමාණයකි.

**වගු අංක 3.23: මැදිරිගිරිය ගොවි බැංකුව මඟින් නිකුත් කළ ණය වටිනාකම; 2001-2009**

| වර්ෂය | වගා ණය ප්‍රමාණය | | | කෘෂි උපකරණ ණය (රු) | අස්වනු නෙලීමේ ණය (රු) | නිකුත් කළ මුළු ණය වටිනාකම (රු) | ණය ලබාගත් ගොවීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| | යල (රු) | මහ (රු) | එකතුව (රු) | | | | |
| 2001 | 2,033,183 | 671,903 | 2,705,086 | - | - | 2,705,086 | 434 |
| 2002 | 2,675,689 | 4,930,920 | 7,606,609 | 1,378,800 | - | 8,985,409 | 937 |
| 2003 | 9,370,630 | 8,152,654 | 17,523,284 | 521,590 | - | 18,044,874 | 2111 |
| 2004 | - | 9,372,395 | 9,372,395 | - | - | 9,372,395 | 809 |
| 2005 | 3,701,890 | 5,009,050 | 8,710,940 | 25,560 | - | 8,736,500 | 836 |
| 2006 | 2,549,632 | 3,605,270 | 6,154,902 | 25,560 | - | 6,180,462 | 472 |
| 2007 | 3,252,929 | 3,586,818 | 6,839,747 | 594,696 | - | 7,434,443 | 595 |
| 2008 | 4,661,140 | 4,892,829 | 9,553,969 | 278,000 | - | 9,831,969 | 645 |
| 2009 | 1,908,704 | 5,947,187 | 7,855,891 | 59,300 | 45,000 | 7,960,191 | 598 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

**වගු අංක 3.24: සංචිත වටිනාකමට සාපේක්ෂව මැදිරිගිරිය ගොවි බැංකුව මඟින් නිකුත් කළ ණය වටිනාකම: 2001-2009**

| වර්ෂය | නිකුත් කළ මුළු ණය වටිනාකම (රු) | සංචිත වටිනාකම (රු) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| 2001 | 2,705,086 | 1,223,081 | 221.17 |
| 2002 | 8,985,409 | 6,070,249 | 148.02 |
| 2003 | 18,044,874 | 14,995,911 | 120.33 |
| 2004 | 9,372,395 | 16,736,262 | 56.00 |
| 2005 | 8,736,500 | 17,134,091 | 50.99 |
| 2006 | 6,180,462 | 19,487,421 | 31.72 |
| 2007 | 7,434,443 | 21,884,311 | 33.97 |
| 2008 | 9,831,969 | 22,365,221 | 43.96 |
| 2009 | 7,960,191 | 20,290,457 | 39.23 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

මෙම ගොවි බැංකුව අනෙකුත් ගොවි බැංකු සමඟ සන්සන්දනය කිරීමේ දී ඉන් බොහොමයකට වඩා මහා පරිමාණ වශයෙන් යන්ත්‍රෝපකරණ ණයවලට ගොස් තිබේ. චක්‍රලේඛ අනුව, ලබා ගන්නා ණය මුදලින් 10%ක කොටස් මිල දී ගෙන තිබිය යුතු නිසා ගොවීන්ට රු. ලක්ෂ 3ක් පමණ වටිනා ට්‍රැක්ටර් ආදිය ගොවි බැංකුව හරහා මිල දී ගැනීමේ දී රු. 30,000ක් වැනි මුදලක් තැන්පත් කිරීමට සිදු වේ. මෙම කොටස් මුදල් නැවත ගොවියාට ලබා ගත නො හැකි නිසා එහි දී අනවශ්‍ය පීඩනයකට ගොවියා හසුවන අතර මෙවැනි අපහසුතා ගොවීන් ගොවි බැංකුව වෙත යොමුවීම අඩාල කරවීමට හේතු වේ. ණය

නිකුත් කිරීමේ මුල් අවධියේ දී, ගොවිජන සේවා මධ්‍යස්ථානය සමඟ ක්‍රියා කරන කෘ.ප.නි.ස. වරුන්ට ප්‍රවාහන කටයුතු පහසු කර ගැනීම සඳහා 9% පොලියට ගොවි බැංකුව හරහා යතුරු පැදි ලබා දී සාර්ථකව අයකර ගත් නමුත් පසුව එම ණය ක්‍රමය ක්‍රියාත්මක නොවූ බව අනාවරණය විය.

## 3.5.5 ණය අයවීම

කෘෂි උපකරණ ණය අය කර ගැනීම කන්න 6ක් තුළ සිදු කරන අතර වගා ණය මෙන් ම කන්නය තුළ ම මුළු ණය මුදල අය නොවන නිසා වාර්ෂිකව අය කර ගැනීම් සඳහන් කිරීමේ දී හිඟ ණය ලෙස පෙන්නුම් කෙරේ. වගා ණය නැවත අයවීම පිළිබඳව පමණක් මෙහි දී සොයා බලන අතර මේ අනුව 2001 වර්ෂය සඳහා නිකුත් කළ ණය 100%ක් ම අය වී තිබේ (වගු අංක 5). අඩුම ණය අයවීමක් පෙන්නුම් කරන්නේ 2002 වර්ෂයේ වන අතර එය 85%කි. 2006 වසරේ සිට සෑම වර්ෂයකදී ම වගා ණය නැවත අයවීම 95% ඉක්මවා පවත්වාගෙන යෑමට සමත් ව තිබේ. මේ සඳහා ගොවිජන මධ්‍යස්ථානය හරහා පසු විපරම මනාව සිදු වීම බලපා තිබේ.

**වගු අංක 3.25: මැදිරිගිරිය ගොවි බැංකුවේ ණය අයවීම: 2001-2009**

| වර්ෂය | ණය වර්ගය | | | | අය කර ගත් මුළු ණය වටිනාකම (රු) | වර්ෂයට අදාළව නිකුත් කළ මුළු ණය වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|---|---|---|
| | වගා ණය (රු) | ප්‍රතිශතය (%) | අස්වනු තෙලීමේ ණය (රු) | ප්‍රතිශතය (%) | | |
| 2001 | 2,705,086 | 100.00 | - | - | 2,705,085.50 | 100.00 |
| 2002 | 6,873,815 | 90.37 | - | - | 6,873,815.00 | 90.37 |
| 2003 | 16,600,745 | 94.74 | - | - | 16,600,744.50 | 94.74 |
| 2004 | 7,994,149 | 85.29 | - | - | 7,994,149.00 | 85.29 |
| 2005 | 8,005,340 | 91.90 | - | - | 8,005,339.50 | 91.90 |
| 2006 | 6,110,007 | 99.27 | - | - | 6,110,006.50 | 99.27 |
| 2007 | 6,805,087 | 99.49 | - | - | 6,805,086.50 | 99.49 |
| 2008 | 9,545,150 | 99.91 | - | - | 9,545,149.75 | 99.91 |
| 2009 | 7,620,412 | 96.45 | 45,000 | 100.00 | 7,665,411.50 | 97.02 |

සටහන: කෘෂි උපකරණ ණය අයවීමේ නිවැරදි දත්ත නොමැති නිසා වගුවට ඇතුළත් කර නැත.
මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

## 3.5.6 ද්‍රව්‍ය ණය ලබාදීම

මෙම ගොවි බැංකුවේ ණය අනු කමිටුව ගෙන ඇති තීරණයක් අනුව ගොවි බැංකුවෙන් ණය ලබා ගන්නා ගොවීන්ට එම ණය මුදල ද්‍රව්‍යවලින් ලබාදීමට කටයුතු කර ඇත. මෙහි දී, පොහොර හා වෙනත් වල් නාශක, කෘමි නාශක යනාදිය ගොවීන්ට ලබා දෙන අතර සමීක්ෂණයට ලක් වූ බොහෝ ගොවීන් ප්‍රකාශ කළේ ද්‍රව්‍ය වශයෙන් ණය සැපයීම තමන්ට පහසුවක් වන අතර මේ නිසා ලබා ගන්නා ණය වගා කටයුතුවලට ම යෙදවිය හැකි බවත්, වෙනත් බැංකුවලින් ලබා ගන්නා ණය මුදල් මෙන් වෙනත් කටයුතුවලට නො යෙදවෙන බවත් ය. එසේ ම, අවම වශයෙන් සෑම ගොවියෙකුම කුඹුරු අක්කර දෙකක්වත් වගා කරන නිසාත්, බොහෝ ගොවීන් වෙනත් අයගෙන් වී බදු, උකස් යනා දී ක්‍රමයන්ට ලබාගත් ඉඩම් ද

ඇතුළුව වගා කරන ඉඩම් ප්‍රමාණය අක්කර 5කටත් වැඩි නිසාත්, අනිවාර්යයෙන් ඒ සඳහා පොහොර හා කෘමිනාශක ලබා ගැනීමට වෙනත් දුර බැහැර ප්‍රදේශ කරා යාමට කාලය මිඩංගු කිරීම අපහසු නිසාත්, ඔවුන්ට ලබාදෙන ණය ද්‍රව්‍යවලින් ලබාදීම කෙරෙහි ඔවුන් තුළ කැමැත්තක් පවතී. ඒවා ලබාගැනීමට පිටස්තර කඩ වෙත යාමට සිදු වුවහොත් කුළී වැඩ හෝ වෙනත් අමතර ආදායම් ඉපැයීමේ කටයුතු (වෙන අයගේ ඉඩම් හැම) වෙනුවෙන් කාලය යෙදීමට අපහසුවීම පමණක් නොව, ප්‍රදේශයේ බාහිර වෙළෙඳසැල්වලින් ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානයට වඩා අඩු මිලට කෘමිනාශක යනාදිය ලබාගත නො හැකිවීමත් ද්‍රව්‍යමය ණය ලබාදීම කෙරෙහි කැමැත්ත දැක්වීමට හේතු වී තිබේ.

පොහොර සහනාධාරය හෝ අවම වශයෙන් ගොවි බැංකු ණය මුදලින් ලබාදීමට මෙම ගොවි බැංකුව කටයුතු කොට ඇත. ගොවීන්ගේ ඉල්ලීම අනුව අදාළ ආයතන සම්බන්ධ කර ගනිමින් කෘෂි රසායන ද්‍රව්‍ය විකුණා මුදල් ගෙවීමේ පදනම මත මිල දී ගෙන ගොවීන්ට නිකුත් කිරීමට මෙම ගොවි බැංකුව කටයුතු කර තිබීම අනුව සමීක්ෂණයට භාජනය වූ අනෙකුත් ගොවි බැංකුවලට සාපේක්ෂව සාර්ථකත්වයක් අත්පත් කරගෙන ඇති බව ප්‍රකාශ කළ හැකි ය.

මෙම ගොවිජන සේවා බල ප්‍රදේශයෙහි විශාල ප්‍රදේශයක් කඩ සාප්පු හා වෙළෙඳ මධ්‍යස්ථානයන්ගෙන් දුර බැහැර හුදකලා ප්‍රදේශවීම නිසා ගොවීන්ට තනි තනිව එය මිල දී ගැනීමට අපහසු තත්ත්වයක් ඇති කරවයි. එසේ වුව ද, ඇතැම් ගොවීන් ප්‍රකාශ කළේ ගොවිජන බැංකුව හරහා ද්‍රව්‍ය මිල දී ගැනීමේ දී තමන්ට වැඩි මුදලක් වැය කිරීමට සිදු වන බවත්, බාහිර වෙළෙඳ සැල් හරහා මෙයට වඩා අඩු මුදලකට එම ද්‍රව්‍ය මිල දී ගත හැකි බවත් ය. එසේ ම, ඇතැම් අවස්ථාවල දී අවශ්‍ය ද්‍රව්‍ය අවශ්‍ය අවස්ථාවල දී ලබා ගැනීමට ගොවිජන බැංකුව තුළ නොමැති බව ද ගොවීහු ප්‍රකාශ කළ හ.

### 3.5.7 කණ්ඩායම් ක්‍රමය

මෙම ගොවි බැංකුව තුළ ද පස් දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායම් ක්‍රමය මුලින් පැවති ය ද, එම ක්‍රමයේ දී බොහෝ ගොවීන්ට අසාධාරණයක් සිදු වූ බැවින් පස් දෙනා වෙනුවට දැනට වසර 3ක පමණ සිට තිදෙනෙකුගෙන් යුත් කණ්ඩායම් ඇති කිරීමට ක්‍රියා කොට තිබේ. බොහෝ ගොවීන්ගේ අදහස වූයේ මෙම තුන්දෙනාගේ කණ්ඩායම්, පහේ කණ්ඩායමට වඩා සාර්ථකව ක්‍රියාත්මක වන බවයි. එසේ ම, ඇතැම් අවස්ථාවල දී සිව් දෙනාගේ කණ්ඩායම් ද දැකගත හැකි විය. මෙහි දී සිදු වී තිබුණේ පස් දෙනෙකු සිටි කණ්ඩායමකින් යම් එක් පුද්ගලයකු ණය නො ගෙවූ විට ඔහුගේ කොටස් වටිනාකමින් ඔහු ලබාගත් ණය මුදල අඩු කර ඔහු කණ්ඩායමෙන් ඉවත් කිරීමයි.

මෙම ගොවි බැංකුව මගින් සෑම කන්නයක් සඳහා ම ගොවීන්ගෙන් රු. 1000ක පුද්ගලික තැන්පත් හා මසකට රු. 50ක කණ්ඩායම් තැන්පත් ලබා ගන්නා නිසා බැංකුව සමඟ ගනුදෙනු කරන සෑම ගොවියෙකුම සතුව ඉහළ තැන්පත් මුදලක් පවතී. ඔවුන් ණය ලබා ගැනීමේ දී ණය ආපසු අය කර ගැනීම පිළිබඳව එතරම් ගැටළුවක් ඇති නොවේ. කණ්ඩායම් ක්‍රමය නිසා ණය අය කර ගැනීම ගොවි බැංකුවට පහසුවක් වී ඇති අතර ගොවීහු තමන්ගේ වැඩ කටයුතු හුවමාරු කර ගනිමින් සහයෝගයෙන් කටයුතු කිරීමට පෙළඹී සිටිති.

### 3.5.8 ණය සීමාවන්

ගොවි බැංකුව මගින් වගා ණය වශයෙන් ලබා දෙන රු. 25,000ක ණය මුදල පොහොර හා වල් නාශක, කෘමි නාශක ආදිය මිල දී ගැනීමට පමණක් ප්‍රමාණවත් වන අතර මෙම ප්‍රදේශයේ බහුතරයක් ගොවීන් කුඹුරු අක්කර 2 - 3 1/2 ප්‍රමාණයකුත් එයට අමතරව රක්ෂිත වල ද වගා කරන නිසා එම ගොවීන්ට වී වගාව සඳහා විශාල වියදමක් දැරීමට සිදු

වේ. වී වගාවේ අක්කරයක් සඳහා රු. 23,000ක් පමණ වැය වන අතර සී සෑමේ දී හී තුනක් වෙනුවෙන් පමණක් රු. 8,500ක් පමණ වැය වේ. එසේ ම, අස්වනු කැපීමට අක්කරයට රු. 8,000ක් පමණ වැය වේ. මේ අනුව, වී වගාවේ විවිධ අදියර සඳහා මුදලින් අති විශාල වියදමක් දැරීමට මෙම ගොවීන්ට සිදුවන අතර ඒ සඳහා තම රත්‍රං බඩු උකස් කර මුදල් ගැනීමට හෝ වෙනත් බැංකු වෙත යාමට සිදු වී තිබේ. බොහෝ ගොවීන්ගේ අදහස වන්නේ තමන්ට බැංකු කිහිපයක් වෙත යාම අපහසු බැවින් ගොවි බැංකුව හරහා මුදලින් ද යම් ණය ප්‍රමාණයක් ලබාදීම සුදුසු බවයි. එසේ ම, ගොවි බැංකුව හරහා ලබා දෙන වගා ණය උපරිම ප්‍රමාණය රු. 50,000 දක්වා වත් වැඩි කිරීම සුදුසු බව ගොවීන්ගේ අදහස විය. තව ද, රු. 10,000 සිට ලක්ෂ 3 දක්වා වන ණය අනුමත කර ගැනීමට දිස්ත්‍රික් කාර්යාලය වෙත යාමට සිදු වී තිබීම වර්තමානයේ මෙම ප්‍රදේශයේ ගොවීන්ගේ ණය අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා බාධකයක්ව තිබේ. එසේ ම, ඇතැම් ගොවි මහතුන්ට විශාල පරිමාණයේ ණය ලබා ගැනීමට අවශ්‍ය වුව ද, ගොවි බැංකු චක්‍රලේඛ හරහා එවැනි අවශ්‍යතා ඉටු කිරීමට බාධා මතු වී තිබීම කැපී පෙණුනි.

### 3.5.9 ගොවි බැංකුවෙ හි වර්තමාන ප්‍රගතිය/දුර්වලත්වය සඳහා බලපෑ සාධක

1. කෘ.ප.නි.ස. වරුන්/වරියන් ගොවි බැංකුව දියුණු කිරීම සඳහා තමන්ගේ බල ප්‍රදේශය තුළ අප්‍රතිහත ධෛර්යයෙන් කටයුතු කිරීම. උදාඃ ලෙස "මහසෙන් බෙදුම් ඇළ ගොවි සංවිධානය" කේන්ද්‍ර කරගෙන සේවයෙ හි නියුතු කෘ.ප.නි.ස වරිය ඒ සම්බන්ධයෙන් අගනා කාර්යභාරයක් ඉටු කොට ඇත. මේ අනුව, ඉතුරුම් හා ණය ලබාදීම සම්බන්ධයෙන් ද කැපී පෙනෙන කාර්යයක් සිදු කොට තිබේ. කුඩා කණ්ඩායමක් විසින් ඒ ඒ සාමාජිකයන් මාසිකව රු. 50/- බැගින් රු. 250/-ක් ද, ගොවියෙකු විසින් පෞද්ගලික තැන්පතු ලෙස මාස 6කට වරක් රු. 1000/-ක් බැගින් ඉතිරි කිරීමට පොලඹවා තිබේ. ඒ අනුව, ගොවි බැංකුවේ ආරම්භයේ සිට මේ දක්වා එක් ගොවියෙකු අඩුම වශයෙන් රු. 19,000/-ක් තැන්පතු ලෙස ඉතිරි කර ඇත. කණ්ඩායමක සාමාන්‍ය තැන්පතු ප්‍රමාණය රු. 25,000/-ක් පමණ වෙයි. එම සංවිධානය යටතේ ඇති කණ්ඩායම් 27 න් සෑම කණ්ඩායමක් ම මෙන් සමාන ප්‍රමාණයන්ගෙන් ඉතුරුම් කොට තිබේ. එම බල ප්‍රදේශයේ ඇති නීත්‍යානුකූල ගොවීන් 197 දෙනාගෙන් 126ක් වැනි විශාල ප්‍රමාණයක් එහි සාමාජිකයින් බවට පත් කරගෙන ඇත. බොහෝ ගොවීන්ට රු. 25,000/- දක්වා ණය දෙනු ලබන අතර ස්ප්‍රේයර් (හැන්ඩ් ස්ප්‍රේ හා බලවේග ස්ප්‍රේ යන්ත්‍ර), සී - පෑන් ට්‍රැක්ටර් යන්ත්‍ර යනාදිය ද ණය වශයෙන් ලබා දී තිබේ. පිට පිට කන්න දෙකක දී සිදු වූ ගංවතුර හානි අවස්ථාවල දී පවා ගොවීන් විසින් සිදු කරනු ලැබූ ඉතිරි කිරීම්වලින් කලින් ලබාගත් ණය කපා හැර නැවතත් ඔවුන්ට ණය ලබාදීමේ කටයුතු සාර්ථකව ඉදිරියට කරගෙන යාමට හැකියාව ලැබී ඇත.

2. කාර්යක්ෂම ලෙස ණය ලබාදීම සඳහාත්, සාමාජික ගොවීන්ගේ වෙනත් අවශ්‍යතා සපුරාලමින් ඔවුන් වඩාත් තෘප්තිමත් කිරීම සඳහාත්, නව ක්‍රියාමාර්ග අත්හදා බැලීම. උදාඃ ලෙස ඔවුන්ට ඉක්මණින් ණය ලබාදීම සඳහා කන්නය ආරම්භයේ දීම කෘ.ප.නි.ස.වරුන් ලවා ඒ ඒ ගොවියාට අවශ්‍ය ණය ප්‍රමාණය හා ඒ යටතේ වන ද්‍රව්‍ය අවශ්‍යතාව පිළිබඳ විස්තර ලබාගැනීම හා එම ණය අවශ්‍යතා සඳහා කලින් ම ණය අනුපාලක කමිටුවෙ හි අනුමැතිය ලබාගැනීම හා ද්‍රව්‍ය ණය සැපයීම සඳහා පූර්ව සූදානම්වීම දැක්විය හැකි ය.

3. ප්‍රාදේශීය නිලධාරීතුමා, බැංකුවේ සේවයෙ හි නියුතු කෘ.ප.නි.ස. වරුන් දෙදෙනා ඇතුළු බැංකු කාර්ය මණ්ඩලය රාජකාරී දින හා වේලාවන් පිළිබඳ නොතකා තම කාලයෙන්

සැලකිය යුතු ප්‍රමාණයක් බැංකුවෙ හි කටයුතු වෙනුවෙන් යෙදීම. මෙහි දී, බොහෝ සතියේ දිනවල සවස 6 දක්වාත් වගා කටයුතු හා සම්බන්ධ කාර්ය බහුල අවස්ථාවන්හි දී රාත්‍රී 7 දක්වාත්, සති අන්තයේ දිනවලත් ඔවුහු ගිණුම් සැකසීම ආදී රාජකාරී කටයුතුවල නිරත වෙති.

4. කණ්ඩායම් ක්‍රමය බැංකුවේ කටයුතු හා සාර්ථක ලෙස ගළපා ගැනීම ද ඉහළ ප්‍රගතියක් සඳහා බලපා තිබේ. කණ්ඩායම්වල සිටින එකිනෙක ගොවීන්ගේ එදිනෙදා කටයුතුවල දී කණ්ඩායමේ අනෙක් සාමාජිකයින්ට සහයෝගය දැක්වීම සඳහා පමණක් නොව, එක් සාමාජිකයෙකුට ණය ගෙවා ගත නො හැකි අවස්ථාවක දී අනෙක් සාමාජිකයින් ඒ සඳහා සහාය දීම වැනි අවස්ථාවන් දක්වා කණ්ඩායම් ක්‍රමය ප්‍රයෝජනයට ගෙන ඇත. මුල් යුගයේ පැවති 5 දෙනාගේ කණ්ඩායම් ක්‍රමයෙ හි ඇතැම් අසාර්ථක අත්දැකීම් සමඟ 3 දෙනාගේ කණ්ඩායම් ක්‍රමය සඳහා උනන්දු කරවීම මඟින් වඩාත් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කණ්ඩායම් ක්‍රමයක් අත්කර ගැනීමට කටයුතු කොට තිබේ. මෙහි දී, බොහෝ විට ණය ගෙවීමේ දී එක් අයෙකුට ඇතිවන අපහසුකම නැති කිරීම සඳහා ඉතිරි දෙදෙනාට එකතු වී කටයුතු කිරීමට හැකි වී තිබේ. පසුගිය කාලයේ දෙවරක් ඇති වූ ගංවතුර තර්ජන හේතුවෙන් වගා අහිමිවීම නිසා ඇතැම් අයට ගෙවීමට අපහසු වූ අවස්ථාවල දී කණ්ඩායමේ ඉතිරි දෙදෙනා එය ගෙවීමෙන් පසු එවැනි අයට සාර්ථකව ණය ලබා ගැනීමට අවස්ථාවන් සැලසී ඇත.

5. ගොවි බැංකුව සඳහා යම් යම් ඉලක්ක ඇති කර ගැනීමත්, ඒවා සපුරා ගැනීම සඳහා ක්‍රමෝපායිකව කටයුතු කිරීමත් මැදිරිගිරිය ගොවි බැංකුවෙහි ඉදිරි ගමන සඳහා හේතු වී තිබේ. පසුගිය ගංවතුර නිසා වූ වගා හානි වීම හේතුවෙන් කණ්ඩායමක දෙදෙනෙකු ණය නො ගෙවූ අවස්ථාවන්හි දී කෘ.ප.නි.ස. වරුන්ට ණය අය කර දෙන බවට ඇපවීම සඳහා අවසර ලබාදීම.

6. ණය අයකර ගැනීම සඳහා කෘ.ප.නි.ස. වරුන් ද සම්බන්ධ කරගත් නිරන්තර හා ක්‍රමවත් පසු විපරම් ක්‍රමයක් අනුගමනය කිරීම ද සඳහන් කළ යුතු කරුණකි. මේ යටතේ සෑම බදාදා දිනකම ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානයට පැමිණෙන කෘ.ප.නි.ස. වරුන් සම්බන්ධ කර ගනිමින් ඒ ඒ අයගේ වසම්වල ණය ගෙවා නැත්තේ කවුද යන්න විමසා බලා නො ගෙවූ ණය අය කර දෙන ලෙස දැන්වීම මඟින් එය සාර්ථකව ඉටු කෙරේ.

7. ආපදා අරමුදලක් පිහිටුවීම මඟින් ආපදාවන්ට පත්වීම හෝ මරණයට පත්වීම වැනි අවස්ථාවක දී ණය ගෙවීමට නො හැකි වන අයගේ ණය මුදල් එමඟින් ගෙවීමට කටයුතු කිරීම මඟින් හිඟ ණය ඇතිවීමට ඇති අවස්ථාව අවම කිරීම ද මේ සම්බන්ධයෙන් වැදගත් වෙයි. ලබා ගන්නා ණය මුදලින් සියයට 1ක් ආපදා අරමුදල සඳහා යොදා ගන්නා අතර මරණයක් වැනි අවස්ථාවක දී ඔහුගේ සම්පූර්ණ ණය මුදල එමඟින් අය කර ගන්නා අතර රු. 5,000/- ක් නිවසට ලබා දේ. කන්න 5කට වඩා ණය ගත් අයගෙන් ආපදා අරමුදල සඳහා කපා ගන්නා ප්‍රමාණය ලබා ගන්නා ණය මුදලින් 0.5 කි.

### 3.5.10 සංවර්ධනයට බලපෑ නීතිමය හා වෙනත් ගැටලු

1. පුද්ගලයෙකුට මිල දී ගත හැකි උපරිම කොටස් සීමාව පිළිබඳ රෙගුලාසීන්වල සඳහන් නොවීම හේතුවෙන් කන්න තුනකට ඉහත දී යන්ත්‍රෝපකරණ ණය යටතේ (සංයුක්ත කොළ මඩින යන්ත්‍රයක්) ලක්ෂ 15ක් වැනි ඉහළ මුදලක් ලබා ගැනීමට අපේක්ෂා කළ ගොවියෙකු කොටස් මිල දී ගැනීම සඳහා වැය කළ මුදල් ආපසු ලබා ගත නො

හැකිවීම නිසා අදාළ ගොවි සංවිධානයේ කෘ.ප.නි.ස. වරුන් මෙන් ම ගොවි බැංකුවේ නිලධාරීන් ද මහත් අපහසු තත්ත්වයකට පත් ව ඇති අතර එය ගොවීන්ගේ කනස්සල්ලට ද හේතු වී තිබේ. අදාළ ණය මුදල ලබා ගැනීම සඳහා රු. 185,000/-ක කොටස් ලබා ගෙන ඇති අතර රු. 590,000/-ක් පෞද්ගලික ඉතිරි කිරීම් ලෙස තැන්පත් කොට තිබේ. මෙම ණය මුදල ලබාදීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව මගින් අනුමැතියක් ලබා නොදීම නිසා තැන්පත් මුදලින් රු. 300,000/-ක් ආපසු ලබාගෙන ඇතත් කොටස් සඳහා වැය කළ මුදල් සම්බන්ධයෙන් පියවරක් ගැනීමට නො හැකි වී තිබේ. පවත්නා රෙගුලාසීන් යටතේ කළ හැක්කේ කොටස් තව අයෙකුට පැවරීම පමණි. මෙම කොටස් සඳහා ලැබෙන පොළිය අදාළ ගොවි මහතාගේ තැන්පතුවලට ඇතුළත් කරමින් ඔහුගේ කනස්සල්ල තරමක් දුරට හෝ අඩු කිරීමට පියවර ගෙන ඇතත් වැය කළ මුදල ආපසු ලබා ගැනීමට නො හැකිවීම තවමත් ගැටලුවක් ව පවතී.

## 3.5.11 යෝජනා

1. සංයුක්ත කොළ මඩින යන්ත්‍රයක් ලබා ගැනීම සඳහා රු. 185,000/-ක් වැනි විශාල මුදල් ප්‍රමාණයක් වටිනා කොටස් මිල දී ගැනීමට වැය කළ මුදල් ආපසු ලබා ගැනීමට නො හැකිවීමෙන් මතු වී ඇති ගැටලුව විසඳීම සඳහා ගොවි බැංකු ජාතික කමිටුව මගින් තීරණයක් ගත යුතු ය.

2. මෙම ගොවි බැංකුව යටතේ ඇති සමහර ගොවි සංවිධානවල ගොවීහු තමන්ගේ ප්‍රධාන ජීවනෝපාය වන වී වගාව සඳහා අවශ්‍ය ණය ප්‍රමාණය ලබා ගැනීමට ගොවි බැංකුවෙහි තිබිය යුතු ඉතුරුම් ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් ඉතුරුම් කොට ඇත. ඔවුන්ගේ ඉල්ලීමක් වන්නේ තමන් ප්‍රමාණවත් තරම් ඉතිරි කර ඇති නිසා වගා කටයුතුවලින් පිටස්තර කාර්යයන් සඳහා ද තමන්ට ගොවි බැංකුවෙන් ණය ලබා දෙන්නේ නම් එය ඉතා වැදගත් බවයි. උදා: ලෙස යුදගනාව "මහසෙන් බෙදුම් ඇළ ගොවි සංවිධානයෙ හි " බොහෝ ගොවීන් රු. 30,000කට ආසන්න මුදලක් ඉතිරි කොට ඇති අතර එම ගොවි සංවිධානය මගින් ගොවි බැංකුවට රු. ලක්ෂ 28ක් වැනි මුදලක් ඉතිරි කර දී ඇත. ඔවුන්ගේ එක් දුක් ගැනවිල්ලක් වූයේ ඔවුන් දැනට එසේ වෙනත් කටයුතු සඳහා සර්වෝදය වැනි බැංකුවලින් 24%ක් වැනි ඉහළ පොළියකට ණය ලබා ගන්නා බවයි. එබැවින්, එසේ සාර්ථකව ඉතිරි කිරීම් සඳහා සහභාගී වූ ගොවීන්ට දිරි දීමක් ලෙස ඔවුන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීමට ඉවහල් වන නිවාස ණය වැනි තෝරාගත් කාර්යයන් සඳහා ණය ලබාදීම සිදු කළ යුතු ය.

3. යන්ත්‍රෝපකරණ ලබා ගැනීම වැනි කාර්යයන් සඳහා අවශ්‍ය ණය ලබා ගැනීමට අවශ්‍යතා සැපිරීමක් ලෙස ඉහළ මුදල් ප්‍රමාණයක් වැය කරමින් කොටස් මිල දී ගෙන ඇත. එසේ වුව ද, එම කාර්යය සැපිරීමෙන් පසුව කොටස් සඳහා එවැනි ඉහළ මුදලක් හිර කර තැබීම අවශ්‍ය නොවන නිසා එම මුදල ඉතුරුම් බවට පත් කිරීම සඳහා නීති රීති මගින් අවසර දිය යුතු ය.

4. දිස්ත්‍රික් මට්ටමින් අනුමත කරගත හැකි ණයවල වටිනාකම ලක්ෂ 3 සිට 5 දක්වා වැඩි කිරීම කාලීන අවශ්‍යතාවක් බව පෙනී යයි. බොහෝ විට, ගොවීන්ගේ යන්ත්‍ර සූත්‍ර ණය අවශ්‍යතා යටතේ අත් ට්‍රැක්ටර් මිල දී ගැනීමට අවශ්‍ය වන අතර ඒවායේ මිල ලක්ෂ 3 ඉක්මවා යන අවස්ථා ඇති බැවින් එවැනි ණය දිස්ත්‍රික් මට්ටමින් අනුමත කොට පහසුවෙන් හා ඉක්මණින් ලබාදීම සඳහා දිස්ත්‍රික්ක මට්ටමින් අනුමත ණය සීමාව වැඩි කිරීම වැදගත් වේ.

5. ගොවිජන සේවා අලෙවි සැල ගොවියාට ආකර්ෂණීය ස්ථානයක් විය යුතු අතර දුර සිටින ගොවීන්ට පහසුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ගොවිජන මධ්‍යස්ථානවල කාරක සභා මගින් වසම් මට්ටමින් අලෙවි සැල් පවත්වාගෙන යා යුතු ය.

6. ගොවි බැංකු සඳහා විධිමත් පුහුණුවක් සහිත නිලධාරීන් දෙදෙනෙකුවත් පත් කළ යුතු අතර දැනට ඒවායේ කටයුතු කරන නිලධාරීන්ට අවශ්‍ය ක්‍රමවත් ගිණුම් හා පරිඝනක පුහුණුවක් ලබාදිය යුතු ය.

## 3.6 මනම්පිටිය ගොවි බැංකුව

### 3.6.1 හැඳින්වීම

පොළොන්නරුව දිස්ත්‍රික්කයෙ හි මනම්පිටිය ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානය පසුබිම් කර ගනිමින් 2000 වර්ෂයේ දී පිහිටුවනු ලැබූ මෙම ගොවිජන බැංකු බල ප්‍රදේශයට "මහවැලි සී කලාපයට" අයත් ප්‍රදේශවලින් සමන්විත දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය පමණක් නොව ඉන් ඔබ්බෙන් පිහිටි "මහවැලි සී කලාපයට" අයත් "වැලිකන්ද" හා "ශ්‍රී පුර" යන ප්‍රදේශ ද මෑතක් වන තෙක් අයත් විය. එසේ වුව ද, 2009 වසරේ සිට "වැලිකන්ද" මෙන් ම "ශ්‍රී පුර" ද මෙයින් ඉවත් කර වෙනත් ගොවිජන සංවර්ධන බල ප්‍රදේශ දෙකක් ලෙස පවත්වාගෙන යෑමට කටයුතු කිරීමත් සමඟ මනම්පිටිය ගොවිජන බැංකු බල ප්‍රදේශය පෙරට වඩා කුඩා විය. කලින් බල ප්‍රදේශය තුළ පැරණි ගොවි සංවිධාන ප්‍රමාණය 143 ක් වූ අතර එය 86 දක්වා අඩු විය. බල ප්‍රදේශයෙ හි සිටින ගොවි පවුල්වලින් වැඩි ප්‍රමාණයක් මහවැලි ජලය පදනම් කරගනිමින් යල මෙන් ම මහ කන්නයේ ද වී වගාව කරති. ජීවන මාර්ගය ගොවිතැන කරගත් මෙම ගොවින්ගෙන් වැඩි පිරිසක් වී විකිණීමෙන් ද ආදායමක් උපයති.

### 3.6.2 සාමාජිකත්ව වර්ධනය

2001 වර්ෂයේ දී ප්‍රදේශයේ ගොවි පවුල් සංඛ්‍යාවෙන් 1.8%ක් පමණ ගොවි බැංකුවේ කොටස් මිල දී ගෙන තිබූ අතර 2010 වර්ෂය වන විට එම ප්‍රමාණය 12.5%ක් දක්වා වාර්ෂිකව 37.8%කින් වර්ධනය වී තිබේ. මෙහි ඉහළම සාමාජික වර්ධනයක් දක්නට ලැබෙන්නේ 2009 වර්ෂය තුළ වන අතර 2005-2008 දක්වා සාමාජික සංඛ්‍යාවේ වෙනසක් සිදු වී නැත (වගු අංක 1). මෙයට හේතු වී ඇත්තේ එම කාලයේ දී කෘ.ප.නි.ස. වරුන්ට එල්ල වූ ඉහළ පීඩනය හේතුවෙන් ගොවීන් ගොවි බැංකු වෙත ආකර්ෂණය කර ගැනීමට හා ගොවීන් ඒ පිළිබඳ දැනුවත් කිරීමට කෘ.ප.නි.ස. වරුන් උනන්දු නොවීමයි.

**වගු අංක 3.26: මනම්පිටිය ගොවි බැංකුවේ සාමාජිකත්ව වර්ධනය: 2001-2010**

| වර්ෂය | සාමාජිකයන් / කොටස් හිමියන් ගණන | කොටස් වල වටිනාකම (රු) | ප්‍රදේශයේ පවුල් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|
| 2001 | 356 | 32,400 | 1.76 |
| 2002 | 680 | 80,900 | 3.36 |
| 2003 | 1,165 | 132,600 | 5.76 |
| 2004 | 1,540 | 147,800 | 7.62 |
| 2005 | 1,540 | 153,800 | 6.58 |
| 2006 | 1,540 | 252,000 | 6.58 |
| 2007 | 1,540 | 256,500 | 6.58 |
| 2008 | 1,540 | 256,900 | 6.58 |
| 2009 | 1,540 | 256,900 | 12.29 |
| 2010 | 1,569 | 308,800 | 12.52 |

ගොවි පවුල් සංඛ්‍යාව 2001 වර්ෂයේ සිට 2004 දක්වා 20,221 කි,

2005 වර්ෂයේ සිට 2008 දක්වා 23,395 කි,

2009 වර්ෂයේන් පසු 12,532 කි.

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

### 3.6.3 ගොවි බැංකුවේ ඉතුරුම්, කොටස් ප්‍රාග්ධනය හා ලාභාංශ වර්ධනය

මනම්පිටිය ගොවි බැංකුව සඳහා 2001 වර්ෂයේ දී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් රු. ලක්ෂ 9.5ක මුදලක් ද, 2002 වර්ෂයේ දී රු. ලක්ෂ 15.5ක් ද, නැවතත් 2003 වර්ෂයේ දී රු. ලක්ෂ 15ක් ද ලබා දී ඇත. මේ අනුව, ගොවිජන බැංකුව සඳහා ප්‍රාග්ධනය ලෙස රු. ලක්ෂ 40 ක් ලැබී තිබූ අතර 2007 වර්ෂයේ දී ඉන් රුපියල් ලක්ෂයක මුදලක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට යවා තිබේ. 2009 'සිරිපුර' සහ 'වැලිකන්ද' ප්‍රදේශවල නව ගොවි බැංකු ආරම්භ කිරීම නිසා රුපියල් ලක්ෂ 10 බැගින් එම ගොවි බැංකු දෙක සඳහා යවා ඇති අතර මේ වනවිට මනම්පිටිය බැංකුව සතුව ආරම්භක ප්‍රාග්ධන මුදලෙන් රු. ලක්ෂ 19ක් පවතී. ගොවි බැංකු මඟින් ලබාදෙන ණය පොළී එකතුවෙන් වර්ධනය වූ සමුච්ඡිත අරමුදල් වටිනාකම 2009 වනවිට රු. මිලියන 3.064ක් වේ. එසේ ම, බැංකුව සමඟ ගනුදෙනු කරන ගොවීන් විසින් මිල දී ගන්නා ලද කොටස් ප්‍රාග්ධනය 2001 වසරේ රු. 32,400 සිට 2009 වනවිට රු. 256,900 දක්වා වර්ධනය වී තිබේ. මෙයට අමතරව කණ්ඩායම් හා පුද්ගල ඉතිරි කිරීම් ගිණුම් හිමියන් සංඛ්‍යාව 2001 වසරේ දී 365 වූ අතර එය 2009 වන විට 1,549 දක්වා වර්ධනය වී ඇත. වාර්ෂික වර්ධනය 40%කි. එසේ ම, මුළු තැන්පත් වටිනාකම 2009 වසර වනවිට රු. මිලියන 3.58 දක්වා වර්ධනය වී ඇති අතර වාර්ෂික වර්ධනය 168% කි. මේ අනුව, ගොවි බැංකුවේ සමස්ත සංචිත වටිනාකම 2001 වසරේ දී රු. 1,264,709 සිට 2009 වසර වනවිට රු. 10,805,528 දක්වා 754%කින් වර්ධනය වී තිබේ. (වගු අංක 3.27).

**වගු අංක 3.27: මනම්පිටිය ගොවි බැංකුවේ අරමුදල් වර්ධනය; 2001-2009**

| වර්ෂය | ප්‍රාග්ධනය (රු) | කොටස් ප්‍රාග්ධනය (රු) | මුළු තැන්පතු වටිනාකම (රු) | සමුච්ඡිත අරමුදල (රු) | සංචිත වටිනාකම (රු) |
|---|---|---|---|---|---|
| 2001 | 950,000 | 32,400 | 247,524 | 34,785 | 1,264,709 |
| 2002 | 2,500,000 | 80,900 | 914,516 | 152,177 | 3,647,594 |
| 2003 | 4,000,000 | 132,600 | 1,938,412 | 301,272 | 6,372,285 |
| 2004 | 4,000,000 | 147,800 | 2,838,539 | 835,198 | 7,821,537 |
| 2005 | 4,000,000 | 153,800 | 3,353,583 | 1,846,706 | 9,354,089 |
| 2006 | 4,000,000 | 252,000 | 3,536,325 | 2,351,683 | 10,140,008 |
| 2007 | 3,900,000 | 256,500 | 3,580,535 | 2,586,098 | 10,323,133 |
| 2008 | 3,900,000 | 256,900 | 3,583,264 | 2,895,774 | 10,635,938 |
| 2009 | 3,900,000 | 256,900 | 3,584,614 | 3,064,015 | 10,805,529 |

ප්‍රාග්ධනය යනු: ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගොවි බැංකු වෙත සපයන ලද මුදල
සංචිත යනු: ප්‍රාග්ධනය,කොටස් ප්‍රාග්ධනය,තැන්පතු වටිනාකම සහ සමුච්ඡිත අරමුදලේ වටිනාකම් වල එකතුව
මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

### 3.6.4 ණය නිකුත් කිරීම

මනම්පිටිය ගොවි බැංකුව ආරම්භක අවධියේ දී ඉතා විශාල ගොවීන් පිරිසකගේ ණය අවශ්‍යතා සපුරා ඇති අතර මේ යටතේ වගා ණය, කෘෂි උපකරණ ණය හා වී සුරකුම් ණය ලබා දී ඇත. මේ අනුව 2001 වර්ෂයේ දී ගොවීන් 488ක් සඳහා රු. මිලියන 2.36 නිකුත් කර ඇත (වගු අංක 3.28). මෙයින් 88%ක් ම වගා ණය වන අතර ඉතිරිය කෘෂි උපකරණ ණය වශයෙන් නිකුත් කොට තිබේ. මෙම වර්ෂය වනවිට සිරිපුර හා වැලිකන්ද

ප්‍රදේශවල ගොවීන් ද මනම්පිටිය ගොවිජන සේවා මධ්‍යස්ථානය මඟින් ණය ලබා ගෙන තිබේ. ඉහළම ණය මුදලක් නිකුත් කොට ඇත්තේ 2004 වර්ෂයේ දී වන අතර මෙහි දී පුද්ගලයින් 1,042ක් සඳහා රු. මිලියන 9.40 නිකුත් කොට ඇත. මේ යටතේ වගා ණය ලෙස නිකුත් කොට ඇති ප්‍රමාණය ඉන් 94%ක් වන අතර වී සුරැකුම් ණය හා කෘ.ප.නි.ස. වරුන්ට යතුරු පැදි ලබාදීමට ද ණය නිකුත් කොට තිබේ. මෙසේ වර්ධනය වූ ගොවි බැංකු ණය නිකුත් කිරීම 2005 වර්ෂයේ සිට ක්‍රමිකව පහළ බැස ඇති අතර 2010 වර්ෂය වනවිට නිකුත් කර ඇත්තේ ගොවීන් 13 දෙනෙකු සඳහා රු. 141,983 ක මුදලක් පමණි (ගොවි බැංකු වාර්තා අනුව). මෙය 2001 වර්ෂයේ නිකුත් කරන ලද මුළු ණය ප්‍රමාණය සමඟ සංසන්දනය කිරීමේ දී 94% ක අවගමනයකි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇති කරුණු ලෙස සණස වැනි වැඩසටහන් වඩාත් ඉක්මණින් ගොවීන් අතර ජනප්‍රියවීමත්, වසම් මට්ටමින් සහනාධාර පොහොර බෙදා හැරීම නිසා ඉතා ඈත ප්‍රදේශවල ගොවීන් ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත ණය ගැනීමට පැමිණීම අඩුවීමත්, ද්‍රව්‍යමය ණය නිකුත් කිරීම නිසා ගොවීන්ට අවශ්‍ය අවස්ථාවල දී අවශ්‍ය ද්‍රව්‍ය කම්ටුව තුළ නො පැවතීම නිසා ගොවීන් වෙනත් ආයතන වෙත ආකර්ෂණය වීම ආදිය දැක්විය හැකි ය. 2005 වර්ෂයේ සිට ගොවීන්ට ණය ලබාදීමට හා ණය ආපසු අය කර ගැනීමට කෘ.ප.නි.ස.වරුන්ගේ සහයෝගය අවම වී ඇති අතර මෙයට හේතු ලෙස ඔවුන් සඳහන් කළේ ගොවීන්ගෙන් ණය අයකර දීම සඳහා කෘ.ප.නි.ස. වරුන්ට වැඩි වගකීමක් පැවරීමත්, එය ඔවුන්ගේ පෞද්ගලික බැඳීමක් ලෙස ඇතැම් නිලධාරීන් සැලකීමත් නිසා තමන්ට එල්ල වූ ඉහළ පීඩනය හේතුවෙන් ණය ලබාදීමට එතරම් උත්සාහ නොගත් බවයි. ගොවි බැංකුවේ සමස්ත ණය ලබාදීමේ හැකියාව පිළිබඳව සලකා බැලීමේ දී 2001 වර්ෂයේ දී පැවති මුළු සංචිත වටිනාකම මෙන් 187%ක් ගොවි බැංකු ණය ලබා දී ඇති අතර 2006 වර්ෂයේ සිට ණය ලබාදීම පහළ බැස තිබේ (වගු අංක 3.29). 2009 වසර වන විට ලබා දී ඇත්තේ ගොවි බැංකුවේ ඒ වසර වනවිට පැවති සංචිත වටිනාකමෙන් 1.2%ක් පමණ වූ ණය ප්‍රමාණයකි. මේ අනුව බලන විට මනම්පිටිය ගොවි බැංකුවේ ගනු දෙනු දුර්වල මට්ටමක පවතින බැව් පෙනී යයි.

**වගු අංක 3.28: මනම්පිටිය ගොවි බැංකුව මඟින් නිකුත් කළ ණය වටිනාකම: 2001-2010**

| වර්ෂය | වගා ණය ප්‍රමාණය | | | ව්‍යාපෘති ණය (රු) | කෘෂි උපකරණ ණය (රු) | වී සුරැකුම් ණය (රු) | ගොවි විශ්‍රාම වැටුප් ණය (රු) | යතුරු පැදි ණය (රු) | නිකුත් කළ මුළු ණය වටිනාකම (රු) | ණය ලබාගත් ගොවීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | යල (රු) | මහ (රු) | එකතුව (රු) | | | | | | | |
| 2001 | 1,230,212 | 851,723 | 2,081,935 | - | 281,250 | - | - | - | 2,363,185 | 488 |
| 2002 | 2,040,380 | 1,715,227 | 3,755,607 | 15,000 | 198,500 | 180,000 | 248,440 | - | 4,397,547 | 730 |
| 2003 | 4,170,888 | 3,149,460 | 7,320,348 | - | 13,500 | 1,640,000 | - | - | 8,973,848 | 1088 |
| 2004 | 4,252,230 | 4,597,500 | 8,849,730 | - | 6,750 | 150,000 | - | 399,750 | 9,406,230 | 1042 |
| 2005 | 3,077,770 | 4,386,925 | 7,464,695 | - | 27,000 | - | - | - | 7,491,695 | 801 |
| 2006 | 853,348 | 2,984,060 | 3,837,408 | - | 6,750 | - | - | - | 3,844,158 | 422 |
| 2007 | 285,599 | 445,238 | 730,837 | - | 13,500 | - | - | - | 744,337 | 100 |
| 2008 | 163,563 | 140,230 | 303,793 | - | 6,750 | - | - | - | 310,543 | 26 |
| 2009 | - | 134,228 | 134,228 | - | | - | - | - | 134,228 | 12 |
| 2010 | 76,813 | 55,170 | 131,983 | - | 10,000 | - | - | - | 141,983 | 13 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

වගු අංක 3.29: සංචිත වට්ටාකමට සාපේක්ෂව මනම්පිටිය ගොවි බැංකුව මඟින් නිකුත් කළ ණය වට්ටාකම: 2001-2009

| වර්ෂය | නිකුත් කළ මුළු ණය වට්නාකම (රු) | සංචිත වට්නාකම (රු) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| 2001 | 2,363,185 | 1,264,709 | 186.86 |
| 2002 | 4,397,547 | 3,647,594 | 120.56 |
| 2003 | 8,973,848 | 6,372,285 | 140.83 |
| 2004 | 9,406,230 | 7,821,537 | 120.26 |
| 2005 | 7,491,695 | 9,354,089 | 80.09 |
| 2006 | 3,844,158 | 10,140,008 | 37.91 |
| 2007 | 744,337 | 10,323,133 | 7.21 |
| 2008 | 310,543 | 10,635,938 | 2.92 |
| 2009 | 134,228 | 10,805,529 | 1.24 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

## 3.6.5 ණය අයවීම

2001 වර්ෂයේ දී ගොවි බැංකුව මඟින් නිකුත් කරන ලද මුළු ණය වට්නාකමෙන් 99%ක් ම නැවත අයකර ගෙන තිබූ අතර අඩුම ණය අයකර ගැනීම වූ 92%ක් වාර්තා වී තිබුනේ 2009 වර්ෂයේ දී ය (වගු අංක 3.30). මේ සඳහා හේතු ලෙස වගා අස්වනු පාළුවීම හා මේ අවස්ථාවේ දී විවිධ බැංකු මඟින් ගොවීන් ලබාගත් වගා ණය රජය මඟින් කපා හරින බවට මාධ්‍ය මඟින් ප්‍රචාරය කර හැරීම නිසා ගොවීන් ගොවි බැංකුවෙන් ගන්නා ලද ණය ද නො ගෙවා හැරීමට කටයුතු කර තිබූ බව හෙළිදරව් විය. ඉන් පසු, සමථ මණ්ඩලයෙ හි හා උසාවියෙ හි නඩු දැමීම මඟින් එම ණය ආපසු අය කර ගැනීමට කටයුතු කොට ඇත. ඒ අනුව, 2009 වසර වනවිට ණය නො ගෙවා සිටි ගොවීන් ප්‍රමාණය වූ 263 මේ වනවිට 60 දක්වා අඩු වී ඇත. ණය අයවීම අඩුවීමට කෘ.ප.නි.ස. වරුන්ගේ පසු විපරම අඩුවීමත් හේතු වී තිබුණි. කෘ.ප.නි.ස. වරුන්ට තම රාජකාරී කරගෙන යාමට අධික පීඩනයක් එල්ලවීම මත මේ අවධියේ දී ඔවුන්ගේ සහයෝගය අඩු වී තිබුණි. සමස්ථයක් ලෙස ගත්විට වගා ණය අයවීම ඉතා හොඳින් සිදු වී ඇති අතර 2009 වර්ෂයේ දී හැර අන් වසරවල එය 98% ඉක්මවා ගොස් තිබේ. ව්‍යාපෘති ණය, යතුරු පැදි ණය නිකුත් කර ඇති වර්ෂවල එම ණය අයවීම් ප්‍රතිශතය පහළ යැමට හේතු වී ඇත්තේ එම ණය ගෙවා නිම කිරීම සඳහා ගොවීන්ට කන්න කිහිපයක් ගතවීමයි. මේ නිසා, සම්පූර්ණ ණය මුදලට අදාළ වර්ෂය තුළ දී අයවීමක් සිදු නොවේ. මෙම ගොවි බැංකුව සඳහා මුල් අවධියේ දී නිලධාරීන් හතර දෙනෙකු සිටිය ද, මේ වනවිට එක් නිලධාරියෙකු පමණක් රාජකාරී ඉටු කරයි. එම නිලධාරියාට ද ගිණුම් කටයුතු පිළිබඳ නිසි පුහුණුවක් ලබා දී නැත. කෙසේ වුවද, 2008 වර්ෂයේ දී ගොවි බැංකුව සඳහා පරිගණකයක් ලබා දී ඇති අතර එය ගොවි බැංකුවේ කටයුතු පවත්වාගෙන යාමට පහසුවක් වී තිබේ.

වගු අංක 3.30: මනම්පිටිය ගොවි බැංකුවේ ණය අයවීම: 2001-2010

| වර්ෂය | ණය වර්ගය | | | | | | | | | | | | අය කර ගත් මුළු ණය වටිනාකම (රු) | වර්ෂයට අදාලව නිකුත් කල මුළු ණය වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වගා ණය (රු) | ප්‍රතිශතය (%) | ව්‍යාපෘති ණය (රු) | ප්‍රතිශතය (%) | කෘෂි උපකරණ ණය (රු) | ප්‍රතිශතය (%) | යතුරු පැදි ණය (රු) | ප්‍රතිශතය (%) | ගොවි විශ්‍රාම වැටුප් ණය (රු) | ප්‍රතිශතය (%) | වී සුරකුම් ණය (රු) | ප්‍රතිශතය (%) | | |
| 2001 | 2,081,935 | 100.00 | - | - | 264,063 | 93.89 | - | - | - | - | - | - | 2,345,997 | 99.27 |
| 2002 | 3,755,607 | 100.00 | 8,979 | 59.86 | 154,563 | 77.87 | - | - | 239,708 | 96.49 | 180,000 | 100.00 | 4,338,855 | 98.67 |
| 2003 | 7,310,433 | 99.86 | - | - | 11,313 | 83.80 | - | - | - | - | 1,554,716 | 94.80 | 8,876,462 | 98.91 |
| 2004 | 8,849,730 | 100.00 | - | - | 6,750 | 100.00 | 346,962 | 86.79 | - | - | 150,000 | 100.00 | 9,353,442 | 99.44 |
| 2005 | 7,436,132 | 99.62 | - | - | 23,625 | 87.50 | - | - | - | - | - | - | 7,459,757 | 99.57 |
| 2006 | 3,750,656 | 97.74 | - | - | 6,750 | 100.00 | - | - | - | - | - | - | 3,757,406 | 97.74 |
| 2007 | 721,541 | 98.73 | - | - | 11,805 | 87.44 | - | - | - | - | - | - | 733,345 | 98.52 |
| 2008 | 303,793 | 100.00 | - | - | 6,750 | 100.00 | - | - | - | - | - | - | 310,543 | 100.00 |
| 2009 | 124,103 | 92.46 | - | - | - | - | - | - | - | - | - | - | 124,103 | 92.46 |
| 2010 | 131,176 | 99.39 | - | - | 10,000 | 100.00 | - | - | - | - | - | - | 141,176 | 99.43 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

### 3.6.6 ද්‍රව්‍ය ණය ලබාදීම

මෙම ගොවි බැංකුව හරහා 100% ද්‍රව්‍ය වශයෙන් ණය ලබා දෙන අතර ගොවීන්ගෙන් අදාළ අවශ්‍යතා ලේඛන ලබා ගෙන එම ගොවීන් සියල්ලටම පොදු වන පරිදි කෘෂි රසායන ද්‍රව්‍ය කම්ටුව මඟින් මිල දී ගැනීම සිදු කරයි. එසේ වුව ද, මේ මඟින් ගොවීන්ගේ ඉල්ලීම් ඉටු නොවන නිසා ඇතැම් ගොවීහු ද්‍රව්‍ය ණය ලබා ගැනීමට අකමැත්තක් දක්වති. වගාව සඳහා අවශ්‍ය පොහොර, කෘමිනාශක, උදළුතල ආදිය ද්‍රව්‍යමය ණය වශයෙන් මෙම ගොවි බැංකුව හරහා ගොවීන්ට ලබාදීමට කටයුතු කොට ඇත. බැංකුව සමඟ මේ දක්වා ගනු දෙනු කරන ගොවීන් බහුතරයක් ප්‍රකාශ කර සිටියේ මෙසේ ද්‍රව්‍යමය ණය ලබාදීම නිසා ගොවීන් වෙනත් බැංකුවලින් ලබාගත්තා ණය මුදල් මෙන් අනවශ්‍ය පරිදි වියදම් නොකර වගා කටයුතු සඳහා ම ණය මුදල් යොදවන නිසා ද්‍රව්‍යමය ණය ලබාදීම වඩා හිතකර බවයි. එසේ ම, ප්‍රදේශයේ ඇති රජරට බැංකුව, සණස, ලංකා බැංකුව, සමෘද්ධි බැංකුව වැනි ආයතන හරහා තනි පුද්ගලයින් වශයෙන් ණය ලබාගත හැකි නිසාත්, ගොවි බැංකුව මඟින් ලබාදෙන ණය මුදලට වඩා වැඩි ණය ප්‍රමාණයක් ලබාගත හැකි නිසාත්, ගොවීන් වඩ වඩාත් එම බැංකු කෙරෙහි ඇදී යාම සිදුව ඇති බව දැන ගත හැකි විය. පොහොර සහනාධාරය ලබාදීමට පෙර අවධියේ අරලගංවිල වැනි ගොවි බැංකුවෙන් කි.මී. 25ක් පමණ දුරින් පිහිටි ප්‍රදේශවල ගොවීහු ගොවි බැංකු ණය ලබා ගනිමින් පොහොර හා කෘමිනාශක ලබා ගැනීමට මහත් කැමැත්තක් දැක්වූ හ. එසේ වුවත්, පොහොර සහනාධාරය ලබාදීමත් සමඟ එම ප්‍රදේශවල පිහිටි මහවැලි පොහොර ගබඩාවලට පොහොර ප්‍රවාහනය කරමින් බෙදා හරින නිසාත්, ඒ සඳහා දැරිය යුත්තේ අක්කර 2 1/2ක් සඳහා රු. 3000/-කට ආසන්න මුදලක් නිසාත්, ඔවුන්ගේ ආදායම් තත්ත්වයන් හා විමසීමේ දී එම මුදල දැරීම එතරම් අපහසු නොවන නිසාත්, කෘමිනාශක ලබා ගැනීමේ කටයුත්ත සඳහා පමණක් එතරම් දුර බැහැරක සිට ගොවි බැංකුවට පැමිණීම අසාර්ථක කටයුත්තක් බව ඇතැම් ගොවීහු ප්‍රකාශ කළහ. එසේ ම, ඇතැම් වසම්වල සිට මනම්පිටිය ගොවි බැංකුවට යාමට කි.මී. 24ක් පමණ අධික දුරක් පැවතීමත්, මෙහි දී ප්‍රවාහන වියදම් අධිකවීමත් නිසා ගොවීහු ගොවි බැංකු වෙත ණය ලබා ගැනීමට යාමට මැලිකමක් දක්වති. ගොවිජන සේවා අලෙවි සැල හරහා නිකුත් කරන ඇතැම් කෘමිනාශක වර්ගවල මිල ප්‍රදේශයේ ඇති පෞද්ගලික වෙළෙඳසැල්වල මිල ගණන්වලට වඩා වැඩිවීමත් ගොවීන් ද්‍රව්‍ය ණය ලබාගැනීම අකමැතිවීමට හේතුවක් වී තිබේ.

### 3.6.7 කණ්ඩායම් ක්‍රමය

ණය ලබාදීමේ දී ආරම්භයේ දී තනි තනි පුද්ගලයින් වශයෙන් ණය ලබාදුන් නමුත් පසුව ක්‍රියාත්මක කරන ලද පස්දෙනාගේ කණ්ඩායම් ක්‍රමය මත ගොවීන් ණය ලබා ගැනීම තවදුරටත් අඩු වී තිබේ. මෙම පස් දෙනාගේ කණ්ඩායම් ක්‍රමය ක්‍රියාත්මක වීම මත, ගොවීන් ණය ගෙවීම පැහැර හැරීම වැඩි වූ අතර එහි අසාර්ථකත්වය සලකා බලා ඉන් පසු තුන් දෙනෙකුගෙන් යුත් කණ්ඩායම් සඳහා ණය නිකුත් කිරීමට කටයුතු කොට තිබේ. කණ්ඩායම් ණය ක්‍රමයේ යහපත් මෙන් ම අයහපත් ලක්ෂණ ද තිබේ. බහුතරයක් ගොවීන් ප්‍රකාශ කළේ දැනට ක්‍රියාත්මක වන තිදෙනෙකුගෙන් යුත් කණ්ඩායම් ක්‍රමය පස් දෙනෙකුගේ කණ්ඩායම් ක්‍රමයට වඩා ප්‍රතිඵලදායී බවයි. එහි දී, කණ්ඩායමේ එක් පුද්ගලයෙකු ණය ගෙවීම නියි කලට සිදු නො කරන විට කණ්ඩායමේ ඉතිරි අය කෙසේ හෝ එම ගොවියා ණය ගෙවීමට පෙලඹවීම නිසා ණය ආපසු අයකර ගැනීමේ අවධානම අඩු ය. මෙහි දී, කණ්ඩායමේ සාමාජිකයන් අතර බැඳීමක් හා වගකීමකින් ක්‍රියා කිරීමක් සිදු වේ. එසේ ම, වෙනත් බැංකුවලින් ණය ලබා ගැනීමට යාමේ දී සිදුවන ඇපකරුවන් සොයා ගැනීම වැනි ගැටලු මෙම කණ්ඩායම් ක්‍රමය මඟින් පැන නො නඟින බව ගොවීහු ප්‍රකාශ කළහ. කණ්ඩායම් ක්‍රමයට අකමැති බව ප්‍රකාශ කළ ගොවීන් ඒ සඳහා හේතු ලෙස සඳහන් කළේ මෙහි දී තම

කණ්ඩායමේ එක් අයෙකු හෝ ණය නො ගෙවූ විට මෙතෙක් කල් සාර්ථකව අඛණ්ඩව ණය ගෙවූ ගොවීන්ට ද ඊළඟ කන්නය සඳහා අවශ්‍ය වේලාවට ණය ලබා ගැනීමට නො හැකිවීම නිසා එවැනි ගොවීන්ට විශාල අසාධාරණයක් වන බවයි. එම නිසා, කණ්ඩායම් ක්‍රමයේ දී සාමූහිකව ක්‍රියා කරන විශ්වාසදායී ගොවීන් පිරිසකගෙන් සමන්විත කණ්ඩායමක් ඇති කර ගැනීම වඩාත් ඵලදායී වේ.

### 3.6.8 ණය සීමාවන්

මෙම ගොවි බැංකුව මඟින් වගා ණය ලෙස එක් ගොවියෙකු වෙනුවෙන් දැනට ලබාදෙන උපරිම මුදල වන රු. 10,000/-ක මුදල කෘෂි රසායන ද්‍රව්‍ය, සහනාධාර පොහොර යනාදිය ලබා ගැනීම සඳහා පමණක් ප්‍රමාණවත් වුව ද, සී සෑම, අස්වනු නෙළීම වැනි විවිධ පියවර සඳහා මුදලින් අධික වියදමක් දැරීමට සිදු වන නිසා මෙම ණය මුදල ප්‍රමාණවත් නොවන බව බොහෝ ගොවීන්ගේ අදහස යි. වර්තමානයේ වී වගාවේ අක්කරයක් සඳහා රු. 20,000-25,000ක් පමණ මුදලක් වැය වේ. බොහෝ ගොවිහු මහවැලිය යටතේ ලබාදුන් වී අක්කර 2 1/2 තවමත් වගා කරන නිසා ගොවි බැංකුව හරහා ලබා දෙන උපරිම ණය මුදල රු. 50,000/-ක් දක්වා වත් ඉහළ නැංවිය යුතු බව ප්‍රකාශ කරති. එසේ ම, වගා කටයුතු සඳහා මූල්‍යමය ණය අවශ්‍ය වන බැවින් නිකුත් කරන ණය මුදලෙන් යම් ප්‍රතිශතයක්වත් මුදලින් ගෙවීම සුදුසු වේ.

### 3.6.9 ගොවි බැංකුවෙ හි වර්තමාන ප්‍රගතිය/දුර්වලත්වය සඳහා බලපෑ සාධක

මෙම ගොවි බැංකුව ක්‍රමයෙන් දියුණුව කරා ගමන් කර ඇතත් පසුව දුර්වලවීමක් දැකිය හැකි ය. මුල දී ගොවීන් විශාල පිරිසකට ණය සපයනු ලැබූ අතර ඔවුන් සාර්ථකව ගෙවා ඇත. පසුව ගෙවීම් ද පැහැර හැර ඇති අතර ණය ගැනීමෙන් ද වැලකී ඇත. 2009 යල කන්නයේ දී ණය දීම ද මුළුමණින්ම නවතා දමා ඇති අතර නැවත 2010 වසරේ දී ණයදීම පවත්වාගෙන ගොස් ඇත. සුළු පිරිසක් පමණක් ණය ලබාගෙන ඇත. මේ සඳහා පහත සඳහන් කරුණු බලපා තිබේ.

1. ණය ලබාදුන් ගොවීන් ප්‍රමාණය හා ණය ප්‍රමාණය අඩුවීම කෙරෙහි, වැලිකන්ද හා ශ්‍රී පුර ප්‍රදේශ වෙනත් ගොවිජන සේවා බල ප්‍රදේශ ලෙස වෙන් කිරීමත් සමඟ අදාළ ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානයට අයත් බල ප්‍රදේශය අඩු වීම ද බලපා ඇත.

2. ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයට අයත් කෘ.ප.නි.ස. වරුන්, ගොවීන් සාමාජිකයින් ලෙස බඳවා ගැනීම හා ඔවුන්ට ණය ලබා ගැනීමට ඔවුන් උනන්දු කරවීම සඳහා මනා ලෙස කැප වී වැඩ කිරීම මුල් යුගයේ ගොවි බැංකුවෙ හි ප්‍රගතිය සඳහා බලපා තිබේ. එසේ වුව ද, පසු කාලයේ දී ඔවුන්ගෙන් සමහරක් අදාළ දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික්ක පරිපාලනය විසින් දැරූ වැරදි ආකල්පය හා ක්‍රියා කලාපය හේතුවෙන් ද කලකිරීමට පත්ව ගොවීන් අලුතින් බඳවා ගැනීම හා බැඳුණු ගොවීන්ට ණය ලබා ගැනීම සඳහා උනන්දු කරවීම ඇතුළු ගොවි බැංකුවේ දියුණුව හා සම්බන්ධ කටයුතුවලින් ද ඉවත් වී ඇත. මෙවැනි තත්ත්වයක් ඇතිවීම සඳහා එවකට පැවති දිස්ත්‍රික්ක ගොවිජන සංවර්ධන පරිපාලනය හේතු වී තිබේ. එහි දී, කෘ.ප.නි.ස. වරුන් ගොවීන්ට ණය ලබාදීම සඳහා නිර්දේශ කළේ නම්, නො ගෙවන ලද සියළු ණය සම්බන්ධයෙන් ද ඔවුන් මුළුමණින්ම වගකීම භාරගත යුතු බව ප්‍රකාශ කර ඇත. මේ හේතුව නිසා නො ගෙවූ ණය ඔවුන්ගේ වැටුපෙන් අය කර ගනු ලැබේ යැයි ඔවුන් තුළ භීතියක් ද හට ගෙන තිබේ.

3. මුල් යුගයේ දී, ප්‍රධාන වශයෙන් ම ගොවීන් ණය ලබා ගනු ලැබුවේ පොහොර ලබාගැනීම සඳහා වුව ද, 2005න් පසු පොහොර සහනාධාරය ලබාදීම හේතුවෙන්

පොහොර සඳහා වැඩි මුදලක් ගෙවීමට අවශ්‍ය නොවීම ද ගොවි බැංකු ණයවල වැදගත්කම අඩුවීම කෙරෙහි බලපා ඇත.

4. විශේෂයෙන් ම, ගොවිජන සංවර්ධන බල ප්‍රදේශය නියෝජනය කරන මහවැලි ජනාවාසවල පොහොර ගබඩා ඉදි කර ඇති නිසාත්, සහනාධාර පොහොර කෙලින්ම ඒවා වෙතට ප්‍රවාහනය කර දෙන නිසාත් ගොවිජන බැංකුව වෙත ඔවුන් තුළ පැවති ආකර්ෂණය අඩුවීමට බලපා ඇත.

5. 2005 වසරින් පසු පොහොර සහනාධාරය පැමිණීම පමණක් නොව රජය විසින් ගොවීන්ගේ වී අස්වනු මිල දී ගැනීම ආරම්භ කිරීමත් සමඟ ඒ වෙනුවෙන් දිස්ත්‍රික්කයේ ඉහළ නිලධාරීන් පමණක් නොව ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානයේ නිලධාරී ද, වැඩි කාලයක් කැප කිරීම හේතුවෙන් ගොවිජන බැංකුව දියුණු කිරීම සඳහා ඔවුන්ට ප්‍රමාණවත් කාලයක් යෙදීමට නො හැකිවීම මේ සඳහා බලපෑ මූලික හේතුවකි.

6. අරලගංවිල හා වෙහෙරගල වැනි ගොවි බැංකු සාමජිකයින් සැලකිය යුතු පිරිසක් ඇති මහවැලි ගොවි ගම්මාන ආසන්නයෙ හි ලංකා බැංකුව, මහජන බැංකුව, සණස, සමෘද්ධි හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (රජරට සංවර්ධන බැංකුව) වැනි මූල්‍යං ආයතන පැවතීමත්, ඒවා මඟින් ගොවීන් දෙදෙනෙකුගේ ඇපවීම් මත පමණක් රු. 50,000/-ක් වැනි ඉහළ මුදලක් ඉතා පහසුවෙන් ලබා ගැනීමට හැකිවීමත් නිසා බොහෝ ගොවීහු එම බැංකු වෙත ආකර්ෂණය වීමූ ගොවි බැංකුවෙ හි පසුබෑමට හේතු වී ඇත. ගන්නා ණය මුදලින් 1/3කට ආසන්න මුදලක් කොටස් හා පෞද්ගලික හෝ කණ්ඩායම් ඉතුරුම් ලෙස පැවතිය යුතුවීමත්, ලබාගත හැකි උපරිම වගා ණය සීමාව රු. 25,000/-ක් පමණක් වන ගොවිජන බැංකුව වැන්නකට වඩා පහසුවෙන් වැඩි මුදලක් ලබාගත හැකි ඉහත දැක් වූ බැංකු වෙත ගොවීන් ආකර්ෂණය වීම ස්වභාවික ය.

### 3.6.10 සංවර්ධනයට බලපෑ නීතිමය හා වෙනත් ගැටලු

වගා ණය යටතේ වී වගාව සඳහා මනම්පිටිය ගොවි බැංකුව මඟින් උපරිම ලෙස දෙනු ලබන්නේ එක් ගොවියෙකු සඳහා රු. 10,000/-ක් වැනි අඩු මුදලක් බැවින් අක්කර 2 1/2ක් කුඹුරු සැකසීම සඳහා ට්‍රැක්ටර් ගාස්තු ලෙස ගෙවීමට සිදුවීම හා ශ්‍රම වියදම යනා දී කාරණා නිසා එම මුදල ප්‍රමාණවත් නොවේ. එම නිසා, ඉතිරි මුදල් සපයා ගැනීමට වෙනත් බැංකුවක් වෙත යාමට සිදු වේ. මේ තත්ත්වයට යටතේ අරලගංවිල, වෙහෙරගල වැනි ඈත ප්‍රදේශවල සිටින ගොවීහු එම ප්‍රදේශවල සමෘද්ධි, සණස, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා ලංකා බැංකුව වැනි වාණිජ බැංකුවලින් රු. 50,000/- දක්වා වූ මුදලක් පහසුවෙන් ගත හැකිව තිබිය දී ගොවි බැංකුවට පැමිණීමට මැලිකමක් දක්වති.

### 3.6.11 යෝජනා

1. මහවැලි ප්‍රදේශයන් හි අක්කර 2 1/2ක් වගා කිරීම සඳහා පොහොර, තෙල් හා බිත්තර වී වෙනුවෙන් රු. 10,000/-කට අධික මුදලක් මුදලින් දැරීමට සිදුවන නිසා ඉතිරි මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීම කෙරෙහි අවධානය යොමුකොට අවම වශයෙන් දැනට දෙනු ලබන මුළු ණය ප්‍රමාණය වන රු. 10,000 - 20,000 දක්වා වැඩි කළ යුතු ය. ගෙවීමේ දී ද්‍රව්‍ය ලබාදීමෙන් අනතුරුව ඉතිරි මුදල මුදලින් ගෙවිය යුතු ය.

2. ප්‍රදේශයේ අනෙක් බැංකු හා සලකා බලනවිට ගොවි බැංකුවට ක්ෂේත්‍ර මට්ටමින් නිලධාරීන් ඇති නිසා අස්වනු සුරකීමේ ණය දීම හා අයකර ගැනීම සඳහා වැඩි හැකියාවක් පවතී. එබැවින්, ගොවි බැංකුව ඒ සඳහා මැදිහත් විය යුතු ය.

3. ගොවි ණය හා අදාළ කටයුතුවලට සම්බන්ධව මනම්පිටිය බල ප්‍රදේශයේ ඈත ප්‍රදේශවල සිටින කෘ.ප.නි.ස. වරුන්ට ගොවීන් වෙත යාමටත්, ගොවි බැංකුව වෙත පැමිණීමටත් විශාල අමතර වියදමක් දැරීමට සිදු වේ. ඒ නිසා, එවැනි කටයුතුවලින් ඈත්ව සිටීම තමන්ට වඩාත් ලාභදායක බව ඔවුන්ගේ හැඟීම වී ඇති බැවින් ගොවි බැංකුව ලබන ලාභයෙන් කොටසක් ඔවුන්ගේ ගමන් වියදම් පියවා ගැනීම සඳහා ඔවුන්ට දිය යුතු ය.

4. ගොවි ණය ලබා දුන්නේ නම් එය අයකර දීම කෘ.ප.නි.ස. වරුන්ගේ වගකීම පමණක් නොව එය නිසියාකාරව නො කරන්නේ නම් නො ගෙවූ ණය මුදල් ඔවුන්ගෙන් අය කළ යුතු ය යන්න මෙයට වසර කිහිපයක දී දිස්ත්‍රික්ක කාර්යාලයේ ක්‍රියාකලාපය මත කෘ.ප.නි.ස. වරුන් වෙත සන්නිවේදනය වී ඇති නිසා ගොවීන් ගොවි බැංකුවේ සාමාජිකයන් කරවීම, ඉතිරි කිරීම සඳහා උනන්දු කරවීම හා ණය ලබාදීම සඳහා මැදිහත්වීම යනාදිය අනවශ්‍ය කාර්යයන් බව බල ප්‍රදේශයේ සියළු කෘ.ප.නි.ස. වරුන්ගේ ආකල්පය වී තිබේ. එම නිසා, ඔවුන් ගොවි බැංකුව දියුණු කිරීම සඳහා පහසුකම් සළසන්නන් මිස ගොවීන් සිදු කරන වැරදි ක්‍රියා පිළිබඳ වග කිවයුත්තන් නොවන බව අවබෝධ කරදෙමින් ඔවුන් ගොවි බැංකුවේ දියුණුව සඳහා කැපව ක්‍රියා කරන නිලධාරීන් පිරිසක් බවට පත් කිරීම.

## 3.7 යටවත්ත ගොවි බැංකුව

### 3.7.1 හැඳින්වීම

මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටි ගොවිජන බැංකු අතරින් සාර්ථක එකක් වශයෙන් යටවත්ත ගොවි බැංකුව දැක්විය හැකි ය. එයට අයත් බල ප්‍රදේශය තෙත් කලාපීය දේශගුණයක් සහිත තැනිතලා ප්‍රදේශයක ඇති වර්ෂාවෙන් හා අමුණුවලින් පෝෂණය වන සරුසාර කුඹුරුවලින් යුක්ත ය. වී සහ එළවළු වගාවන් වලින් ප්‍රචලිත එම ගොවිජන සංවර්ධන බල ප්‍රදේශය පතෝල හා වැටකොළු වැනි පහතරට එළවළු සඳහාත්, බෝංචි හා තක්කාලි වැනි උඩරට එළවළු සඳහාත් වඩාත් ප්‍රචලිත ය. බල ප්‍රදේශයේ ඇති කුඹුරු ප්‍රමාණය අක්කර 1,294ක් වන අතර වගා කරන ගොඩ ඉඩම් ප්‍රමාණය අක්කර 7,600ක් වෙයි. ප්‍රදේශයේ සිටින ගොවීන් ප්‍රමාණය 3,079ක් වන අතර ඔවුන් නියෝජනය කරන ගොවි සංවිධාන ප්‍රමාණය 38ක් වේ. ගොවි බැංකු නියමු ව්‍යාපෘතිය ආරම්භක අවධියේ දීම පිහිටුවා ඇති මෙම ගොවි බැංකුවේ ඉතිහාසය 1998 ඔක්තෝබර් 28 දින දක්වා දිව යයි.

### 3.7.2 සාමාජිකත්ව වර්ධනය

2010 වර්ෂය වනවිට ප්‍රදේශයේ ඇති මුළු ගොවි සංවිධාන ප්‍රමාණයෙන් සියයට 34ක් ගොවි බැංකුව හා සම්බන්ධ කරගෙන ඇති අතර ප්‍රදේශයේ ඇති මුළු ගොවීන්ගෙන් 70%ක් එහි සාමාජිකයින් බවට පත් කොටගෙන ඇත. එහි සාමාජිකත්වය වර්ධනය වී ඇති ආකාරය වගු අංක 3.31 මඟින් ඉදිරිපත්කර කෙරේ. ඒ අනුව, 2000-2002 අතර කාලය තුළ දී සාමාජික වර්ධනය වේගයෙන් සිදු වී ඇති අතර නැවත 2002-2004 කාලය තුළ දී එය සිදු වී ඇත්තේ ඉතා මන්දගාමී ලෙස ය. මුල් අවධියේ දී ගොවි බැංකුවේ වර්ධනය සඳහා කැප වී කටයුතු කළ ප්‍රාදේශීය නිලධාරීන් සිටීම නිසා සාමාජික වර්ධනය වේගයෙන් සිදු වූවත්, 2005න් පසු පොහොර සහනාධාරය ලබාදීම හේතුවෙන් ණය මඟින් ලබා ගත යුතු යෙදවුම් පහසුවෙන් ලැබීම නිසා ණය වල ඇති වැදගත්කම අඩුවීමෙන් සාමාජිකත්වය වර්ධනය මන්දගාමීවීමට හේතු වී තිබේ.

වගු අංක 3.31: යටවත්ත ගොවි බැංකුවේ සාමාජිකත්ව වර්ධනය: 2002-2010

| වර්ෂය | සාමාජිකයන් / කොටස් හිමියන් ගණන | කොටස් වල වටිනාකම (රු) | ප්‍රදේශයේ පවුල් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|
| 2002 | 979 | 58,600 | 31.80 |
| 2003 | 1,040 | 193,700 | 33.78 |
| 2004 | 1,083 | 277,300 | 35.17 |
| 2005 | 2,067 | 377,850 | 67.13 |
| 2006 | 2,081 | 449,850 | 67.59 |
| 2007 | 2,099 | 491,950 | 68.17 |
| 2008 | 2,112 | 522,150 | 68.59 |
| 2009 | 2,128 | 573,050 | 69.11 |
| 2010 | 2,141 | 604,650 | 69.54 |

ගොවි පවුල් සංඛ්‍යාව 3079 කි.
මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

## 3.7.3 ගොවි බැංකුවේ ඉතුරුම්, කොටස් ප්‍රාග්ධනය හා ලාභාංශ වර්ධනය

මෙම ගොවි බැංකුව සඳහා මූලික ප්‍රාග්ධන අරමුදල් වශයෙන් රු. ලක්ෂ 14ක් ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගින් ලබා දී තිබේ. කෙසේ වුව ද, 2009 වසර වනවිට එම සම්පූර්ණ මුදල් ප්‍රමාණයම දෙපාර්තමේන්තුව වෙත යැවීමට මෙම බැංකුවට හැකියාව ලැබී ඇති අතර මේ වනවිට ගොවීන්ට අවශ්‍ය ණය ලබාදීම සඳහා උපයෝගී කරගනු ලබන්නේ ඔවුන් සතු කොටස් ප්‍රාග්ධන අරමුදල, පුද්ගල හා කණ්ඩායම් තැන්පතු මුදල් හා සමුච්චිත අරමුදලේ ඇති මුදල් ය. කොටස් ප්‍රාග්ධන අරමුදල වශයෙන් රු. 58,600/-ක් 2002 වර්ෂයේ දී පැවති අතර එම අරමුදල 2010 වසර වනවිට රු. 604,650/- දක්වා 932%කින් වර්ධනය වී ඇත (වගු අංක 2). එසේ ම, 2010 වනවිට තනි පුද්ගල තැන්පතුවල වටිනාකම 649%කින් ද, කුඩා කණ්ඩායම් තැන්පතු වටිනාකම 240%කින් ද වර්ධනය වී තිබේ. මේ අනුව, මුළු තැන්පතු වාර්ෂිකව 291%කින් වර්ධනය වී ඇති බව පෙනේ. කොටස් ප්‍රාග්ධනය හා තැන්පතුවල ඉහළ වර්ධනයක් දැකිය හැක්කේ 2003 වර්ෂයේ දී ය. ගොවි බැංකුවේ පොළී, ලාභාංශ ආදිය එකතුවීමෙන් ගොඩනැගුණු සමුච්චිත අරමුදලේ වටිනාකම 2010 වනවිට රු. ලක්ෂ 12.3ක් දක්වා වර්ධනය වී ඇති අතර 2002 වර්ෂයට සාපේක්ෂව 844%ක වර්ධනයක් දක්නට ලැබේ. මේ අනුව, කොටස් ප්‍රාග්ධනය, තැන්පතු හා සමුච්චිත අරමුදල එකතුවීමෙන් ගොඩනැගුණු මුළු සංචිත වටිනාකම 2002 වර්ෂයේ සිට 2010 වර්ෂය වනවිට වාර්ෂිකව 14%කින් වර්ධනයවීමක් දක්නට ලැබේ. ඉහළම සංචිත වටිනාකමක් දක්නට ලැබුණේ 2008 වර්ෂයේ දී වන අතර ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලබා දී තිබූ මූලික ප්‍රාග්ධන අරමුදල සම්පූර්ණයෙන්ම දෙපාර්තමේන්තුව වෙත 2009 වසරේ දී යවා තිබීම නිසා එම වර්ෂය තුළ මුළු සංචිත අරමුදල 35%කින් අඩු වී ඇත.

වගු අංක 3.32: යටවත්ත ගොවි බැංකුවේ අරමුදල් වර්ධනය: 2002-2010

| වර්ෂය | ප්‍රාග්ධනය (රු) | කොටස් ප්‍රාග්ධනය (රු) | පුද්ගල තැන්පතු වටිනාකම (රු) | කුඩා කණ්ඩායම් තැන්පතු (රු) | මුළු තැන්පතු (රු) | සමුච්චිත අරමුදල (රු) | සංචිත වටිනාකම (රු) |
|---|---|---|---|---|---|---|---|
| 2002 | 900,000 | 58,600 | 19,390 | | 19,390 | 131,493 | 1,109,483 |
| 2003 | 1,400,000 | 193,700 | 61,147 | 95,660 | 156,807 | 117,416 | 1,867,923 |
| 2004 | 1,400,000 | 277,300 | 95,933 | 149,120 | 245,053 | 310,652 | 2,233,005 |
| 2005 | 1,400,000 | 377,850 | 104,043 | 201,620 | 305,663 | 424,209 | 2,507,722 |
| 2006 | 1,400,000 | 449,850 | 126,913 | 228,628 | 355,541 | 569,707 | 2,775,098 |
| 2007 | 1,400,000 | 491,950 | 135,963 | 250,768 | 386,731 | 714,162 | 2,992,843 |
| 2008 | 1,400,000 | 522,150 | 139,863 | 280,045 | 419,908 | 900,969 | 3,243,027 |
| 2009 | - | 573,050 | 143,863 | 299,240 | 443,103 | 1,084,820 | 2,100,973 |
| 2010 | - | 604,650 | 145,263 | 325,740 | 471,003 | 1,236,640 | 2,312,293 |

ප්‍රාග්ධනය : ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගොවි බැංකු වෙත සපයන ලද මුදල

සංචිත වටිනාකම : ප්‍රාග්ධනය, කොටස් ප්‍රාග්ධනය, තැන්පතු වටිනාකම සහ සමුච්චිත අරමුදලේ වටිනාකම්වල එකතුව

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

## 3.7.4 ණය නිකුත් කිරීම

යටවත්ත ගොවි බැංකුව හරහා ප්‍රධාන වශයෙන්ම ගොවීන්ට අවශ්‍ය වගා ණය හා ව්‍යාපෘති ණය සපයා දී තිබේ. මුල් කාලයේ දී ක්ෂණික ණය සැපයීමක් ද සිදු වී ඇති අතර 2006 වර්ෂයේ සිට එය නතර කොට ඇත. මෙම ගොවි බැංකුව මඟින් සපයා ඇති ණය තොරතුරු විශ්ලේෂණයේ දී දැකගත හැකි කරුණක් වන්නේ වැඩිම වගා ණය ප්‍රමාණයක් ලබා දී ඇත්තේ යල කන්නය තුළ බවයි. එනම්, 2010 වර්ෂය තුළ පමණක් ගොවීන්ට ලබාදුන් මුළු වගා ණයවලින් 85%ක් පමණ යල කන්නයේ දී ලබා දී ඇත. මෙයට හේතුව, එම ගොවීන් ප්‍රධාන වශයෙන්ම බෝංචි, කරවිල, පතෝල, ගෙඩි ගෝවා ආදී එළවළු වගා කිරීමට ණය ලබා ගැනීම හා එම බෝග යල කන්නයේ දී වගා කිරීමයි. මෙයට අමතරව, වී වගාව සඳහා ද ණය ලබාගැනීම සිදු වේ. මෙම ගොවි බැංකුව වගා ණය සැපයීමේ දී 50%ක් ද්‍රව්‍යවලින් හා 50%ක් මුදලින් (බිම් සැකසීම ආදියට) ලබාදෙන අතර අලෙවි සැල මඟින් ගොවීන්ට අවශ්‍ය බීජ, පොහොර, කෘෂි රසායන ද්‍රව්‍ය ආදිය සපයනු ලැබේ. තව ද, 2004 වර්ෂයේ සිට ව්‍යාපෘති ණය ලබා දී ඇති අතර උපරිම ව්‍යාපෘති ණය මුදලක් නිකුත් කොට ඇත්තේ 2008 වර්ෂය තුළ ය. කෙසේ වුව ද, 2010 වර්ෂය වනවිට ව්‍යාපෘති ණය සැපයීම පෙර වර්ෂයට සාපේක්ෂව 44%කින් පමණ අඩුවීමක් දක්නට ලැබේ.

ගොවි බැංකුව හරහා වැඩිම ගොවීන් පිරිසකට ණය සපයා ඇත්තේ 2002 වර්ෂයේ දී වන අතර පසුගිය කාලය තුළ ණය ලබාගත් ගොවීන් සංඛ්‍යාවේ ක්‍රමික අඩුවීමක් දක්නට ලැබේ. ගොවි බැංකුව හරහා උපරිම ණය මුදලක් නිකුත් කොට ඇත්තේ 2006 වර්ෂයේ දී වන අතර ගොවි බැංකුවේ සංචිත වටිනාකමට සාපේක්ෂව මෙම ප්‍රමාණය 98.6%කි. කෙසේ වුව ද, සංචිත වටිනාකමට සාපේක්ෂව ඉහළම ණය මුදලක් (106%) නිකුත් කොට ඇත්තේ 2009 වර්ෂයේ දී ය. සංචිත වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස අඩුම ණය ප්‍රමාණයක් 2007 හා 2008 යන වර්ෂවල දී නිකුත් කර ඇත (පිළිවෙළින් 55% සහ 59%). කණ්ඩායම් ක්‍රමය පැමිණීමත් සමඟ කණ්ඩායම තුළ සිටින ගොවීන්ගේ සාමූහික බව බිඳී යාමෙන් කලින්

සක්‍රියව ගොවි බැංකුව සමඟ ගනුදෙනු කළ ගොවීන් ද අක්‍රිය තත්ත්වයට පත් ව ඇති බව හෙළිදරව් විය. එසේ ම, ගොවි බැංකුව හරහා ද්‍රව්‍ය ණය ලබාදීමේ දී එම ද්‍රව්‍යවල (බීජ හා කෘෂි රසායන ද්‍රව්‍ය) මිල ගණන් බාහිර වෙළෙඳසැල්වලට වඩා අධිකවීම ගොවීන් ගොවි බැංකු ණය කෙරෙන් ඈත්වීමට බලපා තිබේ. මෙහි දී, ලබා දෙන උපරිම රු. 25,000/- ක මුදල ගොවීන්ගේ වගා වියදම් සමඟ සැසඳීමේ දී ගොවීන්ට කිසිසේත් ප්‍රමාණවත් නොවන නිසා ගොවීන් වෙනත් බැංකු කරා යොමු වීම ද දක්නට ලැබුණි. එසේ ම, ගොවි බැංකුව හරහා මුදලින් ගනුදෙනු කිරීමක් සිදු නොවන අතර ගොවියාට අවශ්‍ය ණය මුදල චෙක්පත් මඟින් ලබාදෙන නිසා එම චෙක්පත් මාරු කර ගැනීමට ගොවියාට තවත් දුරක් ගෙවා බැංකුව වෙත යාමට සිදුවීම ඔවුන් තවදුරටත් අපහසුතාවයට ලක්වීමකි.

**වගු අංක 3.33: යටවත්ත ගොවි බැංකුව මඟින් නිකුත් කළ ණය වටිනාකම: 2002-2010**

| වර්ෂය | වගා ණය ප්‍රමාණය | | | ව්‍යාපෘති ණය (රු) | ක්ෂණික ණය (රු) | නිකුත් කල මුළු ණය වටිනාකම (රු) | ණය ලබාගත් ගොවීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| | යල (රු) | මහ (රු) | එකතුව (රු) | | | | |
| 2002 | 1,015,645 | 422,920 | 1,438,565 | - | - | 1,438,565 | 412 |
| 2003 | 1,289,160 | 692,096 | 1,981,256 | - | 105,000 | 2,086,256 | 384 |
| 2004 | 966,007 | 402,193 | 1,368,200 | 604,682 | 205,000 | 2,177,882 | 279 |
| 2005 | 1,239,892 | 183,835 | 1,423,727 | 649,682 | 205,000 | 2,278,409 | 290 |
| 2006 | 1,015,132 | 517,585 | 1,532,717 | 1,204,682 | - | 2,737,399 | 270 |
| 2007 | 231,585 | 623,341 | 854,926 | 800,000 | - | 1,654,926 | 161 |
| 2008 | 490,720 | 129,997 | 620,717 | 1,292,285 | - | 1,913,002 | 100 |
| 2009 | 973,698 | 167,609 | 1,141,307 | 1,088,574 | - | 2,229,881 | 126 |
| 2010 | 1,128,600 | 202,138 | 1,330,738 | 600,000 | - | 1,930,738 | 136 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

**වගු අංක 3.34: සංචිත වටිනාකමට සාපේක්ෂව යටවත්ත ගොවි බැංකුව මඟින් නිකුත් කළ ණය වටිනාකම: 2002 -2010**

| වර්ෂය | නිකුත් කළ මුළු ණය වටිනාකම (රු) | සංචිත වටිනාකම (රු) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| 2002 | 1,438,565 | 1,109,483 | 129.66 |
| 2003 | 2,086,256 | 1,867,923 | 111.69 |
| 2004 | 2,177,882 | 2,233,005 | 97.53 |
| 2005 | 2,278,409 | 2,507,722 | 90.86 |
| 2006 | 2,737,399 | 2,775,098 | 98.64 |
| 2007 | 1,654,926 | 2,992,843 | 55.30 |
| 2008 | 1,913,002 | 3,243,027 | 58.99 |
| 2009 | 2,229,881 | 2,100,973 | 106.14 |
| 2010 | 1,930,738 | 2,312,293 | 83.50 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

## 3.7.5 ණය අයවීම

ගොවි බැංකුවේ වගා ණය අයවීම 2008 වර්ෂය දක්වා ඉතා සාර්ථකව සිදු වී තිබේ. කෙසේ වුව ද, 2009 වර්ෂයේ වගා ණය අයවීම යම් තරමක අඩුවීමක් දක්නට ලැබෙන අතර 2010 වර්ෂය වන විට ණය අයවීම තවදුරටත් පහළ බැස ඇත. මේ අනුව, සමස්ත ණය අයවීමේ ප්‍රවණතාවය වාර්ෂිකව අඩුවීමක් නිරීක්ෂණය වේ (වගු අංක 3.35). ගොවීන් ණය ගෙවීමට පෙළඹවීම සඳහා කෘ.ප.නි.ස. වරුන්ගෙන් ලැබෙන සහයෝගය අඩුවීම, බීජවල ගුණාත්මක බව අඩුවීමෙන් ලැබෙන අස්වැන්න අඩු නිසා ණය ගෙවීමට අපහසුවීම, ඇතැම් ගොවීන් වුවමනාවෙන් ම ණය ගෙවීම පැහැර හැර තිබීම යන කරුණු ණය අයවීම අඩුවීම කෙරෙහි බලපා තිබේ. ව්‍යාපෘති ණය ලබා දෙන්නේ කන්න කිහිපයකට බැවින් හා වගු අංක 5න් ණය අයවීමේ ප්‍රතිශතය පෙන්නුම් කරන්නේ අදාළ වර්ෂය සඳහා පමණක් බැවින් ද ව්‍යාපෘති ණය අයවීමේ සාර්ථක/අසාර්ථක බව මෙම වගුව තුළින් පැහැදිලිව පිළිබිඹු නොවේ.

**වගු අංක 3.35: යටවත්ත ගොවි බැංකුවේ ණය අයවීම: 2002-2010**

| වර්ෂය | ණය වර්ගය | | | | | | අය කර ගත් මුළු ණය වටිනාකම (රු) | වර්ෂයට අදාළව නිකුත් කළ මුළු ණය වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|---|---|---|---|---|
| | වගා ණය (රු) | ප්‍රතිශතය (%) | ව්‍යාපෘති ණය (රු) | ප්‍රතිශතය (%) | ක්ෂණික ණය (රු) | ප්‍රතිශතය (%) | | |
| 2002 | 1,424,413 | 99.02 | - | - | - | - | 1,424,413 | 99.02 |
| 2003 | 1,971,036 | 99.48 | 0 | - | 0 | - | 1,971,036 | 94.48 |
| 2004 | 1,357,727 | 99.23 | 0 | - | 200,000 | 97.56 | 1,557,727 | 71.52 |
| 2005 | 1,405,647 | 98.73 | 354,217 | 54.52 | 205,000 | 100.00 | 1,964,864 | 86.24 |
| 2006 | 1,532,717 | 100.00 | 782,642 | 64.97 | - | - | 2,315,359 | 84.58 |
| 2007 | 849,477 | 99.36 | 526,750 | 65.84 | - | - | 1,376,227 | 83.16 |
| 2008 | 600,561 | 96.75 | 743,711 | 57.55 | - | - | 1,344,271 | 70.27 |
| 2009 | 1,012,196 | 88.69 | 631,013 | 57.97 | - | - | 1,643,209 | 73.69 |
| 2010 | 691,600 | 51.97 | 560,379 | 93.40 | - | - | 1,251,979 | 64.84 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

## 3.7.6 ද්‍රව්‍ය ණය ලබා දීම

යටවත්ත ගොවි බැංකුව මඟින් ගොවීන් සඳහා වගා ණය ලබා දී ඇත්තේ බොහෝ විට ද්‍රව්‍ය ණය වශයෙන් බව සමීක්ෂණයේ දී හෙළිදරව් විය. මෙහි දී, එළවළු බීජ, බිත්තර වී, පොහොර, කෘමි නාශක, වල් නාශක ආදිය ගොවීන්ට ලබා දී ඇති නමුත් එම ද්‍රව්‍යවල මිල ගණන් බාහිර වෙළෙඳසැල්වලින් මිල දී ගන්නවාට වඩා අධික බව ගොවීන් ප්‍රකාශ කළ හ. එම ද්‍රව්‍ය සඳහා වට්ටම් ක්‍රම නොවන බැවින් ගොවීන් බහුතරයක් පිටතින් එම ද්‍රව්‍ය සපයා ගැනීමට පෙළඹී සිටිති. එසේ ම, මෙම ගොවි බැංකුව හරහා ලබා දෙන බෝංචි බීජ හා වෙනත් බීජවල ගුණාත්මය පිළිබඳ බොහෝ ගොවීන්ගෙන් පැමිණිලි ලැබී තිබේ. තව ද, ගොවීන්ට අවශ්‍ය කෘෂි රසායන ද්‍රව්‍ය, බීජ ආදිය අවශ්‍ය වේලාවට, අවශ්‍ය ප්‍රමාණයන්ගෙන් හා සාධාරණ මිලකට ලබා ගැනීමට නො හැකි බැවින් ගොවිහු ගොවි බැංකු ණය ලබා ගැනීමට මැලි වෙති. කෙසේ වුව ද, මුදලින් ලබාදෙන ණය මුදල් වගා කටයුතුවලට හැර වෙනත් කටයුතුවලට යෙදවෙන නිසා ද්‍රව්‍යවලින් ණය ලබාදීම සුදුසු බව ඇතැම් ගොවීන්ගේ

අදහස විය. කෙසේ වුව ද, එම ද්‍රව්‍ය ගොවියාගේ වර්තමාන අවශ්‍යතාවයට නො ගැලපෙන්නේ නම් හා සාධාරණ මිලකට නො ලැබෙන්නේ නම් ගොවින් ඉදිරියේ දී ගොවි බැංකුව වෙත ආකර්ෂණය නොවන බව සමීක්ෂණයේ දී හඳුනා ගත හැකි විය.

## 3.7.7 කණ්ඩායම් ක්‍රමය

පස් දෙනාගේ කුඩා කණ්ඩායම් පැවතීම ගොවි බැංකුව හරහා ණය ලබා ගැනීමට ද පූර්ව අවශ්‍යතාවයකි. කෙසේ වුව ද, මෙම කණ්ඩායම් ක්‍රමය මේ වනවිට පවතින්නේ ණය ගැනීමේ අවශ්‍යතාව සඳහාම පමණි. ඒ හැර මෙම ප්‍රදේශයේ ගොවීන් සාමූහිකව කණ්ඩායම් ක්‍රමයෙන් ප්‍රයෝජනය ලබා ගැනීම අඩු බව නිරීක්ෂණය කළ හැකි විය. බොහෝ ගොවීන් ප්‍රකාශ කළේ කණ්ඩායම් ක්‍රමය පැමිණීමෙන් පසු කලින් ගොවි බැංකුව සමඟ සක්‍රියව දායක වී සිටි ගොවීන් බහුතරයක් මේ වන විට අක්‍රිය වී ඇති බවයි. මෙයට හේතු වී ඇත්තේ කණ්ඩායමේ එක් පුද්ගලයෙකු හෝ ණය නො ගෙවූ විට කණ්ඩායමේ අන් සියළුම දෙනාට ණය ලබා ගැනීමට නො හැකිවීමත්, හිඟ ණය ගෙවීම කණ්ඩායමේම ගොවීන්ගේ වගකීමක් බවට පත්වීමත් ය. මෙම තත්ත්වය උනන්දුවෙන් සාර්ථකව ගොවිතැන් කරන ගොවීන්ට ද බාධාවක් නිසා එවැනි අවස්ථාවල දී එම ගොවීන් තවදුරටත් ගොවි බැංකුව සමඟ ගනුදෙනු නො කරන තත්ත්වයක් ඇති වේ. කෙසේ වුව ද, වඩාත් හොඳින් ණය ගෙවමින් සාර්ථකව ක්‍රියාත්මක වන කණ්ඩායම්වල ගොවීන් පමණක් කණ්ඩායම් ක්‍රමයට කැමැත්තක් දක්වන අතර මෙම ක්‍රමයේ ඇති ප්‍රධාන වාසියක් වන්නේ කණ්ඩායම් ඇප මත ණය ලබාගත හැකි වීමයි. එම නිසා, වෙනත් ඇතැම් බැංකුවල මෙන් ඇප තැබීම සඳහා කරදරවීමේ අවශ්‍යතාවයක් නොමැත.

## 3.7.8 ණය සීමාවන්

මෙම ප්‍රදේශයේ ගොවීහු වැඩි පිරිසක් ප්‍රධාන වශයෙන් යල කන්නයේ එළවළු වගාවට පෙළඹී සිටිති. මේ හැර වී වගාව ද සිදු කරති. බෝංචි, ගෝවා ආදී එළවළු වගා කිරීමේ දී ප්‍රධාන වශයෙන් බීජ සඳහා ඉතා අධික මුදලක් වැයවන බැවින් හා කම්කරු කුළිය ඉතා ඉහළ බැවින් වගා කටයුතු සඳහා ගොවි බැංකුවෙන් ලබාදෙන ණය මුදල ප්‍රමාණවත් නොවන බව පැහැදිළි විය. ගෝවා, බෝංචි ආදී එළවළු වගා කිරීම සඳහා අක්කරයකට රු. 40,000ක පමණ මුදලක් වැය වන බැවින් ගොවි බැංකුව තුළින් ණය ලබා ගත්විට මෙම ගොවීන්ගේ අවශ්‍යතා සම්පූර්ණ නොවන නිසා ඔවුන්ට තවත් බැංකුවලින් ණය ලබා ගැනීමට සිදු වේ. එම නිසා, අවම වශයෙන් එක් ගොවියෙකුට වගා ණය ලෙස රු. 50,000ක් වැනි මුදලක්වත් ගොවි බැංකුව හරහා සැපයීම උචිත බව පැහැදිළි විය. එසේ නොමැති වුවහොත් වර්තමාන ගොවීන්ගේ අවශ්‍යතා අනුව ඔවුන් තවදුරටත් ගොවි බැංකුව තුළ නොරැඳෙනු ඇත. මෙහි දී, කෘෂි රසායන ද්‍රව්‍ය, බීජ ආදිය අවශ්‍ය ප්‍රමාණයන්ගෙන් හා කලට වේලාවට ඉහළ ගුණාත්මයෙන් යුතුව සැපයීම ද අත්‍යාවශ්‍ය කරුණකි.

## 3.7.9 ප්‍රගතිය සඳහා බලපෑ සාධක

සැලකිය යුතු සාමාජිකයින් ප්‍රමාණයක් බඳවා ගනිමින් කොටස් හා ඉතුරුම් වර්ධනය කරමින් සැලකිය යුතු පිරිසකට ණය ලබා දී අයකර ගෙන ඇති මෙම ගොවි බැංකුව මෑතක් දක්වාම ඉහත දැක් වූ සියළු අංශයන්ගෙන් ඉහළ ප්‍රගතියක් පෙන්වා ඇත.

මෙම ගොවි බැංකුවෙ හි ඉහළ ප්‍රගතිය සඳහා බලපෑ ප්‍රධාන කාරණය වී ඇත්තේ ආරම්භක අවධියේ සිට දිගින් දිගටම සිටි ප්‍රාදේශීය නිලධාරීන් ගොවි බැංකුව දියුණු කිරීම සඳහා කැපවීමෙන් හා උනන්දුවෙන් සේවය කළ අයවීමයි. මෙම නිලධාරීන් ප්‍රදේශයේ ඉහළ ඉල්ලුමක් ඇති ගොවීන්ගේ බීජ අවශ්‍යතා සැපිරීම සඳහා කන්නයට පූර්ව අවධියේ සිට සූදානම්ව සිටීම

තුළින් රු.ලක්ෂ 7-8 ක පමණ බීජ ප්‍රමාණයක් ණයට ලබා දී තිබේ. එසේ වුව ද, මේ වන විට එම සේවාව දුර්වලත්වයට පත් ව ඇත.

ගොවිජන බැංකුවෙ හි පාලන කටයුතු දිගින් දිගටම සිදු කළ කම්ටු ලිපිකරුතුම්යගේ අවංකභාවය, කාර්යශූරත්වය හා කැපවීම ද ගොවිජන බැංකුවෙ හි කටයුතු වඩාත් සාර්ථකව පවත්වාගෙන යාමට බලපා තිබේ.

සියළුම වසම්වල නො වූවත් ඇතැම් වසම්වල සේවය කරන කෘ.ප.නි.ස. වරුන් කන්නයට කලින් ගොවීන්ගේ ණය අවශ්‍යතා විමසා බලා ණය ඉල්ලුම්පත්‍ර ගෙනැවිත් බාරදීමත්, ණය ලබාදීමෙන් පසු පෞද්ගලිකවම මැදිහත් වී ගෙවිය යුතු මුදල් ඉල්ලා ගෙනැවිත් ගෙවා රිසිට්පත් ආපසු ගෙන ගොස් භාරදීමත් සිදු කරනු ලබන අතර එය ද ණය දීමේ ක්‍රියාවලිය සාර්ථක කරගැනීම සඳහා මෙන් ම ගොවි බැංකුවෙ හි සාර්ථකත්වය සඳහා හේතු වී ඇත.

ප්‍රදේශයෙ හි පවත්නා සමාජ-ආර්ථික තත්ත්වය හා කෘෂිකර්මයෙ හි වාණිජමය ස්වරූපය ද ගොවි බැංකුව සාර්ථකව පවත්වාගෙන යාමට රුකුලක් වී තිබේ. ඇතැම් උඩරට එළවළු මෙන් ම පහතරට එළවළු ද වාණිජමය වගාවන් ලෙස සාර්ථකව කරගෙන යා හැකි හොඳ දේශගුණික තත්ත්වයක් පැවතීම හා ඒ සඳහා මැදිහත් විය හැකි ඉඩ කඩම් සහිත ජනතාවකගෙන් සමන්විත වීම ද මේ සම්බන්ධයෙන් වැදගත් වේ.

## 3.7.10 ගොවි බැංකුවෙහි වර්තමාන ප්‍රගතිය/දුර්වලත්වය සඳහා බලපෑසාධක

1. ණය ලබාදීමේ දී ඇප ලෙස කණ්ඩායම් ක්‍රමය දිරි ගැන්වීම වරක් ලබාගත් ණය සාර්ථක ලෙස ගෙවා තවත් ණය ලබා ගැනීමට උනන්දුවක් දක්වන ගොවීන්ට ගැටලුවක් වී ඇති බව නිරීක්ෂණය කළ හැකි විය. තම කණ්ඩායමෙ හි අනෙක් ගොවීන් ණය නො ගෙවීම මෙන් ම ගෙවීම සඳහා මන්දගාමී ස්වභාවයක් අනුගමනය කිරීම මේ සඳහා හේතු වී තිබේ. මේ හේතුවෙන් සාර්ථක ගොවීන් ද ගොවිජන බැංකුවෙන් ණය ලබා ගැනීමට පසුබට වන බව බැංකු කටයුතු මෙහෙයවා ඇති නිලධාරීන්ගේ ද අදහස ය. කණ්ඩායම් ක්‍රමය වෙනුවට තනි තනිව ණය දෙන්නේ නම් එය වඩාත් සාර්ථක කළ හැකි බවත්, එහි දී තනි තනිව ගොවීන් නිර්දේශ කිරීම හා අයකර දීමේ කටයුත්ත කෘ.ප.නි.ස. වරුන්ට කළ හැකි බවත් වැඩිදුරටත් ඔවුන්ගේ අදහසයි.

2. කණ්ඩායම් ක්‍රමය පිළිබඳව ගොවීන්ට දැනුම අඩු අතර ඒ හේතුව නිසා කණ්ඩායම් හැඟීමෙන් ද කටයුතු නො කරයි. ණය නො ගෙවීම සඳහා මෙය ද හේතුවක් වී තිබේ.

3. ගොවීන් ගම් මට්ටමින් ගොවි බැංකුව වෙත බඳවා ගැනීම සඳහා කෘ.ප.නි.ස. වරුන්ගෙන් ඉටුවන සේවය ප්‍රමාණවත් නොවන බව ද බැංකුව මෙහෙයවන නිලධාරීන්ගේ අදහසයි.

4. එමෙන් ම, ග්‍රාමීය මට්ටමේ ගොවි සංවිධාන ආකර්ශනීය ලෙස කටයුතු නො කිරීම හා පාරදෘශ්‍යභාවයෙන් තොරව ක්‍රියා කිරීමත්, ගොවීන්ට ගොවි ණය ලබාදීම සඳහා උනන්දුවක් ඇති නො කිරීමත් ඔවුන් සංවිධානවලින් පමණක් නොව ගොවි බැංකුවෙන් ද ඈත්කර තැබීමට හේතු වී ඇති බව පර්යේෂණ කණ්ඩායම් විසින් ස්වාධීන ව ක්ෂේත්‍රයෙ හි කරනු ලැබූ සාකච්ඡා හා නිරීක්ෂණයන් මඟින් දැනගත හැකි විය. මෙවැනි එක් අත්දැකීමක් ආශ්‍රයෙන් දැනගත හැකි වූයේ එක් වසමක කෘ.ප.නි.ස. විසින් තමන්ගේ ඥාතීන් හා හිතවතුන් දිගින් දිගටම ගොවි සංවිධානයෙ හි නිලධාරීන් ලෙස කටයුතු කිරීමට සලස්වා ඒ ඔස්සේ

ගොවි සංවිධානය මඟින් ලබාගත හැකි තමන්ට අවශ්‍ය විවිධ ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු යොදා ගෙන ඇති බව යි.

5. වර්තමානයෙ හි ණය දීමේ දී සපයනු ලබන ගොවිජන සංවර්ධන කම්ටු අලෙවිසැලෙ හි ඇති බීජ හා වෙනත් භාණ්ඩ පෞද්ගලික වෙළෙඳුන්ගෙන් මිල දී ගෙන ගොවීන්ට සපයනු ලබන නිසා සැලකිය යුතු කොමිස් මුදලක් සහිතව ඒවා ඔවුන්ට ලබාදීමට නො හැකි වේ. බැංකුවෙන් ලබාගැනීමට වඩා අධික ලාභයක් යටතේ බාහිර වෙළෙඳසැල්වලින් ද්‍රව්‍ය මිල දී ගත හැකිවීම ගොවීන් ගොවිජන බැංකුව වෙත යොමුකර ගැනීමට අපහසු කරවන කරුණක් බවට පත්ව තිබේ.

6. වගා කටයුතු සඳහා විවිධ බෝගයන් වෙනුවෙන් දෙනු ලබන ණය මුදල් ප්‍රමාණය ප්‍රමාණවත් නොවීම ද, ගොවීන් වෙනත් බැංකු කෙරෙහි යොමු කරවීමට හේතු වී ඇති බව සාකච්ඡාවන් තුළින් දැනගත හැකි විය.

7. ගොවි බැංකුව මුදල් මඟින් ගෙවීම් සිදු කරනු ලබන්නක් නොවන නිසා සුළු මුදල් ප්‍රමාණයක් වූව ද ගෙවීමේ දී බැංකුවලට චෙක්පත් ලියා ඒ ඔස්සේ කටයුතු කිරීම හේතුවෙන් ඔවුන්ට වෙනත් බැංකුවලට යාමට සිදුවීම ගැටලුකාරී තත්ත්වයකි.

### 3.7.11 යෝජනා

කණ්ඩායම් ඇප ක්‍රමය ගොවි බැංකු ක්‍රියාවලිය තුළ විවාදයට භාජනය වූවක් මෙන් ම සෑම අවස්ථාවක දී ම සාර්ථක භාවයට පත් වී නොමැති වූයේක් නිසා කණ්ඩායම් ක්‍රමය හා සමගාමීව කැමති අයට තනි පුද්ගලයින් වශයෙන් ණය ලබා ගැනීමට සුදුසු ක්‍රමවේදයක් සැලසිය යුතු ය. එසේ තනි පුද්ගලයින් වශයෙන් සලකා ණය නිකුත් කිරීමේ දී ණය අය කර දෙන බවට කෘ.ප.නි.ස./ප්‍රාදේශීය නිලධාරී නිර්දේශය හෝ ගොවීන් දෙදෙනෙකුගේ සහතිකය ලබා තිබීම වැනි ලිහිල් ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතු ය.

ණය නිර්දේශ කිරීම පමණක් නොව, නිවැරදිව ඉල්ලුම්පත් පුරවාදීම, ඒවා ගොවි බැංකුව වෙත භාරදීම, ණය ආපසු ගෙවීමට උනන්දු කරවීම හා ඒවා බැංකුව වෙත ගෙවීමට භාර ගැනීම යනා දී වූ කාරණා සඳහා කෘ.ප.නි.ස. වරුන් සම්බන්ධ කර ගැනීම මඟින් ගොවීන්ගේ කාලය හා වියදම අඩුවීම පමණක් නොව ගොවි බැංකුවට ද ඉතා ඉක්මණින් හා අඩු වියදමකින් ණය නිකුත් කිරීමට හැකි වේ. කෘ.ප.නි.ස. වරුන් ගොවිජන බැංකුව දියුණු කිරීමේ කාර්යය සඳහා සහභාගීකරවා ගැනීමේ දී අදාළ ප්‍රදේශයට ගැලපෙන පරිදි සාමාජිකයින් බඳවා ගැනීම, ණය නිකුත් කිරීම හා අයකර ගැනීම යනා දී කාරණා සඳහා ඉලක්ක ලබාදිය යුතු අතර ඒවා ඔවුන්ගේ කාර්යසාධනය ඇගයීම සඳහා ඍජුවම සම්බන්ධ කරගත යුතු ය.

## 3.8 ඉලුක්කුඹුර ගොවි බැංකුව

### 3.8.1 හැඳින්වීම

මාතලේ දිස්ත්‍රික්කයෙ හි ලග්ගල මැතිවරණ කොට්ඨාසයෙ හි පිහිටි ඉලුක්කුඹුර ගොවිජන බැංකුව භෞතිකමය වශයෙන් ගමනාගමන අපහසුකම් සහිත ඉතා දුෂ්කර ප්‍රදේශයක පිහිටි එකකි. ගොවිජන බැංකුවට අයත් බල ප්‍රදේශය කඳු හෙල් හා ද්‍රෝණිවලින් සමන්විත වන අතර මිටියාවත් හි පිහිටි අස්වද්දන ලද කුඹුරු බිම් කේන්ද්‍ර කරගත් හුදකලා ගම්වලින් යුක්ත ය. ගොවිජන බලප්‍රදේශය තුළ පිහිටි එවැනි හුදකලා ගම් සංඛ්‍යාව 11ක් වන අතර එක් ගමක ඇති පවුල් ප්‍රමාණය 50-60 අතර සංඛ්‍යාවක් වේ. ඊසානදිග මෝසම් වැස්සෙන් ප්‍රධාන වශයෙන් පෝෂණය වන මෙම ගම්මානයන් හි පිහිටි කුඹුරු ඉඩම්වල මහ කන්නයේ දී වී වගාවත්, යල කන්නයේ දී තක්කාලි, ගෝවා, බෝංචි, කරවිල, මෑ වැනි උඩරට හා



පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

පහතරට එළවළු වගාවන් සිදු කෙරේ. ග්‍රාම සේවා වසම් 11කින් සමන්විත මුළු බල ප්‍රදේශය තුළ පදිංචි ගොවි පවුල් ප්‍රමාණය 578 කි. ප්‍රදේශයේ වගා කරන ගොඩ ඉඩම් ප්‍රමාණය අක්කර 441ක් වන අතර මඩ ඉඩම් ප්‍රමාණය අක්කර 998කි. ඉතා කුඩා ඉඩම්වල වගා කරන සෑම ගොවි පවුලක්ම අඩුම වශයෙන් අක්කර 1/2ක් හෝ කුඹුරු ප්‍රමාණයක් වගා කරති. සෑම ගමකම ජනගහනයෙන් 25%ක් පමණ සමෘද්ධිලාභීන් ය. මෙම ගොවිජන බැංකුව ආරම්භ කොට ඇත්තේ 1999/2000 මහ කන්නයේ සිට ය.

## 3.8.2 සාමාජිකත්ව වර්ධනය

මෙම ගොවි බැංකුව සමඟ වර්තමානයේ ගනු දෙනු කරන වසම් සංඛ්‍යාව 6ක් වන අතර කුඩා කණ්ඩායම් ගණන 16කි. පිටවල-2, ඇටන්වල-5, රත්තින්ද-2, මහලකොටුව -1, පුවක්පිටිය -3 හා ඉලුක්කුඹුර -3 ලෙස එම කණ්ඩායම් ක්‍රියාත්මක වේ. 2001 වසරේ දී ගොවි බැංකුව තුළ සාමාජිකත්වය ලද ගොවීන් ගණන බල ප්‍රදේශයේ මුළු පවුල් සංඛ්‍යාවෙන් 21%ක් වූ අතර එය 2010 වන විට මුළු පවුල් සංඛ්‍යාවෙන් 35%ක් දක්වා වර්ධනය වී තිබේ (වගු අංක 3.36). ගොවි බැංකුව ආරම්භයේ දී (2001 දී) එහි සාමාජිකයින් සංඛ්‍යාව 123ක් වූ අතර 2010 වන විට එය 203 දක්වා එනම් 65%කින් වර්ධනය වී ඇත. එසේ වුව ද, පසුගිය වසර කිහිපය තුළ, එනම් 2003න් පසුව සාමාජිකත්වය වර්ධනය වී ඇත්තේ අල්ප වශයෙනි (4.6%).

**වගු අංක 3.36: ඉලුක්කුඹුර ගොවි බැංකුවේ සාමාජිකත්ව වර්ධනය: 2001-2010**

| වර්ෂය | සාමාජිකයන් / කොටස් හිමියන් ගණන | කොටස් වල වටිනාකම (රු) | ප්‍රදේශයේ පවුල් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|
| 2001 | 123 | 25,750 | 21.28 |
| 2002 | 168 | 33,250 | 29.07 |
| 2003 | 194 | 43,200 | 33.56 |
| 2004 | 198 | 43,200 | 34.26 |
| 2005 | 198 | 48,440 | 34.26 |
| 2006 | 202 | 57,080 | 34.95 |
| 2007 | 202 | 58,650 | 34.95 |
| 2008 | 202 | 59,150 | 34.95 |
| 2009 | 203 | 68,750 | 35.12 |
| 2010 | 203 | 72,450 | 35.12 |

ගොවි පවුල් සංඛ්‍යාව 578 කි

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

## 3.8.3 ගොවි බැංකුවේ ඉතුරුම්, කොටස් ප්‍රාග්ධනය හා ලාභාංශ වර්ධනය

ගොවි බැංකුව ආරම්භයේ දී, එනම් 2000.08.31 දින මූලික ප්‍රාග්ධන මුදල ලෙස රුපියල් 275,000ක් ගොවිජන බැංකුව පිහිටුවීම සඳහා දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති අතර 2001 දී නැවත රුපියල් ලක්ෂ 4ක මුදලක් ලබා දී තිබේ. මේ අනුව, රු. 675,000ක මුදලක් ප්‍රාග්ධනය ලෙස මෙම ගොවිජන බැංකුව සඳහා ලබා දී ඇති අතර 2011 වසර වන විට මෙම සම්පූර්ණ ප්‍රාග්ධන මුදල නැවත දෙපාර්තමේන්තුව වෙත යවා තිබුණි. ගොවි බැංකුවේ

ඉතුරුම් ගිණුම් තුළ රු. 46,600ක් 2001 වසරේ දී පැවති අතර මේ වන විට කණ්ඩායම් ගිණුම් නො තිබුණි. එය 2010 වන විට රු. 116,490ක් දක්වා වර්ධනය වී ඇත. කුඩා කණ්ඩායම් ගිණුම් ආරම්භ වී ඇත්තේ 2004 වර්ෂයේ දී ය. මේ දක්වා පුද්ගල තැන්පතු ගිණුම්වල ඇති ඉහළම මුදල වාර්තා වී ඇත්තේ 2004 දී වන අතර 2010 වන විට එය 7%කින් පමණ අඩු වී තිබේ. 2001 දී ගොවීන් විසින් රු. 25,750ක කොටස් මිල දී ගෙන ඇති අතර එය 2010 වනවිට රු.72,450 දක්වා වර්ධනය වී ඇත. එසේ ම, ගොවි බැංකුව මඟින් ගොවීන්ට ණය සැපයීමේ දී එහි පොළිය එකතුවීමෙන් ගොඩනැඟුණු සමුච්ඡිත අරමුදලක් පවතින අතර 2002 දී රු. 19,231ක් වූ එය 2010 වන විට රු. 275,328ක් දක්වා ඉහළ ගොස් ඇත. මේ අනුව, තැන්පත් වටිනාකම, කොටස් වටිනාකම, සමුච්ඡිත අරමුදල හා ආරම්භක ප්‍රාග්ධනය එකතුවීමෙන් ගොඩනැඟුණු සමස්ත සංචිත වටිනාකම 2009 දී රු. 1,081,859 ක් වූ අතර 2010 දී ආරම්භක ප්‍රාග්ධනයෙන් කොටසක් ගෙවීම නිසා සමස්ත සංචිත වටිනාකම රු. 739,268 දක්වා අඩුවීමක් දැකිය හැකි ය. මෙම මුළු සංචිත වටිනාකම ගොවි බැංකුව මඟින් ගොවීන්ට ණය නිකුත් කිරීම සඳහා යොදා ගනු ලබයි (වගු අංක 3.37). මෙම ගොවි බැංකුව සමඟ ගනු දෙනු කරන සාමාජික සංඛ්‍යාව අඩු අගයක් වීම නිසා හා ගොවීන් ණය සඳහා පෙළඹීම අඩු නිසා ගොවි බැංකුව සතු සංචිත වටිනාකම ණය දීම සඳහා ප්‍රමාණවත් වේ. තව ද, මෙම ප්‍රදේශය අති දුෂ්කර ප්‍රදේශයක් බැවින් මේ වන විට තම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු හා වෙනත් රැකියා සඳහා මෙම ප්‍රදේශය හැර යන පිරිස ඉහළ ගොස් ඇති අතර කොටස් මිල දී ගෙන ඇති ගොවීන් ඒවා වෙනත් ගොවීන්ට පැවරීමක් සිදු කොට තිබේ (ගොවීන් 5 දේනෙකු එසේ පැවරීම කර ඇත).

**වගු අංක 3.37: ඉලුක්කුඹුර ගොවි බැංකුවේ අරමුදල් වර්ධනය: 2001-2010**

| වර්ෂය | ප්‍රාග්ධනය (රු) | කොටස් ප්‍රාග්ධනය (රු) | පුද්ගල තැන්පතු වටිනාකම (රු) | කුඩා කණ්ඩායම් තැන්පතු (රු) | මුළු තැන්පතු වටිනාකම (රු) | සමුච්ඡිත අරමුදල (රු) | සංචිත වටිනාකම (රු) |
|---|---|---|---|---|---|---|---|
| 2001 | 675,000 | 25,750 | 46,600 | - | 46,600 | (954) | 746,396 |
| 2002 | 675,000 | 33,250 | 67,200 | - | 67,200 | 19,231 | 794,681 |
| 2003 | 675,000 | 43,200 | 79,530 | - | 79,530 | 38,066 | 835,796 |
| 2004 | 675,000 | 43,200 | 85,630 | 12,500 | 98,130 | 92,945 | 909,275 |
| 2005 | 675,000 | 48,440 | 84,930 | 15,000 | 99,930 | 104,760 | 928,130 |
| 2006 | 675,000 | 57,080 | 77,990 | 27,500 | 105,490 | 165,469 | 1,003,039 |
| 2007 | 675,000 | 58,650 | 77,990 | 30,000 | 107,990 | 181,052 | 1,022,692 |
| 2008 | 675,000 | 59,150 | 77,590 | 30,000 | 107,590 | 206,735 | 1,048,475 |
| 2009 | 675,000 | 68,750 | 76,490 | 40,000 | 116,490 | 221,619 | 1,081,859 |
| 2010 | 275,000 | 72,450 | 76,490 | 40,000 | 116,490 | 275,328 | 739,268 |

ප්‍රාග්ධනය යනු: ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගොවි බැංකු වෙත සපයන ලද මුදල

සංචිත යනු: ප්‍රාග්ධනය,කොටස් ප්‍රාග්ධනය,තැන්පතු වටිනාකම සහ සමුච්ඡිත අරමුදලේ වටිනාකම් වල එකතුව

පුද්ගල තැන්පතු හා කුඩා කණ්ඩායම් තැන්පතු වල එකතුව මුළු තැන්පතු වේ.

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

## 3.8.4 ණය නිකුත් කිරීම

ගොවි බැංකුව මඟින් ණය වර්ග කිහිපයක් ගොවීන්ට ලබාදීමට කටයුතු කර ඇති අතර වගා ණය ඉන් ප්‍රධාන වේ. ගොවි බැංකු චක්‍රලේඛ අනුව උපරිම රු. 25,000 දක්වා වගා ණය ගොවි බැංකුව හරහා ලබාදිය හැකි වුව ද, මෙම ප්‍රදේශයේ බොහෝ ගොවීන් තවමත්

පාරම්පරික ගොවිතැනේ යෙදී සිටින පිරිසක් බැවින් හා පවුලේ ශ්‍රමය වැඩිපුර භාවිතා කිරීමෙන් කරන වී වගාවේ දී වැය වන නිෂ්පාදන වියදම අඩු ය. එම නිසා, ඔවුන්ට ලබා දෙන්නේ රු. 5,000 – 10,000 අතර වූ ණයකි. පිටතින් ලබා ගන්නා පොහොර, කෘමිනාශක, බිත්තර වී (මෙය ද කලාතුරකින් ගනී) ආදිය සඳහා පමණක් ඔවුන්ට මුදල් වැය වන අතර මේ නිසා වී වගාවේ අක්කරයක් සඳහා වැය වන්නේ රු. 5,000ක් වැනි මුදලක් පමණි. ගොවි බැංකුව මගින් මෙම ප්‍රදේශයේ ගොවීන්ගේ ණය අවශ්‍යතා හා ගනු දෙනු කිරීමේ විශ්වාසය මත ණය ලබා දෙනු ලැබේ. දැනට වගා ණය උපරිම රු. 10,000ක් දක්වා ලබා දෙන අතර මෙහි දී වැඩි වශයෙන් ලබා දෙන්නේ ද්‍රව්‍ය වශයෙනි. මෙම ප්‍රදේශයේ ගොවි බැංකුව මගින් දෙසැම්බර් මස අවසානයේ ණය ඉල්ලුම් පත්‍ර නිකුත් කරන අතර කෘ.ප.නි.ස. වරුන් එම ඉල්ලුම් පත්‍ර ගොවීන්ට භාර දී ඔවුන් ලවා පුරවා ගැනීමෙන් පසු ගොවි බැංකුවට ගෙනැවිත් භාර දේ. ඉන් පසු, ණය පාලක කමිටුවේ අනුමැතිය අනුව ජනවාරි මාසයේ දී පමණ ණය නිකුත් කිරීම සිදු වේ. ගොවි බැංකුව ආරම්භක වර්ෂවල දී එනම් 2002 වසරේ දී ගොවීන් 103ක් ණය ලබා ගෙන ඇති අතර රු. 380,480ක් මුළු වගා ණය වශයෙන් නිකුත් කොට ඇත. නිකුත් කරන ණය ප්‍රමාණය උපරිම වී ඇත්තේ 2004 දී වන අතර ඉන් පසු වර්ෂවල දී ලබා දුන් මුළු ණය ප්‍රමාණයේ විචලනයක් දක්නට ලැබේ (වගු අංක 3.38). එසේ ම, ගොවි බැංකු ණය ලබා ගත් ගොවීන් සංඛ්‍යාව 2004 න් පසු පහළ බැස ඇති අතර 2010 වසරේ දී ගොවීන් 37ක් සඳහා රු. 304,420ක් ලබා දී ඇත. ආරම්භක වර්ෂයේ දී එනම් 2001 දී ගොවි බැංකු සාමාජිකයන්ගෙන් 64%ක් ගොවි බැංකුවෙන් ණය ලබා ගෙන ඇති අතර එම ප්‍රමාණය මුළු සංචිත වටිනාකමෙන් 67% කි. 2005-2008 කාල සීමාව තුළ නිකුත් කොට ඇති ණය ප්‍රමාණය සංචිත වටිනාකමට සාපේක්ෂව බැලීමේ දී විශාල අඩුවක් දක්නට ලැබේ. 2010 වන විට ණය ලබා ගෙන ඇත්තේ සාමාජිකයන්ගෙන් 18%ක් තරම් වන සුළු පිරිසකි. 2010 වර්ෂයේ දී ලබා දුන් ණය ප්‍රමාණය ගොවි බැංකුවේ සමස්ත සංචිත වටිනාකමින් 41%ක් වේ (වගු අංක 3.39). ගොවි බැංකුව පිහිටා ඇති ස්ථානයේ සිට එයට අයත් වසම් ඉතා දුරින් පිහිටීමත් (උදා: කි.මී. 10-12 පමණ) එම ප්‍රදේශවල සිට ගොවි බැංකුවට පැමිණීමට ප්‍රවාහන පහසුකම් නොමැතිවීමත්, වගා අස්වනුවල පවතින අවිනිශ්චිතතාවය මත ණය ලබා ගත හොත් ඒවා ගෙවීමට ක්‍රමයක් නොමැතිවීමත් ගොවීන් ණය ලබා ගැනීම අඩුවීමට සමස්ත වශයෙන් බලපා තිබේ. කෙසේ වූව ද, මුල් වර්ෂවල දී තරමක් දුරට සාර්ථක මට්ටමෙන් කරගෙන ගිය ගොවි බැංකු ණය ලබාදීමේ කටයුතු පසුව ක්‍රමයෙන් අඩාලවීමට ගොවිජන මධ්‍යස්ථානය සඳහා ස්ථිර වශයෙන් ම නිලධාරියකු නොමැතිවීම යන කරුණු බලපා තිබේ. එසේ ම, පොහොර සහනාධාර ක්‍රමය සමඟ ගොවීන් ණය ලබා ගැනීම තවදුරටත් සීමා වීම ද එයට හේතුවක් වී තිබේ. බොහෝ ගොවීන් තමන් සතු ගවයින් ආදිය යොදා ගෙන අත්තම් ක්‍රමයට ගොවිතැන් කටයුතු තමන්ට හැකි අයුරින් සිදු කරන අතර මූල්‍යමය වියදම් අඩුවීම නිසා ඔවුන්ට ණය ලබා ගැනීමේ අවශ්‍යතාවය ද අඩු බව දැක ගත හැකි විය.

**වගු අංක 3.38: ඉලුක්කුඹුර ගොවි බැංකුව මඟින් නිකුත් කල ණය වටිනාකම: 2001-2010**

| වර්ෂය | වගා ණය ප්‍රමාණය | | | ව්‍යාපෘති ණය (රු) | කෘෂි උපකරණ ණය (රු) | නිකුත් කළ මුළු ණය වටිනාකම (රු) | ණය ලබාගත් ගොවීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| | මහ (රු) | යල (රු) | එකතුව (රු) | | | | |
| 2001 | 253,478 | 249,885 | 503,362 | - | - | 503,362 | 136 |
| 2002 | 166,787 | 213,694 | 380,481 | - | - | 380,481 | 103 |
| 2003 | 226,500 | 89,408 | 315,908 | - | - | 315,908 | 75 |
| 2004 | 314,972 | 167,013 | 481,984 | - | - | 481,984 | 105 |
| 2005 | - | 71,498 | 71,498 | - | - | 71,498 | 10 |
| 2006 | 94,660 | 71,049 | 165,709 | - | - | 165,709 | 35 |
| 2007 | 60,546 | 20,774 | 81,320 | - | - | 81,320 | 23 |
| 2008 | 53,722 | - | 53,722 | - | - | 53,722 | 15 |
| 2009 | 195,771 | 21,910 | 217,681 | - | - | 217,681 | 42 |
| 2010 | 209,364 | - | 209,364 | 15,496 | 79,560 | 304,420 | 37 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

**වගු අංක 3.39: සංචිත වටිනාකමට සාපේක්ෂව ඉලුක්කුඹුර ගොවි බැංකුව මඟින් නිකුත් කළ ණය වටිනාකම: 2001-2010**

| වර්ෂය | නිකුත් කළ මුළු ණය වටිනාකම (රු) | සංචිත වටිනාකම (රු) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| 2001 | 503,362 | 746,396 | 67.44 |
| 2002 | 380,481 | 794,681 | 47.88 |
| 2003 | 315,908 | 835,796 | 37.80 |
| 2004 | 481,984 | 909,275 | 53.01 |
| 2005 | 71,498 | 928,130 | 7.70 |
| 2006 | 165,709 | 1,003,039 | 16.52 |
| 2007 | 81,320 | 1,022,692 | 7.95 |
| 2008 | 53,722 | 1,048,475 | 5.12 |
| 2009 | 217,681 | 1,081,859 | 20.12 |
| 2010 | 304,420 | 739,268 | 41.18 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

## 3.8.5 ණය අයවීම

ගොවි බැංකුව මඟින් ණය ලබා දෙන්නේ මහ කන්නය සඳහා පමණක් වන අතර ගොවීන් වී වගාව සඳහා ලබා ගන්නා ණය නැවත ගෙවන්නේ යල කන්නයේ එළවළු වගාවෙන් ලබා ගන්නා ආදායමෙනි. තවමත් වාණිජකරණයට ලක් නොවූ ඉතා සුහදශීලී හා පාරම්පරික

ගම්වැසියන් වන මෙම ප්‍රදේශයේ ගොවිහු තමන් ලබාගන්නා ණය ගෙවීම තම වගකීමක් කොට සලකති. ඒ අනුව, ණය අයවීම ඉතා හොඳ මට්ටමක පවතින අතර 2010 වර්ෂයේ හැර අන් වර්ෂවල එය 90% ඉක්මවා පවතී. 2010 වර්ෂය සඳහා ගොවීන් ලබා ගත් වගා ණය ගෙවීමේ ප්‍රතිශතය 58%ක් වන අතර ව්‍යාපෘති ණයවලින් 41%ක් ගෙවා ඇත (වගු අංක 3.40). ණය ලබාදීමේ දී කෘ.ප.නි.ස. වරුන් ගොවීන්ට ණය ගෙවීමට හැකියාවක් තිබේ ද යන්න පිළිබඳව වඩාත් විමසිලිමත් වන අතර නිරන්තරව ගොවීන් දැනුවත් කරමින් ඔවුන් ණය ගෙවීමට පෙළඹවීම ණය ගෙවීම ඉහළ මට්ටමක පවත්වාගෙන යාමට හේතු වී තිබේ.

**වගු අංක 3.40: ඉලුක්කුඹුර ගොවි බැංකුවේ ණය අයවීම: 2001-2010**

| වර්ෂය | ණය වර්ගය | | | | | | අය කර ගත් මුළු ණය වටිනාකම (රු) | වර්ෂයට අදාළව නිකුත් කළ මුළු ණය වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|---|---|---|---|---|
| | වගා ණය (රු) | ප්‍රතිශතය (%) | ව්‍යාපෘති ණය (රු) | ප්‍රතිශතය (%) | කෘෂි උපකරණ ණය (රු) | ප්‍රතිශතය (%) | | |
| 2001 | 498,812 | 99.10 | - | - | - | - | 498,812 | 99.10 |
| 2002 | 375,481 | 98.69 | - | - | - | - | 375,481 | 98.69 |
| 2003 | 315,908 | 100.00 | - | - | - | - | 315,908 | 100.00 |
| 2004 | 478,984 | 99.38 | - | - | - | - | 478,984 | 99.38 |
| 2005 | 68,372 | 95.63 | - | - | - | - | 68,372 | 95.63 |
| 2006 | 165,709 | 100.00 | - | - | - | - | 165,709 | 100.00 |
| 2007 | 81,320 | 100.00 | - | - | - | - | 81,320 | 100.00 |
| 2008 | 53,722 | 100.00 | - | - | - | - | 53,722 | 100.00 |
| 2009 | 199,759 | 91.77 | - | - | - | - | 199,759 | 91.77 |
| 2010 | 122,782 | 58.65 | 15,496 | 100.00 | 32,942 | 41.41 | 171,220 | 56.24 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

### 3.8.6 ද්‍රව්‍ය ණය ලබා දීම

මෙම ප්‍රදේශය අනුව බැලීමේ දී ද්‍රව්‍ය වශයෙන් ණය ලබාදීම වඩා සාර්ථක වී තිබේ. මෙම ප්‍රදේශයේ පවතින ප්‍රවාහන දුෂ්කරතා නිසා ගොවිජන සේවා කම්ටුවේ අලෙවි සැල හරහා පොහොර හා වෙනත් රසායන ද්‍රව්‍ය ලබාදීම ගොවීන්ට පහසුවක් වී ඇත. එසේ නොමැති නම් මෙම ගොවීන්ට තම ද්‍රව්‍යමය යෙදවුම් ලබාගැනීම සඳහා මාතලේට යාමට සිදු වූවහොත් ඒ සඳහා සම්පූර්ණ දවසක් ම ගත වේ. එසේ ම, එම ද්‍රව්‍ය තම වසම් වෙත ප්‍රවාහනය කිරීම සඳහා අධික පිරිවැයක් දැරීමට ද සිදු වේ. මුදලින් ණය ලබා දුනහොත් එම ණය වගාවට හැර වෙනත් කටයුතුවලට ද වැයවීමට ඉඩ ඇති නිසා ද්‍රව්‍ය ණය ලබාදීම සුදුසු බව ගොවිහු ද ප්‍රකාශ කළ හ. එසේ වුව ද, ගොවිජන සේවා කම්ටුව මඟින් ද්‍රව්‍ය මිල දී ගැනීමේ දී ඔවුන් කුඩා ප්‍රමාණයන්ගෙන් ද්‍රව්‍ය මිල දී ගන්නා නිසා කෘෂි රසායන වෙළෙඳුන්ගෙන් ලැබෙන්නේ අඩු වට්ටමකි. ගොවියාට මෙම ද්‍රව්‍ය නිකුත් කරන්නේ කම්ටුව විසින් 5% ක පමණ වට්ටමක් තබා ගැනීමෙන් පසුව ය. එවිට ගොවියාට ඉන් ලැබෙන්නේ අඩු ප්‍රතිලාභයකි. ගොවීන්ට අවශ්‍ය සෑම කෘමි නාශක/වල් නාශකයක් ම අවශ්‍ය අවස්ථාවල දී කම්ටුව තුළ නො තිබීම ද ගැටළුවකි. එම නිසා, ගොවීන්ට යම් යම් අසීරුතාවලට මුහුණපෑමට සිදු වුව ද, ප්‍රධාන ප්‍රවාහන පද්ධතිවලින් ඈත් ව හුදකලාව පවතින මෙවැනි ප්‍රදේශයක අලෙවි සැල් හරහා තමන්ට අවශ්‍ය කෘෂි රසායන ද්‍රව්‍ය ලබා ගැනීමට හැකිවීම පහසුවක් බව බොහෝ ගොවීන්ගේ අදහස විය.

### 3.8.7 කණ්ඩායම් ක්‍රමය

මෙවැනි හුදකලා වූ ප්‍රදේශයක ගොවීන් තම කුඹුරු වගා කටයුතුවල දී අන්‍යෝන්‍ය සහයෝගය මත වැඩ කටයුතු කරන නිසා කණ්ඩායම් ක්‍රමය එතරම් ගැටළු ඇති කරවන්නක් නොවූ බව අත්දැකිය හැකි විය. කණ්ඩායමේ එක් සාමාජිකයකු ණය නො ගෙවූ විට අනෙක් සාමාජිකයන් එම ණය ගෙවන ලෙස ඔහුට විටින් විට දැනුම් දෙයි. එම සාමාජිකයාට ණය ගෙවීම අසීරු වී ඇති අවස්ථාවක දී සෙසු සාමාජිකයින් එකතු වී ණය ගෙවීම සිදු කරන අවස්ථා ද වාර්තා විය. එම නිසා වඩාත් එකමුතු වගකීමකින් ක්‍රියා කිරීමට කණ්ඩායම් ක්‍රමය නිසා හැකියාව ලැබී තිබේ. එසේ වුව ද, තනි තනි පුද්ගලයින් වශයෙන් ණය ලබා ගැනීමට කැමති ගොවීන් ද සිටි අතර කණ්ඩායම් ක්‍රමය පැමිණීමට පෙර පැවති එම ක්‍රමය තුළ දී එනම් 2004 දක්වා දැනට වඩා ගොවීන් ප්‍රමාණයක් ගොවි බැංකුවෙන් ණය ගැනීමට පෙළඹී තිබුණි. වගු අංක 3 මගින් මෙය පැහැදිලි ව හඳුනා ගත හැකිය.

### 3.8.8 ණය සීමාවන්

මෙම ප්‍රදේශයේ ගොවීන් තවමත් යැපුම් මට්ටමේ වී වගාවක් කරන අතර වාණිජ වශයෙන් වගා කිරීමක් දැකිය නො හැකි ය. එක් ගොවියෙකුට වී වගා කිරීමට ඇති අක්කර ප්‍රමාණය අක්කර 2 1/2 ක් පමණ වේ. මෙම ප්‍රදේශයේ ගොවීන් ශ්‍රමය හුවමාරු කර ගැනීමෙන් සාමූහිකව වගා කටයුතුවල නිරත වන බැවින් ද, තමන් සතු හරකුන් වී වගාව සඳහා භාවිතා කරන බැවින් ද, වල් හා කෘමිනාශක කලාතුරකින් භාවිතා කරන බැවින් ද, තම වගාවේ වියදම අඩු කර ගැනීමට හැකියාව ලැබී තිබේ. එම නිසා, ඔවුන්ගේ මූල්‍යමය අවශ්‍යතාවයන් අඩු අතර වී වගාව සඳහා දැනට දෙන උපරිම ණය ප්‍රමාණය වන රු. 10,000ක මුදල ප්‍රමාණවත් බව ගොවීන් බහුතරයකගේ අදහස විය. එම ණය මුදල ඔවුන්ට වී වගාව සඳහා අවශ්‍ය පොහොර ඇතුළු කෘෂි රසායනික ද්‍රව්‍ය ගැනීම සඳහා ප්‍රමාණවත් වෙයි. වෙනත් බොහොමයක් ප්‍රදේශවල මෙන් වගාව සඳහා විශාල වශයෙන් මුදල් වියදම් කිරීම මේ ප්‍රදේශයේ මේ වනතුරුත් එතරම් ප්‍රචලිත වී නොමැත.

### 3.8.9 ගොවි බැංකුවෙ හි වර්තමාන ප්‍රගතිය/දුර්වලත්වය සඳහා බලපෑ සාධක

භෞතිකමය වශයෙන් ජීවිසීම සඳහා දැඩි දුෂ්කරතාවන් ඇති හුදකලා ප්‍රදේශයක පිහිටි, අඩු දියුණු තත්ත්වයේ පසුවන සුළු ජනගහනයකට සේවා සැපයීම සඳහා පිහිටුවා ඇති ඉලුක්කුඹුර ගොවි බැංකුව අනෙක් ගොවි බැංකු හා සසඳත්ම විශාල දියුණුවක් ලබා නැතත් ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රධාන වගාව වූ වී වගා ණය අවශ්‍යතා සපුරාලමින් දුප්පත් ගොවීන්ට සේවය කරන ආයතනයක් බවට පත්ව තිබේ. ආරම්භක අවස්ථාවේ දී ක්‍රියාත්මකවීම සඳහා ලබා දී ඇති ප්‍රාග්ධන අරමුදල් ද පොලී සමඟින් ආපසු ගෙවා ඇති නිසා එය එක්තරා මට්ටමක ස්ව ශක්තියෙන් පවත්වාගෙන යනු ලබන ආයතනයක් බව පැවසිය හැකි ය. ඒ සඳහා පහත සඳහන් කරුණු බලපා තිබේ.

- ගොවිජන බැංකු කළමනාකරණ සහකාර ඇතුළු අනෙකුත් කෘ.ප.නි.ස. වරුන් ණය ලබාදීම සඳහාත්, අය කර ගැනීම සඳහාත් ගොවීන් දැනුවත් කිරීම ආදියෙන් දරනු ලබන උත්සාහය හා කැපවීම මෙහි දී කැපී පෙනෙන කරුණක් බවට පත් ව ඇත.

- සාමාජික ගොවීන්ගේ පැත්තෙන් සාමූහික ජීවිතයක් ගත කරන ඔවුන් ණයකරුවන් වීමට ඇති අකමැත්ත නිසා කෙසේ හෝ ගෙවීමට කටයුතු කිරීම ගොවි බැංකුවේ පැවැත්ම සඳහා රුකුලක් වී තිබේ. මේ දක්වා ණය නො ගෙවා පැහැර හැරිය පිරිස ලෙස උසාවියට ඉදිරිපත් කර ඇත්තේ සුළු ගොවීන් ප්‍රමාණයකි (10 ක් පමණි).

### 3.8.10 සංවර්ධනයට බලපෑ තීතිමය හා වෙනත් ගැටලු

ප්‍රදේශයේ පවත්නා භෞතික දුෂ්කරතාවත් හා හුදකලා පිහිටීම නිසා පහසුවෙන් ප්‍රදේශයට පිවිසිය නො හැකි බව ගොවි බැංකුව ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාමේ දී විවිධ අයුරින් බාධාවන් වී තිබේ. ප්‍රාදේශීය නිලධාරීන් මෙන් ම කෘ.ප.නි.ස. වරුන් ඇතුළු අනෙකුත් නිලධාරීන් ප්‍රදේශය තුළ ස්ථිරවම රඳවා ගැනීමට නො හැකිකම, ගොවිජන බැංකුවේ මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් (මුදල් දැමීම හා ගැනීම) රාජ්‍ය බැංකුවක් හා දෛනිකව කටයුතු කිරීමේ දී ඇතිවන ප්‍රවාහන අපහසුතා, යෙදවුම් ප්‍රවාහනය කිරීමේ දී අධික වියදමක් දැරීමට සිදුවීම හා හුදකලාව පිහිටි ගම්වල සිටි සාමාජික ගොවීන්ට ගොවිජන බැංකුව වෙත ගනුදෙනු කිරීමට පැමිණීමේ දී මතුවන ගමනාගමන දුෂ්කරතා මෙහි දී සඳහන් කළ හැකි ය.

විශේෂයෙන් ම, ගොවිජන බැංකුව ඉතා දුෂ්කර හුදකලා ප්‍රදේශක පිහිටීම හේතුවෙන් මනා දක්ෂ ප්‍රාදේශීය නිලධාරීන් මෙන් ම කෘ.ප.නි.ස වරුන් ඇතුළු අනෙකුත් නිලධාරීන්ගේ අඛණ්ඩ සේවාවක් ලබා ගැනීමට නො හැකි වී ඇත. ගොවි බැංකුව ආරම්භ කළ අවධියේ පටන් මේ දක්වා ප්‍රාදේශීය නිලධාරීන් 9 දෙනෙකු පමණ සේවය කොට ඇති අතර ඉන් සමහරු රාජකාරී කර ඇත්තේ මාසය දෙක වැනි සුළු කාලයකි. බොහෝ විට, වැඩ බලන ප්‍රාදේශීය නිලධාරීන් යටතේ එය සැලකිය යුතු කාලයක් පාලනය වී තිබේ. ප්‍රදේශයේ කෘ.ප.නි.ස. වරුන් පවා අධ්‍යාපන හා සෞඛ්‍ය වැනි සේවා ලබා ගැනීම සඳහා මාතලේ නගරයෙ හි පදිංචිව සිට මෙහි සේවය සඳහා පැමිණෙන තත්ත්වයක් පවතී. ඒ හේතුවෙන් ගොවි බැංකුව දියුණු කිරීම සඳහා ඔවුන්ගේ පූර්ණකාලීන දායකත්වය ලබා ගැනීමට නො හැකි වී තිබේ.

ප්‍රදේශයේ පවත්නා කෘෂිකර්මය වාණිජමය ස්වරූපයකට වඩා යැපුම් මට්ටමක පැවතීම හා සම්ප්‍රදායික බව ද, ගොවි බැංකුව ශක්තිමත් කිරීමේ දී අයහපත් ලෙස බලපාන කරුණකි. බොහෝ විට, අත්තම් ශ්‍රමය මෙන් ම තමන්ගේ සතුන් භාවිතය, වඩාත් නවීන වී වර්ග භාවිතා නො කිරීම මෙන් ම ඒ හා සම්බන්ධ යෙදවුම් අවශ්‍ය නොවීම නිසා ලබා ගැනීමට අවශ්‍ය ණය ප්‍රමාණයත් අඩු ය. අඩු එලදාව හා අඩු නිෂ්පාදන ප්‍රමාණය නිසා ණය ගෙවීම සිදු කරන්නේ ද කුලී වැඩ හෝ වෙනත් කටයුත්තකින් උපයන ආදායමින් ඊළඟ (යල) කන්නයේ වගා කරන එළවළු බෝග වලිනි. ඔවුන්ගේ කෘෂිකර්මයේ පවත්නා යැපුම් ස්වභාවය, අඩු ආදායම මෙන් ම අඩු විවිධාංගීකරණය නිසා කෘෂිකාර්මික මෙන් ම යන්ත්‍ර සූත්‍ර හෝ ව්‍යාපෘති ණය සඳහා ඔවුන් පෙළඹවීම අපහසු ය. උදාහරණ ලෙස ව්‍යාපෘති ණය ලෙස මේ දක්වා ලබා දී ඇත්තේ එක් ගොවියෙකුට මිරිස් වගා කිරීම සඳහා රු. 15,000/- ක ණය ප්‍රමාණයකි.

ගොවිජන බැංකු ගිණුම් සැකසීම සම්බන්ධයෙන් බැංකු සහකාරට ප්‍රමාණවත් පුහුණුවක් ලැබී නොමැති බව පෙනේ. ඒ හේතුවෙන් ගිණුම් තැබීමේ දී යම් යම් ගැටලු දැක්වෙන බව ගොවිජන බැංකු සහකාරතුමිය ප්‍රකාශ කළේ ය.

### 3.8.11 යෝජනා

- ගොවීන්ගේ කෘෂි යෙදවුම් විශේෂයෙන් ම, කෘෂි රසායන මිල දී ගැනීමේ දී දිස්ත්‍රික්ක මට්ටමින් සියළු ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන වෙනුවෙන් එකවර ඇනවුම් කිරීමෙන් වඩාත් ඉහළ කොටස් ලබා ගැනීමට කටයුතු කිරීම සඳහා සහාය දීමෙන් ගොවීන්ට වැඩි වට්ටමක් ලබා දීම හා ඒ ඔස්සේ ගොවීන් ගොවිජන බැංකුවට සම්බන්ධ කර ගැනීමට කටයුතු කිරීම.

- හුදකලා ගම්වල සිටින සියළු ගොවීන් ගොවිජන බැංකුවට බඳවා ගැනීම සඳහා එහි ඇති ප්‍රයෝජන පිළිබඳ දැනුවත් කිරීමෙන් කටයුතු කිරීම ඉතා වැදගත් වේ. එවිට

ප්‍රවාහන දුෂ්කරතා ඇති මෙම ප්‍රදේශය තුළ ගොවීන්ට ගොවිජන බැංකුවේ සිට යෙදවුම් ප්‍රවාහනය කිරීමේ දී එකවර සිදු කිරීමෙන් යන වියදම ද අඩු කර ගත හැකි ය.

- ගොවිජන බැංකුවේ ගිණුම්කරණ කටයුතු පිළිබඳව එහි සහකාර කළමනාකරුට පුහුණුවක් ලබාදීමත්, කෘ.ප.නි.ස. වරුන් විසින් නව සාමාජිකයින් බඳවා ගැනීම, ඉතිරි කිරීම් සඳහා ගොවීන් උනන්දු කරවීම, ණය ලබාදීම හා අයකර ගැනීම යනා දී කාර්යයන් සඳහා පෙළඹවීම ඉතා වැදගත් වන අතර ලබන ආදායමෙන් යම් කිසි කොටසක් ඔවුන්ට දිරි දීමනා ගෙවීම ඒ සඳහා භාවිතා කිරීම හෝ ප්‍රවාහන දීමනාවක් ලබාදීම වැදගත් වන බව පෙනේ.

## 3.9 බොරලන්ද ගොවි බැංකුව

### 3.9.1. හැඳින්වීම

බදුල්ල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානයන් 30ක ගොවිජන බැංකු පිහිටුවා ඇති අතර ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමීක්ෂණයකට අනුව ඉන් ක්‍රියාකාරිත්වය අතින් වඩාත් ම ඉහළ මට්ටමක පවතින ගොවි බැංකු දෙක අතර බොරලන්ද ගොවි බැංකුව ද පවතී. අර්තාපල්, බෝංචි, ලීක්ස්, බීට්, කැරට් වැනි අධික ඉල්ලුමක් සහිත වාණිජමය වටිනාකමක් ඇති උඩරට එළවළු වගාවන්ට අවශ්‍ය වගා ණය අවශ්‍යතා සපුරාලීම සඳහා මෙන් ම උපකරණ ආදිය මිලට ගැනීම සඳහා මෙම ගොවි බැංකුව මඟින් ණය සපයා දෙනු ලබයි. කුදු බැවුම් හා කුඹුරු වල ස්වාභාවික ජල සම්පත් ආශ්‍රයෙන් මෙන් ම ජල සම්පාදනයෙන් වගා කටයුතු කරනු ලබන ගොවීන් සඳහා මෙමඟින් ණය සේවා සපයා දෙනු ලැබේ. මෙම ගොවි බැංකුව පිහිටුවනු ලැබ ඇත්තේ ගොවි බැංකු නියමු ව්‍යාපෘතිය ආරම්භ කළ මුල් අවධියේ එනම් 1998 වසරේදී ම ය. 2010 වසර වනවිට මුළු ගොවි පවුල් 5,083ක් බොරලන්ද ප්‍රදේශය තුළ ජීවත් වෙති.

### 3.9.2 සාමාජිකත්ව වර්ධනය

1998 වර්ෂය තුළ බොරලන්ද ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානය ආශ්‍රිතව ආරම්භ කරන ලද මෙම ගොවි බැංකුව සමඟ සම්බන්ධ වූ ආරම්භක සාමාජික සංඛ්‍යාව 66ක් වූ අතර එය ප්‍රදේශයේ මුළු පවුල් සංඛ්‍යාවෙන් 1%ක් තරම් වූ සුළු ප්‍රතිශතයක් විය. ගොවි බැංකුව සමඟ සම්බන්ධ වූ සාමාජික සංඛ්‍යාව 2002 වසරේ දී කලින් වසරට සාපේක්ෂව සැලකිය යුතු වර්ධනයක් (88%ක් පමණ) පෙන්නුම් කොට තිබේ. මෙම සාමාජික සංඛ්‍යාව 2009 වන විට ක්‍රමිකව වර්ධනය වූ අතර ඒ වන විට සාමාජිකයන් 1,206ක් එනම් මුළු ගොවි පවුල් සංඛ්‍යාවෙන් 23%ක් මේ සමඟ සම්බන්ධ වී සිටිය හ (වගු අංක 3.41). කෙසේ වුව ද, 2010 වර්ෂයේ දී ගොවි බැංකුවේ සාමාජිකත්වය ලැබූ සංඛ්‍යාව 2009 වර්ෂයට සාපේක්ෂව 11%ක් පමණ පහළ යෑමක් දක්නට ලැබෙන අතර මෙයට හේතු විය හැක්කේ 2002/2003 වර්ෂවල කොටස් වටිනාකම් ණයට හිලවු කිරීම හෝ ඇතැම් කොටස් ගොවීන්ගේ ඉල්ලීම පරිදි නැවත ආපසු ගෙවා තිබීමයි. එසේ වුව ද, එම වර්ෂවල ඒවා නිවැරදි කොට නොමැති අතර සටහන් කිරීමේ දෝෂ පැවති බව වාර්තා විය. මෙම සටහන් නිවැරදි කිරීම හේතුවෙන් 2010 කොටස් හිමියන් සංඛ්‍යාව අඩුවෙන් සඳහන් විය හැකි ය.




පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

වගු අංක 3.41: බොරලන්ද ගොවි බැංකුවේ සාමාජිකත්ව වර්ධනය: 2003-2010

| වර්ෂය | සාමාජිකයන් / කොටස් හිමියන් ගණන | කොටස් වල වටිනාකම (රු) | ප්‍රදේශයේ පවුල් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|
| 2003 | 865 | 176,700 | 17.02 |
| 2004 | 929 | 264,390 | 18.28 |
| 2005 | 981 | 342,531 | 19.30 |
| 2006 | 1,044 | 403,731 | 20.54 |
| 2007 | 1,057 | 434,531 | 20.79 |
| 2008 | 1,204 | 470,400 | 23.69 |
| 2009 | 1,206 | 910,750 | 23.73 |
| 2010 | 1,078 | 946,450 | 21.21 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

රූප සටහන් අංක 3.1: ගොවි බැංකුවේ සාමාජිකත්වය වර්ධනය




මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත වාර්තා හෙ.කො.ගො.ප.පු. ආයතනය 2011

### 3.9.3 ගොවි බැංකුවේ ඉතුරුම් කොටස් ප්‍රාග්ධනය හා ලාභාංශ වර්ධනය

මෙම ගොවි බැංකුව සඳහා රු. මිලියන 2ක් ප්‍රාග්ධනය වශයෙන් ආරම්භයේ දී රජය මඟින් ලබා දී ඇති අතර එයින් රුපියල් මිලියනයක් 2010 වර්ෂයේ දී නැවත ආපසු ගොවිජන කොමසාරිස් වෙත ලබා දීමට සමත් වී තිබීම මෙම බැංකුවේ අරමුදල් ශක්තිමත් බව සඳහා උදාහරණයක් ලෙස පෙන්වාදිය හැකි ය. එසේ ම, කණ්ඩායම් හා පුද්ගල තැන්පතු ගිණුම්වල වටිනාකම මේ වන විට රුපියල් මිලියන 8.3ක් ව පවතී (වගු අංක 3.42). එය 2003 වර්ෂයට සාපේක්ෂව 93%ක වර්ධනයකි. මුළු තැන්පතු වටිනාකම 2003 සිට 2007 දක්වා වර්ධනය වී ඇති නමුත් ඉන් පසුව වර්ෂ 2ක තුළ දී අඩුවීමක් දක්නට ලැබෙන අතර 2009 තුළ දී පෙර වර්ෂයට සාපේක්ෂව 37%කින් අඩුවීමක් දක්නට ලැබේ. ගොවීන් විසින්

සිය තැන්පත් මුදල් ආපසු ලබා ගැනීමට විශාල වශයෙන් පෙළඹී ඇති බව මේ අනුව පැහැදිලි වේ.

එසේ ම, ගොවීන් විසින් මිල දී ගන්නා ලද කොටස් එකතුවීමෙන් සෑදුණු කොටස් ප්‍රාග්ධනය 2003 සිට 2010 දක්වා වාර්ෂිකව 62%කින් වර්ධනය වී ඇත. කොටස් ප්‍රාග්ධනයේ ඉහළම වර්ධනයක් වාර්තා වී ඇත්තේ 2009 වර්ෂය තුළ දී ය. මෙය පෙර වර්ෂයට සාපේක්ෂව 94%ක වර්ධනයකි.

තව ද, ගොවි බැංකුව සතු ලාභ එකතුවීමෙන් වර්ධනය වී ඇති සමුච්ජිත අරමුදල 2003 වසරේ දී රු.109,862ක් වූ අතර 2010 වසර වන විට එය 2003 වසරට සාපේක්ෂව 273%කින් වර්ධනය වෙමින් මුළු අරමුදල් ගිණුම රු.2,210,556ක් දක්වා පුළුල් වීමක් දක්නට ලැබීම ගොවි බැංකුවේ ණය ලබාදීමට ඇති ඉහළ විභවය පෙන්නුම් කරයි. මේ අනුව, ගොවි බැංකුවේ ඉතුරුම්, මූලික ප්‍රාග්ධනය, කොටස් ප්‍රාග්ධනය හා ලාභාංශවලින් සමන්විත වූ සම්පූර්ණ සංචිත වටිනාකම 2001 වන විට රු. මිලියන 3.4ක් වූ අතර 2010 වන විට එය රු. මිලියන 4.99ක් ව පැවතුනි. රුපියල් මිලියනයක මූලික ප්‍රාග්ධනය ආපසු ගොවිජන සේවා දෙපාර්තමේන්තුව වෙත යවා තිබීම මෙසේ සමස්ත සංචිත වටිනාකම ඉහළ අගයකින් නො පෙන්වීම කෙරෙහි බලපා තිබුණි. මෙම සංචිත අරමුදල ගොවීන්ට ණය දීම සඳහා යොදා ගනු ලැබේ. 2003 වසරට සාපේක්ෂව 2010 වන විට මුළු සංචිත 46%කින් වර්ධනය වී තිබේ (වගු අංක 3.42).

**වගු අංක 3.42: බොරලන්ද ගොවි බැංකුවේ අරමුදල් වර්ධනය: 2003-2010**

| වර්ෂය | ප්‍රාග්ධනය (රු) | කොටස් ප්‍රාග්ධනය (රු) | මුළු තැන්පතු වටිනාකම (රු) | සමුච්ජිත අරමුදල (රු) | සංචිත වටිනාකම (රු) |
|---|---|---|---|---|---|
| 2003 | 2,000,000 | 176,700 | 1,115,086 | 109,862 | 3,401,648 |
| 2004 | 2,000,000 | 264,390 | 1,119,292 | 330,224 | 3,713,905 |
| 2005 | 2,000,000 | 342,531 | 1,137,310 | 610,914 | 4,090,755 |
| 2006 | 2,000,000 | 403,731 | 1,173,408 | 924,562 | 4,501,701 |
| 2007 | 2,000,000 | 434,531 | 1,191,131 | 1,346,732 | 4,972,394 |
| 2008 | 2,000,000 | 470,400 | 1,175,833 | 1,638,014 | 5,284,246 |
| 2009 | 2,000,000 | 910,750 | 734,014 | 1,971,100 | 5,615,864 |
| 2010 | 1,000,000 | 946,450 | 835,298 | 2,210,556 | 4,992,304 |

ප්‍රාග්ධනය යනු: ගොවිජන සංවර්ධන දෙපාර්තුමේන්තුව විසින් ගොවි බැංකුවෙත සපයන ලද මුදල
සංචිත යනු: ප්‍රාග්ධනය,කොටස් ප්‍රාග්ධනය,තැන්පතු වටිනාකම සහ සමුච්චිත අරමුදලේ වටිනාකම් වල එකතුව
මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.1ගො.ප.පු. ආයතනය

## 3.9.4 ණය නිකුත් කිරීම

බොරලන්ද ප්‍රදේශය තුළ ආර්ථිකමය අතින් තරමක් ඉහළ මට්ටමක ජීවත් වන ගොවීන් සිටින අතර අර්තාපල්, ගෝවා, බෝංචි ආදී ඉහළ ආර්ථික වටිනාකමක් සහිත බෝග ඔවුන්ගේ ප්‍රධාන වගාවන් වේ. එමනිසා, මෙම ගොවීන්ගේ ණය අවශ්‍යතාවය ඉතා ඉහළ මට්ටමක් වන අතර ගොවි බැංකුව පිහිටුවා ඇති ප්‍රදේශය ආශ්‍රිතව විවිධ කෘෂි රසායන ද්‍රව්‍ය අලෙවි කරන පෞද්ගලික වෙළෙඳුන් මෙන් ම මහජන බැංකුව, ලංකා බැංකුව වැනි විවිධ රාජ්‍ය බැංකු, සමෘද්ධි බැංකුව, ඌව සංවර්ධන බැංකුව ආදී ණය සැපයුම් මාර්ග රාශියක් පවතී. එම නිසා, ගොවිජන බැංකුව මගින් ලබා දෙන උපරිම ණය මුදල වන රු.25,000ක

මුදල මෙම ප්‍රදේශයේ ගොවීන්ගේ වගා ණය අවශ්‍යතාවය සමඟ සැසඳීමේ දී කිසිසේත් ප්‍රමාණවත් නොවන බව ගොවීන්ගේ මෙන් ම නිලධාරීන්ගේ ද අදහස විය. ගොවි බැංකුව මඟින් 10%ක් මුදල්වලින් හා 90%ක් ද්‍රව්‍යවලින් ද කෘෂි උපකරණ, බීජ, පොහොර, කෘමි නාශක ලෙස ලබා දෙන අතර එම ද්‍රව්‍ය සඳහා ගොවීන්ට ලැබෙන වට්ටම බාහිර වෙළෙඳසැල්වලින් ලබා දෙන වට්ටමට වඩා අඩු ය. මෙහි දී වගා ණය මෙන් ම කෘෂි උපකරණ ණය යටතේ ට්‍රැක්ටර්, ස්ප්‍රේ යන්ත්‍ර, වතුර මෝටර් යනාදිය ද ලබා දී ඇත. මෙහි දී 10%ක කොටස් මිල දී ගෙන තිබිය යුතු අතර රු. ලක්ෂයක ණයක් සඳහා රු. 10,000ක කොටස් මිල දී ගෙන තිබිය යුතු වීම ගොවීන්ට අපහසු කටයුත්තකි. මේ නිසා, ගොවීන් බොහොමයක් ගොවි බැංකුවෙන් ණය ලබා නො ගැනීමට මෙය හේතු වී ඇත. එසේ වුව ද, මෙම ගොවි බැංකුව මඟින් රු. 10,000ම කොටස්වලට නොදී 8,000 ඉතිරි කිරීම් හා 2000 කොටස් ලෙස තැබීමට කමිටුවෙන් තීරණය කොට තිබේ. ගොවි බැංකුව මඟින් ණය ලබාගත් සාමාජික සංඛ්‍යාව 2004 වර්ෂයේ දී මුළු සාමාජික සංඛ්‍යාවෙන් 88%ක් (වගු අංක 3.43) තරම් ඉහළ අගයක පැවතුන අතර මෙය සාපේක්ෂව ඉහළ ප්‍රගතියක් විය.

**වගු අංක 3.43: බොරලන්ද ගොවි බැංකුව මඟින් නිකුත් කළ ණය වටිනාකම: 2004-2010**

| වර්ෂය | ණය ලබාගත් සාමාජිකයින් සංඛ්‍යාව | මුළු කොටස් හිමියන් සංඛ්‍යාව | ණය ලබාගත් සංඛ්‍යාව කොටස් හිමියන්ගේ ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|
| 2004 | 816 | 929 | 88 |
| 2005 | 637 | 981 | 65 |
| 2006 | 529 | 1,044 | 51 |
| 2007 | 396 | 1,057 | 37 |
| 2008 | 193 | 1,204 | 16 |
| 2009 | 141 | 1,206 | 12 |
| 2010 | 51 | 1,078 | 5 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

2004 වර්ෂයේ දී නිකුත් කරන ලද මුළු ණය මුදල රු. මිලියන 5.4ක් වූ අතර ඉන් වැඩි ප්‍රමාණයක් එනම් මිලියන 3ක් මහ කන්නය තුළ ගොවීන් විසින් ලබා ගෙන තිබුණි (වගු අංක 3.44). මෙහි දී, මුළු වගා ණය රු.මිලියන 5.1 සහ ව්‍යාපෘති ණය රු.285,796ක් නිකුත් කොට තිබේ. මුළු සංචිත වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස මෙම සමස්ත ණය ප්‍රමාණය 166%ක් (වගු අංක 3.45) වූ අතර මෙම වර්ෂය වන විට රු.මිලියන 2ක් වූ ප්‍රාග්ධන ගිණුම ද ණය මුදල් ගෙවීම සඳහා යොදා ගත හැකිව තිබුණි. 2007 සිට 2010 දක්වා කාලය තුළ නිකුත් කර ඇති ණය මුදල සංචිත වටිනාකමට සාපේක්ෂව ඉතා සුළු ප්‍රතිශතයක් වේ. මේ අනුව, 2010 වන විට නිකුත් කොට ඇති මුළු ණය මුදල සංචිත වටිනාකමින් 24%ක් වන අතර වගා ණය හා ගොවි සංවිධාන ණය මේ යටතේ නිකුත් කොට ඇත. කෙසේ වුව ද, 2010 වසර වන විට ගොවි බැංකුවේ මුළු ණය නිකුත් කිරීම රු.මිලියන 1.19ක් වූ අතර මෙම ණය ලබා ගත් ගොවීන් සංඛ්‍යාව ගොවි බැංකුවේ 5%ක් තරම් වූ සුළු ප්‍රතිශතයකි. 2004 වසරෙන් පසුව ගොවි බැංකුවෙන් ණය ලබාගත් සාමාජික සංඛ්‍යාවේ විශාල පසුබෑමක් දක්නට ලැබේ. ගොවි බැංකුවෙන් ලද තොරතුරු අනුව, රජයෙන් ලබාදෙන පොහොර සහනාධාරය ද මෙයට විශාල වශයෙන් බලපා තිබේ. එසේ ම, අර්තාපල් වැනි ආර්ථිකමය අතින් ඉහළ බෝගයක් වගා කිරීමේ දී අක්කරයකට රු. ලක්ෂ 2-3ත් අතර


විශාල පිරිවැයක් යෙදවීමට සිදු වීම ද මේ සඳහා හේතු වී තිබේ. මෙහි දී, උපරිම රු. 25,000 වැනි මුදලක් ගොවි බැංකුවෙන් ලබාදෙන අතර එය අර්තාපල් ගොවියාගේ වගා ණය අවශ්‍යතාවයෙන් 10%කටත් අඩු ප්‍රමාණයක් වන බැවින් මෙවැනි ප්‍රදේශවල ගොවීන්ට ගොවි බැංකුවෙන් ලබා ගන්නා ණය කිසිසේත් ම ප්‍රමාණවත් නොවේ. එමනිසා, එවැනි ගොවීන් ගොවි බැංකුවෙන් බැහැරව වෙනත් බැංකු වලින් ණය ලබාගැනීම හා රත්‍රන් බඩු උකස් කිරීම, කෘෂි රසායන ද්‍රව්‍ය ආදිය ණයට සපයන වෙළෙඳුන් කෙරේ යොමුවීමක් දක්නට ලැබේ. මෙහි දී, ගොවි බැංකුව මඟින් වාර්ෂිකව 9%ක් වැනි සාපේක්ෂව අඩු පොලියක් අය කර ගොවීන්ගේ ණය අවශ්‍යතාවයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් සැපයීමට කටයුතු නො කරන නිසා ඔවුහු අධික පොලියකට වුව ද වෙනත් බැංකුවලින් හා ආයතනවලින් ණය ගැනීමට මැලිකමක් නො දක්වති.

**වගු අංක 3.44: බොරලන්ද ගොවි බැංකුව මඟින් නිකුත් කළ ණය පිළිබඳ සාරාංශය**

| වර්ෂය | යල කන්නයේ නිකුත් කළ වගා ණය ප්‍රමාණය | මහ කන්නයේ නිකුත් කළ වගා ණය ප්‍රමාණය | මුළු වගා ණය ප්‍රමාණය | ව්‍යාපෘති ණය | ක්ෂණික හා වෙනත් ණය | මුළු ණය නිකුත් කිරීම් |
|---|---|---|---|---|---|---|
| 2003 | 2,039,992 | 3,077,569 | 5,117,561 | 285,796 | | 5,403,357 |
| 2004 | 2,062,968 | 3,430,109 | 5,493,077 | 623,388 | 45,000 | 6,161,465 |
| 2005 | 2,429,381 | 2,310,960 | 4,740,341 | 665,833 | 45,000 | 5,451,174 |
| 2006 | 1,729,671 | 2,898,337 | 4,628,008 | 665,833 | 45,000 | 5,338,841 |
| 2007 | 1,140,132 | 2,325,784 | 3,465,916 | 665,833 | 45,000 | 4,176,749 |
| 2008 | 1,066,653 | 674,025 | 1,740,678 | 665,833 | 45,000 | 2,451,511 |
| 2009 | 624,575 | 426,010 | 1,050,585 | 680,833 | 360,000 | 2,091,418 |
| 2010 | 518,800 | 177,920 | 696,720 | | 500,000 | 1,196,720 |

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත වාර්තා හෙ.කො.ගො.ප.පු. ආයතනය 2011

**රූප සටහන් අංක 3.2: ගොවි බැංකුව මඟින් එක් එක් වර්ෂවල නිකුත් කළ මුළු ණය ප්‍රමාණය**




මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

**වගු අංක 3.45: බොරලන්ද ගොවි බැංකුව විසින් නිකුත්කළ ණය ප්‍රමාණය සංචිතවල ප්‍රතිශතයක් ලෙස**

| වර්ෂය | නිකුත් කළ මුළු ණය වටිනාකම (රු) | සංචිත වටිනාකම (රු) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| 2003 | 5,403,357 | 3,401,648 | 158.85 |
| 2004 | 6,161,465 | 3,713,905 | 165.90 |
| 2005 | 5,451,174 | 4,090,755 | 133.26 |
| 2006 | 5,338,841 | 4,501,701 | 118.60 |
| 2007 | 4,176,749 | 4,972,394 | 84.00 |
| 2008 | 2,451,511 | 5,284,246 | 46.39 |
| 2009 | 2,091,418 | 5,615,864 | 37.24 |
| 2010 | 1,196,720 | 4,992,304 | 23.97 |

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත වාර්තා හෙ.කො.ගො.ප.පු. ආයතනය 2011

### 3.9.5 ණය අයවීම

2004 වර්ෂයේ දී ගොවි බැංකුව මගින් ණය ලබාගත් ගොවීන් 816 දෙනාගෙන් 781 දෙනෙකු එම වර්ෂය තුළ දී ලබාගත් ණය පියවා ඇති අතර රු.99,766ක් තව දුරටත් හිඟ ණය වශයෙන් පවතී. මේ වන විට ණය නො ගෙවා ඇති ගොවීන්ට උසාවිවල නඩු පැවරීමට ගොවි බැංකුව ක්‍රියා කොට තිබේ (මේ වන විට උසාවි දමා ඇති නඩු ගණන 74කි). ණය ආපසු අයකර ගැනීම ක්‍රමිකව අඩුවීමක් දක්නට ලැබෙන අතර 2010 වර්ෂය තුළ දී සමස්ත ණය අයවීම 43% දක්වා පහළ බැස ඇති අතර (වගු අංක 3.46) එය ගොවි බැංකුවේ ඉදිරි ප්‍රගමනය සඳහා විශාල බාධකයක් ව පවතී. ණය නො ගෙවීම සඳහා විවිධ හේතු බලපා තිබෙන අතර ගොවීන්ගේ අස්වනු හානි වීම නිසා ලබාගත් ආදායම ප්‍රමාණවත් නොවීම, ගොවීන් විසින් ඒ පිළිබඳව නො සලකා හැරීම ද බලපා ඇත. 2003-2005 වර්ෂවල දී 99%කටත් වඩා ඉහළ වගා ණය ගෙවීමේ ප්‍රතිශතයක් දක්නට ලැබුණ ද, ඉන් පසු වගා ණය ගෙවීමේ ප්‍රගතිය අඩු වී තිබේ. කෙසේ වූව ද, ව්‍යාපෘති ණය හා ක්ෂණික ණය අයවීම වගා ණය අයවීමට වඩා සාර්ථක බව පෙන්නුම් කෙරේ.

**වගු අංක 3.46: බොරලන්ද ගොවි බැංකුව විසින් නිකුත් කළ ණය අයවීම: 2003-2010**

| වර්ෂය | ණය වර්ගය | | | | | | | | අය කොට ගත් මුළු ණය වටිනාකම (රු) | වර්ෂයට අදාළව නිකුත් කළ මුළු ණයවටිනාකමේ ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වගා ණය (රු) | ප්‍රතිශතය (%) | ව්‍යාපෘති ණය (රු) | ප්‍රතිශතය (%) | ක්ෂණික ණය (රු) | ප්‍රතිශතය (%) | ගොවි සංවිධාන ණය (රු) | ප්‍රතිශ-තය (%) | | |
| 2003 | 5,112,562 | 99.90 | 191,030 | 66.84 | - | - | - | - | 5,303,592 | 98.15 |
| 2004 | 5,474,198 | 99.66 | 285,796 | 45.85 | 1,750 | 3.89 | - | - | 5,761,744 | 93.51 |
| 2005 | 4,608,826 | 97.23 | 402,259 | 60.41 | 6,695 | 14.88 | - | - | 5,017,780 | 92.05 |
| 2006 | 4,079,888 | 88.16 | 489,685 | 73.54 | 35,300 | 78.44 | - | - | 4,604,873 | 86.25 |
| 2007 | 2,581,015 | 74.47 | 497,129 | 74.66 | 40,300 | 89.56 | - | - | 3,118,444 | 74.66 |
| 2008 | 986,226 | 56.66 | 587,101 | 88.18 | 45,000 | 100.00 | - | - | 1,618,327 | 66.01 |
| 2009 | 659,374 | 62.76 | 598,681 | 87.93 | 45,000 | 100.00 | 150,000 | 50.00 | 1,453,055 | 69.48 |
| 2010 | 264,988 | 38.03 | - | - | - | - | 250,000 | 50.00 | 514,988 | 43.03 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතන

### 3.9.6 ද්‍රව්‍ය ණය ලබාදීම

චක්‍රලේඛ උපදෙස් අනුව 10% මුදලින් හා 90% ද්‍රව්‍යවලින් ණය ලබාදීම මෙම ගොවි බැංකුව මඟින් සිදු කරනු ලැබේ. මෙහි දී, පොහොර, කෘෂි රසායන ද්‍රව්‍ය, කෘමිනාශක, බීජ හා කෘෂි උපකරණ යනාදිය ද්‍රව්‍ය ණය වශයෙන් ලබාදෙනු ලැබේ. දැනට අලෙවි සැල ක්‍රියාත්මකවීම දුර්වල තත්ත්වයක පවතින අතර කලින් සී.අයි.සී. කොමර්ෂල් පොහොර වැනි සමාගම් මඟින් ද්‍රව්‍ය ගෙන්වා ඇති අතර පසුව එම ක්‍රමය නතර වී තිබේ. එසේ ම, ගොවීන්ට ලබා දෙන ද්‍රව්‍යවල මිල බාහිර වෙළෙඳසැල්වල මිලට වඩා අධික බවත්, තව ද, අවශ්‍ය ද්‍රව්‍ය අවශ්‍ය වේලාවට ලබා ගැනීමට නො හැකි බවත් ගොවීහු පවසති. මේ හේතුව නිසා මුල දී ගොවි බැංකුව සමඟ ගනුදෙනු කළ ගොවීන් බොහොමයක් පසුව ගොවි බැංකුවෙන් ඈත් වී ඇති බව හෙළිදරවු විය. වැඩි වශයෙන් අර්තාපල්, බෝංචි වැනි එළවළු සඳහා යල කන්නයේ දීත් වී වගාව සඳහා මහ කන්නයේ දීත් ද්‍රව්‍ය ණය ලබා ගෙන ඇත.

### 3.9.7 කණ්ඩායම් ක්‍රමය

පස් දෙනාගේ කණ්ඩායම් ක්‍රමය මෙම ප්‍රදේශයේ ද ක්‍රියාත්මක වන අතර සමීක්ෂණයට භාජනය වූ ගොවීන්ගෙන් වැඩි පිරිසක් කණ්ඩායම් ක්‍රමය මඟින් ණය ලබා ගැනීමට අකමැත්ත ප්‍රකාශ කොට ඇත. කණ්ඩායම් ක්‍රමයේ ඇති වාසිවලට වඩා එමඟින් ස්වාධීන ව නැඟී සිටීමට උත්සාහ දරන ගොවීන්ට අපහසුතාවලට ලක්වීමට සිදුවීම මෙයට හේතුවයි. කණ්ඩායමේ කලින් ණය ලබාගත් ගොවීන් නිසි වේලාවට ණය නො ගෙවීම නිසා නියමිත වේලාවට ණය ගෙවූ ගොවීන්ටත් ඉදිරි කන්නවල දී ණය ලබාගත නො හැකි වීම, කණ්ඩායමේ අනෙක් සාමාජිකයන් රැස්කර ගැනීම අපහසුවීම ආදී දුර්වලතා කණ්ඩායම් ක්‍රමය ගොවීන් අතර ජනප්‍රිය නොවීමට හේතු වී තිබේ. එසේ ම, කරුණු මඟින් පැහැදිළි වූයේ කණ්ඩායම් ක්‍රමය පැමිණීමට පෙර තනි පුද්ගලයින් ලෙස ණය ලබා දීමේ දී වැඩි ගොවීන් පිරිසක් ගොවි බැංකු ණය ලබාගත් බවයි. එසේ ම, ණය ගෙවීම ද සාර්ථකව සිදු වී ඇත. කණ්ඩායම් ක්‍රමය තුළ ගොවීන්ට ඇති වාසියක් ලෙස ඔවුන් සඳහන් කලේ කණ්ඩායමේ සාමාජිකයන්ට ණය සඳහා ඇපවීම නිසා වෙනත් බැංකුවල මෙන් ණය ගැනීමට යාමේ දී කරදර නොවීමයි. කෙසේ වූව ද, මෙම බැංකුව පිහිටා ඇති ප්‍රදේශය තුළ වෙනත් රාජ්‍ය මෙන් ම රාජ්‍ය නොවන බැංකු රාශියක් ද පිහිටා ඇති නිසා වර්තමානයේ කණ්ඩායම් ක්‍රමය උපයෝගී කොටගෙන ගොවි බැංකු ණය ලබා ගැනීමට ගොවීන් ඉදිරිපත් වීම අඩු බව පැහැදිළි වේ.

### 3.9.8 ණය සීමාවන්

ගොවි බැංකුව හරහා උපරිම වශයෙන් වගා ණය වශයෙන් ලබා දෙන්නේ රු. 25,000/-ක් පමණ ණය මුදලක් වන අතර මෙම ප්‍රදේශයේ ගොවීන් වගා කරන බෝග වර්ග හා ඔවුන්ගේ ණය අවශ්‍යතා සමඟ සැසඳීමේ දී එම ණය මුදල කිසිසේත් ප්‍රමාණවත් නොවේ. මෙම ප්‍රදේශයේ අර්තාපල්, බෝංචි මාළු මිරිස් ආදී වාණිජමය බෝග වගා කරන අතර එම බෝගවල වියදම ද අධික ය. උදාහරණයක් ලෙස අර්තාපල් අක්කරයක් සඳහා රු. ලක්ෂ 2 1/2 - 3 අතර මුදලක් වැය වන විට අවම අක්කරයක් වගා කරන ගොවියෙකුටවත් ගොවි බැංකුව හරහා ලැබෙන ණය මුදල ප්‍රමාණවත් නොවේ. එසේ ගොවි බැංකුව හරහා ණය ගතහොත් ඔහුට තවත් බැංකුවකින් ණය ලබා නො ගෙන තම ණය අවශ්‍යතාවය සපුරා ගත නො හැකි වේ. මේ නිසා, බැංකු දෙක තුනක් වෙත යාමට සිදුවීම නිසා ගොවීන් ගොවි බැංකුවට ණය ලබා නො ගනී. එසේ ම, ගොවි බැංකුව හරහා ලබා දෙන කෘෂි රසායන ද්‍රව්‍ය සඳහා බාහිර වෙළෙඳුන් ලබා දෙන තරම් වට්ටම් ලබා නොදීම ද ගොවීන් ඉත් ඈත්වීමට හේතු වී ඇත.

### 3.9.9 ඉහළ ප්‍රගතිය සඳහා බලපෑ සාධක

2003-2006 අතර කාලයේ දී විශාල ගොවීන් පිරිසක් ගොවි බැංකුව සමඟ සම්බන්ධ වී සිටි අතර ඔවුන්ට ඉහළ මට්ටමේ මූල්‍ය සේවාවන් සැපයීමෙන් ඉහළ ප්‍රගතියක් පෙන්වා තිබේ. ගොවීන් බඳවා ගැනීම, ණය සැපයීම, ණය ආපසු අයකර ගැනීම යනාදිය හොඳින් සිදු වී ඇති අතර ගොවීන්ට අවශ්‍ය යෙදවුම් හා උපකරණ ගොවිජන සේවා අලෙවි මධ්‍යස්ථානයේ ප්‍රමාණවත් තරම් පැවතී ඇත. විශේෂයෙන් ම, බීජ හා අනෙකුත් යෙදවුම් අලෙවි කරනු ලබන සමාගම් සමඟ ශක්තිමත් සබඳතා ගොඩනැඟී පැවතී ඇති අතර ඒ හේතුවෙන් ඉහළ වට්ටම් සහිතව ඒවා ගොවීන්ට ලබා දීමට හැකියාව ලැබී තිබේ.

ඉහත සාර්ථකත්වය සඳහා සැලකිය යුතු දායකත්වයක් සපයා ඇත්තේ එවකට සිටි ප්‍රාදේශීය සංවර්ධන නිලධාරී තුමා ය. තරුණ වියෙහි සිටි ඔහුගේ පළමු පත්වීම මෙම ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානයට ලැබී ඇති අතර ගොවිජන බැංකුව ඇතුළු ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානය දියුණු කිරීම වෙනුවෙන් ඔහු තම සම්පූර්ණ කාලය කැප කොට තිබේ.

අදාළ කාලය තුළ ගොවිජන බැංකුව භාරව සිටි සහායිකාව ද අදාළ යෙදවුම් සපයනු ලබන සමාගම් සමඟ සෘජුවම සබඳතා පවත්වමින් ඒවා ලබා ගැනීමට දක්වන ලද සහාය ද මෙහි ප්‍රගතිය සඳහා හේතු වී තිබේ.

පර්යේෂණ කණ්ඩායමෙ හි නිරීක්ෂණයට ලක් වූ මෙහි ඉහළ ප්‍රගතිය සඳහා දායක වූ අනෙක් කාරණය වී ඇත්තේ මෙම ප්‍රදේශය ඉහළ වාණිජමය වටිනාකමක් හා ඉල්ලුමක් ඇති, ආර්ථිකව වඩාත් ලාභදායී වගාවන් වන අර්තාපල් ඇතුළු උඩරට එළවළු වගාවන් හි නිරත විශාල ජනතාවකගෙන් සමන්විත ප්‍රදේශයක් වීමයි. එම අවස්ථාව (Opportunity) ආයතනයේ වාසියට පෙරලා ගැන්මට සමත් වූ පිරිසක් සිටීම ජයග්‍රහණය පිණිස හේතු වී ඇත.

ගොවිජන බැංකුව හා සම්බන්ධ ඇතැම් ගොවි සංවිධාන තම සංවිධානයේ සාමාජික ගොවීන්ට නියමිත අවස්ථාවේ දී ණය ලබාදීම සඳහා ඉතා කාර්යක්ෂම ලෙස පියවර ගැනීම ද ගොවි බැංකුවෙ හි ණය ලබාදීමේ හා ආපසු අයකර ගැනීමේ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා හේතු වී තිබේ. එවැනි ගොවි සංවිධාන, නව වගා කන්නයක් පටන් ගැන්මත් සමඟ ණය පාලන රැස්වීමක් පවත්වා ණය අවශ්‍ය ගොවීන් හා අවශ්‍ය ණය ප්‍රමාණය පිළිබඳ විමසා බලා ඒ පිළිබඳ වාර්තාවක් ගොවි බැංකුවට යැවීමට කටයුතු කරයි. ඊට අමතර වශයෙන් එම රැස්වීමේ දී අදාළ ණය ඉල්ලුම්පත්‍ර ලබා දී නියමිත දිනක දී ඒවා ගොවීන්ගෙන් බාරගෙන කෘ.ප.නි.ස. මාර්ගයෙන් ගොවිජන බැංකුවට ලබා දේ. ණය ආපසු ගෙවීම් සම්බන්ධයෙන් වුව ද ගොවි සංවිධානය විසින් වරින් වර අදාළ ණය ලබාගත් ගොවීන්ගෙන් විමසා බැලෙයි.

මෙම බැංකුවෙ හි ඉහළ ප්‍රගතිය සඳහා බලපෑ තවත් හේතුවක් වී ඇත්තේ වකුලේබන වලට සීමා නොවී ඉන් ඔබ්බට ගොස් සාමාජිකයින්ගේ කෘෂිකාර්මික මෙන් ම ස්වයං රැකියා සඳහා ණය අවශ්‍යතා සැපයීමට කටයුතු කිරීම ය. කණ්ඩායමක එක් අයෙකු ණය නො ගෙවූ අවස්ථාවල දී ඉතිරි අයට ණය ලබාදීම කල නො හැකි වුවත් එවැනි අවස්ථාවල දී කලින් ලබාගත් ණය මුදල් නිසිලෙස පියවීමට කටයුතු කොට ඇති සාමාජිකයින්ට ගොවි බැංකුවේ විශ්වාසය මත කෘෂි උපකරණ ලබාදීමට පියවර ගෙන ඇත. එසේ ම, ස්වයං රැකියා ණය යටතේ ට්‍රැක්ටර් ලබා ගැනීමට 100,000/- ණය ලබා දීමේ දී ණය ලබා ගන්නා විසින් ගොවි ජන බැංකුවෙන් ලබා ගන්නා ණය මුදලින් 10%ක කොටස් (රු.10,000/- ක් වටිනා කොටස්) මිල දී ගත යුතු වුවත්, ආපසු ලබාගත නො හැකි එතරම් මුදලක් කොටස් වෙනුවෙන් ආයෝජනය කිරීමට බල කිරීම ප්‍රායෝගික නොවන නිසා රු.2000/-ක් වටිනා කොටස් මිල දී ගැනීමට හා ඉතිරි රු.8,000ක් වූ මුදල අවසන් ණය වාරිකයට හිලව්

කිරීමට හැකි වන පරිදි ඉතිරි කිරීම් වල යෙදීමට හැකිවන පරිදි ගො.ස. කාරක සභා තීරණයක් ගැනීම ද මේ සඳහා වූ තවත් උදාහරණයකි. මෙවැනි තීරණයක් ගැනීම නිසා කෘෂි උපකරණ ණය යටතේ ට්‍රැක්ටර් ලබා ගැනීමේ ණය 10ක් හා ස්ප්‍රේ යන්ත්‍ර මිල දී ගැනීම සඳහා වූ ණය 15ක් පසුගිය කාලය තුළ දී ලබා දී සාර්ථකව අයකර ගැන්මට හැකි වී තිබේ.

ණය දීමේ ක්‍රියාවලිය සඳහා ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානයේ සිටින ප්‍රාදේශීය සංවර්ධන නිලධාරී ඇතුළු සියළු නිලධාරීන්ගේ අප්‍රතිහත ධෛර්යය හා කැපවීම ද ගොවි බැංකුවෙහි ප්‍රගතිය සැලකියයුතු මට්ටමකින් පවත්වා ගෙන යාම සඳහා බලපා තිබේ. උදාහරණ ලෙස පසුගිය කාලය තුළ දී බැංකු කළමනාකාරතුමිය අසනීප වී සති තුනක් පමණ කාලයක් රෝහල් ගත ව සිටිය ද එගා ණය දීමේ ක්‍රියාවලිය නොකඩවා පවත්වාගෙන යාම සඳහා කම්ටු ලිපිකාරිණියගේ ද සහාය ලබාගෙන ප්‍රාදේශීය නිලධාරිතුමා කටයුතු කර ඇත.

## 3.9.10 සංවර්ධනයට බලපාන තීතිමය හා වෙනත් ගැටලු

අදාළ බැංකුවෙ හි බැංකු කළමනාකාරතුමිය මෙන් ම ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානයේ ප්‍රදේශීය නිලධාරී මහතා සමග කළ සාකච්ඡාවට අනුව ගොවිජන බැංකුවෙ හි ප්‍රගතියට බලපාතු ලබන නීතිමය මෙන් ම වෙනත් ගැටලු ද හඳුනා ගනු ලැබුණි. කෘ.ප.නි.ස. වරුන්, ගොවි සංවිධාන නායකයින් හා ගොවීන් සමග කළ සාකච්ඡාවන්ගෙන් ද ඇතැම් ගැටලු වල ඇති බැරෑරුම්කම තව දුරටත් තහවුරු විය.

ගොවිජන බැංකුවට ස්වාධීන බැංකුවක් ලෙස කටයුතු කිරීමට අවස්ථාව සලසනු වෙනුවට ගොවිජන සංවර්ධන කාරක සභාව හා බැඳ තැබීමත්, ගොවිජන බැංකුවේ සාමාජිකයන්ගේ අවශ්‍යතා සැපිරීම සඳහා එදිනෙදා ක්ෂණිකව ගත යුතු තීරණ ගැනීම් වලට ගො.ස.කා. සභාවේ සභාපති මෙන් ම ගො.ජ.ස.දෙ. දිස්ත්‍රික් කොමසාරිස්තුමාත් සම්බන්ධ කිරීම නිසා සාමාජිකයින් තෘප්තියට පත් කිරීමට පමණක් නොව ඔවුන් දීගින් දිගටම බැංකුව සමඟ බැඳ තබා ගැනීමට නො හැකි වේ. උදාහරණ ලෙස දක්වන්නේ නම් බැංකුවක් ලෙස මේ යටතේ ගොවීන් මුදල් තැන්පත් කරනවා නම් තමන් අභිමත මුදලක් ඕනෑම අවස්ථාවක ආපසු ගැනීම සඳහා හැකියාව පැවතිය යුතු ය. එසේ වුව ද, ඕනෑම මුදලක් ආපසු ලබා දීමේ දී එය ගොවිජන බැංකුව ගෙවන්නේ චෙක් පතකින් වන අතර ඒ සඳහා ප්‍රාදේශීය සංවර්ධන ලේකම්තුමාගේ අනුමැතිය ලබාගත යුතුම ය. එය රු.10,000/-කට වැඩි මුදලක් වන්නේ නම් එයට දිස්ත්‍රික් කොමසාරිස්තුමාගේ ද අනුමැතිය ලබාගත යුතු ය. ප්‍රාදේශීය නිලධාරී තුමා බදාදා දිනයේ අනිවාර්යයෙන් ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානයේ සිටිය යුතු වේ. අනෙක් දිනවල බොහෝ විට ක්ෂේත්‍ර කටයුතු වල නිරත වන කාර්ය බහුල අයෙකු වන බැවින් ආයතනය තුළ සිටින බදාදා දිනයේ දී ගොවීන්ගේ වෙනත් විවිධ ප්‍රශ්න විසඳීම වැනි කාර්යයන් හි නිරත වන අයෙකි. එනිසා, ඔහුගේ ක්ෂණිකව අනුමැතිය ලබා ගත නො හැකි ය. දිස්ත්‍රික් කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය වූ අවස්ථාවක දී ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානයේ අයෙකුට අදාළ චෙක්පත රැගෙන යාමට සිදුවන අතර එය සපුරා ගැනීමට දින කිහිපයක් ගතවීමට හා සැලකිය යුතු වියදමක් දැරීමට සිදුවිය හැකි ය.

ගොවිජන බැංකුව තුළ එක්රැස් වන මුදල් දෛනිකව දවස අවසානය වන විට රජයේ බැංකුවල තැන්පත් කළ යුතු ය. එම නිසා, පසුව පැමිණෙන ගොවියෙකුට අවශ්‍ය ක්ෂණික ණය අවශ්‍යතා සපුරාලිය නො හැකි ය. රුපියල් 10,000/ කට අඩු මුදලක් ගෙවීමට වුවත් එවැනි මුදල් ප්‍රමාණයක් රඳවා ගැනීමට තරම් සුදුසු පසුබිමක ගොවි බැංකුව නොමැත. ඒ සඳහා සේප්පුවක් වැනි උපකරණ ද තිබිය යුතු ය.

කණ්ඩායම් ක්‍රමය ගොවීන්ට පහසු ඇප ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් මෙන් ම ගොවි බැංකුවේ හි අරමුදල් තර කරන ක්‍රමයක් වුව ද එය අසාර්ථක එකක් බව ගොවි බැංකුව මෙහෙයවන්නන් පමණක් නොව සාර්ථකව ණය ලබා ගෙන සාර්ථකව ආපසු ගෙවන ගොවීහු ද සඳහන් කළ හ. පස්දෙනෙකුගේ කණ්ඩායමක එක් අයෙකු ණය නො ගෙවූ විට එම කණ්ඩායමේ අන් සියළු දෙනාට ණය ලබාගත නො හැකි නිසා ඔවුන් කලින් කී පුද්ගලයා ණය ගෙවන්නේ ද නැද්ද යන්න පිළිබඳව කන්න දෙකක් පමණ බලා ඉන් පසුව නො ගෙවයි නම් බැංකුව අතහැර යති. කණ්ඩායම් 100ක් ගත් විට, ඉන් 50ක් පමණ එවැනි ගැටළු වලට මුහුණ පා ඇත. ණය නො ගෙවූ විට පනතට අනුව මාස 18ක් බලා උසාවි ගොස් සාර්ථකව අයකර ගැනීම සඳහා අවස්ථාව සලසා දී තිබිය දී ණය දීමට කණ්ඩායම් ක්‍රමය අත්‍යාවශ්‍ය අංගයක් ලෙස සලකා කටයුතු කිරීමට සැලැස්වීම ණය දීමේ ක්‍රමයෙ හි අසාර්ථකත්වය සඳහා බලපා තිබේ.

ණය ලබා දීමේ දී ලබා ගන්නා ණය මුදලින් 10%කට සමාන කොටස් ප්‍රමාණයක් ණය ලබා ගන්නා පුද්ගලයාගේ නමින් හා ඔහු ලබා ගන්නා ණය මුදලින් 25%කට සමාන මුදලක් කණ්ඩායම් අරමුදලේත් පැවතිය යුතු ය යන නීතිය ප්‍රායෝගික නොවේ. ට්‍රැක්ටරයක් ලබා ගැනීමට රු.100,000/-ක ණයක් ගන්නා අයෙකුට රු.10,000/- ක කොටස් ගැනීමට සිදු වේ. එය ආපසු ලබාගත නො හැකි මුදලක් නිසා කොටස් වෙනුවෙන් එවැනි මුදලක් රැඳවීමට ගොවීන් කැමති නැත. මේ කාර්යය සඳහා කණ්ඩායම් අරමුදලේ රු.25,000/-ක් ඉතිරි කිරීමට සිදු වේ. ඒ සඳහා ණය ලබා නො ගන්නා කණ්ඩායම් සාමාජිකයින්ට ද රු.5000/- බැගින් ඉතිරි කිරීමට සිදු වේ. ඒ අය ඒ සඳහා කෙසේවත් කැමති නොවේ. ණය ලබා ගන්නා පුද්ගලයාට වුව ද තනිව රු.25,000/-ක් ඉතිරි කිරීමට නො හැකි ය. එනිසා, ණය සඳහා ගොවීන්ගෙන් ඇති ඉල්ලුමට ප්‍රතිචාර දැක්වීමට මෙම නීතිය අවහිරයක් වේ.

කෘෂි ණයදීමේ දී හැකි තරම් ද්‍රව්‍යමය ණය ලබා දීම නියම කිරීම වර්තමානයට නො ගැලපෙන්නකි. ගොවීන් ද සඳහන් කළ ආකාරයට පුද්ගලික වෙළෙඳුන්ගෙන් කෘමිනාශක, බීජ වැනි යෙදවුම් මිල දී ගැනීමේ දී දෙනු ලබන 25% දක්වා වූ කොමිස් ප්‍රමාණය ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානවලින් බීජ මිල දී ගැනීමේදී ඔවුන්ට නො ලැබේ. එතරම් කොමිස් මුදලක් ලබා දෙනු ලබන ආයතන සමඟ තරඟ කිරීමට ද ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානවලට හැකියාව නොමැත. ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානයෙන් ලබා දෙනු ලබන සුළු ද්‍රව්‍ය ප්‍රමාණය හෝ අදාළ සමාගම් වලින් නො ගෙන පුද්ගලික වෙළඳුන්ගෙන් ලබාගෙන විකිණීමේ දී කොමිස් මුදලක් සහිතව ගොවීන්ට විකිණීමට අවස්ථාව නො ලැබේ. ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානයෙන් ගන්නවාට වඩා පිටතින් මිල දී ගැනීම වාසි බව දක්වන ගොවීහු ගොවිජන සංවර්ධන මධ්‍යසථානයෙන් ණය ලබා ගැනීමට ඉදිරිපත් නොවෙති.

බැංකුවක් ලෙස කටයුතු කිරීමේ දී නිශ්චිත ක්ෂේත්‍ර නිලධාරියෙකු හා කළමනාකරුවෙක් අවශ්‍ය වේ. එසේ වුව ද, ගොවිජන බැංකුවෙ හි මෙම කටයුතු දිගින් දිගටම පවත්වාගෙන ගොස් ඇත්තේ ඒවා පිළිබඳව නිසි පුහුණුවක් නො ලැබූ යම්කිසි නිලධාරියෙකු හෝ නිලධාරිනියක විසිනි. වර්තමානයෙ හි වඩාත් හොඳින් ක්‍රියාත්මක බැංකු 100 සඳහා කළමනාකරන සහායකයින් පත්කිරීමේ ක්‍රියාවලිය යටතේ බොරලන්දට ද ව්‍යාපාර කළමනාකරන උපාධියක් හැදෑරූ අයෙකු පත්කර එවා ඇති අතර ඇය විසින් වැරදි ආකාරයෙන් සිදු කෙරෙමින් පැවති බොහෝ ගිණුම් කරන කටයුතු නිවැරදි කොට තිබේ.

ආයතනයක කටයුතු අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා නිසි පරිදි පසුවිපරම් හා නිවැරදි අධීක්ෂණයක් පැවතිය යුතු වේ. මෙම ගොවි බැංකු මූල්‍යමය වශයෙන් කටයුතු පවත්වා ගෙන යන ආයතනයක් බැවින් එම ආයතනයේ කටයුතු අධීක්ෂණය හා විගණනය සිදු කළ යුතු වේ. එසේ වුව ද, වර්තමානය දක්වා මෙම බැංකුවල කටයුතු අධීක්ෂණයක් හා

විගණනයක් සිදු නොවීම අඩුපාඩුවක් වී ඇත. ගිණුම් කටයුතු තැබීම සඳහා ව්‍යාපාර කළමනාකරන උපාධියක් හැදෑරූ අයෙකු පත් ව සිටිය ද, එම නිලධාරියා තුළින් ද වැරදි සිදුවිය හැකි බැවින් එම කටයුතු අධීක්ෂණය සිදු කළ යුතු වේ. එමෙන් ම, එසේ නොවීම මත නිලධාරීන්ට වංචනික ක්‍රියාවන් හි නිරත වීමට ඇති හැකියාව ද පවතිනු ඇත. එම නිසා, මෙම බැංකු කටයුතු අධීක්ෂණයට හා විගණනය සඳහා සෑම දිස්ත්‍රික්කයකටම අධීක්ෂකවරයකු පත් කිරීම කළ යුතු වේ.

දැනට මෙම බැංකුව තුළ කාර්යයෙ හි නියුතු නිලධාරීන්ගේ හා අලුතින් පත්වන නිලධාරීන්ම නිශ්චිත කාර්යභාරය පැහැදිළි ලෙස පැවරීමක් පැවතිය යුතු වේ. එසේ නොමැති වීමෙන් ඔවුන්ගෙන් ඉටුවිය යුතු සේවාව නිවැරදි හා කාර්යක්ෂමව ඉටු කිරීමට නො හැකියාවක් පවතී. එම නිසා, නිලධාරීන්ට කාර්යභාරය හා වගකීමක් පැහැදිළි ලෙස පැවරීමක් සිදුකළ යුතු වේ.

ගොවි බැංකු ක්‍රමය තුළ එහි චක්‍ර ලේඛන හා රෙගුලාසි තුළින් කණ්ඩායම් ගත වීමට හැකියාව ඇත්තේ කවුරුන්ද යන වග සඳහන් කර ඇත. එහි දී, එකම පවුලේ හා ඥාති සබඳතා ඇති අය කණ්ඩායම් ගත වීම වලක්වා තිබේ. එසේ වුව ද, ගමක් ගත් විට එහි වැඩි වශයෙන් පවුල් අතර ඥාති සබඳතා පවතින අතර කණ්ඩායම් ගත කිරීමේ දී මෙම නීති රීති වලින් බැහැරව (ප්‍රායෝගිකව ක්‍රියාත්මකව නොහැකි නිසා) කණ්ඩායම් ගත කිරීමට එම ප්‍රදේශයට අවස්ථාව ලබාදීම සාර්ථකත්වයට පත්වීමට බලපා තිබේ.

වාණිජමය ආර්ථික රටාවක් පවතින සමාජය තුළ මෙම බැංකු සාර්ථක කර ගැනීම සඳහා එම ආයතනයන් හි සේවයේ නියුතු නිලධාරීන්ට කාලීනව පුහුණු වැඩසටහන් වලට සහභාගී වී ඔවුන්ගේ ගැටලු තත්ත්වයන් විසඳා ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් වර්තමානය දක්වා නො පවතී. එය වර්තමානයේ මෙම බැංකුවල සාර්ථකත්වයට බලපෑම් එල්ල වීමට බලපා ඇත.

### 3.9.11 යෝජනා

1. ගොවිජන බැංකුව ගොවිජන සංවර්ධන කාරක සභාවේ සුපරීක්ෂණයට යටත් ස්වාධීන බැංකුවක් බවට පත් කිරීම.
2. යම්කිසි නිශ්චිත කොටස් ප්‍රමාණයක් හැර අන් කොටස් ඕනෑම වේලාවක විකිණීමටත්, තැන්පත් කරන ලද මුදල් ඕනෑම අවස්ථාවක ඉක්මණින් ලබා ගැනීමටත් අවස්ථාව සැලසිය යුතු ය.
3. සියළු ගොවිජන මධ්‍යස්ථානවලට බීජ සම්බන්ධයෙන් ප්‍රකට සමාගම්වලින් කොමිස් ක්‍රමයට බීජ ලබා ගැනීම සඳහා කටයුතු කිරීම.
4. ගොවිජන බැංකු සඳහා සේප්පු සැපයීම
5. විධිමත් කාර්ය මණ්ඩලයක් සැපයිය යුතු අතර එයට කළමනාකරුවකු, කළමනාකාර සහායකයකු හා ක්ෂේත්‍ර නිලධරයෙකු අයත් විය යුතු ය.
6. ගොවි බැංකු සඳහා ස්වයංක්‍රීයව පොලිය ගණනය වන පරිඝනක මෘදුකාංගයක් හඳුන්වා දිය යුතු ය. එසේ නොමැතිනම් අතින් ගණනය කිරීම අසීරු කටයුත්තකි.
7. ණය ලබාදීමේ දී කණ්ඩායම් ක්‍රමය අනිවාර්ය කළ යුතු නැත. පුද්ගලික ඇප්පු හෝ වෙනත් පිළිගත හැකි පහසු සුරකීමේ ක්‍රම මත පුද්ගලික ණය ගන්නන්ට ඒ සඳහා අවස්ථාව සලසා දිය යුතු අතර එසේ නො හැකි අයට පහසු වීම සඳහා කැමති පරිදි කණ්ඩායම් ක්‍රමය මත ණය ලබා ගැනීමේ ක්‍රම තව දුරටත්

ක්‍රියාත්මක කළ යුතු ය. කණ්ඩායමේ සජීවීකරණයට භාජනය කිරීම සඳහා ඒ සම්බන්ධ පුහුණුවක් ලබාදීම වැදගත් ය. මේ යටතේ කණ්ඩායම් සම්බන්ධ ආකල්පමය වෙනසක් ඇති කළ යුතු ය.

8. ණය ලබා ගත් ගොවීන්ගේ ගෙවීම් පිළිබඳව පසුවිපරමක් කළ යුතු ය. මේ සඳහා කෘ.ප.නි.ස වරුන්ගේ උපරිම සහාය ලබාගත යුතු ය. දැනටත් ඔවුන්ගේ රාජකාරි ලැයිස්තුවෙ හි එක් කොටසක් ලෙස ණය අයකර ගැනීමට සහාය වීම සඳහන් කර ඇති අතර ඒ සඳහා ලකුණු ලබා දීමෙන් දිරිමත් කළ යුතු ය.

## 3.10 රිදීමාලියද්ද ගොවි බැංකුව

### 3.10.1 හැඳින්වීම

බදුල්ල දිස්ත්‍රික්කයේ අම්පාර හා මොණරාගල දිස්ත්‍රික්කවලට මායිම් ව පිහිටා ඇති රිදීමාලියද්ද ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශය ශ්‍රී ලංකාවේ ඉහළම දරිද්‍රතාවය ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වන්නකි. මෙම ගොවිජන සේවා මධ්‍යස්ථානය ආශ්‍රිතව ග්‍රාම සේවා වසම් 27ක් ඇති අතර ඒවායෙ හි මිනිසුන්ගේ ප්‍රධාන ජීවනෝපාය වාරි මෙන් ම වර්ෂා ජලය පදනම් කරගෙන වී හා අනෙකුත් වගාවන් එනම්, බඩඉරිඟු, කව්පි ආදී බෝග වගා කිරීමයි. ග්‍රාමීය වැව් කිහිපයක් හා ප්‍රධාන වාරි මාර්ගයක එක් කොටසක් ඇතුළත් ව ජල සම්පාදිත කුඹුරු ඉඩම් පැවතිය ද, බල ප්‍රදේශයේ වැඩි බිම් ප්‍රමාණයකට ජලය සපයා ගැනීමේ පහසුකම් නොමැත. එමෙන් ම, කඳු හා ද්‍රෝණිවලින් සමන්විත ප්‍රදේශ ද බල ප්‍රදේශය තුළ පවතී. කුඩා වැව් කිහිපයක් ප්‍රදේශය තුළ පැවතිය ද, ඒවා නිසි පරිදි ප්‍රතිසංස්කරණය නො කිරීමෙන් අබලන් තත්ත්වයක පැවතීම මත ජල හිඟය මෙම ප්‍රදේශයේ ගොවි ජනතාවගේ වගා කටයුතු හා දෛනික කටයුතුවල දී ප්‍රධාන බාධකයක්ව පවතී. එම නිසා ප්‍රධාන වශයෙන් ගොවීන් තම වගා කටයුතු සිදු කරන්නේ මහ කන්නය තුළ අහස් දිය භාවිතයෙනි. යල කන්නයේ දී වගා කටයුතු කිරීම ඉතා පහළ මට්ටමක පවතින අතර බහුතරයක් ගොවීහු විවිධ කුලී වැඩ කිරීමෙන් තම ජීවිකාව කරගෙන යාමට පෙළඹී සිටිති. ජල හිඟය නිසා යල් කන්නයේ දී වගා කටයුතු කිරීමට නො හැකි වීමත්, මහ කන්නයේ දී ලැබෙන වර්ෂාව පිළිබඳ ඉහළ විශ්වාසයක් තැබිය නො හැකිවීමත් නිසා අස්වැන්න අඩුවීම මෙම ප්‍රදේශයේ ජනතාවගේ ආදායම් මට්ටම පහළ තත්ත්වයක පැවතීමට හේතු වී තිබේ. එසේ ම, ප්‍රදේශයේ ප්‍රවාහන පහසුකම් ඉතා දුර්වල මට්ටමක පවතින අතර තම අස්වැන්න සාධාරණ මිලකට අලෙවි කර ගැනීමේ ගැටලුවලට ද ගොවීහු මුහුණපා සිටිති. සුළු වාරිමාර්ග යටතේ ගොවි සංවිධාන 53 ක් හා මහා වාරිමාර්ග ගොවි සංවිධාන 2ක් පවතින අතර මහා වාරිමාර්ග යටතේ අක්කර 2 බැගින් හා සුළු වාරිමාර්ග යටතේ අක්කර 1/2 බැගින් ගොවීන්ට ඉඩම් ලබා දී ඇත.


මෙම ගොවි බැංකුව 2001 වසරේ දී ගොවිජන සේවා මධ්‍යස්ථානය තුළ ස්ථාපිත කරන ලද අතර මුලින් 2001 වර්ෂයේ දී රුපියල් ලක්ෂ 4ක මුදලක් ද, පසුව 2002 වර්ෂයේ දී රුපියල් ලක්ෂ 10ක මුදලක් ද ප්‍රාග්ධනය වශයෙන් ලබා දී ඇත.

### 3.10.2 සාමාජිකත්ව වර්ධනය

ගොවි බැංකුව තුළ 2010 වර්ෂය අවසානයේ දී කුඩා කණ්ඩායම් 104ක් සිටි අතර එක් කුඩා කණ්ඩායමක් සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත විය. ගොවි බැංකුව ආරම්භයේ දී එනම් 2001 වසරේ දී සාමාජිකයන් 663ක් සිටි අතර 2010 වන විට ගොවීන් 1,282ක් එනම් 2001 වසරට සාපේක්ෂව 93%ක් දක්වා සාමාජිකත්වය වර්ධනය වීමක් දැකිය හැකි ය. බල ප්‍රදේශයේ මුළු ගොවීන් සංඛ්‍යාව 7,342ක් වන අතර 2001 දී ගොවි බැංකුවේ

සාමාජිකත්වය ලැබූ ගොවීන් සංඛ්‍යාව බල ප්‍රදේශයේ මුළු ගොවීන් සංඛ්‍යාවෙන් 9%කි. මෙම ප්‍රතිශතය 2010 වසර වන විට 17% දක්වා වර්ධනය වීමක් දැකිය හැකි ය. කොටස් හිමියන් සංඛ්‍යාවේ ඉහළම වර්ධනය 2002 වර්ෂයේ දී සිදු වී ඇති අතර 2004 වර්ෂයෙන් පසු මෙහි කොටස් මිල දී ගත් ගොවීන් සංඛ්‍යාවේ වර්ධනයේ පැහැදිලි අඩුවීමක් දක්නට ලැබේ (වගුව 3.47).

**රූප සටහන් අංක: 3.3 ගොවි බැංකුවේ සාමාජිකත්වය වර්ධනය**




මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කෝ.ගො.ප.පු. ආයතනය

**වගු අංක 3.47: රිදීමාලියද්ද ගොවි බැංකුවේ කොටස් හිමියන්ගේ සහ කොටස් වටිනාකමේ වර්ධනය**

| වර්ෂය | බැඳුණු සාමාජිකයන් / කොටස් හිමියන් ගණන | කොටස් වල වටිනාකම (රු) | ප්‍රදේශයේ පවුල් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස (%) | කොටස් හිමියන් සංඛ්‍යාවේ වර්ධනය |
|---|---|---|---|---|
| 2001 | 663 | 124,000 | 9.03 | |
| 2002 | 878 | 176,000 | 11.96 | 32.43 |
| 2003 | 922 | 193,040 | 12.56 | 5.01 |
| 2004 | 1,041 | 276,982 | 14.18 | 12.91 |
| 2005 | 1,060 | 316,032 | 14.44 | 1.83 |
| 2006 | 1,130 | 357,632 | 15.39 | 6.60 |
| 2007 | 1,164 | 381,632 | 15.85 | 3.01 |
| 2008 | 1,217 | 438,032 | 16.58 | 4.55 |
| 2009 | 1,238 | 472,132 | 16.86 | 1.73 |
| 2010 | 1,282 | 515,632 | 17.46 | 3.55 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කෝ.ගො.ප.පු. ආයතනය

### 3.10.3 ගොවි බැංකුවේ ඉතුරුම්, කොටස් ප්‍රාග්ධනය හා ලාභාංශ වර්ධනය

මෙම ගොවි බැංකුව සතුව මේ වන විට ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් ලබා දුන් මුළු ප්‍රාග්ධන මුදල වන රුපියල් ලක්ෂ 14න් ලක්ෂ 5ක් 2010 වසරේ දී ආපසු යවා ඇති අතර ලක්ෂ 9ක් තවමත් පවතී. එසේ ම, ගොවි බැංකුව විසින් ගොවීන්ට නිකුත් කළ ණය මුදල්වල පොළී වලින් ගොඩ නැඟුණු ලාභාංශ එකතු වීමෙන් ගොවි බැංකු සමුච්චිත අරමුදල් ගිණුම සැදී ඇති අතර මෙහි වටිනාකම 2002 දී රුපියල් 489,569ක් විය. 2010 වන විට

මෙහි මුළු වටිනාකම රු. මිලියන 3.79ක් වූ අතර එය මේ වන විට ගොවීන්ට අවශ්‍ය ණය නිකුත් කිරීම සඳහා යොදා ගත හැකිව පවතී. එසේ ම, එක් කොටසක වටිනාකම රු. 100 ක් බැගින් ගොවීන් විසින් මිල දී ගෙන ඇති මුළු කොටස්වල වටිනාකම 2010 වසර වන විට රුපියල් 515,632ක් වන අතර එය 2001 වසරට සාපේක්ෂව 35%ක වාර්ෂික වර්ධනයකි. මෙම කොටස් නැවත ගෙවීමක් සිදු නොවන අතර එය යොදා ගනු ලබන්නේ ගොවීන්ට ණය නිකුත් කිරීම සඳහා වන අරමුදල ශක්තිමත් කර ගැනීමට ය. මෙයට අමතරව, කණ්ඩායම් හා පුද්ගල ඉතිරි කිරීම් ගිණුම්වල එකතුව 2001 වසරේ දී රුපියල් 164,175ක් වූ අතර මෙය 2010 වන විට වර්ධනය වී තිබුණේ 1.4%කින් පමණි (වගුව 3). ගොවි බැංකුවේ ඉතුරුම් තැන්පත් ගිණුම් හිමියන් සංඛ්‍යාව 2001 වසරේ දී 648ක් වූ අතර 2010 වන විට 59%කින් වර්ධනය වී තිබේ (වගුව 2).

**වගු අංක 3.48: රිදීමාලියද්ද ගොවි බැංකුවේ තැන්පත්වල වර්ධනය**

| වර්ෂය | තැන්පත් හිමියන් | තැන්පත් වටිනාකම (රු) |
|---|---|---|
| 2001 | 648 | 164,175 |
| 2002 | 854 | 245,568 |
| 2003 | 884 | 275,859 |
| 2004 | 999 | 306,852 |
| 2005 | 1,005 | 353,452 |
| 2006 | 1,021 | 321,294 |
| 2007 | 1,027 | 333,044 |
| 2008 | 1,021 | 366,694 |
| 2009 | 1,021 | 377,322 |
| 2010 | 1,031 | 401,122 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

**වගු අංක 3.49: රිදීමාලියද්ද ගොවි බැංකුවේ අරමුදල් වර්ධනය**

| වර්ෂය | ප්‍රාග්ධනය (රු) | කොටස් ප්‍රාග්ධනය (රු) | මුළු තැන්පතු වටිනාකම (රු) | සමුච්ජිත අරමුදල (රු) | සංචිත වටිනාකම (රු) |
|---|---|---|---|---|---|
| 2001 | 400,000 | 124,000 | 164,175 | - | 688,175 |
| 2002 | 1,400,000 | 176,000 | 245,568 | 489,569 | 2,311,136 |
| 2003 | 1,400,000 | 193,040 | 275,859 | 784,283 | 2,653,183 |
| 2004 | 1,400,000 | 276,982 | 306,852 | 1,162,079 | 3,145,913 |
| 2005 | 1,400,000 | 316,032 | 353,452 | 1,566,361 | 3,635,845 |
| 2006 | 1,400,000 | 357,632 | 321,294 | 1,996,429 | 4,075,355 |
| 2007 | 1,400,000 | 381,632 | 333,044 | 2,479,590 | 4,594,266 |
| 2008 | 1,400,000 | 438,032 | 366,694 | 2,994,800 | 5,199,526 |
| 2009 | 1,400,000 | 472,132 | 377,322 | 3,351,814 | 5,601,268 |
| 2010 | 900,000 | 515,632 | 401,122 | 3,793,157 | 5,609,911 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

ප්‍රාග්ධනය යනු: ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගොවි බැංකු වෙත සපයන ලද මුදල

සංචිත යනු: සපයනු ලැබූ ප්‍රාග්ධනය, කොටස් ප්‍රාග්ධනය, තැන්පතු, වටිනාකම සහ සමුච්ජිත අරමුදලේ වටිනාකම්වල එකතුව වේ.

### 3.10.4 ණය නිකුත් කිරීම

ගොවි බැංකුව මගින් එහි සාමාජිකයන් සඳහා ප්‍රධාන වශයෙන් වගා ණය හා ව්‍යාපෘති ණය සපයනු ලබන අතර මෙයට අමතරව ක්ෂණික ණය සැපයීමක් මුල් කාලයේ දී සිදු කොට ඇත. මේ අනුව, 2000/2001 මහ කන්නය සඳහා ගොවීන් 54 දෙනෙක් ණය ලබාගෙන ඇති අතර මුළු ණය නිකුත් කිරීම්වල වටිනාකම රු.208,676ක් විය (වගුව 3.50). මෙම ණය මුදල් ලබා ගත් ගොවීන් සංඛ්‍යාව ගොවි බැංකුවේ සාමාජිකයන් සංඛ්‍යාවෙන් 8%ක් තරම් අඩු අගයක පැවතුණි. දත්ත විශ්ලේෂණයේ දී පෙනී යන කරුණක් වන්නේ රිදීමාලියද්ද ගොවි බැංකුව මගින් ණය ලබාගත් සංඛ්‍යාව එහි මුළු සාමාජික සංඛ්‍යාවට සාපේක්ෂව දිගින් දිගටම පහළ අගයක් ගන්නා බවයි. වාර්තා අනුව වැඩිම සාමාජිකයින් ප්‍රමාණයක් ණය ලබාගෙන ඇත්තේ 2003 වසරේ දී වන අතර එම ප්‍රමාණය මුළු සාමාජිකයන් සංඛ්‍යාවෙන් 34%කි. මෙහි දී නිකුත් කළ මුළු ණය ප්‍රමාණය රු.1,288,861ක් වන අතර එය එම වසරේ බැංකුවේ පැවති සමස්ත ණය ලබාදීමේ ධාරිතාවයෙන් (තැන්පත් + කොටස් + ප්‍රාග්ධනය + ලාභාංශ) ප්‍රතිශතයක් ලෙස 49%ක් විය (වගුව 3.49). 2009 වසරේ දී ගොවීන් 229ක් ගොවි බැංකු ණය ලබාගෙන ඇති අතර 2010 වසර තුළ එම සංඛ්‍යාව 97 ක් දක්වා විශාල අඩුවීමක් පෙන්නුම් කරයි. මෙසේ ගොවීන් ගොවි බැංකුවෙන් ණය ලබා ගැනීමට ඉදිරිපත් නොවීමට හේතු ලෙස දක්වා තිබුණේ කණ්ඩායම් ක්‍රමයට ණය ලබා ගැනීමේ දී ඔවුන් මුහුණපාන දුෂ්කරතා, ලබා දෙන ණය මුදල ඔවුන්ගේ වගා කටයුතු සඳහා ප්‍රමාණවත් නොවීම ආදියයි. එසේ ම, මෙම ගොවි බැංකු පිහිටා තිබුණු ප්‍රදේශයේ සිට එහි එක් එක් වසම්වලට ඇති දුර ප්‍රමාණය අධික වීමත්, එම වසම්වල සිටින ගොවීන්ට ගොවි බැංකුවට පැමිණීම සඳහා ප්‍රවාහන දුෂ්කරතා විශාල වශයෙන් පැවතීමත්, ගොවි බැංකුවෙන් ණය ලබා ගැනීම අඩු වීමට බලපා තිබුණි.

**වගු අංක 3.50: රිදීමාලියද්ද ගොවි බැංකුවේ ණය නිකුත් කිරීම**

| වර්ෂය | වගා ණය ප්‍රමාණය | | | ක්ෂණික ණය (රු) | කෘෂි උපකරණ ණය (රු) | නිකුත් කළ මුළු ණය වටිනාකම (රු) | ණය ලබාගත් ගොවීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| | යල (රු) | මහ (රු) | එකතුව (රු) | | | | |
| 2001 | - | 208,676 | 208,676 | - | - | 208,676 | 56 |
| 2002 | 137,326 | 393,269 | 530,595 | - | - | 530,595 | 114 |
| 2003 | 57,100 | 1,231,761 | 1,288,861 | - | - | 1,288,861 | 316 |
| 2004 | 37,925 | 652,651 | 690,576 | 95,000 | - | 785,576 | 144 |
| 2005 | - | 1,166,211 | 1,166,211 | 88,000 | 29,425 | 1,283,636 | 203 |
| 2006 | 10,000 | 649,550 | 659,550 | 85,000 | 42,225 | 786,775 | 124 |
| 2007 | 10,000 | 760,438 | 770,438 | 85,000 | 67,425 | 922,863 | 181 |
| 2008 | 20,000 | 667,836 | 687,836 | 85,000 | 140,295 | 913,131 | 172 |
| 2009 | 50,000 | 1,412,950 | 1,462,950 | 85,000 | 159,875 | 1,707,825 | 226 |
| 2010 | - | 425,796 | 425,796 | 85,000 | 159,875 | 670,671 | 97 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

මූල්‍යමය වශයෙන් වැඩිම ණය ප්‍රමාණයක් නිකුත් කොට තිබුණේ 2009 වර්ෂයේ දී වන අතර එම ප්‍රමාණය රුපියල් 1,707,825ක් විය. එසේ වුව ද, 2010 වර්ෂය තුළ නිකුත් කරන ලද මුළු ණය ප්‍රමාණයේ වටිනාකම ඉතා පහළ අගයක පැවති අතර (රුපියල් 670,671) එය ගොවි බැංකුවේ මුල් කාලයෙන් පසුව (එනම් 2002) වසරින් පසුව ලබාදුන් අඩුම ණය මුදල ලෙස දැක්විය හැකි ය. සමීක්ෂණයට භාජනය වූ බොහෝ ගොවීන් ප්‍රකාශ කර සිටියේ ගොවි බැංකුවේ කාර්යභාරය පිළිබඳව නිසි දැනුමක් තමන්ට නොමැති බවයි.



පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

බොහොමයක් කෘ.ප.නි.ස. වරුන් තම වසම්වල ගොවීන් දැනුවත් කිරීම අඩු මට්ටමක පැවති බව දැකගත හැකි විය. ගොවි බැංකුවේ ණය නිකුත් කිරීමේ හැකියාවට සාපේක්ෂව එමගින් ණය ලබාදීමේ අඩුවීමක් දැකිය හැකි අතර ගොවි බැංකුවේ සමස්ත ණය දීමේ ධාරිතාවය සමග බැලීමේ දී 2010 වසර තුළ දී ලබා දුන් සමස්ත ණය ප්‍රමාණය ලබා දිය හැකි ණයවල වටිනාකමින් 12%ක් තරම් පහළ අගයක පැවතුනි.

**වගු 3.51 : රිදීමාලියද්ද ගොවි බැංකුවේ ණය නිකුත් කිරීම සංචිත වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස**

| වර්ෂය | නිකුත් කළ මුළු ණය වටිනාකම (රු) | සංචිත වටිනාකම (රු) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| 2001 | 208,676 | 688,175 | 30.32 |
| 2002 | 530,595 | 2,311,136 | 22.96 |
| 2003 | 1,288,861 | 2,653,183 | 48.58 |
| 2004 | 785,576 | 3,145,913 | 24.97 |
| 2005 | 1,283,636 | 3,635,845 | 35.31 |
| 2006 | 786,775 | 4,075,355 | 19.31 |
| 2007 | 922,863 | 4,594,266 | 20.09 |
| 2008 | 913,131 | 5,199,526 | 17.56 |
| 2009 | 1,707,825 | 5,601,268 | 30.49 |
| 2010 | 670,671 | 5,609,911 | 11.96 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

### 3.10.5 ණය අයවීම

2002 වර්ෂය තුළ දී රිදීමාලියද්ද ගොවි බැංකුව මගින් ලබාදුන් මුළු ණයවලින් 99%ක් දක්වා අය කර ගෙන තිබීම ඉතා හොඳ ප්‍රවණතාවයකි. ඉන්පසු ක්‍රමිකව ණය අය කර ගැනීමේ ප්‍රතිශතය පහළ යාමක් දක්නට ලැබෙන අතර නැවත 2006 හා 2007 යන වර්ෂවල දී ණය අය කර ගැනීමේ ප්‍රතිශතය 85% ඉක්මවා ඇත. කෙසේ වුව ද, 2009 වර්ෂය තුළ දී ගොවීන්ට ඉහළම ණය ප්‍රමාණයක් නිකුත් කර තිබුණත් ණය අය වීම 58% දක්වා අවම අගයක් පෙන්නුම් කරයි. මෙම වසරේ වගා ණය අයවීම මේ දක්වා වාර්තා වී ඇති අවම ණය අයවීම වේ. මෙයට හේතුව, එම වසරේ තද නියඟයක් පැවතීම මත ගොවීන්ගේ අස්වනු විශාල වශයෙන් හානි වීමයි. වගා ණය අයවීම 2009 වසරේ හැර අනෙකුත් වර්ෂවල බොහෝදුරට සාර්ථකව සිදු වී ඇති අතර කෘෂි උපකරණ ණය අයවීම කන්න කිහිපයක් තුළ සිදු වේ. මෙහි දක්වා ඇත්තේ අදාළ වර්ෂය අවසන් වන විට අය වී ඇති කෘෂි උපකරණ ණය ප්‍රමාණයයි. මෙම බැංකුව මගින් 2004 සිට මේ දක්වා ක්ෂණික ණය නිකුත් කරන අතර 2007 සිට අයවීමේ ප්‍රතිශතය 100%ක් ව පවතී. 2010 වර්ෂය තුළ ණය ලබා ගත් ගොවීන් 97 දෙනාගෙන් 77 දෙනෙක්ම එම වර්ෂය තුළ ණය පියවා ඇති අතර ණය අයවීමේ ප්‍රතිශතය නිකුත් කළ මුළු ණය වටිනාකමෙන් 77%ක් ව පවතී (වගුව 3.52). ගොවීන්ගෙන් හිඟ ණය අය කර ගැනීම සඳහා සමථ මණ්ඩලයේ නඩු පැවරීම සිදු කොට ඇති අතර ඉන් පසුවත් ණය නො ගෙවන ගොවීන් සඳහා උසාවිවල නඩු පැවරීම සිදු කොට තිබේ. පසුගිය 2010 වසරේ ණය නො ගෙවීම මත ගොවීන් 22කට සමථ මණ්ඩලයේ නඩු පවරා ඇති අතර 2009 වසරේ ගොවීන් 12 දෙනෙකුට උසාවියේ නඩු පවරා ඇත. ණය අයවීම අඩුවීම කෙරෙහි බලපා ඇති ප්‍රධාන හේතු වන්නේ එම ප්‍රදේශයේ ජල හිඟය නිසා අස්වනු පිළිබඳ අවධානමක් පැවතීම හා එළදාව අඩුවීම, හොඳින් සංවිධානය වූ වෙළෙඳපොළක් නො පැවතීම නිසා ගොවීන්ට තම අස්වනු සඳහා හොඳ මිලක් නො ලැබීම හා ප්‍රවාහන දුෂ්කරතා නිසා නිෂ්පාදන අලෙවි කිරීමේ ගැටළු මතුවීම යනාදිය යි.

වගු අංක 3.52: රිදීමාලියද්ද ගොවි බැංකුවේ ණය අයකර ගැනීම

| වර්ෂය | ණය වර්ගය | | | | | | අය කර ගත් මුළු ණය වටිනාකම (රු) | වර්ෂයට අදාළව නිකුත් කළ මුළු ණය වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|---|---|---|---|---|
| | වගා ණය (රු) | ප්‍රතිශතය (%) | කෘෂි උපකරණ ණය (රු) | ප්‍රතිශතය (%) | ක්ෂණික ණය (රු) | ප්‍රතිශතය (%) | | |
| 2001 | 201,431 | 96.53 | - | - | - | - | 201,431 | 96.53 |
| 2002 | 525,896 | 99.11 | - | - | - | - | 525,896 | 99.11 |
| 2003 | 1,203,987 | 93.41 | - | - | - | - | 1,203,987 | 93.41 |
| 2004 | 675,401 | 97.80 | - | - | 17,000 | 17.89 | 692,401 | 88.14 |
| 2005 | 958,901 | 82.22 | 0 | 0 | 13,000 | 14.77 | 971,901 | 75.71 |
| 2006 | 589,174 | 89.33 | 29,425 | 69.69 | 81,746 | 96.17 | 700,345 | 89.01 |
| 2007 | 765,149 | 99.31 | 35,825 | 53.13 | 85,000 | 100.00 | 885,974 | 96.00 |
| 2008 | 646,763 | 94.03 | 71,650 | 51.07 | 85,000 | 100.00 | 803,413 | 87.98 |
| 2009 | 796,836 | 54.47 | 109,485 | 68.48 | 85,000 | 100.00 | 991,321 | 58.05 |
| 2010 | 309,890 | 72.78 | 118,657 | 74.22 | 85,000 | 100.00 | 513,547 | 76.57 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

## 3.10.6 ද්‍රව්‍ය ණය ලබාදීම

2007/01 දරන චක්‍රලේඛය අනුව වගා ණය ලබාදීමේ දී අනුමත ණය මුදලින් 80%ක් ම ගෙවිය යුතු වන්නේ ද්‍රව්‍යවලිනි. මුදලින් ගෙවිය හැක්කේ බිම් සැකසීම සඳහා 20%ක් පමණි. එසේ වුව ද, ගොවිජන සේවා කම්ටුව කෘමි නාශක, දිලීර නාශක ආදී ද්‍රව්‍ය මිල දී ගන්නේ බිබිල, මහියංගණ ආදී ප්‍රදේශවල සිටින නියෝජිතයන්ගෙන් මිල ගණන් කැඳවීමෙනි. එවිට කම්ටුවට ලැබෙන වට්ටම 22%ක් පමණ වේ. අලෙවි සැල මඟින් ගොවීන්ට ලබාදෙන වට්ටම මෙයට වඩා අඩු ය. කම්ටුවෙන් මිල දී ගැනීමේ දී ගොවියාට වැඩි මිලක් ගෙවීමට සිදුවන අතර බාහිර කඩවල් හෝ අලෙවි නියෝජිතයින්ගෙන් කෙළින්ම මිල දී ගැනීම තුළින් ගොවියාට වැඩි ලාබයක් ලබා ගත හැකි ය. එම නිසා, ණය මුදල මුදලින් ලබා දෙන්නේ නම් ගොවියාට වඩා අඩු මුදලකට අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගත හැකි බව ඇතැම් ගොවීන්ගේ මතය විය. එසේ ම, ද්‍රව්‍ය වශයෙන් ලබා දෙන බීජවල ගුණාත්මක තත්ත්වය අඩු තත්ත්වයක පැවතීම නිසා ගොවීන් ද්‍රව්‍ය මිල දී ගැනීමට අකමැති ය. තව ද, ගොවීන්ට අවශ්‍ය කෘෂි රසායනික ද්‍රව්‍ය ඇතැම් විට අලෙවි සැල තුළ නොමැති අවස්ථා තිබේ. එවැනි අවස්ථාවල දී මුදලින් අදාළ ණය මුදල ලබාදීම මෙම ගොවි බැංකුව විසින් සිදු කරනු ලැබේ. ද්‍රව්‍ය වශයෙන් ණය ලබා ගැනීමට අකමැති බව සමීක්ෂණයට ලක් වූ ගොවීන්ගෙන් වැඩි පිරිසක් ප්‍රකාශ කළ අතර ද්‍රව්‍ය වශයෙන් ලබා ගැනීමට කැමති බව ප්‍රකාශ කළ ගොවීන් එයට හේතු ලෙස සඳහන් කළේ පිටතින් ගෙන ඒමේ දී ප්‍රවාහන දුෂ්කරතා පැන නැඟීම ය. මෙසේ අදහස් දැක් වූ ගොවීන් බොහෝවිට ගමනාගමන අපහසුකම් ඇති දුෂ්කර ගම්මානවල සිටියවුන් වූහ.

## 3.10.7 කණ්ඩායම් ක්‍රමය

පස් දෙනෙකුගෙන් සමන්විත කුඩා කණ්ඩායමක් ණය ගැනීම සඳහා සිටිය යුතු ය. මෙම ප්‍රදේශයේ ඇතැම් ගොවීන් ගොවිතැනට අමතරව කුලී වැඩ ආදිය ද කරන නිසා ඔවුන්ට කණ්ඩායම් ගත වීම සඳහා අවශ්‍ය කාලය නොමැති නිසා කණ්ඩායම් වශයෙන් ණය ලබා

ගැනීමට අකමැති ය. එසේ වුව ද, කණ්ඩායම් ක්‍රමයේ ඇති වාසි ලෙස එම කණ්ඩායමට අයත් ගොවීන්ට තම කුඹුරේ සියළුම කටයුතුවල දී සහයෝගයෙන් හා අත්තම් ක්‍රමයට වැඩකටයුතු කර ගැනීමට හැකිවීමත්, කණ්ඩායමේ ගොවීන් අතර ඇපවීමක් ඇති නිසා එක් පුද්ගලයෙකු ණය නො ගෙවූ විට කණ්ඩායමේ අය විසින් බලපෑම් කිරීම නිසා කෙසේ හෝ ණය ගෙවීමට පෙළඹවීමක් දැක්විය හැකි ය. මෙම තත්ත්වය නිසා ගොවිජන සේවා මධ්‍යස්ථානයට ණය අය කර ගැනීම පිළිබඳ ඇති අවධානම යම්තාක් දුරකට අඩුවීමක් සිදු වේ. මෙවැනි කණ්ඩායම් ක්‍රමයක් පැවතීම මඟින් සිදු වන්නේ කණ්ඩායමේ පුද්ගලයින් අදාළ ණය සඳහා ඇපවීම වූවත් ඔවුන් ණය ගෙවීම සිදු නො කළ විට චක්‍රලේඛ අනුව නීති මඟින් කටයුතු කළ හැකි නිසා තනි තනිව වුව ද ණය ලබාදීම ප්‍රශ්නයක් නොවන බව නිලධාරීන්ගේ මතය විය. මෙම ණය කණ්ඩායම් ක්‍රමයට ලබාදීමේ දී කණ්ඩායමේ එක් අයෙකු හෝ ණය නො ගෙවූ විට සියළුම ණය මුදල් පියා වූ අත් සාමාජිකයන්ට ද ණය ලබා ගත නො හැකිවීම මත ඔවුන් ගොවි බැංකුවෙන් දුරස්ථ වී වෙනත් බැංකුවලට යොමුවීම සිදු වේ. එසේ ම, රිදීමාලියද්ද වැනි අති දුෂ්කර ප්‍රදේශයක ජීවත් වන ගොවීන් වසම්වල ඉතා දුරින් විසිරී සිටීම මත ඔවුන්ට කණ්ඩායමක් ලෙස එකට එකතු වී වැඩ කිරීමට ඇතැම් අවස්ථාවල දී අපහසු වේ. මෙවැනි හේතු මත බහුතරයක් ගොවීන් කණ්ඩායම් ක්‍රමයට ඇති අකමැත්ත නිසාම ගොවි බැංකුව මඟින් ණය ලබා ගැනීමට නො පෙළඹෙන තත්ත්වයක් දැක ගත හැකි විය.

### 3.10.8 ණය සීමාවන්

රිදීමාලියද්ද ගොවි බැංකුව මඟින් වගා ණය ලෙස මේ දක්වා එක් ගොවියෙකුට උපරිම ලෙස ලබා දෙන්නේ රු. 10,000/-ක් පමණි. චක්‍රලේඛ අනුව රු. 25,000/- ක් දක්වා ලබාදිය හැකි වූවත් මෙම ප්‍රදේශයේ ගොවීන්ගේ ආර්ථික තත්ත්වය හා ණය ගෙවීමේ හැකියාව සලකා බලා ලබාදෙන ණය මුදල රු. 10,000ක් දක්වා සීමා කර තිබේ. වී වගාවේ දී ගොවීන්ට වැය වන පිරිවැය සමඟ සසඳා බැලීමේ දී මෙම ණය මුදල ප්‍රමාණවත් නොවන බවත්, වී අක්කරයක් සඳහා රු. 10,000/ - 15,000/-ක් අතර මුදලක්වත් ණය වශයෙන් ලබාදීම උචිත බවත්, මහා වාරි මාර්ගයන් යටතේ වගා කටයුතුවල නිරත වන ගොවීන් සමඟ සාකච්ඡාවේ දී හෙළිදරව් විය. මෙම ලබා දෙන ණය මුදල බීජ, රසායනික ද්‍රව්‍ය ආදිය ලබා ගැනීමට වියදම් කළ විට වගාවේ සෙසු කටයුතු සඳහා එනම් බිම් සකස් කිරීමේ සිට අස්වැන්න නෙළීම දක්වා වන කටයුතු සඳහා ප්‍රමාණවත් නොවන බව එම ගොවීහු පැවසූ හ. සිය පවුලේ ශ්‍රමය භාවිතය හා අත්තම් ක්‍රමයට වැඩ කිරීම මඟින් වගා වියදම අඩු කර ගැනීමට ග්‍රාමීය මට්ටමින් ගොවිතැන් කරන ඇතැම් අය පෙළඹී සිටියත්, වෙනත් රැකියාවල නිරතවන පුද්ගලයෙකුට අවශ්‍ය ශ්‍රමය පිටතින් මිල දී ගැනිමට සිදු වූවහොත් ණය මුදල ප්‍රමාණවත් නොවේ.

### 3.10.9 ගොවි බැංකුවෙ හි වර්තමාන ප්‍රගතිය/දුර්වලත්වය සඳහා බලපෑ සාධක

2001 වර්ෂය තුළ ආරම්භ කරන ලද මෙම ගොවි බැංකුව සමඟ ගනු දෙනු කරන ගොවීන් ආර්ථික අතින් තරමක දුෂ්කරතාවලින් පෙළෙන්නෝ වෙති. ඔවුන් ගෙන් ඇතැම් අය ගොවිතැනට අමතරව කුලී වැඩ, ආරක්ෂක අංශය, ඇඟළුම් ක්ෂේත්‍රය වැනි අංශවල රැකියාවල යෙදී සිටිති. ප්‍රදේශයේ පවතින දැඩි ජල හිඟය මෙම ගොවීන්ගේ වගා කටයුතු සඳහා ප්‍රබල බාධාවක් ව පවතී. එමනිසා, ගොවීහු මහ කන්නයේ වගා කටයුතු කිරීම සඳහා පමණක් ගොවි බැංකුව මඟින් ණය ලබා ගනිති. යල කන්නය තුළ අස්වනු පිළිබඳව විශ්වාසයක් තැබිය නො හැකි නිසා එම කන්නය තුළ ගොවීන් ණය ලබා ගැනීමට නො පෙළඹේ. එසේ ම, වසම්වල රාජකාරී කටයුතු කරන කෘ.ප.නි.ස. වරුන් ද ණය නිකුත් කිරීමේ දී ගොවීන්ගේ ණය ආපසු ගෙවීමේ හැකියාව පිළිබඳව විමසිලිමත් වෙති. එසේ නැවත

ණය ආපසු පියවීමේ අවදානමක් ඇති ගොවීන්ට ණය ලබාදීමට එම නිලධාරීහු මැලිකමක් දක්වති.

ගොවි බැංකු මගින් එක් ගොවියෙකුට ලබා දෙන උපරිම වගා ණය ප්‍රමාණය රු. 10,000/-ක මුදලක් දක්වා සීමා කර තිබෙන්නේ එම ප්‍රදේශයේ ගොවීන් අස්වනු ලබා ගැනීමේ දී දැඩි අවදානමකට මුහුණ දී ඇති බැවිනි. මෙම ගොවිජන බැංකු මගින් ගොවීන්ගේ අවශ්‍යතාවය අනුව ද්‍රව්‍යමය ලෙස හෝ මුදලින් ණය ලබා දේ. මෙම ප්‍රදේශයේ ප්‍රවාහන දුෂ්කරතාවය නිසා ගොවීන්ට පිටතින් කෘෂි රසායන ද්‍රව්‍ය මිල දී ගෙන එමට අපහසු බැවින් ගොවිජන සේවා අලෙවි සැලෙන් මිල දී ගැනීමට කැමති ගොවීන්ට තමන් ලබා ගන්නා ණය මුදලට ද්‍රව්‍ය මිල දී ගැනීමටත්, මුදලින් ණය ලබා ගැනීමට අවශ්‍ය ගොවීන්ට එසේ මුදලින් ණය ලබාදීමටත්, මෙම බැංකුව මගින් පියවර ගෙන තිබේ. එසේ වුවද, ගොවි බැංකුව තම ගොවීන්ට අවශ්‍ය කෘෂි රසායන ද්‍රව්‍ය, කෘමි නාශක, වල් නාශක ආදිය මිල දී ගන්නේ පෞද්ගලික කඩවල්වලින් සුළු ප්‍රමාණයන්ගෙන් බැවින් එහි දී ගොවීන්ට අඩු මිලට ද්‍රව්‍ය ලබාදීමට හැකියාවක් අලෙවි සැලට නැත. කෙසේ වූව ද, ගොවීන්ගේ ඉල්ලීම් සලකා බලා නම්‍යශීලීව ණය ලබාදීමට පියවර ගැනීම හොඳ ප්‍රවණතාවයක් ලෙස සැලකිය හැකි ය.

මෙම ප්‍රදේශයේ ඇතැම් කෘ.ප.නි.ස.වරුන්ගෙන් නැවත ණය අය කර ගැනීම සඳහා ලැබෙන සහයෝගය ප්‍රමාණවත් නොවන බව දැකිය හැකි ය. එසේ වුවද, ඇතැම් කෘ.ප.නි.ස.වරුන් වඩාත් උනන්දුවෙන් හා කැපවීමෙන් කටයුතු කරමින් ගොවීන් දැනුවත් කිරීමටත්, කණ්ඩායම් ගත කර ගොවි බැංකුව වෙත යොමු කිරීමටත්, කන්න රැස්වීම්වල දී ණය අවශ්‍යතා හඳුනා ගෙන අවශ්‍ය ගොවීන්ට ණය ඉල්ලුම්පත් ලබා දී, එම ඉල්ලුම්පත් පිරවීම සඳහා සහාය වී, අනතුරුව ඒවා මධ්‍යස්ථානයට ම ගෙනැවිත් භාරදීමට කටයුතු කරනු දැකිය හැකි ය. මෙම තත්ත්වය අරළුපිටිය වැනි වසම්වල වඩාත් හොඳින් දැක ගත හැකි වූ අතර එවැනි කැපවීමක් සහිත නිලධාරීන් සිටින ප්‍රදේශවල ගොවි බැංකුව සමඟ ගොවීන් ගනු දෙනු කිරීම හා නැවත ණය ආපසු ගෙවීම ඉහළ මට්ටමක පවතිනු දැකිය හැකි ය.

මෙම ප්‍රදේශයේ ණය ආපසු අය කර ගැනීමේ හැකියාව පිළිබඳව සොයා බලා එක් ගොවියෙකුට රු. 10,000/-ක් වැනි උපරිම ණයක් ලබාදීමට පියවර ගෙන ඇතත්, සාර්ථකව දිගටම ණය ගෙවූ ගොවීන්ට එය ප්‍රමාණවත් නොවන නිසා ඔවුන් ඊට වඩා ණය ලබා ගත හැකි වෙනත් මාර්ගවලට යොමුවීම දැකිය හැකි ය. විශේෂයෙන් ම මහා වාරි බල ප්‍රදේශයන් යටතේ සිටි ගොවීන්ටත් අනෙක් අයට සාපේක්ෂව විශාල ඉඩම් ප්‍රමාණයක් වගා කරන ගොවීන්ටත් වගාව සඳහා විශාල මුදලක් අවශ්‍ය නිසා දැනට පනවා ඇති ණය සීමාව ගැටලුවක්ව පවතී.

එසේ ම, මෙම ප්‍රදේශයේ යටිතල පහසුකම් දුර්වල තත්ත්වයක පැවතීම මත නිෂ්පාදන අලෙවි කර ගැනීම සඳහා ගොවීන්ට විශාල වශයෙන් ගැටළු මතු වී ඇත.

තව ද, ඇතැම් වසම්වල වපසරිය විශාලවීමත්, ප්‍රවාහන පහසුකම් නොමැතිවීමත් නිසා එම ප්‍රදේශවල රාජකාරිවල නිරත කෘ.ප.නි.ස.වරුන්ට ණය අය කර ගැනීමේ දී දුෂ්කරතාවලට මුහුණදීමට සිදුවීම ගොවි බැංකුවේ ප්‍රගතිය සඳහා බාධකයක් ව තිබේ. ගොවීන්ගේ ආර්ථික මට්ටම පහළ අගයක පැවතීම හා ප්‍රදේශයේ යටිතල පහසුකම් අවමවීම මත මෙම ගොවි බැංකුව මගින් ලබාදෙන මුළු ණය ප්‍රමාණය සීමා කිරීමට සිදු වී තිබේ.

## 3.10.10 සංවර්ධනයට බලපාන නීතිමය හා වෙනත් ගැටලු

රිදීමාලියද්ද ගොවිජන බැංකුව මගින් ගොවීන්ට ණය අවශ්‍යතා සැපයීමේ දී එහි ක්‍රියාකාරීත්වය සඳහා බලපාන ගැටළු කිහිපයක් නිරීක්ෂණය කළ හැකි විය. ඇතැම් ඒවා

එම ගොවි බැංකුවට පමණක් සුවිශේෂී වූ ඒවා වන අතර තවත් සමහරක් පොදුවේ ගොවි බැංකු ක්‍රියාත්මක කිරීමේ දී පැන නැඟී ඇති ගැටළු ලෙස හඳුනා ගත හැකි ය.

වගා ණය වශයෙන් චක්‍රලේඛ අනුව ගොවියකුට උපරිම රු. 25,000/-ක් දක්වා ලබා දිය හැකි වූවත් මෙම ගොවි බැංකුව මඟින් ලබාදෙන උපරිම මුදල රු. 10,000/-ක් වීම ගොවීන්ගේ වගා වියදම් සමඟ සැසඳීමේ දී ප්‍රමාණවත් නොවන්නකි.

ව්‍යාපෘති ණය ලෙස රු. 25,000/-ක් ලබා දීමට හැකි වූවත් එය ගොවිජන සේවා කමිටුව විසින් අනුමත කොට දිස්ත්‍රික් ගොවිජන සේවා සහකාර කොමසාරිස් අනුමත කළ යුතු ය. එසේ වුව ද, මේ සඳහා රිදීමාලියද්දේ සිට ඉතා අධික දුරක් ගෙවා බදුල්ල දිස්ත්‍රික් ගොවිජන සේවා කාර්යාලයට යා යුතු අතර එය අනුමත වීම සඳහා මාස 2ක කාලයක් ගත වේ. මේ නිසා ගොවීන් එවැනි ණය සඳහා නැඹුරුවීමක් සිදු නොවේ. වතුර පොම්ප, ට්‍රැක්ටර් ආදිය සඳහා විශාල ඉල්ලුමක් ඇතත්, ගොවීන්ගේ අවශ්‍යතා සපුරාලීමට මේ නිසා බාධා ඇති වේ.

ගොවි බැංකුව මඟින් බිත්තර වී, බඩඉරිඟු, කෘමිනාශක, වල් නාශක ආදී ද්‍රව්‍ය ණය ලෙස ගොවීන්ට ලබාදීමට තීරණය කොට තිබේ. මෙහි දී, ගොවීන්ට අවශ්‍ය සියළුම රසායනික ද්‍රව්‍යයන් ගොවිජන සේවා අලෙවි සැල මඟින් සැපයීම සිදු නොවේ. ගොවීන්ගේ අවශ්‍යතා විවිධ නිසා ඒ සෑම ද්‍රව්‍යයක්ම ගොවිජන සේවා කමිටුව මඟින් මිල දී ගත නො හැකි ය.

එසේ ම, අවට වෙළෙඳුන්ගෙන් මෙම කෘෂි රසායන ද්‍රව්‍ය සුළු ප්‍රමාණවලින් මිල දී ගන්නා නිසා එහි දී ලැබෙන වට්ටම අඩු බැවින් ගොවියාට නිකුත් කිරීමේ දී ලබා දිය හැකි වට්ටම ද ඉතා අඩු ය. ඇතැම් විට බාහිර වෙළෙඳපොළට වඩා වැඩි මිලක් ගෙවීමට ද ගොවියාට සිදු වේ. මේ නිසා ගොවියාට මුදලින් ණය සැපයුවහොත් ඔහුට අවශ්‍ය ද්‍රව්‍ය මීට වඩා අඩු මිලකට ලබා ගැනීමට හැකියාව ඇතත් මෙම ප්‍රදේශයේ ගමනාගමන කටයුතුවල දී ගොවියාට දැරීමට සිදුවන දුෂ්කරතාවය නිසා මෙම රසායනික ද්‍රව්‍ය සඳහා වැඩි මිලක් දැරීමට ගොවියාට සිදු වේ.

මෙම ප්‍රදේශයේ පවතින අධික දුෂ්කරතාවය නිසා මෙහි සේවයට පැමිණෙන නිලධාරීන් කලින් කලට මාරුවී යාමත්, ගොවි බැංකුවේ කටයුතු සඳහා නිසි දැනුමක් සහිත නිලධාරියෙකු නො සිටීමත්, ගිණුම් තැබීම සඳහා ප්‍රමාණවත් පුහුණුවක් මෙම ගොවි බැංකුවල නිලධාරීන්ට නො තිබීමත්, ගොවි බැංකුවේ සේවය කරන නිලධාරීන්ට දැරීමට සිදුවන ගමන් වියදම හා වෙනත් වියදම් සඳහා ප්‍රමාණවත් මුදලක් නොගෙවීම නිසා ඔවුන්ට තම සේවය නිසි පරිදි සැපයීම සඳහා ප්‍රධාන බාධකයන් ව පවතී. මෙම ගොවි බැංකුව සඳහා වෙනම නිලධාරියෙක් අනුයුක්ත කර නොමැති අතර මෙහි රාජකාරී කරන්නේ ද කෘ.ප.නි.ස.වරයෙකි. ක්ෂේත්‍රයේ රාජකාරී කරන කෘ.ප.නි.ස.වරුන්ට වෙනත් දීමනා ආදිය හිමි වුව ද ගොවිජන බැංකුවේ සේවය කරන නිලධාරීන්ට එම දීමනා හිමි නොවන බැවින් ඔවුන් අධෛර්යට පත්ව සිටීම ගැටළුවකි.

ගොවි බැංකු මඟින් ණය ලබා ගැනීම සඳහා ගොවියා ලබා ගන්නා අදාළ ණය මුදලින් 10%ක කොටස් මිල දී ගෙන තිබිය යුතු නිසාත්, මෙම කොටස් නැවත වෙනත් කෙනෙකුට අලෙවි කිරීමට හෝ ආපසු ලබා ගැනීමට නොහැකි නිසාත්, ගොවීහු මෙම බැංකු ක්‍රමයට දායකවීමට මැලිකමක් දක්වති. ඒ මඟින් තම මුදල් අනවශ්‍ය ලෙස හිරවීමකට ලක්වන බව ඔවුන්ගේ අදහසයි.

මෙම ප්‍රදේශයේ වසම් ඉතා දුරින් පිහිටා තිබීම නිසාත්, ඇතැම් වසම් ගොවිජන බැංකුවට අධික දුරකින් පිහිටා තිබීම නිසාත්, ගොවීන්ට ණය ලබා ගැනීමට යාමේ දී ඒ සඳහා සම්පූර්ණ දිනයක් ගත වේ. මෙම ගොවීන් ණය ආපසු ගෙවීම සඳහා පෙළඹවීම එම කොට්ඨාසයේ කෘ.ප.නි.ස. ගේ රාජකාරියක් වූවත් ඇතැම් නිලධාරීන්ගෙන් ඒ සඳහා

ප්‍රමාණවත් සහායක් නො ලැබෙන බව වාර්තා විය. එසේ ම, ගොවිජන බැංකුවෙන් ණය ලබාදීමේ දී ප්‍රාදේශීය සංවර්ධන නිලධාරී විසින් අනුමැතිය ලබාදිය යුතු නිසා ඔහුට ක්ෂේත්‍රයේ වෙනත් රාජකාරී අධික දිනවල ගොවීන් ණය ලබා ගැනීමට පැමිණියහොත් ණය ලබා ගැනීමට නො හැකි වේ.

මෙම ප්‍රදේශයේ ඇති වෙනත් බැංකුවලින් (උදා: ඌව සංවර්ධන බැංකුව, සමෘද්ධි බැංකුව, ගැමිදිරිය ගොවීන්ට ගොවි බැංකුවේ පොලියට වඩා අඩු පොලියකට වැඩි ණය මුදලක් ලබා ගත හැකි වීමත්, ගොවි බැංකුවෙන් ලබාදෙන මුදල වගා කටයුතු සඳහා ප්‍රමාණවත් නොවීමත්, ගොවි බැංකුව මඟින් කණ්ඩායම් ක්‍රමයට ණය ලබාදීම නිසා කණ්ඩායමේ එක් අයෙකු ණය නො ගෙවූ විට ඉතිරි අයටත් ණය ලබා ගත නො හැකිවීමත් යන කරුණු ඇතැම් ගොවීන් ගොවිජන බැංකුවෙන් ඈත් කරවීමට හේතු වී තිබේ.

මෙම ප්‍රදේශයේ යල කන්නයේ වගා කටයුතු සඳහා ජල හිඟය ප්‍රධාන ගැටළුවක් ව පවතින බැවින් එම කන්නය තුළ වගා කටයුතු කිරීම අවම මට්ටමකින් සිදු වේ. එම නිසා, අස්වැන්න පිළිබඳ සහතික කළ නොහැකි නිසා යල කන්නයේ දී ගොවීන්ට වගා ණය සැපයීමට කෘ.ප.නි.ස. වරු ඉදිරිපත් නොවෙති. එසේ ම, මෙම ප්‍රදේශයේ වගා කරන වී, අළු කෙසෙල්, දෙහි, බඩ ඉරිඟු හා වෙනත් එළවළු වර්ග අලෙවි කර ගැනීම සඳහා සුදුසු වෙළෙඳපොළක් නොමැති බැවින් ගොවීන්ට තම අස්වැන්න සාධාරණ මිලකට විකුණා ගත නො හැකිවීම ඔවුන්ට හොඳ ආදායමක් ලබා ගැනීම සඳහා බාධාවක් ව පවතී. එසේ ම, මෙම ගොවීන්ට අධික අස්වැන්නක් ඇති කාලයට ඒවා අලෙවි කර ගත නො හැකි නිසාත්, ගොවීන්ට ගොවි බැංකුවෙන් ලබාගත් ණය මුදල හෝ නිසි කාලයට ආපසු ගෙවීමට නො හැකි වේ.

ගොවි බැංකුව ගොවිජන මධ්‍යස්ථානය තුළ පිහිටුවා ඇති ආයතනයක් වන අතර එය ස්වාධීන ආයතනයක් ලෙස සලකා ක්‍රියා කිරීමට යොමු වී නැත. ගොවි බැංකුවේ විවිධ කටයුතු සඳහා වැය කිරීමට සිදුවන පරිපාලන වියදම්, ලිපි ද්‍රව්‍ය ආදිය සඳහා වූව ද වියදම් සිදු කරන්නේ ගොවිජන සේවා කම්ටුව මඟිනි. මේ තත්ත්වය එහි කටයුතු පුළුල් කිරීම සඳහා මෙන් ම එය තිරසාරව පවත්වාගෙන යාමට බාධාවකි.

තව ද, වෙනත් බැංකු ආයතනවල මෙන් මෙහි තැන්පත් කරන මුදල් ගොවීන්ට අවශ්‍ය අවස්ථාවල දී ලබා ගත නො හැකිවීම නිසා ගොවීන් මුදල් තැන්පත් කිරීම සඳහා එතරම් කැමැත්තක් නො දැක්වීම මෙහි අරමුදලේ ශක්තිමත් බව ඉහළ නැංවීමට බාධකයක්ව පවතී.

### 3.10.11 යෝජනා

1. ගොවීන්ට ලබා දෙන ණය මුදල ඉහළ නැංවීම: මෙහි දී වගා කරන බෝගය අනුව හා ගොවීන්ගේ ණය අවශ්‍යතා අනුව ලබා දෙන ණය ප්‍රමාණය වැඩි කළ යුතු ය. උදා: වී වගාව සඳහා අක්කරයකට රු. 10,000 – 15,000 වත් ණය ලබා දීම.
2. කණ්ඩායම් ක්‍රමය මඟින් බහුතරයක් ගොවීන්ට තම ණය ලබා ගැනීමේ අවස්ථා ඇහිරී යන නිසා කණ්ඩායම් ක්‍රමය මඟින් ණය ලබා ගැනීමට අකමැති ගොවීන්ට තනි තනි පුද්ගලයින් වශයෙන් ණය ලබා ගැනීමට අවස්ථාව සලසා දීම.
3. ගොවීන්ගේ අවශ්‍යතාවය අනුව මුදලින් හෝ ද්‍රව්‍යමය වශයෙන් ණය ලබා ගැනීමට අවස්ථාව ලබාදීම.
4. ගොවීන්ට තම තැන්පත් මුදල් අවශ්‍ය අවස්ථාවල දී ඉක්මණින් ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීම.

5. ගොවිජන බැංකුවට අදාළ පරිපාලන හා වෙනත් වියදම් එම බැංකු මඟින් ම දැරීමට හැකිවන පරිදි එය ගොවිජන සේවා මධ්‍යස්ථානය තුළම ස්වාධීන ඒකකයක් ලෙස පවත්වාගෙන යාම.

6. ගොවිජන බැංකුවල කළමනාකරුවන් වශයෙන් ඒ පිළිබඳ දැනුම ඇති නිලධාරීන් දෙදෙනෙකුවත් පත් කළ යුතු අතර දැනට සිටින නිලධාරීන්ට අවශ්‍ය ගිණුම් පුහුණුව, පරිගණක පුහුණුව ආදිය ලබාදීම හා ඔවුන්ට බැංකුව පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සලසාදීම.

7. ගොවි බැංකුවේ කටුයතු පිළිබඳ නිසි ඇගයීමක් හා අධීක්ෂණයක් සිදු කිරීමත්, ණය ආපසු අය කර ගැනීම සඳහා මනා පසු විපරමක් සිදු කිරීමත් අවශ්‍ය වේ.

8. ගොවි බැංකුවේ ණය යෝජනා ක්‍රමය පිළිබඳව ගොවීන් දැනුවත් කිරීම හා ණය ආපසු අය කර ගැනීම සඳහා කෘ.ප.නි.ස. වරුන් දිරිමත් කිරීමට ගොවි බැංකුවේ ලාභයෙන් යම් දීමනාවක් ඔවුන්ට හා ගොවි බැංකුවේ කටයුතු කරන නිලධාරීන්ට ගෙවීමට ක්‍රමයක් සකස් කිරීම කළ යුතු ය.

9. ගොවි බැංකුවේ තැන්පත් කරන කොටස් මුදල් ගොවීන්ට ආපසු ලබා ගැනීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කළ යුතු ය. එසේ ම, යන්ත්‍රෝපකරණ ආදිය මිල දී ගැනීම සඳහා අවශ්‍ය කරන ණය ප්‍රමාණයෙන් 10%ක කොටස් මිල දී ගැනීමට ගොවීන්ට සිදුවීමත්, එහි දී එකවර විශාල මුදල් ප්‍රමාණයක් කොටස් වශයෙන් තැන්පත් කිරීමෙන් පසු එය නැවත ලබා ගත නො හැකි වීමත්, ගොවි බැංකුවේ ණය කටයුතු පුළුල් කිරීමට බාධකයකි. එම නිසා, මෙවැනි විශාල කොටස් මුදල් කොටස් වශයෙන් තැන්පත් කිරීම වෙනුවට එයින් යම් නිශ්චිත ප්‍රමාණයක් ඉතිරි කිරීමේ ගිණුමකට බැර කිරීමට අවස්ථාව ලබාදිය යුතු ය.

10. ගොවි බැංකුවෙන් ණය ලබාගත් ගොවීන් අලෙවි ගැටළුවලට මුහුණ පෑ අවස්ථාවන්හි දී එම නිෂ්පාදන විකුණා ගැනීමට සහාය දීම හෝ අස්වනු ගබඩා කිරීම සඳහා තවත් ණය සැපයීමෙන් සහාය දීම වැනි කාර්යයන් ද ගොවි බැංකුවේ ණය වැඩපිළිවෙළ සමඟ ඒකාබද්ධව සිදු කළ යුතු ය.

පුස්තකාලය
LIBRARY
ගෙ.කො.ගො.ප.පු.ආ
HARTI

# සිව්වැනි පරිච්ඡේදය

# සන්සන්දනාත්මක ප්‍රගතිය

## 4.1 හැඳින්වීම

මෙම පරිච්ඡේදය මඟින් අධ්‍යයනය යටතේ තෝරාගත් ගොවි බැංකු සම්බන්ධයෙන් සිදු කරනු ලැබූ සිද්ධි අධ්‍යයන තුළින් කළ සොයාගැනීම් හා අත්දැකීම් පිළිබඳව පොදුවේ සාකච්ඡාවට ලක් කරනු ලැබේ. ඒ අනුව, ගොවි බැංකු සඳහා ගොවීන් දායක කරගැනීම, ඉතුරුම් වර්ධනය, ප්‍රාග්ධනය ගොඩනැඟීම, විවිධාකාරයේ වූ ණය නිකුත් කිරීම හා අයකර ගැනීම යනා දී කරුණු කෙරෙහි අවධානය යොමු කරනු ලබන අතර ඒ යටතේ එකිනෙක ගොවි බැංකු සංසන්ධනාත්මකව විමර්ශනයට ලක් කෙරේ.

## 4.2 ගොවීන් දායක කරගැනීම

අධ්‍යයනයට ලක් කළ ඒ ඒ ගොවි බැංකුව විසින් ඒවායේ සාමාජිකයින් ලෙස (කොටස් හිමියන් ලෙස) ගොවීන් දායක කර ගැනීම හා සම්බන්ධ විස්තර 4.1 වගුව මඟින් ඉදිරිපත් කොට ඇත. එසේ සාමාජිකයින් ලෙස දායක කරගත් ගොවීන් ප්‍රමාණය ප්‍රදේශයේ පදිංචි ගොවීන්ගේ මුළු ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් ලෙස ගත්විට එය ගොවි බැංකුවෙන් ගොවි බැංකුවට බෙහෙවින් විචලනය වන බවක් දක්නට ලැබේ. උදාහරණ ලෙස වැඩිම ගොවීන් ප්‍රතිශතයක් බඳවාගත් යටවත්ත ගොවි බැංකුවෙ හි 69%ක් හා අඩුම ප්‍රතිශතයක් දායක කරගත් ඉපලෝගම ගොවි බැංකුවෙ හි 4%ක් වශයෙන් පෙන්නුම් කෙරේ. එසේ වුව ද, බොහොමයක් ගොවි බැංකුවල ප්‍රදේශයේ ගොවීන් දායක කර ගැනීමේ ප්‍රතිශතය 20% - 30% අතර ප්‍රමාණයක් ලෙස වාර්තා විය.

**වගු අංක 4.1: ගොවි බැංකු මඟින් 2009 වර්ෂය අවසාන වනවිට ඒවාට ගොවීන් දායක කරගැනීම**

| ගොවි බැංකුව | බල ප්‍රදේශයේ ගොවි පවුල් සංඛ්‍යාව | කොටස් මිල දී ගත් සාමාජික ගණන | බල ප්‍රදේශයේ ගොවි පවුල් වල ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|
| යටවත්ත | 3,079 | 2,128 | 69.11 |
| බොරලන්ද | 5,083 | 1,206 | 23.73 |
| රිදීමාලියද්ද | 7,324 | 1,238 | 16.86 |
| ඉළුක්කුඹුර | 578 | 203 | 35.12 |
| මැදිරිගිරිය | 12,794 | 2,435 | 19.03 |
| මතම්පිටිය | 12,532 | 1,540 | 12.29 |
| ඇලයාපත්තුව | 3,278 | 716 | 21.84 |
| ඉපලෝගම | 10,773 | 388 | 3.60 |
| තබ්බෝව | 2,622 | 705 | 26.89 |
| මහකුඹුක්කඩවල | 5,833 | 1,340 | 22.97 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු.ආයතනය

ගොවි බැංකු සාමාජිකත්වය ලබා නො ගත් ගොවීන් ආශ්‍රයෙන් කළ නියැදි අධ්‍යයනයේ මත විමසීමට අනුව (4.2 වගුව) මෙසේ ගොවීන්ගෙන් වැඩි ප්‍රමාණයක් ගොවි බැංකුවෙ හි සාමාජිකත්වය ලබා නො ගැනීමට ප්‍රධාන හේතුන් වී ඇත්තේ ගොවි බැංකු හා සම්බන්ධ ගැටලු නිසා ය. එවා නම් ගොවි බැංකුවක් මඟින් ලබාදෙන ණය ප්‍රමාණවත් නොවීම, ගොවි බැංකුවෙ හි සේවාවන් හා එහි ප්‍රයෝජන පිළිබඳව පැහැදිලි දැනුමක් නැතිකම, ගොවි බැංකුව මඟින් ණය ලබාදීමේ ක්‍රමයට ඇති අකමැත්ත හා කණ්ඩායම් ගතවීම සඳහා ඇති අපහසුතාව (සුදුසු විශ්වාසවන්ත අය සොයා ගැනීමට ඇති අපහසුව) වැනි කාරණා ය. ගොවි බැංකු සාමාජිකයින් නොවන ගොවීන් නියෝජනය කළ නියැදියෙහි සිටි සියයට 70ක් ම එයට නො බැඳීම සඳහා බලපෑ හේතුන් ලෙස මෙම කාරණා ඉදිරිපත් කළ හ. එසේ වුව ද, ආරම්භයේ පටන් ම ගොවිජන බැංකු කටයුතුවලට සම්බන්ධ වූ ප්‍රාදේශීය නිලධාරී හා මධ්‍යස්ථාන ලිපිකරු වැනි අයගේ උනන්දුව නිසා ඇතැම් ගොවි බැංකු වෙත ඉහළ සාමාජික ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීමට සමත්ව ඇත. ඉදුක්කුඹුර වැනි දුෂ්කර ප්‍රදේශයක පිහිටි ගොවි බැංකුවකට ද ඉහළ සාමාජික ප්‍රමාණයක් (35%) ආකර්ෂණය කර ගැනීමට හැකි වී ඇති අතර ඒ සඳහා ප්‍රදේශයේ අඩු ගොවි ජනගහනයක් සිටීම නිසා පමණක් නොව, සිටින ජනතාව වුව ද වෙනත් ණය ලබාගැනීමේ හා කෘෂි ද්‍රව්‍ය ලබාගැනීමේ අඩු පහසුකම් මැද ගොවි බැංකුවේ ඇති වැදගත්කම ඔවුන් විසින් අවබෝධ කර ගැනීම තුළ එයට සම්පවීම ඒ සඳහා හේතු වී ඇති බව අධ්‍යයනයේ දී නිරීක්ෂණය විය.

ගොවි බැංකුවල දිගුකාලීන සාමාජිකත්වය පිළිබඳව සලකා බලන විට 2008 වසරින් පසුව සියළු ගොවි බැංකුවල සාමාජිකත්ව ප්‍රමාණයේ අඩුවීමක් අත්දැකිය හැකි ය. එයට ප්‍රධාන හේතුවක් වී ඇත්තේ රජය මඟින් පොහොර සහනාධාරය ලබාදීම ය. කලින් පොහොර සඳහා අධික මුදලක් වැය වූ අතර එය සහනදායී ලෙස හා පහසුවෙන් ණයට ලබාගැන්ම සඳහා ගොවි බැංකුව මත යැපුනු ගොවීන්ට පොහොර සහනාධාරය යටතේ තමන් අත පවත්නා මුදලින් හා දැරිය හැකි මිලකට ගම වෙතම පොහොර ලබාදීමේ ක්‍රමයක් බිහිවීම නිසා පොහොර සඳහා තවදුරටත් ගොවි බැංකු ණය මත රැඳීම අවශ්‍ය නොවී ය.

**වගු අංක 4.2: ගොවි බැංකුවෙ හි සාමාජිකත්වය ලබා නො ගැනීමට හේතු**

| | හේතු | ගොවීන් සංඛ්‍යාව (N=100) | ප්‍රතිශතය |
|---|---|---|---|
| 1 | ඉන් ලබාදෙන ණය ප්‍රමාණවත් නොවීම | 30 | 30 |
| 2 | ගොවි බැංකුවේ සේවාවන් හා එහි ප්‍රයෝජන පිළිබඳ පැහැදිලි දැනුමක් නැතිකම | 28 | 28 |
| 3 | ණය ලබාගැන්මට ඇති බිය හා අකමැත්ත | 15 | 15 |
| 4 | ණය ලබාදීමේ ක්‍රමය පිළිබඳව ඇති අකමැත්ත හා කණ්ඩායම් ගතවීමේ අපහසුතාව | 12 | 12 |
| 5 | ණය අවශ්‍යතාවක් නො තිබීම | 08 | 08 |
| 6 | වෙනත් මාර්ගවලින් ණය ලබාගැනීමට යොමුව සිටීම හා එම මාර්ග පහසුවීම | 05 | 05 |
| 7 | වෙනත් | 02 | 02 |
| | **එකතුව** | 100 | 100 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු.ආයතනය

## 4.3 තැන්පතු වර්ධනය හා ප්‍රාග්ධනය ගොඩනැඟීම

ගොවිජන බැංකු තුළ ආරම්භක අවධියේ අමාත්‍යාංශයෙන් ලබාදෙනු ලැබූ ප්‍රාග්ධනය මෙන් ම ඒවා විසින්ම කොටස් අලෙවි කර ගොඩනැගූ ප්‍රාග්ධනය යන දෙ ආකාර වූ ප්‍රාග්ධනයක් පවතී. අධ්‍යයනයට තෝරාගත් යටවත්ත බැංකුව පමණක් 2009 වනවිට පිටතින් ලබාදුන් ප්‍රාග්ධනය ගෙවා අවසන් කොට තිබුණි. 2010 වසරේ දී, මැදිරිගිරිය ඇතුළු තවත් බැංකු කිහිපයක් පිටතින් ලැබුණු ආරම්භක ප්‍රාග්ධනය ගෙවා අවසන් කොට ඇත.

**වගු අංක 4.3: ගොවි බැංකු විසින් 2009 වර්ෂය අවසාන වනවිට ප්‍රාග්ධනය ගොඩනැඟීම**

| ගොවි බැංකුව | මූලික ප්‍රාග්ධනය (රු..) | කොටස් ප්‍රාග්ධනය (රු.) | මුළු තැන්පතු වටිනාකම (රු.) | සමුච්චිත අරමුදල (රු.) | සංචිත වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|
| යටවත්ත | *** | 573050 | 443,103 | 1,084,820 | 2,100,973 |
| බොරලන්ද | 2,000,000 | 910,750 | 734,014 | 1,971,100 | 5,615,864 |
| රිදීමාලියද්ද | 1,400,000 | 472,132 | 377,322 | 3,351,814 | 5,601,268 |
| ඉළුක්කුඹුර | 675,000 | 68,750 | 116,490 | 221,619 | 1,081,859 |
| මැදිරිගිරිය | 7,000,000 | 1,616,321 | 9,067,958 | 2,606,178 | 20,290,457 |
| මනම්පිටිය | 3,900,000* | 256,900 | 3,584,614 | 3,064,015 | 10,805,529 |
| ඇලයාපත්තුව | 1,000,000 | 207,100 | 571,653 | 1,225,414 | 3,004,168 |
| ඉපලෝගම | 1,075,000 | 411,117 | 591,317 | 508,689 | 2,586,123 |
| තබ්බෝව | 1,062,455 | 583,370 | 386,670 | 1,402,240 | 3,434,735 |
| මහකුඹුක්කඩවල | 500,000 | 722,200 | 420,182 | 453,396 | 2,095,779 |

*** රු. 1400000 මූලික ප්‍රාග්ධනය ගෙවා අවසන් කර ඇත.
* 2007 වර්ෂයේ දී රු. 100,000/- ක වූ මූලික ප්‍රාග්ධනය ගෙවා ඇත.
මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු.ආයතනය

ඒ ඒ ගොවි බැංකු සතු ප්‍රාග්ධන ගොඩනැඟීම් දැක්වෙන වගු අංක 4.3ට අනුව, මැදිරිගිරිය ගොවි බැංකුව මිලියන 1.6ක පමණ ඉහළ වූ කොටස් ප්‍රාග්ධනයක් ගොඩනගා ඇති බව පෙනේ. බොරලන්ද, යටවත්ත, මහකුඹුක්කඩවල හා තබ්බෝව යන බැංකු ද රුපියල් ලක්ෂ 5 ඉක්මවා යන ප්‍රමාණයක කොටස් අරමුදල් ගොඩනගා ඇත. මෙම ගොවි බැංකු ප්‍රදේශ බොහොමයක් වී වගාව මෙන් ම එළවළු ඇතුළු අනෙකුත් කෘෂි බෝගයන් ද වාණිජ මට්ටමෙන් සිදු කරන ප්‍රදේශයන් වන අතර කොටස් අරමුදල් ගොඩනැඟීම සඳහා එය ද ඉවහල් ව තිබේ.

තැන්පත් ගොඩනැඟීම් හා සම්බන්ධයෙන් සලකා බලනවිට මැදිරිගිරිය ගොවි බැංකුව කැපී පෙනෙන පරිදි ඉතා ඉහළ ප්‍රගතියක් අත් කරගෙන ඇති බව දක්නට ලැබේ. රුපියල් දශලක්ෂ 9 ඉක්මවා යන මුදලක් එම ගොවි බැංකුවෙ හි ඉතුරුම් තැන්පතු ලෙස වාර්තා වේ. එම ගොවි බැංකුව මඟින් ප්‍රාග්ධන අරමුදල් හා මෙම ඉතුරුම් සමඟින් රුපියල් කෝටියක ස්ථාවර තැන්පතුවක් ද (ලංකා බැංකුවෙ හි) පවත්වාගෙන යනු ලැබේ. මෙතරම් ඉහළ මුදලක් ඉතිරි කිරීමට හැකි වී ඇත්තේ ක්‍රමවත් සැලැස්මක් අනුව සෑම සාමාජිකයකු මෙන් ම කුඩා කණ්ඩායමක් ම නොකඩවා ඉතිරි කිරීම් සඳහා පෙලඹවීම ය. එම බැංකුවෙ හි සෑම සාමාජිකයකුම සෑම කන්නයක් අවසානයේ ම (මාස 6 කට වරක්) රු. 1000ක මුදලක්

ඉතිරි කළ යුතු ය යන පොදු තීරණයකට පැමිණ තිබේ. ඒ අනුව, හොඳින් ඉතුරුම් කරන ගොවි සංවිධානවල සාමාජිකයින් මේ වනවිට රු. 30,000/- ඉක්මවා යන මුදලක් ඉතිරි කොට ඇත. වී වගාව ඉහළ මට්ටමෙන් වාණිජ වගාවක් ලෙස කිරීමත්, බොහෝ ගොවීන් සාපේක්ෂව තරමක ලොකු ඉඩම්වල වගා කටයුතු සිදු කිරීමත් තුළින් ලැබෙන ඉහළ ආදායම ද මේ සඳහා රුකුලක් වී ඇත. බොරලන්ද, ඇලයාපත්තුව වැනි ගොවි බැංකුවල ලක්ෂ 5 ඉක්මවා යන මුදලක් ද, යටවත්ත හා මහකුඹුක්කඩවල යන ගොවි බැංකුවල ලක්ෂ 4 ඉක්මවා යන මුදලක් ද ඉතුරුම් තැන්පතු ලෙස ඇති බව දැක් වේ. රිදීමාලියද්ද හා ඉලුක්කුඹුර වැනි ගොවි බැංකු අඩු ඉතුරුම් තැන්පතු සහිත බැංකු ලෙස වාර්තා වූ අතර අඩු යටිතල පහසුකම් හා සම්පත් ඇති කෘෂිකර්මය වඩාත් යැපුම් මට්ටමකින් කරගෙන යන ජනතාවක් ඇති එවන් ප්‍රදේශ ඉතුරුම් සඳහා පෙළඹවීමට ඇති අපහසුව ද ඒ සඳහා බලපා තිබේ.

## 4.4 ණය ලබාදීම

අධ්‍යයනයට ලක් කළ ගොවි බැංකු විසින් තම සාමාජිකයින් සඳහා 2009 වසර තුළ දී ලබාදුන් ණය පිළිබඳව වගු අංක 3.3 හි දැක් වේ. ඒ අනුව, මැදිරිගිරිය ගොවි බැංකුව 2009 වර්ෂයේ දී රු. ලක්ෂ 79ක් වැනි ඉහළ වටිනාකමක් ඇති ණය ගොවීන්ට ලබා දී ඇත. ගොවීන් වැඩි ප්‍රමාණයක් ගොවි බැංකුවට දායක කරගැනීමත්, යල සහ මහ කන්න දෙකේදී ම වගා ණය ලෙස කන්නයක දී ලබාදිය හැකි උපරිම ණය මුදල වන රු. 25,000/- බොහෝ ගොවීන්ට ලබාදීමත්, වැඩි කුඹුරු ප්‍රමාණයක් වගා කරමින් ඒවායේ විවිධ කාර්යයන් හි නියැලි කාර්යබහුල ගොවීන්ට යෙදවුම් සපයාගැනීම වෙනුවෙන් කාලය වැය කිරීම අපහසු නිසා ගොවි බැංකුව මඟින් ණයට යෙදවුම් ලබාදීම වඩාත් පහසුවක් ලෙස සැලකීම හේතුවෙන් ඔවුන් ගොවි බැංකු ණය වෙත වඩාත් ආකර්ෂණය වීම මෙන් ම එම ගොවීන්ට කෘෂි උපකරණ හා අස්වනු නෙලීමේ ණය ද, එම ගොවි බැංකු මඟින් ලබා දී ඇති බැවින් ලබා දී ඇති ණය ප්‍රමාණය අනෙක් ගොවි බැංකු වලට වඩා ඉහළ අගයක් ගනී. තම සංචිත වලින් 40%කට ආසන්න ප්‍රමාණයක් ණය ලෙස ලබා දී ඇති එම ගොවි බැංකුව 2009 වසරේ දී ගොවීන් 598කට ණය ලබා දී තිබේ. එම ප්‍රමාණය ගොවි බැංකුවෙ හි සාමාජිකයින්ගෙන් 25%ක් නියෝජනය කෙරේ.

**වගු අංක 4.4: ගොවි බැංකු විසින් 2009 වර්ෂය තුළ නිකුත් කළ ණය පිළිබඳ විස්තර**

| ගොවි බැංකුව | ණය මුදල | | ගොවීන් ගණන | |
|---|---|---|---|---|
| | නිකුත් කළ මුළු ණය මුදල (රු.) | සංචිත වල ප්‍රතිශතයක් ලෙස (%) | ණය නිකුත්කළ ගොවීන් ගණන | මුළු සාමාජිකයින්ගේ ප්‍රතිශතයක් ලෙස (%) |
| යටවත්ත | 2,229,881 | 106.14 | 126 | 5.92 |
| බොරලන්ද | 2,091,418 | 37.24 | 141 | 11.69 |
| රිදීමාලියද්ද | 1,707,825 | 30.49 | 226 | 18.26 |
| ඉළුක්කුඹුර | 217,681 | 20.12 | 42 | 20.69 |
| මැදිරිගිරිය | 7,960,191 | 39.23 | 598 | 24.56 |
| මනම්පිටිය | 134,228 | 1.24 | 12 | 0.78 |
| ඇලයාපත්තුව | 2,167,000 | 72.13 | 96 | 13.41 |
| ඉපලෝගම | 2,906,198 | 112.38 | 192 | 49.48 |
| තඹබෝව | 3,581,546 | 104.27 | 344 | 48.79 |
| මහකුඹුක්කඩවල | 3,228,687 | 154.06 | 509 | 37.99 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු.ආයතනය

වී වගාව වඩාත් ප්‍රමුඛ ප්‍රදේශයන් හි පිහිටි තඹිබෝව හා මහකුඹුක්කඩවල ගොවි බැංකු මඟින් ද පිළිවෙලින් ලක්ෂ 35 හා 32 යනාදී ලෙස අදාළ වර්ෂයේ දී ණය ලබා දී ඇත. මෙම ගොවි බැංකු දෙක ඇතුළු තවත් ගොවි බැංකු එනම් යටවත්ත ගොවි බැංකුව හා ඉපලෝගම ගොවි බැංකුව ණය ලෙස ලබාදිය හැකි සංචිත වල වටිනාකමට වඩා වැඩි ප්‍රමාණයක් ණය ලෙස ලබා දී තිබේ. තඹිබෝව හා මහකුඹුක්කඩවල ගොවි බැංකු මඟින් ණය ලබා දී ඇති ගොවීන් ප්‍රමාණය පමණක් නොව ඔවුන්ගේ ප්‍රතිශතය ද වඩාත් ඉහළ මට්ටමක පවතී. එම ගොවි ප්‍රතිශතය මැදිරිගිරියටත් වඩා ඉහළින් තිබේ. එනම්, පිළිවෙලින් 49% හා 38% වශයෙනි. එම ගොවි බැංකු ණය ලබාදීම සඳහා පමණක් නොව අය කරගැනීම සඳහා වඩාත් ක්‍රියාශීලීව කටයුතු කිරීම ණය ලබාදීම සම්බන්ධයෙන් ඉහළ ප්‍රගතියක් පවත්වාගෙන යාමට රුකුලක් වී තිබේ. එසේ ම, ඉපලෝගම වැනි ගොවි බැංකුවක් ණය නිකුත් කළ ගොවීන්ගේ ප්‍රතිශතය අනෙකුත් බොහෝ ගොවි බැංකුවලට වඩා ඉහළ මට්ටමක් ලෙස පෙන්නුම් කරන අතර එයට හේතු වී ඇත්තේ එහි ඇති අඩු සාමාජිකයින්ගේ ප්‍රමාණයයි. එනම්, ප්‍රදේශයේ ගොවීන්ගෙන් 4%කට ආසන්න ප්‍රමාණයක් පමණක් සාමාජිකයින් කර ගැනීම හා ඔවුන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයකට ණය ලබාදීම නිසා ණය ලබාගත් අයගේ ප්‍රතිශතය ඉහළ ගොස් ඇත.

## 4.5 නිකුත් කළ ණය වර්ග

ඒ ඒ ගොවි බැංකු විසින් 2009 වර්ෂය තුළ දී නිකුත් කළ ණය, ලබා දී ඇති කාර්යයන් හා සම්බන්ධයෙන් ඇති තොරතුරු පිරික්සා බැලීමේ දී පැහැදිළි වන්නේ බොහොමයක් ගොවි බැංකු ගොවි ණය පමණක් හෝ තවත් එක් වර්ගයක හෝ දෙ වර්ගයක ණය ලබාදීම පමණක් කෙරෙහි අවධානය යොමු කර ඇති බව යි. ඒ අනුව, මනම්පිටිය, ඉලුක්කුඹුර හා ඇලයාපත්තුව යන ගොවි බැංකු 100%ක් ම ගොවි ණය පමණක් නිකුත් කොට තිබුණි (වගු අංක 4.5). එසේ වුව ද, බොරලන්ද ගොවි බැංකුව පමණක් වගා ණය වලට අමතරව එමඟින් ලබාදුන් අනෙකුත් ණය වර්ග, හතරක් දක්වා ව්‍යාප්ත කොටගෙන ඇත.

**වගු අංක 4.5: ගොවි බැංකු විසින් 2009 වර්ෂය තුළ නිකුත් කළ ඒ ඒ වර්ගයේ ණය මුළු ණය වටිනාකමේ ප්‍රතිශතය**

| ගොවි බැංකුව | ණය වර්ග | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | වගා ණය (%) | ව්‍යාපෘති ණය (%) | ක්ෂණික ණය (%) | කෘෂි උපකරණ ණය (%) | අස්වනු තෙළීමේ ණය (%) | ගොවි සංවිධාන ණය (%) | එකතුව |
| යටවත්ත | 51.18 | 48.82 | - | - | - | - | 100 |
| බොරලන්ද | 50.23 | 32.55 | 2.15 | 0.72 | - | 14.34 | 100 |
| රිදීමාලියද්ද | 85.66 | - | 4.98 | 9.36 | - | - | 100 |
| ඉළුක්කුඹුර | 100.00 | - | - | - | - | - | 100 |
| මැදිරිගිරිය | 98.69 | - | - | 0.74 | 0.57 | - | 100 |
| මනම්පිටිය | 100.00 | - | - | - | - | - | 100 |
| ඇලයාපත්තුව | 100.00 | - | - | - | - | - | 100 |
| ඉපලෝගම | 79.35 | 20.65 | - | - | - | - | 100 |
| තඹිබෝව | 81.85 | 18.15 | - | - | - | - | 100 |
| මහකුඹුක්කඩවල | 89.93 | 10.07 | - | - | - | - | 100 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු.ආයතනය

බොරලන්ද ගොවි බැංකුව මෙන් ම යටවත්ත ගොවි බැංකුව ද ලබාදුන් ණය වල වටිනාකමෙන් වගා ණය ලෙස ලබාදුන් ප්‍රමාණය පිළිවෙලින් 50% හා 51%ක් ලෙස තබා ගැනීමට සමත් වී ඇති අතර ඉතිරි ණය වලින් පිළිවෙලින් එම බැංකු 33%ක් හා 49%ක් ව්‍යාපෘති ණය ලෙස ලබා දී තිබේ. තඹබෝව හා මහකුඹුක්කඩවල ගොවි බැංකු විසින් බෝග වගා හා ආශ්‍රිත කටයුතු වලට සීමා නොවී කිරි හරක් කර්මාන්තය, කජු මද සැකසීම වැනි ප්‍රදේශයේ වෙනත් ආර්ථික කටයුතු හා බද්ධ වෙමින් ව්‍යාපෘති ණය ලබාදීමට ක්‍රියා කර තිබුණි.

## 4.6 ණය අය කරගැනීම

ගොවි බැංකු විසින් ණය අය කරගැනීම හා සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කෙරෙන වගු අංක 4.6 ට අනුව අධ්‍යයනයට ලක්කල ගොවි බැංකු 10 න් 6ක් ම 90% ට වඩා වැඩි ණය ප්‍රමාණයක් අය කරගෙන ඉහළ ප්‍රගතියක් වාර්තා කොට ඇත. මෙයින් ඉහළ කළමනාකරණයක් ඇති මැදිරිගිරිය ගොවි බැංකුවෙ හි 97%ක ණය අය කරගැනීමේ ප්‍රගතියක් ද තඹබෝව ගොවි බැංකුවෙ හි 99%ක ප්‍රගතියක් ද දක්නට විය. විශේෂයෙන් ම, වාර්ෂිකව ණය අයකර ගැනීම අතින් පුත්තලම් දිස්ත්‍රික්කයෙ හි ගොවිජන බැංකු වඩාත් ඉදිරියෙන් ඇති බව අධ්‍යයනයේ දී වාර්තා විය.

**වගු අංක 4.6: ගොවි බැංකු විසින් 2009 වර්ෂයේ ලබාදුන් ණය අයකර ගැනීමේ ප්‍රතිශතය**

| ගොවි බැංකුව | අය කරගත් ණය වටිනාකම (රු.) | අය කරගත් ණය ප්‍රමාණය ලබාදුන් ණයවල ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|
| යටවත්ත | 1,643,209 | 73.69 |
| බොරලන්ද | 1,453,055 | 69.48 |
| රිදීමාලියද්ද | 991,321 | 58.05 |
| ඉළුක්කුඹුර | 199,759 | 91.77 |
| මැදිරිගිරිය | 7,665,412 | 97.02 |
| මතම්පිටිය | 124,103 | 62.46 |
| ඇලයාපත්තුව | 2,028,036 | 93.59 |
| ඉපලෝගම | 2,414,666 | 83.09 |
| තඹබෝව | 3,540,311 | 98.85 |
| මහකුඹුක්කඩවල | 2,948,916 | 91.33 |

මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු.ආයතනය

ණය වැඩසටහන පිළිබඳව ඉහළ කළමනාකාරීත්වය විසින් (දිස්ත්‍රික්කයේ ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්තුමා විසින්) පසු විපරමට ලක් කිරීම හා නියමිත අවස්ථාවේ දී ගොවීන්ට ණය ගෙවීම සඳහා මතක් කර ලිපි යැවීම මෙන් ම කෘ.ප.නි.ස.වරුන් ලවා ණය අයකරවා ගැනීමට ඔවුන්ව උනන්දු කිරීම මෙහි සාර්ථක භාවයට හේතු වී ඇති බව දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා බිම් මට්ටමේ නිලධාරීන් සමඟ කළ සාකච්ඡාවන්ගෙන් පැහැදිලි විය.

පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

## 4.7 දුප්පත්කම සඳහා බලපෑම

තියැදි සමීක්ෂණයට අනුව ගොවි බැංකුවෙන් ණය ලබාගත් එහි සාමාජික ගොවීන් පදිංචි ප්‍රදේශ හා ඔවුන් වගා කළ ඉඩම් ප්‍රමාණයන් සලකා බැලීමේ දී ඉතා පැහැදිළිව පෙනී ගිය දෙයක් වූයේ ඔවුන් බොහොමයක් වෙනත් බැංකු හා මූල්‍ය පහසුකම් නොමැති දුෂ්කර ප්‍රදේශවල පදිංචි අය පමණක් නොව ඇප ලෙස තැබිය හැකි දේපල නොමැති ඉතා කුඩා ඉඩම්වල වගා කළ දුප්පත් අය බවයි. ඔවුන් වගා කළ ඉඩම්වල ප්‍රමාණය දැක්වෙන වගු අංක 4.7 මඟින් එය තවදුරටත් පැහැදිලි වෙයි. එම වගුවට අනුව, ඔවුන්ගෙන් 40%ක් ම අක්කර 2 සහ ඊට වඩා අඩු ඉඩම් වගා කළ අය වන අතර 64%ක් ම අක්කර 3 සහ ඊට අඩු ඉඩම් වගා කළෝ වෙති. අක්කර 4 සහ ඊට වඩා වැඩි ප්‍රමාණයේ ඉඩම්වල වගා කළ අය 36%ක් පමණ සිටිය ද ඔවුන්ගෙන් වැඩි ප්‍රමාණයක් අද, බදු හෝ උකස් ඉඩම්වල වගා කළ අය වෙති.

**වගු අංක 4.7: ගොවි බැංකු ණය ලබාගත් ගොවීන්, වගා කරන ඉඩම් ප්‍රමාණය අනුව බෙදීයාම**

| අක්කර ප්‍රමාණය | ගොවීන් සංඛ්‍යාව (N=70) | ප්‍රතිශතය (%) |
|---|---|---|
| අක්කර 1 සහ 1ට අඩු | 9 | 12.86 |
| අක්කර 2 සහ 1ට වැඩි | 19 | 27.14 |
| අක්කර 3 සහ 2ට වැඩි | 17 | 24.29 |
| අක්කර 4 සහ 3ට වැඩි | 7 | 10.00 |
| අක්කර 5 සහ 4ට වැඩි | 11 | 15.71 |
| අක්කර 5ට වැඩි | 7 | 10.00 |

මූලාශ්‍රයː සමීක්ෂණ දත්ත වාර්තා, 2011, හෙ.කො.ගො.ප.පු.ආයතනය

ඉලුක්කුඹුර, රිදීමාලියද්ද වැනි දුෂ්කර ගම්මාන සහිත ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයන්හි දී ලැබිය හැකි වූ එක් අත්දැකීමක් වූයේ වී ගොවිතැන පාරම්පරික මෙන් ම යැපුම් කටයුත්තක් ලෙස කරනු ලබන ගම්මානයන් හි වැසියන් ගොවි බැංකු ණය ලබාගැනීම තුළින් තම ආයෝජන අවශ්‍යතා සපුරා ගනු ලබන බවයි. මෙම වැසියන්ට පහසුවෙන් කෘෂිද්‍රව්‍ය ලබාගත හැකි තැන් නොමැති අතර දේපල හෝ වෙනත් ඇපයන් නොමැති ව බැංකු ණය ලබා ගැනීමට ද හැකියාවක් නො පවතී. ගොවිජන බැංකුවෙන් කණ්ඩායම් ඇප යටතේ ගොවි ණය ලෙස යෙදවුම් ද්‍රව්‍යයන් ලබා ගන්නා ඔවුන්ට එය මහත් අස්වැසිල්ලකි. මෙසේ ලබාගනු ලබන ණය ඇතැම් ගොවීන් ආපසු ගෙවනු ලබන්නේ යල කන්නයේ දී තම කුඹුරුවල වගා කරනු ලබන වාණිජ බෝග වගා කිරීමෙන් ලබන ආදායමෙනි. එසේ වුව ද, ඇතැම් ගොවීන් එය ආපසු ගෙවනු ලැබූවේ කුලී ශ්‍රමිකයින් ලෙස වැඩ කර ලබන ආදායමෙනි. විශේෂයෙන් ම, වඩාත් දුෂ්කර ප්‍රදේශයක් වූ රිදීමාලියද්ද ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ ඇකිරියන්කුඹුර ප්‍රදේශයෙන් එවැනි ගොවීන් විශාල ප්‍රමාණයක් වාර්තා විය. ඇතැම් හු ගොවි බැංකු ණය ගෙවීම සඳහා සති දෙකක් පමණ කොළඹ ප්‍රදේශයේ ශ්‍රමිකයන් ලෙස සේවය කොට සිටිය හ. එමෙන් ම, සාකච්ඡාවන්ගෙන් පැහැදිලි වූ තවත් කරුණක් වූයේ ඉලුක්කුඹුර වැනි මහත් දුෂ්කර ප්‍රදේශයක වූ ගොවි බැංකුවක් යටතේ පාරම්පරික වී වගාවෙ හි නියැලි මුල්ගම වැනි ගම්වල වැසියන් තම වී වගාවෙහි ණය අවශ්‍යතා සපුරා ගැනීමේ මාර්ගයක් ලෙස ගොවි බැංකු ප්‍රයෝජනයට ගන්නා පමණක් නොව, ලබාගත් තම ණය එම කන්නයේම ගෙවීම සඳහා ආදායම් ප්‍රමාණවත් නොවූ බැවින් ඒ සඳහා ඊළඟ කන්නයේ (මහ කන්නය) වගා කළ වාණිජ බෝගයන් හි ආදායම පවා උපයෝගී කර ගන්නා බවයි. ගොවි බැංකුව මෙසේ දුප්පත් ගොවීන්ගේ ආහාර සුරක්ෂිතතාවය හා දුප්පත්කම නැති කිරීම සඳහා අගනා සේවයක් ඉටු කරමින් සිටින බව මෙයින් තහවුරු විය.

# පස්වන පරිච්ඡේදය

# සොයා ගැනීම්, නිගමන හා නිර්දේශ

## 5.1 හැඳින්වීම

ග්‍රාමීය ගොවි ජනතාවගේ ණය අවශ්‍යතා සැපිරීම සඳහා පිහිටුවනු ලැබූ වසර 10කට වැඩි කාලයක් තුළ ක්‍රියාත්මක වූ ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතියෙ හි ක්‍රියාකාරී ප්‍රගතිය සහ අපේක්ෂිත අරමුණු සපුරා ගැනීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා සිදු කළ මෙම අධ්‍යයනය මඟින් කළ සොයා ගැනීම්, නිගමන හා යෝජනා මෙම පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරේ.

## 5.2 සොයා ගැනීම්

1. කොටස් මිල දී ගැනීම් හා ඉතිරි කිරීම් සඳහා පෙළඹවීම, සාමාජිකත්ව වර්ධනය, ණයදීම, අයකර ගැනීම හා පිටතින් ලැබුණු ප්‍රාග්ධන අරමුදල් ආපසු පියවීම, මෙන් ම ස්වශක්තියෙන් නැඟී සිටීම සම්බන්ධයෙන් මැදිරිගිරිය, යටවත්ත ඇතුළු සීමිත වූ ගොවි බැංකු ප්‍රමාණයක් වඩාත් ඉදිරියෙන් සිටින අතර ඒ සඳහා ඒවා කළමනාකරණය කළ නිලධාරීන්ගේ කළමනාකරන දක්ෂතා මෙන් ම ඒ සඳහා සහාය දෙන කෘ.ප.නි.ස. වරුන් ඇතුළු අනෙකුත් නිලධාරීන්ගේ උනන්දුවත් ප්‍රදේශයේ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ඇති විභවතාව මෙන් ම ගොවීන්ගේ සමාජ ආර්ථික තත්ත්වයත් බලපා තිබේ.

2. දිගුකාලීන ක්‍රියාකාරීත්වය සලකා බැලීමේ දී, බොහෝ ගොවි බැංකුවල සාමාජිකත්ව වර්ධනයේ ඇණහිටීමක් හෝ අඩුවීමක් ද, කොටස් නිකුත් කිරීම හා ඉතුරුම් වර්ධනයෙ හි මන්දගාමී තත්ත්වයක් ද, ගොවි ණය නිකුත් කිරීමෙ හි අඩුවීමක් ද දැකිය හැකි වූ අතර ණය අයකර ගැනීමේ ඉහළ ප්‍රගතියක් දක්නට ලැබුණි. සාමාජිකත්ව වර්ධනයේ අඩුවීම සඳහා 2005 වසරේ සිට පොහොර සහනාධාරය ලබාදීම නිසා ගොවි බැංකු ණයවල වැදගත්කම අඩුවීම බෙහෙවින් බලපා ඇති අතර ණය අයකර ගැනීමේ ඉහළ ප්‍රගතිය සඳහා නො ගෙවන ණය සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම හා ගෙවීමට උනන්දු කිරීම බලපා ඇත.

3. ගොවිජන බැංකු වැඩසටහන මඟින් ප්‍රතිලාභ ලබන්නන් (ගොවි බැංකුවෙ හි සාමාජිකයින්) අදාළ බල ප්‍රදේශයේ ගොවීන්ගෙන් 20%ත් - 30%ත් අතර ප්‍රමාණයක් වන අතර ඉන් වැඩි ප්‍රමාණයක් අඩු පහසුකම් ඇති හුදකලා ගම්මානවල සිටින ඉතා කුඩා ඉඩම්ලාභීහු වෙති. එබැවින්, ඔවුන්ගේ දිළිඳුභාවය නැති කිරීම සඳහා ඉන් සැලසෙන සේවාව ඉතා අගය කළ යුතු ය.

4. සෑම ස්ථානයකම නැතත් අදාළ ප්‍රදේශයේ කෘ.ප.නි.ස. ඇතුළු ගොවි බැංකුවෙහි නිලධාරීන් වඩාත් කාර්යක්ෂම ලෙස කටයුතු කරන ස්ථානයන් හි ගොවීන්ට තමන් ඉල්ලුම් කළ ණය මුදල ලබා ගැනීමට පමණක් බැංකුවට යාම මඟින් එය සපුරා ගත හැකි නිසා ගොවි බැංකුව වඩාත් අඩු වියදමක් හා අඩු කාලයක් වැය කිරීමෙන් ණය ලබාගත හැකි ආයතනයක් බව තහවුරු විය.

5. ගොවීන්ගෙන් 70%-80%ක් අතර ප්‍රමාණයක් ගොවි බැංකුවෙ හි සේවා ලබාගැනීමට පෙළඹී නොමැත්තේ (සාමාජිකත්වය ලබා නොමැත්තේ) එමඟින් සපයන සේවාවන් හා එහි ප්‍රතිලාභ පිළිබඳ නො දැනුවත්භාවය නිසා (28%)පමණක් නොව, එමඟින්

සපයනු ලබන වගා ණය ප්‍රමාණය ප්‍රමාණවත් නොවීම (30%), ඒවා ද්‍රව්‍ය වශයෙන් ලබා ගැනීමට ඇති අකමැතිභාවය, ණය ලබාගැනීමට ඇති බිය (15%) හා ණය ලබා ගැනීම සඳහා අවශ්‍යතාවක්ව පවතින කණ්ඩායම් ක්‍රමය කෙරෙහි ඇති අකමැත්ත (12%) පමණක් නොව එහි ඉතිරි කරනු ලබන මුදල් පහසුවෙන්, ඉක්මණින් හා මුදලින් ආපසු ගැනීමට නො හැකිවීම යනා දී හේතු නිසා ය.

6. බොහොමයක් ප්‍රදේශවල වී වගාවේ දී අස්වනු නෙළීමේ අවස්ථාව දක්වා අක්කරයක වගාවක් පවත්වා ගැනීම වෙනුවෙන් රු. 15,000/-ක පමණ මුදලක් වැය වූවත්, ඒ සඳහා නීතිරීති අනුව ගොවිජන බැංකුවෙන් ලබාදිය හැක්කේ රු. 5,000ක මුදලක් නිසාත්, බොහෝ ගොවි බැංකු අස්වනු නෙළීමේ ණය ලබාදීමට කටයුතු නො කරන නිසාත් ඒ සඳහා යන වියදම ද මුල දී ලබා දෙනු ලබන රු. 5,000 න් ආවරණය කර ගැනීමට අපහසු බැවින් දැනට දෙනු ලබන එම මුදල් ප්‍රමාණය වී වගාව සඳහා ප්‍රමාණවත් නොවේ. වැඩි වී අක්කර ප්‍රමාණයක් වගා කරන ගොවියෙකුට වූව ද වගා ණය ලෙස ලබා ගත හැකි උපරිම මුදල වන රු. 25,000 ඒ සඳහා ප්‍රමාණවත් නොවේ. අර්තාපල්, ලොකු ළූණු, හා මිරිස් වැනි නිෂ්පාදන වියදම (අක්කරයක් සඳහා) රු. ලක්ෂය ඉක්මවා යන බෝග සඳහා ද වගා ණය ලෙස උපරිම වශයෙන් ලබාගත හැක්කේ රු. 25,000ක මුදලක් නිසා එම ණය සීමාව වර්තමානයට නො ගැලපේ. එය කිසිසේත් ම ප්‍රමාණවත් නොවන බව අධ්‍යයනයට ලක් කළ ගොවි බැංකු ණය ලබාගත් සාමාජිකයින්ගෙන් 83%ක් සඳහන් කළ හ.

7. ගොවි බැංකුවට අදාළ චක්‍රලේඛවලට අනුව නිකුත් කරනු ලබන ණය සම්පූර්ණයෙන් ම හෝ 80%ක ප්‍රමාණයක් බිත්තර වී, පොහොර, කෘමිනාශක වැනි ද්‍රව්‍යවලින් නිකුත් කළ යුතු වන අතර එසේ කිරීමේ දී ඉහළ කොමිස් යටතේ එම ද්‍රව්‍ය විශේෂයෙන් ම කෘමිනාශක වඩාත් ලාභදායී මුදලකට ගොවීන්ට බාහිර වෙළෙඳසැල්වලින් ලබා ගැනීමට ඇති අවස්ථාව අහිමි වන බව පෙනේ. සුළු ප්‍රමාණයන්ගෙන් එම ද්‍රව්‍ය මිල දී ගනු ලබන ගොවිජන බැංකුවට ඒ සඳහා ලැබෙන්නේ අඩු කොමිස් මුදලක් නිසා ගොවීන්ට වැඩි වාසියක් ලැබෙන පරිදි ලබාදීම අපහසු ය. එබැවින්, වෙළෙඳසැල් කරා පහසුවෙන් ගමන් කළ නො හැකි මාතලේ – ඉලුක්කුඹුර බදුල්ල - රිදීමාලියද්ද වැනි ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයන් හි දුෂ්කර ප්‍රදේශවල ගොවීන් හැරුණු විට අන් ගොවීහු ද්‍රව්‍යවලින් ණය ලබා ගැනීම කෙරෙහි කැමැත්තක් නො දක්වති. මේ පිළිබඳ මත විමසුමකට ලක්කළ ගොවි බැංකු සාමාජිකයින්ගෙන් 47%ක් ද ඒ සඳහා අකමැත්ත පළ කළ හ.

8. ගොවි බැංකු නීතිරීති අනුව ණය ලබා ගැනීමේ මූලික අවශ්‍යතාවයක්ව පවතින කණ්ඩායමේ අවශ්‍යතා සපුරාලීම සම්බන්ධයෙන් ද ගොවීන් බොහොමයක් මහත් අපහසුතාවයන්ට ලක් වන නිසා ඔවුන් තුළ ඒ පිළිබඳ කැමැත්තක් නො පවතී. කණ්ඩායම් ණය ක්‍රමය යටතේ එක් අයෙකු ණය නො ගෙවූ විට කණ්ඩායමේ අනෙක් සාමාජිකයන්ට ණය ලබා ගැනීමට නො හැකි නිසා මෙන් ම ව්‍යාපෘති ණය යටතේ ඉහළ ණය ප්‍රමාණයක් ලබාගැනීමට යාමේ දී කණ්ඩායම් ගිණුමේ ලබාගන්නා ණය මුදලින් 25%කට සමාන ප්‍රමාණයක් තිබිය යුතු බැවින් එය සපුරාලීමට අන් සාමාජිකයින් පොළඹවා ගැනීම හැම විටම ප්‍රායෝගික කටයුත්තක් නොවේ. එබැවින්, ගොවීන් තුළ ඒ සඳහා අකැමැත්තක් පවතී. සමීක්ෂණයට භාජනය කළ ගොවි බැංකු ණය ලබාගත් සාමාජිකයන්ගෙන් 37%ක් ඒ සඳහා අකැමැති බව ප්‍රකාශ කළ හ.

9. ගොවි බැංකු මගින් ණය වර්ග හයක් හඳුන්වා දී තිබුණ ද බොහෝ ගොවි බැංකු වගා ණය හා ව්‍යාපෘති ණය ලබාදීමට පමණක් සීමා විය.

10. අස්වනු තෙළීමේ ණය පමණක් නොව, අස්වනු සුරකීමේ ණය ද වඩාත් සාර්ථක ලෙස ක්‍රියාත්මකභාවයට පත් කළ හැක්කේ සෑම ගම් ප්‍රදේශයකටම කෘ.ප.නි.ස. වැනි බිම් මට්ටමේ නිලධාරියෙකු සහිත ගොවිජන බැංකුවට වුවත් මෙම ණය දෙවර්ගයම ලබාදීම සඳහා ඉදිරිපත් වී ඇත්තේ ඉතා සීමිත වූ ගොවි බැංකු ප්‍රමාණයකි. ඒවා වුව ද, ඒ සඳහා මැදිහත්ව ඇත්තේ සුළු වශයෙනි.

11. මහකුඹුක්කඩවල, තබ්බෝව වැනි ඇතැම් ගොවි බැංකුවලට තම සංචිත වටිනාකම අභිබවා ණය ලබාදීමට හැකි වී ඇති අතර සත්ත්ව පාලනය, කජු මද සැකසීම වැනි ප්‍රදේශයට අනුකූල වූ ගොවිපොළ නොවන ආදායම් ව්‍යාපෘති දිරි ගැන්වීම සඳහා ණය සැපයීමට පියවර ගැනීම ඒ සඳහා උදව් වී ඇත.

12. ණය ආපසු අය කර ගැනීම අතින් බොහොමයක් ගොවි බැංකු 90%කට වඩා ඉහළ ප්‍රගති මට්ටමක සිටින අතර පුත්තලම් දිස්ත්‍රික්කයේ ගොවි බැංකු මේ සම්බන්ධයෙන් වඩාත් ඉදිරියෙන් සිටී. ණය අයවීම සම්බන්ධයෙන් නිතර ප්‍රගති සමාලෝචනයට ලක් කිරීම පමණක් නොව, ඒවා අය කර ගැනීම සඳහා අස්වනු නෙළීමත් සමඟ මතක් කිරීම වැනි ක්‍රමානුකූල පියවර ගැනීම මෙම ප්‍රගතියට බලපා තිබේ.

13. ගොවිජන බැංකු ආරම්භයේ සිට මේ දක්වා සුළු ගොවීන්ට සේවා සැපයුම් ආයතනයක් ලෙස සලකා ක්‍රියා කර ඇති අතර ඒවායෙහි මූල්‍යමය ලාභදායී බව හා තිරසාරභාවය පිළිබඳව අවධානය යොමු කොට නොමැත. ඒවායෙ හි එදිනෙදා වියදම් දරන්නේ ද ඒ ඒ බැංකුව පිහිටි ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානයේ ගොවිජන සංවර්ධන කමිටු මගිනි.

14. ගොවි බැංකු කළමනාකරණය සම්බන්ධයෙන් විමසා බැලීමේ දී ඒ සඳහා නිශ්චිත කාර්ය මණ්ඩලයක් නොමැති අතර එය විවිධ අය මාර්ගයෙන් සිදු වෙයි. ඇතැම් ගොවි බැංකු කළමනාකාර ලිපිකරු මගින් ද, ඇතැම් ඒවා ඒ සඳහා අනියුක්ත කරනු ලැබූ කෘ.ප.නි.ස. වරුන් මගින් ද, තවත් ඒවා උපාධිධාරී කළමනාකාර සහකාර වරුන් මගින් ද, පාලනය වෙයි. එසේ වුව ද, එය නියත තනතුරක් නොවන නිසා කෘ.ප.නි.ස. වරුන් වැන්නන් අනෙකුත් කෘ.ප.නි.ස. වරුන්ට ඇති ප්‍රතිලාභ සමඟ සසඳා බලා ගොවි බැංකුව දියුණු කිරීම සඳහා වඩාත් මහන්සි වීමෙන් තමන්ට විශේෂ වාසියක් නො ලැබෙන නිසා ඒ සඳහා උත්සාහයක් නො ගනී.

15. එකිනෙක ගොවිජන බැංකු විසින් ගිණුම් තැබීමේ කටයුතු තමන්ට අභිමත ආකාරයන්ට සිදු කොට ඇති අතර තොරතුරු එකිනෙක හා සැසඳීමට යාමේ දී ඒ සම්බන්ධයෙන් අපහසුතාවක් ඇති වේ. ඇතැම් ගොවි බැංකු සාර්ථකව පරිඝනක භාවිතා කොට ඇති අතර ඇතැම් ඒවා පරිඝනක තිබිය දී වුව ද අදාළ නිපුණතාවය නොමැති නිසා ඒවා භාවිතා නො කරති.

## 5.3 නිගමන

ග්‍රාමීය ගොවි ජනතාවගේ ඉතිරිකිරීම් නැමියාව වර්ධනය කිරීම සඳහාත්, ඔවුන්ගේ ණය අවශ්‍යතා සැපිරීම සඳහාත් උපයෝගී කරගත හැකි ග්‍රාමීය ජනතාවගේම සහභාගීත්වය ඇතිව ගමේ හි ක්‍රියාත්මක වන බැංකුවක් ස්ථාපිත කිරීම ගොවිජන බැංකු පිහිටුවීමෙන් අපේක්ෂා කෙරිණ. එසේ වුව ද, මෙම කාර්යය ඒ ආකාරයෙන්ම ඉටු වී ඇති බවක් නො පෙනුන ද ඇතැම් ප්‍රදේශවල හෝ වඩාත් දුප්පත් ජනතාවට ඵල ප්‍රයෝජන වන ආකාරයේ ආයතනයක් පිහිටුවීමට එය සමත්ව සිටී. විශේෂයෙන් ම වර්තමානයේ එහි ප්‍රයෝජන නොකඩවා ලබාගත්තා පිරිස් වඩාත් දුෂ්කර හා නාගරික ප්‍රදේශ වලින් බැහැර ප්‍රදේශයන් හි ජීවත්වන වාණිජ බැංකු මඟින් ණය ලබා ගැනීම සඳහා සුදුසුකම් නො ලබන හා ඒ සඳහා සුරකුම් ලෙස තැබිය හැකි සුදුසු දේපල නොමැති දුප්පත් ගොවීන් ය. ඔවුන් ඉන් ලබාගන්නා වූ සේවය ඉමහත් බව පෙනේ.

එසේ වුව ද, තරමක් වාණිජ කෘෂිකර්මය දෙසට නැඹුරුවූවන්ට විශේෂයෙන්ම වී වගාවෙන් ඔබ්බට ගිය ගොවීන්ට ඉන් ලැබෙන ප්‍රයෝජනය අඩු බව පෙනේ. වී වගාව සම්බන්ධයෙන් වුව ද වඩාත් වැඩි ඉඩම් ප්‍රමාණයක් (අක්කර තුනට වැඩි) වගා කරන්නන්ට වගා ණය යටතේ ඇති ණය සීමාවන් නිසා ඉහළ ප්‍රතිඵලයක් ලබා ගැනීමට නො හැකි ය. එබැවින්, දැනට වඩාත් දුප්පත් කොටස්වලට සීමා වී ඇති ගොවි බැංකුවෙහි ප්‍රයෝජන වඩාත් පුළුල් වූ ජනතාවක් වෙතට ලබාදීම කෙරෙහි අවධානය යොමුවිය යුතු ය.

ගොවි බැංකුවෙ හි සංවර්ධනය වසර ගණනාවකට ඉහත දී පනවන ලද දැඩි නීතිරීතීන් හා රෙගුලාසීන් මත සීමා වී ඇති බවක් පෙනේ. ඒවා වර්තමානයට ගැලපෙන පරිදි පමණක් නොව, ප්‍රදේශයන්ට උචිත පරිදි ගලපා ගැනීම සඳහා අවස්ථාව පැවතිය යුතු ය. නව තාක්ෂණය හා ආයෝජන අවස්ථා ඔස්සේ ඇති වී ඇති සමාජ නවීකරණයත් සමඟ කාර්ය බහුලත්වය වැනි කාරණා නිසා කණ්ඩායම් කටයුතු වෙනුවෙන් දීර්ඝ කාලයක් වැය කිරීමට නො හැකි වීම යනා දී කරුණු කෙරෙහි ද අවධානය යොමු විය යුතු අතර සුරකුම් ලෙස භාවිතා කළ හැකි වෙනත් ක්‍රමවේදයන් කෙරෙහි ද අවධානය යොමු කළ යුතු ය.

වඩාත් දුප්පත් කොටස්වලට මෙන් ම ඊට ඉහළින් සිටින්නා වූ ස්ථරයට ද ඵල ප්‍රයෝජනයන් වන ආකාරයේ ආයතනයක් බිහි කිරීම තුළින් වඩ වඩාත් ග්‍රාමීය ජනතාව ඒකරාශී කරගත් ශක්තිමත් හා වඩාත් ඵලදායී සේවා සපයන ආයතනයක් බවට ගොවිජන බැංකුව පත් කිරීම ග්‍රාමීය ක්ෂේත්‍රයේ පුනර්ජීවනය සඳහා ඉතා වැදගත් ය.

## 5.4 නිර්දේශ

1. ගොවිජන බැංකුව හා එහි ප්‍රතිලාභ පිළිබඳව ගොවි ජනතාවට පුළුල් අවබෝධයක් ලබාදීම තුළින් ගොවි බැංකුවෙ හි සාමාජිකත්වය මෙන් ම කොටස් හා ඉතුරුම් අරමුදල් වර්ධනය කිරීමට පියවර ගත යුතු ය.

2. වගා ණය සඳහා දෙනු ලබන උපරිම ණය සීමාව බෝග හා ප්‍රදේශ අනුව වෙනස් විය යුතු අතර ට්‍රැක්ටර් සඳහා තෙල් සපයා ගැනීම හෝ කුඹුරු සකස් කරවා ගැනීමේ දී ගෙවීමට සිදුවන ට්‍රැක්ටර් ගාස්තු යනාදිය වෙනුවෙන් දැරීම සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් දිය යුතු ය. පොළොන්නරුව වැනි ප්‍රධාන වාරිමාර්ගවලින් සමන්විත ප්‍රදේශයන් හි එක් ගොවියෙකුට ලබාදෙන වගා ණය ප්‍රමාණය රු. 45,000/-ක උපරිමයකට යටත්ව වී වගා අක්කරයක් වෙනුවෙන් රු. 15,000/-ක මුදලක් ලබා දිය යුතු ය.

3. මහා පරිමාණයෙන් කෘෂිනාශක අලෙවි කරන ගොවි බැංකු ඒවා නියෝජිතවරුන් මාර්ගයෙන් ලබා ගැනීම නිසා ගොවීන්ට 23%ක් වැනි ඉහළ කොමිස් මුදලක් ලබාදීමට හැකි වී ඇතත් සුළු වශයෙන් අලෙවි කරන ගොවි බැංකු පුද්ගලික වෙළෙඳුන්ගෙන් ඒවා මිලට ගෙන අලෙවි කරන නිසා ගොවීන්ට ඒවා ලබාදීමට හැකි වී ඇත්තේ කිසිදු කොමිස් මුදලකින් තොරව ය. ඇතැම් විට, ඒවා පුද්ගලික වෙළෙඳුන්ගේ මිලටත් වඩා වැඩි මිලකට ලබාදීමට සිදුව තිබේ. එසේ වුව ද, ඒවා කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයෙන් හෝ ඒ ඒ දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන කාර්යාල මඟින් දිස්ත්‍රික්කයේ අවශ්‍යතාව සොයා බලා තොග වශයෙන් මිලට ගෙන සියළු ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන අලෙවිසැල් වෙත ලබාදීමට ක්‍රියා කිරීම මඟින් උසස් ප්‍රමිතියකින් යුතුව හා ඉහළ කොමිස් සහිතව සියළු ගොවීන්ට ලබාදීමට හැකියාව ලැබේ.

4. අස්වනු නෙළීමේ දී ණය ලබාදීම සඳහා වෙනත් බැංකුවලට නොමැති විභවතාවක් ගොවිජන බැංකුවට පවතින අතර එහි උපරිම ඵල නෙලා ගත යුතු ය. හැම ගොවි බැංකුවක් ම මේ සම්බන්ධයෙන් උනන්දු කළ යුතු ය.

5. වී සුරකීමේ ණය සඳහා ද ණය දෙන්නාටත්, ලබන්නාටත් අවහිරතාවයකින් තොරව වඩාත් ප්‍රායෝගික ලෙස මැදිහත්වීමේ අවස්ථාව ඇත්තේ ගොවිජන බැංකුවට ය. සුරකීමට තබන්නා වූ වී වල ගුණාත්මක භාවය මෙන් ම ඒවා පිළිබඳව වරින් වර විමසා බැලීමටත්, ඒවා සුරක්ෂිතව ගබඩා කිරීමටත්, නියමිත අවස්ථාවේ දී විකුණා උපරිම මිලක් ලබාගැනීම සඳහා පහසුකම් සැලසීමටත් අවශ්‍ය මඟපෙන්වීම් කිරීමටත්, වැඩි හැකියාවක් ඇත්තේ ග්‍රාමීය මට්ටම නියෝජනය කරන ගොවීන් හා සමීප ඇසුරක් සහිත කෘ.ප.නි.ස. වැනි නිලධාරියෙකු සහිත ගොවි බැංකුවට ය. මේ සම්බන්ධයෙන් ද ඵල නෙලා ගැනීමට ගොවි බැංකුව මැදිහත් විය යුතු ය.

6. කාන්තා හා ළමා ඉතිරි කිරීම් වැනි දේවල් සඳහා අවස්ථාව ඇතත්, හැම ගොවි බැංකුවක් ම ඒ පිළිබඳව අවධානය යොමු කොට නොමැත. ඒ ඔස්සේ ගොවි සමාජයේ විවිධ කණ්ඩායම්වල අවශ්‍යතාවලට සරිලන පරිදි ණය යෝජනා ක්‍රම ආරම්භ කිරීමට හැකියාව පවතී.

7. ගොවි බැංකුව පොහොර හා තෙල් ඇතුළු සීමිත උපකරණ කිහිපයක් පමණක් වෙනුවෙන් ණය ලබාදෙනවා වෙනුවට අවශ්‍ය බීජ, අස්වනු පිරවීමේ ගෝනි යනා දී වර්තමාන කෘෂිකර්මයේ දී වැදගත්වන උපකරණාදිය සොයා බලා ඒවා ද ණයට සපයාදීම දක්වා පුළුල් කළ යුතු ය.

8. ඊට අමතරව, රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය හා අනුබද්ධිතව ණයදීමේ කාර්යයන් ප්‍රචලිත කළ හැකි ය. කාබනික පොහොර නිෂ්පාදනය සඳහා ණය සැපයීම මෙයින් එක් කටයුත්තකි.

9. ගොවි බැංකු තම අරමුදල් නොකඩවා ආයෝජනය කිරීමේ ක්‍රියාමාර්ගයක් ලෙස දැනට සුළු වශයෙන් සිදු කෙරෙමින් පවත්නා වූ කෘෂි පාදක ස්වයං රැකියා සඳහා ණය ලබාදීමෙන් පමණක් ආයෝජන කටයුතුවලින් සාර්ථකත්වයක් අත්කර ගත නො හැකි අතර ඒ සඳහා අදාළ පුහුණුවීම්, අලෙවි මාර්ග සලසාදීම වැනි

ක්‍රියාමාර්ග වෙත ද අවතීරණ විය යුතු ය. මෙහි දී සර්වෝදය සීඩ්ස් වැඩසටහන[1] වැන්නක් ආදර්ශයට ගත හැකි ය.

10. හැම ගොවි බැංකුවකටම ඒවායෙ හි වත්කම් ප්‍රමාණය අනුව අත තබා ගත හැකි මුදල වැඩි කිරීමට පියවර ගත යුතු ය. අඩුම වශයෙන් එක් දිනක දී ගොවීන් පස් දෙනෙකු සමඟවත් මුදලින් ගනුදෙනු කළ හැකි වන ආකාරයට එහි මුදල් පැවතිය යුතු ය. එහි දී රු. 3,000/- හෝ ඊට අඩු මුදල් ප්‍රමාණයක් බැංකු කළමනාකරන සහායක හා කම්ටු ලිපිකරු යන අයගේ අත්සනින් නිකුත් කළ හැකි විය යුතු ය. ගොවිජන බැංකුවට ප්‍රාදේශීය නිලධාරීන්ගේ අනුමැතියෙන් නිකුත් කළ හැකි ණය ප්‍රමාණය රු. 50,000/- දක්වාත්, දිස්ත්‍රික්ක මට්ටමෙන් අනුමැතිය ඇතිව ලබාදිය හැකි ණය ප්‍රමාණය රු. ලක්ෂ 5 දක්වාත් වැඩි කළ යුතු ය.

11. ගිණුම් සැකසීම එකිනෙක ගොවි බැංකු විසින් ඔවුනටම අවේණික ක්‍රම අනුව කරගෙන යන අතර පිළිගත් පොදු ක්‍රමයකට අනුව එය සිදු කිරීම සඳහා හැම බැංකුවක්ම උනන්දු කළ යුතු ය. ඒ සඳහා බැංකුව හා අදාළ නිලධාරීන්ට බැංකුකරණය හා ගිණුම් තැබීම පිළිබඳව විශේෂ පුහුණුවක් දිය යුතු ය. මේ කාර්යය සඳහා පරිගණක තාක්ෂණය ද සම්බන්ධ කරගත යුතු ය.

12. කණ්ඩායම් හි ඇතැම් සාමාජිකයින් ලබාගත් ණය නො ගෙවීම, සාර්ථකව ණය ගෙවා තවත් ණය ලබා ගැනීමෙන් ආයෝජන කටයුතු සිදු කරන වඩාත් කාර්යක්ෂම ගොවීන්ට අවහිරයක් නිසා පුහුණු වැඩසටහන් මඟින් සාමූහිකත්වය හා කණ්ඩායම් හැඟීම් වර්ධනය කිරීමට කටයුතු කිරීම හා ඒ තුළින් ණය ගෙවීමට දිරිගැන්විය යුතු ය.

13. කණ්ඩායම් ක්‍රමය ණය ආපසු ගෙවීම සඳහා පිළිගත් පෙළඹුම් ක්‍රමයක් වූව ද, ඇතැම් සාමාජිකයින්ට මූල්‍යමය අගහිඟකම් නිසා තම ණය පියවීමට නොහැකි වන අතර එය සාර්ථකව ගෙවූ අයට තවත් ණය ලබාගැනීමට අවහිරයක් වේ. එවැනි අවස්ථාවන්හි දී සමූපකාර බැංකු කරන්නාක් මෙන් ඔප්පුවක් වැනි ලියැවිල්ලක් සුරකුමක් ලෙස තබා ගැනීමෙන් කෘ.ප.නි.ස, ගොවි සංවිධානය හා වෙනත් ගොවි බැංකු සාමාජිකයින් එක් අයෙකු හෝ දෙදෙනෙකු හෝ සහතිකවීම මත ණයදීමේ ක්‍රමයක් ඇති කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

14. ගොවිජන බැංකුවෙ හි ලාභයෙන් 20%ක් ගොවිජන සංවර්ධන කාරක සභාවට දිය යුතු ය යන චක්‍රලේඛය ක්‍රියාත්මක කළ යුතු ය. ණය අය කර ගැනීම සඳහා උසාවි යෑම් ආදී කටයුතු වෙනුවෙන් කරනු ලබන වියදම් දැනට දරනු ලබන්නේ කාරක සභාවෙන් බැවින් එසේ ලබන ලාභයෙන් 20%ක් කාරක සභාවට ලබාදීම උචිත වෙයි. එසේ නොමැති නම්, එමඟින් දරන වියදම ආපසු පියවිය යුතු ය.

15. ගොවි බැංකුවට සාමාජිකයින් බඳවා ගැනීම, කුඩා කණ්ඩායම් ගොඩනැඟීම, ඉතිරිකිරීම් සඳහා උනන්දු කරවීම මෙන් ම ණය ලබාදීමේ කටයුතු වෙනුවෙන් කෘ.ප.නි.ස. වරුන්ට ප්‍රවාහනය වැනි කාර්යයන් සඳහා වියදම් දැරීමට ද සිදු වේ.

---

[1] සීඩ්ස් (Seeds - Sarvodaya Economic Enterprises Development Services (Guaranteed Limited) යනු: සර්වෝදය ආයතනයේ ආර්ථික හස්තයයි. එහි ප්‍රධාන අරමුණ තිරසාර ජීවනෝපාය සංවර්ධනය සඳහා ග්‍රාමීය ජනතාව ආර්ථික වශයෙන් බලගැන්වීම තුළින් දුප්පත්කම නැති කිරීමයි (www.seeds.lk). වැඩසටහන යටතේ ස්වයං රැකියා ණය සැපයීමට අමතරව තොරතුරු, වෙළෙඳපළ සැපයීම, කුසලතා වර්ධනය, කාර්මික පුහුණුව මෙන් ම අවශ්‍ය අවස්ථාවන් හි යෙදවුම් සැපයීම ද කරනු ලබයි (ශ්‍රී ලංකා මහ බැංකුව, 1993).

ගොවි බැංකුවෙ හි ලාභයෙන් කොටසක් කෘ.ප.නි.ස. වරුන් ඇතුළු ගොවි බැංකුවෙ හි කාර්යයන්ට සම්බන්ධ නිලධාරීන් සඳහා දිරි දීමනාවක් ලෙස ගෙවීමට නිර්දේශ කර ඇතත් පරිපාලන ගැටළු නිසා එය ක්‍රියාත්මක වී නොමැති බැවින් ඒ ඒ ප්‍රදේශවල ගොවිජන බැංකු ලබා ඇති ප්‍රගතිය පදනම් කර ගනිමින් හා සිදු කිරීමට ඇති කාර්යයන් හි ස්වභාවය අනුව කෘ.ප.නි.ස. වරුන්ට ගමන් වියදම් දීමනාවක් ගෙවීම සිදු කළ යුතු ය.

16. කෘ.ප.නි.ස. වරුන් ගොවිජන බැංකුව සම්බන්ධයෙන් කරනු ලබන කාර්ය කොටස ඇගයීමක් ලෙස ඔවුන්ගේ වාහන ණය අවශ්‍යතා ගොවිජන බැංකුව මඟින් සැපිරීම වැදගත් වෙයි. ඇතැම් ගොවිජන බැංකු මඟින් දැනටමත් සපයා ඇති ආකාරයට (මැදිරිගිරිය ගොවිජන බැංකු කෘ.ප.නි.ස වරුන්ට යතුරුපැදි ලබාගැනීම සඳහා යෝජනා ක්‍රමයක් අරඹා ඇත.) ඔවුන්ට මෝටර් සයිකලයක් ගැනීම සඳහා ප්‍රමාණවත් ණය මුදලක් ලබාදීමෙන් ගොවි බැංකු පිළිබඳ ඔවුන් තුළ ද යම්කිසි පැහැදීමක් ඇති වෙයි.

17. සමෘද්ධි බැංකුව මෙන් ගොවිජන බැංකුව ද සමාජ අවශ්‍යතා අනුව හැඩගැසීම වැදගත් වෙයි. ගොවීන්ගේ ළමුන් වෙනුවෙන් ශිෂ්‍යත්ව දීම හා නොමිලේ ඉංග්‍රීසි පාඨමාලාවක් පැවැත්වීම වැනි කාර්යයන් තුළින් ගොවිජන බැංකුව ගොවි ජනතාව සමඟ වඩාත් සමීපතාවක් ගොඩනඟා ගත යුතු ය.

18. සෑම දිස්ත්‍රික්කයකට පරිඝනක ආදී නවීන තාක්ෂණික අංගෝපාංගයන්ගෙන් හෙබි අංග සම්පූර්ණ හා ආකර්ෂණීය ගොවි බැංකුවක් පවත්වාගෙන යා යුතු ය.

19. අළුතෙන් බඳවා ගනු ලබන උපාධිධාරීන්ගෙන් සමන්විත ගොවි බැංකු කළමනාකරණ සේවාවක් ආරම්භ කළ යුතු අතර හැම ගොවිජන බැංකුවකටම ඒ තුළින් පත් කරනු ලබන කළමනාකරුවකු පත් කළ යුතු ය. මේ හා සමානව ගොවිජන බැංකු විගණන සේවාවක් ද ස්ථාපිත කළ යුතු අතර හැම ගොවිජන බැංකුවක් මෙන් ම ගොවිජන සංවර්ධන කාරක සභාවක් ද එමඟින් කාලීනව විගණනයට භාජනය විය යුතු ය.

20. ගොවි බැංකු ණය ලබාදීම හා සම්බන්ධ කටයුතුවල දී රටටම පොදු නීති රීතින් වෙනුවට ඒවා දිස්ත්‍රික් මට්ටමේ අනුමැතිය ඇතිව ප්‍රාදේශීය මට්ටමට ගැලපෙන පරිදි හැඩ ගස්වා ගැනීමට හැකියාව පැවතිය යුතු ය. එසේ ම, ජාතික මට්ටමේ අනුමැතිය ඇතිව ඒ ඒ ප්‍රදේශවල ගොවිජන අවශ්‍යතා අනුව ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ බලය ගොවිජන බැංකුවලට පැවතිය යුතු ය.

21. වැඩි වැඩියෙන් සාමාජිකයින් බඳවා ගැනීම, ඔවුන් ඉතිරි කිරීම් මෙන් ම ණය ගැනීම සඳහා උනන්දු කරවීම හා එම ණය සාර්ථකව අය කර ගැනීම යනා දී කාර්යයන් තුළින් ගොවිජන බැංකුවෙ හි කටයුතු තවත් පුළුල් වන අතර කාර්යයන් ද බහුල වේ. දැනට බොහොමයක් ගොවිජන බැංකුවල සිටින්නේ එක් නිලධාරියෙකු පමණක් නිසා ඔහුට පමණක් එම කාර්යයන් සැපිරීම අපහසු ය. කෘ.ප.නි.ස. වරුන් පමණක් නොව ප්‍රාදේශීය නිලධාරීන් ද සැලකිය යුතු ප්‍රමාණයක් දැනට නිලධාරී පුරප්පාඩු ඇති වසම් දෙකක රාජකාරී කරන නිසා ණය අය කර ගැනීම වැනි කාර්යයන් සඳහා පූර්ණ අවධානය යොමු කිරීම අපහසු ය. එබැවින්, ගොවිජන බැංකු සඳහා තවත් නිලධාරියෙකුගේ සේවය ලබාදීමට අමතරව, ප්‍රාදේශීය නිලධාරීන් හා කෘ.ප.නි.ස. වරුන් සඳහා ඇති අනෙක් පුරප්පාඩු පිරවීම ගොවි බැංකුවෙ හි කාර්යයන් සාර්ථකව සිදු කිරීම සඳහා මහෝපකාරී වෙයි.

22. සමහර කන්නවල දී අස්වනු පාළුවීම වැනි කරුණු නිසා ගොවීන්ට ණය ගෙවීමට අපහසු වේ. ප්‍රමාණවත් තරම් තැන්පතු ඉහළ දමා තිබේ නම් එවැනි අවස්ථාවල දී තැන්පතුවලින් හිමි ණය කපා හැරිය හැකි ය. එබැවින්, මැදිරිගිරිය ගොවි බැංකුවෙහි මෙන් ඉතුරුම් තැන්පත් වර්ධනය කිරීම නොඩකවා කරන කාර්යයක් විය යුතු ය (මැදිරිගිරිය ගොවි බැංකුව යටතේ ඇති සෑම ගොවියෙකුම කන්නයක් අවසානයේ රු.1000ක් ඉතිරි කළ යුතු ය යන්න රීතියක් බවට පත් කරගෙන ඇත). මේ යටතේ ප්‍රදේශයට ගැලපෙන මුදල් ප්‍රමාණයක් කන්නයක් වෙනුවෙන් ඉතිරි කිරීමට තීරණය කරගත හැකි ය.



පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො,ප.පු.ආ
HARTI

## ආශ්‍රිත ග්‍රන්ථ


1. Attanayake, M.M.(1993) An Evaluation of the Role of Financial Institutions in Poverty Alleviation: Sri Lankan Experience, Staff Studies, Vol. 23, No.1 & 2, Central Bank of Sri Lanka.

2. Batra, V. and Sumangeet (2011) The State of Microfinance in India "Emergence, Delivering Models and Issues, Working Paper No. AIVB-Bus-Econ-2011-2, http.//orp.aiub.edu.

3. Brau, J.C and Woller, G.M. (2004) Micro Finance: A comprehensive Review of the Existing Literature; Journal of Entrepreneurial Finance and Business Ventures, Vol. 9, Issue 1, 2004, pp 1-26

4. Chandrasiri, J.K.M.D. (2005) Rural Credit for Small Farming Sector, Achievements, Failures and Future Prospects: with Special Attention to Micro-credit Systems.

5. Fernando, N.A. (1987) Some Observations on Formal Small Farmer Credit in Sri Lanka, Unpublished Research Report.

6. Jayasena, G.W. , Shanker, M.S. S. G and Jayatissa, R.L.N. Performance: Review of Small farmer Credit Given Under Farmer Bank (1999) Hector Kobbekaduwa Agrarian Research and Training Institute (HARTI) (unpublished research report) Summarized in HARTI Annual Report 1999.

7. Krog, J. (2000) Attacking Poverty with Micro Credit : Indian Experiences, www. un.au.dk

8. Rama Krishna, R. Subbaiah, M. and Kannarao (2011): Micro Finance and Rural Credit Access for the Poor: Annovation, Indian Journal of Agricultural Economics, Vol.16, No.3, Conference Number, July-September 2011, Indian Society of Agricultural Economic, Mumbai.

9. Ratnayake, P. (1992): Towards Self-Reliant Development; A Policy Experiment in Sri Lanka, Karunaratne and Sons Ltd, Colombo.

10. Sanderatne, N. (2002): Leading Issues in Rural Finance, Postgraduate Institute of Agriculture, University of Peradeniya.

11. Shylendra, H.S. (2011) : Rapporteur's Report on Innovations in Agricultural Credit Market: Rationalization of Policy Response, Indian Journal of Agricultural Economics, Vol.16, No.3, Conference Number, July-September 2011, Indian Society of Agricultural Economics, Mumbai; pp.554-566

## ඇමුණුම් අංක 01

## ගොවි බැංකු පරිපාලනය හා සම්බන්ධ කමිටු සතු වගකීම් හා බලතල

ගොවිජන බැංකු කළමනාකරණය හා සම්බන්ධයෙන් ග්‍රාමීය, ප්‍රාදේශීය, දිස්ත්‍රික්ක දෙපාර්තමේන්තු හා ජාතික මට්ටමෙන් පිහිටුවා ඇති ණය අනු කමිටු විසින් මහත් කාර්ය භාරයක් ඉටු කෙරේ. එම එකිනෙක කමිටුවල බලතල හා කාරය භාරය මෙහි පහත සඳහන් කොට ඇත.

### 1.ග්‍රාමීය ණය අනු කමිටුව

ප්‍රදේශයේ ගොවි සංවිධානයේ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, කෘ.ප.නි.ස. වරයකු හා ගොවි සංවිධානයේ තවත් අයෙකුගෙන් සැදුම් ලත් මෙම කමිටුව මඟින් කෘ.ප.නි.ස විසින් දැනුවත් කොට ගොවීන් වෙත භාරදුන් ණය අයදුම්පත් ආපසු ලැබුණු පසු එමඟින් ඉල්ලනු ලබන ණය මුදල් ලබා දීමට සුදුසු බවට නිර්දේශ කෙරේ. ණය ආපසු අයකර දෙන බවට සහතික වීම ද මෙම කමිටුව සතු වගකීමකි.

### 2.ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුව

ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතිය මඟින් නිකුත් කරනු ලබන ණය ගොවි ජනතාව වෙත නිකුත් කිරීමේ හා අයකර ගැනීමේ බලධාරීත්වය දරන්නේ මෙම කමිටුව මඟිනි. ඒ සඳහා ගොවිජන සංවර්ධන සභාව විසින් සාමාජිකයන් පස්දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත්කර ගත යුතු අතර එය ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුව වෙයි. ඒ සඳහා ගොවිජන සංවර්ධන සභාවේ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික අනිවාර්යෙන්ම ඇතුළත් විය යුතු අතර තවත් සාාමාජිකයන් පස් දෙනෙකු ද පත්කර ගැනේ. ගොවි සංවිධාන අනු කමිටුව විසින් නිර්දේශ කරන ලද ණය ඉල්ලුම්පත් අනුමත කිරීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මෙම කමිටුවට ඇත. ණය ලබාදීම, අයකර ගැනීම පමණක් නොව එම මුදල් වඩාත් ඵලදායී ලෙස භාවිතයට ගැනීම සඳහා මෙම කමිටුව කටයුතු කරයි. මෙම කමිටුවට අනුමැතිය දීම සඳහා බලය ඇත්තේ රු.25,000 දක්වා වූ ණය සඳහා පමණි. දිස්ත්‍රික් මෙහෙයුම් කමිටුවේ අනුමැතිය, මඟපෙන්වීම හා නායකත්වය යටතේ කටයුතු කරන මෙම කමිටුව සතු කාර්යයන් කිහිපයකි. ඒවා නම්ඃ ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතිය යටතේ පිහිටුවා ඇති ග්‍රාමීය ආයතනයන් සඳහා අවශ්‍ය මඟපෙන්වීම ලබාදීම, පවතින මූල්‍ය සම්පත් හැකිතාක් දුරට නිෂ්පාදන කාර්යාවලීන් සඳහා යොමු කිරීම, ඕනෑම ණය මුදලක් පිළිබඳව නිර්දේශ කිරීමට පෙර අදාළ ගොවිජන සංවර්ධන සභවේ අනුමැතිය ලබාගැනීම ආදිය වේ.

### 3.දිස්ත්‍රික් මෙහෙයුම් කමිටුව

මෙම කමිටුවට රු.25,000 සිට රු.300,000 දක්වා වූ ණය අනුමත කිරීම් හැකියාව පවතී. මෙම කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි වෙයි. දිස්ත්‍රික්කයේ ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්(සභාපති), දිස්ත්‍රික්ක ගොවි සංවිධානයේ සභාපති/ලේකම් (උප සභාපති), දිස්ත්‍රික්ක කෘෂිකර්ම අධ්‍යක්ෂ හෝ ඔහු විසින් නම් කරන ලද නියෝජිතයෙකු, දිස්ත්‍රික්ක සත්ත්ව නිෂ්පාදන සංවර්ධන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ හෝ ඔහු විසින් නම් කරන ලද නියෝජිතයෙකු, දිස්ත්‍රික්ක වාරිමාර්ග අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ හෝ ඔහු විසින් නම් කරන ලද නියෝජිතයෙකු, දිස්ත්‍රික්ක සමූපකාර කොමසාරිස් හෝ ඔහු විසින් නම් කරන ලද නියෝජිතයෙකු, ගොවිජන සංවර්ධන මූලස්ථාන ප්‍රාදේශීය කොමසාරිස්/නිලධාරී(ලේකම්)ආදී වශයෙනි.

## 4.ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු මෙහෙයුම් කමිටුව

ගොවිජන සංවර්ධන කොමසාරිස්වරයා විසින් ජාතික මෙහෙයුම් කමිටුව විසින් කරනු ලබන ප්‍රතිපත්ති මාලාවක් ක්‍රියාත්මක කිරීමෙහි ලා ප්‍රධාන වගකීම දරයි. මෙම මෙහෙයුම් කමිටුව මඟින් ගොවිජන සංවර්ධන සභාව හා ජාතික මෙහෙයුම් කමිටුව අතර සම්බන්ධීකරණ කාර්යය ඉටුකරයි. ඒ අනුව, ගොවිජන බැංකුව ක්‍රියාත්මක කිරීමෙහි ලා අවශ්‍ය සියලු නීතිරීති හා විධිවිධාන පැනවීම මෙන් ම අදාළ ලේඛන නඩත්තු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ද ගොවිජන සේවා කොමසාරිස්වරයාගේ වගකීම වෙයි. මෙම වගකීම ඉටුකිරීම සඳහා සහාය ලබාගැනීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු මට්ටමෙන් ඇතිකරගනු ලැබීමට ගොවිජන සංවර්ධන කොමසාරිස්වරයාට හැකියාවක් පවතී.

## 5.ජාතික මෙහෙයුම් කමිටුව

ගොවිජන බැංකුවේ ප්‍රාග්ධන භාරකාරිත්වය දැරීම, ණය ලබාදීමේ ජාතික ප්‍රතිපත්ති මාලාවක් තීරණය කිරීම, ගොවිජන සංවර්ධන කොමසාරිස්වරයා මඟින් ණය නිකුත් කිරීම යනාදිය මෙමඟින් සිදු කෙරේ. ලබාදෙනු ලබන ණය නිකුත් කිරීම හා අයකර ගැනීම සම්බන්ධයෙන් මෙහෙයුම් කමිටුව පහත සඳහන් පරිදි නිලධාරීන්ගෙන් යුක්ත වෙයි. කෘෂිකර්ම විෂය දරන අමාත්‍යාංශයේ ලේකම්තුමා (සභාපති), එම අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සාමාජික), ග්‍රාමීය ණය පිළිබඳ උපදේශකවරයෙකු, ගොවිජන සංවර්ධන කොමසාරිස්තුමා, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ගොවි සමාගම් පිළිබඳව කටයුතු කරන ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතනික) යන අය වේ.

## ඇමුණුම් අංක 02

## විවිධ ණය වර්ග

ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතිය යටතේ ණය නිකුත් කිරීම හා අය කිරීම සම්බන්ධව 2007.08.20 දින නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුව ගොවිජන බැංකුව මඟින් ලබාදෙන ණය වර්ග පහත සඳහන් පරිදි වෙයි.

i. වගා ණය

ii. අස්වනු තෙලීමේ ණය

iii. අස්වනු සුරැකීමේ ණය

iv. කෘෂි යන්ත්‍රෝපකරණ ණය

v. ව්‍යාපෘති ණය

vi. ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට දායකවීමේ ණය

## ඉහත ණය ලබාගැනීම සඳහා සුදුසුකම්

i. ගොවිජන සේවා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි අයකු වීම.

ii. වගා ඉඩම් පිහිටි ප්‍රදේශයේ ගොවි සංවිධානයේ සාමාජිකයකු වීම.

iii. ගොවිජන සේවා බල ප්‍රදේශය තුළ කෘෂිකාර්මික කටයුතුවල නියැලෙන ඉඩම් හිමි ගොවියකු හෝ භුක්තිකරුවකු වීම.

iv. මෙයට පෙර ණය ලබාගෙන ඇතොත් ඒ සියල්ල නිසි පරිදි නිරවුල් කර ඇති අයකු වීම.

v. ලබාගැනීමට අපේක්ෂිත ණය මුදලින් අවම වශයෙන් 10%ක වටිනාකමින් යුත් ගොවිජන බැංකු කොටස් ලබාගෙන සිටීම.

vi. ණය අයදුම්කරු සාමාජිකත්වය දරන කුඩා කණ්ඩායම් ගිණුමේ හෝ පුද්ගල ගිණුමේ අපේක්ෂිත ණය මුදලින් 25%ක තැන්පත් මුදල් ශේෂයක් පවත්වාගෙන යා යුතු වීම.

vii. ණය පැහැර හරින ලද ගොවියකුගේ ඇපකරුවකු නොවීම.

viii. වගා ණය හැර අනෙක් සියළු ණය වර්ග ලබාගැනීම සඳහා පෙර කන්න 03ක දී වගා ණය ලබාගෙන නිසි පරිදි ගෙවූ හෝ මාස 18ක කාලයක් ගොවි බැංකුවේ ක්‍රියාකාරි සාමාජිකයකු වීම.

24190

## වගා ණය

කන්නයක් තුළ දී වගා කරනු ලබන ඕනෑම කෙටිකාලීන කෘෂිකාර්මික බෝගයක් සඳහා දෙනු ලබන ණය මෙයට අයත් ය. බීජ හා යෙදවුම් (මෙවලම්) සඳහා මෙම ණය ලබාදෙයි.

- උපරිම ණය සීමාව රු. 25,000/- කි.
- ණය පියවීමේ කාලය මාස 06 කි.
- ද්‍රව්‍ය හා යෙදවුම් ණය ලෙස නිකුත් කළ යුතු ය.
- අවශ්‍ය වුවහොත් අනුමත ණය මුදලින් 20%ක් පමණක් බිම් සැකසීම සඳහා නිකුත් කළ හැකි ය.
- ණය ගෙවීමේ කාලසීමාව ණය කමිටුව මගින් තීරණය කෙරේ.

## ව්‍යාපෘති ණය

කෙටිකාලීන නොවන වෙනත් වගාවන් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන වැඩිදියුණු කිරීමට හා පසු අස්වනු තාක්ෂණය වැඩි දියුණු කිරීමට නිකුත් කරනු ලබන ණය මේ යටතට ගැනේ. (උදා. සත්ත්ව පාලනය, මිරිදිය මත්ස්‍ය වගාව, මල් වගාව, පලතුරු වගාව)

- වරකට ගත හැක්කේ මෙම ණය හෝ කෘෂි යන්ත්‍රෝපකරණ ණය යන දෙකින් එක් වර්ගයකි.
- ණය ඉල්ලුම් කිරීමේ දී ව්‍යාපෘති වාර්තාවක් හා කොට්ඨාසයේ කෘෂිකර්මය පිළිබඳ තාක්ෂණික නිලධාරියකුගේ නිර්දේශය ඉදිරිපත් කළ යුතු ය.

## අස්වනු නෙළීමේ ණය

වී ඇතුළු කෙටිකාලීන බෝග නෙළීමේ ණය මෙයට අයත් වේ.

- ලබාදිය හැකි උපරිම මුදල රු. 40,000.00 කි.
- ණය ගෙවීමේ කාලය උපරිම මාස 01 කි.

## අස්වනු සුරකීමේ ණය

වී සහ අනෙකුත් කෙටිකාලීන බෝග සුරකීම සඳහා දෙනු ලබන ණය මේ යටතේ ගැනේ.

- මෙම ණය ලබා ගැනීමට ප්‍රථම මෙයට පෙර ලබාගත් කෙටිකාලීන ණය සම්පූර්ණයෙන්ම ගෙවා සිටිය යුතු ය.
- වී සඳහා කි.ග්‍රෑ. 01කට රු. 15/-ක් බැගින් ණය ලබාදෙයි.
- අනෙක් බෝග සඳහා දෙන ණය ප්‍රමාණය දිස්ත්‍රික් පාලක කමිටුව තීරණය කළ යුතු ය.
- උපරිම ණය සීමාව රු. 75,000/-කි.
- ණය පියවීමේ කාලය උපරිම මාස 03 කි.

පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගෙ.,ප.පු.ආ
HARTI

## කෘෂි යන්ත්‍රෝපකරණ ණය

- එක් වරක දී ලබාගත හැක්කේ කෘෂි යන්ත්‍රෝපකරණ ණය හෝ ව්‍යාපෘති ණය වලින් එක් වර්ගයක් පමණි.
- මේ සඳහා ව්‍යාපෘති යෝජනා පත්‍රයක් ඉදිරිපත් කළ යුතු ය.
- ණය ගෙවා අවසන් වනතුරු යන්ත්‍රෝපකරණවල පරම අයිතිය ගොවිජන සේවා කාරක සභාව සතු විය යුතු ය.

## ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට දායකවීමේ ණය

මේ යටතේ ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ක්‍රමයට අළුතෙන් දායක වන්නන් සඳහා ගෙවීමට සිදුවන හිඟ මුදල් ප්‍රමාණය ණයක් ලෙස ලබාදෙයි.

124190

තැ.පෙ. 1522
කොළඹ,
ශ්‍රී ලංකාව.

දු.අ : 94112696981
94112696437

ෆැක්ස්: 94112692423

විද්‍යුත් තැපැල්.:library@harti.lk
වෙබ් : www.harti.gov.lk

ISBN 978-955-612-146-9
9789556121469

Rs. 475/-

## National Digitization Project

*National Science Foundation*

Institute : National Science Foundation

1. Place of Scanning : Sanje (Private) Ltd, Hokandara

2. Date Scanned : 02/06/2017

3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara

4. Scanning Officer

Name : Angelo Melvin Luwis

Signature : A. M. Luwis

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Information Officer

Name : Renuka Sugathadasa

Signature : K. P. Sugathadasa

Date : 02/06/2017

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*